ISSN 2420-7381

# සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය

# 2020

හත්වන වෙළුම, පළමු කලාපය

# Journal of Social Statistics

# 2020

**Volume 07, Issue 01**

**ප්‍රකාශනය**
**සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය**
**සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව**

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය 2020 - සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගම් වාර්ෂික ප්‍රකාශනය

මුද්‍රණය 2020 දෙසැම්බර්

ISSN 2420-7381

සංස්කාරක : සහකාර කථිකාචාර්ය ලෂිනි ලියනගේ

සහාය සංස්කාරක : සහකාර කථිකාචාර්ය පී. ජී. ටී. එන්. පෙරේරා

කවර නිර්මාණය : සහකාර කථිකාචාර්ය ලෂිනි ලියනගේ

හත්වන වෙළුම, පළමු කලාපය

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ඇතුලත් ශාස්ත්‍රීය ලිපිවල අන්තර්ගත කරුණු සම්බන්ධ වගකීම කර්තෘන් සතුවන අතර, ඒ සඳහා සංස්කාරක මණ්ඩලය වගකීමක් නොදරයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි හත්වන වෙළුම, පළමු කලාපය ප්‍රකාශන අනුග්‍රහය

# සඟරා ලිපි විමර්ශන මණ්ඩලය


- මහාචාර්ය ඩබ්.එම්. සේමසිංහ මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*

- මහාචාර්ය එච්. එම්. නවරත්න බණ්ඩා මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (C'bo), M.Sc. (York), Ph.D. (Kel'ya)*

- මහාචාර්ය ආර්. ඒ. සීතා ප්‍රියංගනි මිය (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (Japan), MSSc. (Kel'ya), Ph.D. (NZ)*

- ආචාර්ය මංජුල ගුණරත්න මයා (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.S.Sc. (Kel'ya), Ph.D. (UMS)*

- ලක්දිනි දසනායක මිය (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.Sc. (Kel'ya), PG.Dip. (C'bo), MSSc. (Kel'ya)*

- ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය (ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A.(ROK), Ph.D (SNU)*

- අපේක්ෂා ඇඹුල්දෙණිය මිය (ආධුනික කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), PQHRM (IPM), M.Sc. (Col'bo)*

- දිලුෂි කොඩිතුවක්කු මෙය (ආධුනික කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.Sc. (Moratuwa)*



# Message from the Vice Chancellor
# University of Kelaniya

It is with great pleasure that I write this message of felicitation for the 7th volume of the Journal of Social Statistics (JSS) – 2020", because I strongly believe that undergraduate level education and training in research is essential to improve and sustain the quality of university education.

Despite the multitude of challenges faced by researchers and conference organizers during the current COVID19 pandemic, the Department of Social Statistics has remained steadfast in its commitment to building a strong research environment and providing a suitable platform for the dissemination of research results for the 7th consecutive year. I am certain that the research findings presented in this issue of the Journal of Social Statistics will undoubtedly assist policy makers and planners to translate conclusions into meaningful action.

I take this opportunity to thank all the staff members of the Department of Social Statistics for all their efforts to preserve the image of the Department as a benchmark in academic outreach, with quality teaching-learning activities, and a deep commitment to dissemination of research studies. I am very happy to note your hard work in publishing this journal.

Finally, I wish all researchers' fruitful deliberations that would help you achieve your high academic and career goals.

**Professor Nilanthi de Silva**

Vice Chancellor

University of Kelaniya



# Message from the Dean

# Faculty of Social Sciences

It is with great pleasure that I extend my warmest wishes for the 7th volume of the Journal of Social Statistics – 2020 published by the Department of Social Statistics.

The journal will provide an opportunity for undergraduates following Social Statistics to share their research findings and to exchange their views on multidisciplinary topics. The evidence-based research would contribute to addressing current issues related to different fields in Sri Lanka. Training undergraduates to engage in high quality research is very important. Not only conducting research, but also publishing research findings in reputed journals is equally important in order to use them for the enhancement of knowledge and national development. I am sure this journal will be of great benefit to all authors and readers.

Finally, I would like to thank everyone who has supported the publication of this year's journal and I offer my congratulations to the Head of the Department, organizing committee and authors. Furthermore, I wish them the very best in their future endeavours.

**Professor M. M. Gunatilaka**

Dean

Faculty of Social Sciences

University of Kelaniya



# Message from the Head
# Department of Social Statistics

For the seventh consecutive year, the Department of Social Statistics, Faculty of Social Sciences, University of Kelaniya publishes "Journal of Social Statistics (JSS) – 2020" under the "Statica" major programme.

JSS is a bi-annual and blind reviewed journal which strives towards publishing original and genuine articles encompassing different topics in Social Sciences. The Journal will contain original research articles. The unbiased and un-opinionated review system effectively filters the validity and importance of articles in today's social sciences domain.

JSS is a tremendous opportunity for undergraduates following their bachelor's degree in Social Statistics. This journal offers an immense support for the young researchers to develop their research skills and academic writing skills. As a department, we always dedicate in motivating researchers to publish adequate research findings. The main objective of the publication of this journal is to create a platform to open a unique opportunity for our undergraduates for publication of high quality scholarly articles on a variety of topics related to Social Sciences. On this purpose, I believe, JSS-2020 will be simply remarkable among the others.

I would like to acknowledge the commitment shown by all the staff of the department of Social Statistics, members of the Social Statistics Students' Association. I take this opportunity appreciate the Finally, I congratulate all the authors and wish you all the best for your future accomplishments

**Dr. Manjula Gunarathna**

Head, Department of Social Statistics

University of Kelaniya



# Message from the Chairman

# Research Council

# University of Kelaniya

It is with great pleasure that I convey this message to the “Journal of Social Statistics (JSS) – 2020” which is published under STATICA Program by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

Training undergraduates to engage in high quality research is very significant as they are our future researchers. It is not only conducting research, but also publishing it in a journal is equally important in order to use them for the enhancement of knowledge and national development.

I congratulate the coordinators and the organizing committee for publishing the “Journal of social Statistics (JSS) 2020” successfully.

**Senior Professor N.P. Sunil-Chandra**

Chairman of the Research Council

University of Kelaniya



# Message from the Editor
# Journal of Social Statistics (JSS)

For the seventh consecutive year, Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya publishes the 7th volume of the Journal of Social Statistics (JSS 2020).

JSS 2020 is a tremendous opportunity for undergraduates to publish their research findings. The aim of JSS is to provide a forum for the dissemination of original research, which publishes bi-annually in the multidisciplinary areas of research. We are keen to boost publication of high quality evidence-based researches in all the categories of academia in a broad sense with a quantitative perspective, by authors who are doing their bachelor's degree in Social Statistics at University of Kelaniya. This helps young researchers to develop their research skills and academic writing skills too.

I would like to convey my sincere gratitude to Dr. K. M. L. M. Manjula Gunarathna, Head, Department of Social Statistics for his vast guide and support for this event. As well as I would like to thank all the Senior Professors, Professors, Senior Lecturers and Lecturers for reviewing articles and their guidance in this event. And I thank all our submitting authors, who have toiled in the production of their work. Finally, I strongly encourage you to submit novel and enlightening manuscripts to educate and support the growing academic world and I wish all the participants to have a successful future.

**Ms. Lashini Liyanage**
Assistant Lecturer
Department of Social Statistics
University of Kelaniya

# සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය

# නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | ඩබ්. එම්. එම්. වීරසුන්දර |
| උප සභාපති | සී. බී. බිංගුමලී |
| ලේකම් | එන්. බී. පී. උපේක්ෂානී |
| සම ලේකම් | ඩබ්. පී. පී. සී. වටගල |
| භාණ්ඩගාරික | අයි. එච්. ආර්. ටී. එම්. බණ්ඩාර |
| සඟරා සංස්කාරක | එච්. එල්. ඒ. එම්. සෙව්වන්දි |
| කමිටු සාමාජිකයන් | එච්. ඒ. එන්. ඩී. ප්‍රේමලාල් |
| | එස්. ජේ. එස්. එස්. දිනෙත්සලා |
| | බී. කේ. කේ. ගයාන් |
| | එම්. කේ. ඩී. විතානවසම් |
| | ඩබ්. එම්. සී. ලක්ෂාණි |
| | ඩබ්. එම්. ඒ. පී. වන්නිනායක |
| ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික | ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය |

# පටුන


| | |
|---|---|
| විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව | 01 |
| සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණයට බලපාන සාධක | 15 |
| තේ කර්මාන්තය වතු කම්කරු ආර්ථිකයට ඇති කරන බලපෑම | 29 |
| ඇඟලුම් කර්මාන්තවල සේවකයන්ගේ ආර්ථික තත්ත්වයට කොවිඩ්-19 හි බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (ග්‍රාමීය අංශ ඇසුරෙන්) | 43 |
| ශ්‍රී ලංකාවේ සතිපොල වෙළඳුන්ගේ ආර්ථික පසුබිම එම කුටුම්භයන්හි දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන ආකාරය | 57 |
| ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව | 79 |
| කාන්තාව උසස් අධ්‍යාපනයට යොමුවීම සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම | 105 |
| Influence of the Industrial Sector on Economy of Sri Lanka | 121 |

# විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව

එච්. ඒ. එන්. ඩී. ප්‍රේමලාල්

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
naradapremalal@gmail.com

***සංක්ෂේපය***

*මෙම අධ්‍යයනයේ ප්‍රධාන අධ්‍යයන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන අධ්‍යාපනික සාධක හඳුනාගැනීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දෙවර්ගයේම දත්ත රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා මූලිකවම ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ ප්‍රශ්නාවලිය උප ලේඛනයක් ලෙස භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල පහළොව අතරින් විශ්වවිද්‍යාල හයක දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් එකසිය දසදෙනකු තෝරා ගන්නා ලදී. එහෙත් නොනියැදුම් දෝෂයක් වන නිෂ්ප්‍රතිචාර අභිනතියට අධ්‍යයනය යටත් වූ නිසා අධ්‍යයනයේ මුළු සංගහනයම අධ්‍යයනය කරනු ලැබුවත් නියැදිය වශයෙන් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් සිය දෙනෙකු පමණක් තෝරා ගත හැකි විය. දත්ත ඒකරාශි කිරීමෙන් පසු එම දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානමය විශ්ලේෂණය සහ ප්‍රධාන සංරචක විශ්ලේෂණය උපයෝගී කරගෙන ඇත. දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව සොයා ගන්නා ලද විවිධ කරුණුවලට යටත්ව යෝජනා සහ නිගමන ඉදිරිපත් කිරීම සිදු කර ඇත. ඒ අනුව වැදගත් යෝජනා කිහිපයක් ලෙස දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් හට පෞද්ගලික පරිගණකයක් ලබා දීම සඳහා සහනාධාර ක්‍රමයක් හෝ ණය පහසුකම් ලබාදීම සඳහා විශ්වවිද්‍යාලය හරහා රාජ්‍ය මැදිහත් වීම, දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ට තනිව තම පරිගණක අධ්‍යයන හෝ අනධ්‍යන ක්‍රියාකාරකම් සිදු කර ගැනීම සඳහා හැකි වන පරිදි දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් පුරුදු පුහුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික උපකාරයන් පිළිබඳව අවධානය යොමු කිරීම සහ දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් හට පරිගණක කටයුතු තුළින් අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම පිළිබඳ අවබෝධය ලබාදීම සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු හඳුනා ගත හැකිය. ප්‍රධාන සංරචක විශ්ලේෂණය තුළින් සොයා ගන්නා ලද ස්වයං අධ්‍යයනය සඳහා උපකාරී වන සාධක කෙරෙහි අවධානය යොමුකර එම සාධකයන් සංවර්ධනය කිරීම තුළින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ ස්වයං අධ්‍යයන කටයුතු සංවර්ධනය කළ හැකි බව මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිගමනයකි.*

***මුඛ්‍ය පද : දෘශ්‍යාබාධිත, විද්‍යාර්ථීන්, පරිගණක, ශක්‍යතාව***

## 1. හැඳින්වීම

වර්තමානය වනවිට දියුණු ලෝකය පොදුවේ සියලුම ආබාධිත පුද්ගලයන් යනු තවදුරටත් කිසිවක් කරගත නොහැකි කොට්ඨාසයක් ලෙස සලකන්නේ නැත. "Disabled" යන ඉංග්‍රීසි වචනය වෙනුවට "Differently abled" යන ඉංග්‍රීසි වචනය ආබාධිතයන් සඳහා භාවිතා කිරීමට තරම් දියුණු ලෝකය සමත්ව ඇත. එහි තේරුම නම් ආබාධිත පුද්ගලයන් යනු තවදුරටත් කිසිවක් කරගත නොහැකි පුද්ගලයන් කණ්ඩායමක් නොව ඔවුන් විවිධ වෙනස් හැකියාවන්ගෙන් පිරිපුන් පිරිසක් යන්නයි (Dror, 2019). 2012 ජනගහන හා නිවාස තොරතුරු අනුව මුළු ආබාධිත පුද්ගලයන් (ශාරීරික හා මානසික දෙවර්ගයේම) 1,617,924ක් සිටිති. මෙම පුද්ගලයන් අතරින් 996,939 ක් දෘශ්‍යාබාධිත පුද්ගලයින්ය. ඒ අනුව මුළු ආබාධිත ජනගහනයෙන් වැඩි ලෙස සිටින්නේ දෘෂ්ටි ආබාධ සහිත පුද්ගලයන්ය. තවද මුළු ජනගහනයෙන් 1000 කට 87 දෙනෙකු කිසියම් හෝ ආබාධයකින් පෙළෙන අතර මුළු ජනගහනයෙන් 1000 කට 54 දෙනෙකු යම්කිසි දෘෂ්ටි ආබාධ තත්ත්වයකින් පසුවේ (Census of population and housing, 2012).

මෙම පර්යේෂණයේ මූලික නියැදී ඒකකය වන විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත ශිෂ්‍යයා යනු කවරෙක්ද යන්න හඳුනා ගැනීම වැදගත් වේ. ඒ අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු යනු විශ්වවිද්‍යාලයකට ඇතුළත්ව අධ්‍යාපනය ලබන අයෙකි. අධ්‍යාපනය පිළිබඳ උපාධියක් සඳහා සුදුසුකම් ලබා ගැනීම සඳහා සහතික කරන කළ ගුරුවරයකුගේ අධීක්ෂණය යටතේ උගන්වන විද්‍යාලයක ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාල ශිෂ්‍යයා හඳුන්වා දී ඇත (University students, 2003-2012).

පරිගණක සාක්ෂරතාව සඳහා අර්ථ දැක්වීම - වයස අවුරුදු 5-69 අතර පුද්ගලයකුට (ඔහු/ ඇය) පරිගණකය භාවිතා කළ හැකි නම් ඔහු /ඇය පරිගණක සාක්ෂරතාව ඇති පුද්ගලයකු ලෙස සැලකේ. උදාහරණයක් ලෙස අවුරුදු 5ක දරුවෙකුට පරිගණක ක්‍රීඩාවක් කළ හැකි නම් ඔහු හෝ ඇය පරිගණක සාක්ෂරතාව ඇති පුද්ගලයකු ලෙස සැලකේ. 2019 දී ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතා අනුපාතය 30.8% ලෙස දක්වයි. පරිගණක සාක්ෂරතා අනුපාතය ලබා ගන්නේ වයස අවුරුදු 5-69 අතර පරිගණක සාක්ෂරතා ජනගහනය මුළු ජනගහනයට ප්‍රතිශතයක් ලෙසයි (Computer Literacy Statistics - 2019(First six months), 2019). ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම සිටින ශිෂ්‍යයින් විශ්වවිද්‍යාල වරම් ලබා ගත් පසු බොහෝ දෙනා වැඩි ලෙස රාජ්‍ය විශ්වවිද්‍යාල තෝරා ගනියි. ඊට හේතු ලෙස පෞද්ගලික විශ්ව විද්‍යාලයක පිරිනමන උපාධියට සාපේක්ෂව රාජ්‍ය විශ්වවිද්‍යාලයක පිරිනමන උපාධියට වැඩි වැදගත්කමක් තිබීම හා වැඩි පිළිගැනීමක් තිබීම,තවද දුෂ්කර ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල්වල ශිෂ්‍යයින්ට පෞද්ගලික විශ්වවිද්‍යාල වලට ඇතුළත් වීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් නොතිබීම ආදියද, මෙම පර්යේෂණයට අදාළ නියැදිය ලබා ගැනීමේදී යම් නගරයක පදිංචිව සිටින විශ්වවිද්‍යාල ශිෂ්‍යයාත් දුෂ්කර ගම්මානයක පදිංචිව සිටින විශ්වවිද්‍යාල ශිෂ්‍යයාත් ආදී සමස්තයක් ලෙස ජාතික මට්ටමෙන් දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව කෙරෙහි බලපෑම් කරනු ලබන අධ්‍යාපනික සාධක මොනවාදැයි අධ්‍යයනය කිරීමට අවශ්‍ය වීම, රාජ්‍ය විශ්වවිද්‍යාල තෝරා ගැනීමට හේතු ලෙස ඉදිරිපත් කළ හැක.

ඒ අනුව මූලාශ්‍ර අධ්‍යයනයේදී පෙනී ගිය කරුණ නම් අනෙක් විෂයන්ට සාපේක්ෂව මුළු මහත් දෘශ්‍යාබාධිත ශිෂ්‍ය ප්‍රජාවටත්, විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ටත් පරිගණකය හැදෑරීම ඉතා වැදගත් බවයි. ඒ පරිගණක ශක්‍යතාවක් තිබුණහොත් අනෙක් විෂයන් පවා පරිගණක මාධ්‍ය භාවිතයෙන් අධ්‍යයනය කළ හැකි වීම නිසයි. තවද පරිගණකය හරහා අධ්‍යාපනය හදාරන දෘශ්‍යාබාධිත ශිෂ්‍යයකුට තම පරිගණකය තමන්ට අවශ්‍ය ලෙස මෙහෙයවීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම පරිගණක දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. නමුත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයා (විද්‍යාර්ථියා) දෙස අවධානය යොමු කරන විට උක්ත සඳහන් කළ වයස් බාණ්ඩ දෙකට සාපේක්ෂව ඔහු/ඇය දැනුම ගවේෂණය කරමින්, විෂයානුබද්ධ පරිබාහිර දැනුම ගවේෂණය කරමින් අධ්‍යයන කටයුතුවල නිරත වන පුද්ගලයෙකි. එසේ දැනුම, අධ්‍යයන දැනුම් සම්භාරයන් ගවේෂණය කරමින් ඉගෙන ගැනීම විශ්වවිද්‍යාල විද්‍යාර්ථියෙකුට අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා ඉහත සඳහන් කරන ලද වයස් කාණ්ඩ දෙකට සාපේක්ෂව විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට වඩා පරිගණක අධ්‍යාපනයක් ලබා තිබීම හෝ පරිගණක අධ්‍යාපනයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

තවද විශ්වවිද්‍යාල විද්‍යාර්ථියෙකු යනු ඉදිරියේදී රටේ ආර්ථික, සමාජ, සේවා ආදී ක්ෂේත්‍රවලට ඍජුවම සම්බන්ධ විය හැකි පුද්ගලයෙකි. පෙරදී සඳහන් කරන ශිෂ්‍ය වයස් කාණ්ඩ දෙකට සාපේක්ෂව විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට පරිගණක සාක්ෂරතාව වැදගත් ගුණාංගයක් ලෙස ඒ අනුව හඳුනා ගත හැක. විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය හදාරනු ලබන විද්‍යාර්ථීන් අතරින් අනෙක් ආබාධිත විද්‍යාර්ථීන්ට හා අනෙකුත් විද්‍යාර්ථීන්ට සාපේක්ෂව දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ට පෙනීමේ දුර්වලතාවක් පවතින බව අප පිළිගත යුතුය. පෙනීම යනු මිනිසාට වගේම සත්ත්වයන්ටද අත්‍යවශ්‍ය අංගයකි. නමුත් විශ්වවිද්‍යාලය තුළ අධ්‍යයනය කටයුතු සිදුකිරීමේදී දෘශ්‍යාබාධිත විද්‍යාර්ථියාට ඔහුගේ තිබෙන දෘශ්‍ය ආබාධිත තත්ත්වය තම උපාධි පාඨමාලාව සාර්ථකව නිමකිරීමට බලපෑම් කරනු ලබනවාද? බලපෑමක් කරනු නොලැබේද? යන්න පරීක්ෂණය කිරීමට මෙම පර්යේෂණය තුළින් අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වේ. එනම් දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව කෙබඳුදැයි යන්න සෙවීමට මෙම පර්යේෂණය මෙහෙයවනු ලැබේ.

දෘශ්‍යාබාධිතභාවය යනු යම් පුද්ගලයෙකුගේ පෙනීමේ පවතින දුර්වලතාවයයි. එය අර්ධ වශයෙන් පෙනීමක් හෝ සම්පූර්ණ වශයෙන් පෙනීම නොමැතිවීමක්ද විය හැකිය. දෘශ්‍යාබාධිත තත්ත්වය යනු පෙනීමේ දුර්වලතාවය හෝ පෙනීම නැතිවීමයි. වීදුරු (ඇස් කණ්ණාඩි) වැනි සුපුරුදු ක්‍රම මගින් විසඳිය නොහැකි ගැටලු ඇති කරන මට්ටමට බැලීමේ හැකියාව අඩුවේ. සමහරුන්ට කණ්ණාඩි හෝ අක්ෂි කාච සඳහා ප්‍රවේශය නොමැති නිසා දැකීමේ හැකියාව අඩු අය ද ඇතුළත්ය (W.H.O, 2015).

මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන්නේ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන අධ්‍යාපනික සාධක කවරේද? යන්නය. මෙහි ප්‍රධාන අධ්‍යයන අරමුණ වන්නේ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක හඳුනා ගැනීමයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

විද්‍යාත්මක පාඨමාලාවලට ප්‍රවේශ වීමේ හැකියාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳ දළ විශ්ලේෂණයක් නම් මෙම අධ්‍යයනයෙන් විශ්වවිද්‍යාල ඉගැන්වීම් කටයුතු කිරීම සඳහා භාවිතා කරන වඩාත් පොදු ක්‍රම පිළිබඳව විශ්ලේෂණයක් සිදු කිරීම, ගණිතමය අන්තර්ගතයක් සහිත විෂයයන් සඳහා ප්‍රවේශතාවයෙදී මතුවන ගැටලු, ගණිතමය අන්තර්ගතය සහිත විෂයන් හැසිරවීම සඳහා විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත සිසුන්ට ලබා දිය හැකි මෘදුකාංග පිළිබඳව හා එම විෂයයන් හැසිරවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ආචාර්යවරුන් විසින් ඉගැන්වීමේ කටයුතු සිදු කළ යුතු ආකාරය පිළිබඳ මෙහිදී දළ විශ්ලේෂණයක් සිදු කර ඇත. දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින් NVDA හෝ JAWS වැනි කථන සංස්ලේෂණ මෘදුකාංගවලින් දැඩි ප්‍රතිලාභ ලබන බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙන අතර අර්ධ වශයෙන් පෙනීම ඇති දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින් ඕනෑම තිර විශාලනයක් සහ තිර පාඨකයක් භාවිතා කළ හැකි බව පෙන්වා දෙයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිගමනයක් වන්නේ සමහර සම්පත් උපකරණ වන විනිවිදක, e-පොත්, e- දේශන සටහන්, විශ්වවිද්‍යාල වෙබ් අඩවි හා විශ්වවිද්‍යාල ඩිජිටල් පුස්තකාල දෘශ්‍යාබාධිත සිසුන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට උපයෝගී කරගත හැකි බව වැඩිදුරටත් පෙන්වා දෙයි. තවද blind Math සහ LaTex වැනි ප්‍රවේශයන් තුළින් දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින්ට අධ්‍යාපනය ලබා දීම පහසු කරන බව පෙන්වා දෙයි (Armano, Capietto, Illengo, Murru & Rossini, 2015).

කොළඹ විශ්වවිද්‍යාලයේ දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා උපකාරක තාක්ෂණයන් යන පර්යේෂණයෙන් පෙන්වා දෙන්නේ දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින්ට තම සම වයසේ මිතුරන් හා සංසන්දනය කරන විට තොරතුරු ලබා ගැනීමේ යම් යම් දුෂ්කරතා තත්ත්වයන් ඇති වී තිබෙන බවයි. තොරතුරු තාක්ෂණය දියුණුව සමඟ සාම්ප්‍රදායික ක්‍රමයන්ට සාපේක්ෂව වර්තමානය වන විට දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් අතර උපකාරක තාක්ෂණයන් සහ විවිධ උපාංග ජනප්‍රිය වී තිබේ. මෙම අධ්‍යයනයේදී උපකාරක තාක්ෂණයන්හි යෝග්‍යතාව හඳුනාගැනීම සඳහා සාහිත්‍ය විමර්ශනයක් කෙරෙහි අවධානය යොමු කර ඇති බව පර්යේෂකයා විසින් පෙන්වා දෙයි. දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් විසින් සංවෘත පරිපථ හෙවත් රූපවාහිනි, ශ්‍රව්‍ය පොත්, තිර විශාලනය සහ තිර පාඨකය යන මෘදුකාංග වැඩි වශයෙන් උපකාරක තාක්ෂණයන් ලෙස භාවිතා කරන බව මෙයින් පෙන්වා දී ඇත. බ්‍රේල් පොත් සාම්ප්‍රදායික සම්පත් ලෙස හඳුනා ගෙන තිබුණද ඒවා වැදගත් යැයි ප්‍රකාශ කරන මෙම පර්යේෂකයා විසින් ඉහත උපාංගවලට අමතරව බ්‍රේල් සටහන්, බ්‍රේල් යතුරුපුවරු, බ්‍රේල් සංදර්ශක සහ කථන සංස්ලේෂක ආදී ආධාරක උපාංගද අඩු වැඩි වශයෙන් දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් විසින් භාවිතයට ගන්නා බව ප්‍රකාශ කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින් සඳහා සම්පත් මධ්‍යස්ථානයේ බ්‍රේල් රීඩර්, ඩිජිටල් කතා පොත් සහ අතේ රැගෙන යා හැකි ඩිජිටල් වීඩියෝ විශාලනයකින් සමන්විත වේ. මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව පර්යේෂකයා විසින් ප්‍රධාන ලෙසම ප්‍රකාශ කර සිටින්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන් සඳහා සම්පත් මධ්‍යස්ථානයේ ඇති සම්පත් හා සේවාවන් දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බව සහ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික

උපකාරක උපකරණ ලබාදීම යෝජනාව කර ඇත. ඒ අනුව දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින්ට තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා අවම කරගැනීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ශ්‍රව්‍ය පොත් එකතුවක්, බ්‍රේල් කියවීමේ පහසුකම් සහිත පරිගණක, බ්‍රේල් යතුරුපුවරු, තිර විශාලනය සහ අනෙකුත් බ්‍රේල් උපකරණ ලබාදීම තුළින් හැකි වන බව මෙම පර්යේෂණයෙන් පෙන්වා දී ඇත (Lankathilake, 2018).

නයිජීරියාවේ තෘතීයික අධ්‍යාපන ආයතනවල දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන්ගේ තත්ත්වය සහ ඔවුන්ගේ අභියෝගයන් ජය ගැනීම සඳහා වන ක්‍රමවේදයන් පිළිබඳව විමර්ශනය කිරීමට අධ්‍යයනයක් කර ඇත. දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින්ට උසස් අධ්‍යාපනය ලැබීමේදී ඇති වන අභියෝග ලෙස දක්වන්නේ වාස්තු විද්‍යාත්මක බාධක, දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින්ගේ මානසික පරිහානිය, මහජනයාගේ ආකල්ප, ප්‍රමාණවත් නොවන ද්‍රව්‍ය උපකරණ සහ අධ්‍යාපන පිරිවැය ඉහළ වීම යන හේතූන්ය. මෙම අධ්‍යයනයෙන් නිගමනය කරනු ලබන්නේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින්ට බොහෝ අධ්‍යාපන ගැටලු ඇති නිසා ආණ්ඩුව සහ රාජ්‍ය නොවන සංවිධාන එක්ව එම අධ්‍යාපන ගැටලු විසඳීමට ප්‍රයෝජනවත් ක්‍රමවේදයන් සකස් කළ යුතු බවයි. මෙම අධ්‍යයනයේ යෝජනාවන් ලෙසට දෘශ්‍යාබාධිත පුද්ගලයන් අධ්‍යාපනය හදාරනු ලබන අධ්‍යාපන ආයතන සඳහා සුදුසුකම් ලත් උපදේශකයින්, නවීන හා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම්, යටිතල පහසුකම් නඩත්තු කිරීමේ පහසුකම්, ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් හා විශේෂ අධ්‍යාපන පහසුකම් වන දෘශ්‍ය ආධාරක, බ්‍රේලර් යන්ත්‍ර, යතුරුලියන යන්ත්‍ර සහ මාර්ගෝපදේශක සුනඛයින් වැනි සංචලන උපකරණ ලබාදීම වැනි පහසුකම් ලබාදීම තුළින් ඔවුන්ගේ අධ්‍යාපනය දිරිමත් කළ හැකි බවට යෝජනා කර ඇත (Andrew, 2015).

මේ ආකාරයට විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම පිළිබඳව විවිධ අයුරින් සාහිත්‍යය විමර්ශනයන් අධ්‍යයනය කිරීමේදී පෙනීගිය ප්‍රධාන කරුණක් නම් ජාත්‍යන්තර වශයෙන් දෘශ්‍යාබාධිත විශ්ව විද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව පිළිබඳ ප්‍රමාණවත් විධිමත් පර්යේෂණයන් සිදු වී ඇති නමුත් දේශීය වශයෙන් ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම පිළිබඳව ප්‍රමාණවත් හා විධිමත් පර්යේෂණ සිදු වී නොමැති බවයි. ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින් පිළිබඳව පර්යේෂණ සිදු වී ඇති නමුත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් පිළිබඳව අල්ප වශයෙන් පර්යේෂණ සිදු කර ඇති නමුත් විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමේ හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමේ ශක්‍යතාව පිළිබඳව විධිමත් සහ ප්‍රමාණවත් පර්යේෂණ සිදු වී නොමැත. ජාත්‍යන්තර මට්ටමෙන්ද දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව සම්බන්ධව සිදු කර ඇති ජාත්‍යන්තර පර්යේෂණවලින් අවධානය යොමු කර ඇති ක්ෂේත්‍ර හා සසඳන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව පිළිබඳව සිදු කර ඇති පර්යේෂණවලින් බොහෝ ක්ෂේත්‍රයන් කෙරේ අවධානය යොමු කර නොමැති හෙයින් මෙවැනි අධ්‍යයනයක් විධිමත්, ප්‍රමාණවත් ලෙස සහ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපනයට අදාළ බොහෝ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පර්යේෂය කිරීමට ඇති අවශ්‍යතාව මතුවිය.

දෘශ්‍යාබාධිත පුද්ගලයින් සඳහා උපකාරක තාක්ෂණය සහ ගුරුවරුන් සූදානම් කිරීමේ වැඩසටහන් පිළිබඳ සිදුකර ඇති සමීක්ෂණයක් ලෙස මෙම සමීක්ෂණය හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන්ට ඉගැන්වීම සඳහා ගුරුවරුන් සූදානම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල පිළිබඳව සමීක්ෂණය කිරීමයි. මෙම සමීක්ෂණය සඳහා විශ්වවිද්‍යාල 30 ක් ප්‍රතිචාර දක්වා ඇති අතර එය 79%-82% අතර ප්‍රතිශතයක් වේ. මේ සඳහා ඇමෙරිකානු විශ්වවිද්‍යාල සහ කැනේඩියානු විශ්වවිද්‍යාල සම්බන්ධ කරගෙන ඇත. අධ්‍යයනයේ නියැදිය ලෙස සහභාගිවන්නන් 38 දෙනෙකු යොදාගෙන ඇති අතර ඔවුන් දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන් සහ ඔවුන්ගේ ආචාර්යවරුන් වේ. මෙම සමීක්ෂණය මාර්ගගත ක්‍රමයෙන් සිදු කර ඇති අතර රැස් කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS මෘදුකාංගය යොදාගෙන ඇත. මෙම අධ්‍යයනයේ සොයාගැනීමක් ලෙස විශේෂිත උපකාරක තාක්ෂණය භාවිතා කරමින් සිසුන්ට විවිධ පාඨමාලාවන් ඉගැන්වීම් කටයුතු සිදු කරන විශ්වවිද්‍යාල මෙන්ම විශේෂිත උපකාර තාක්ෂණය භාවිත නොකරන විශ්වවිද්‍යාලද හඳුනාගැනීමට හැකි වී ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස දෘශ්‍යාබාධිත දුර්වලතා ඇති ශිෂ්‍යයින්ට ඉගැන්වීමේ කටයුතු කිරීම සඳහා ඔවුන්ගේ ගුරුවරුන් සඳහා විවිධ විශේෂිත වූ වැඩසටහන් සංවර්ධනය කිරීමක් මෙම අධ්‍යයනයේ දී සිදුව ඇත. අධ්‍යයනයෙන් යෝජනා කරනු ලබන්නේ විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සඳහා දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින්ට මගපෙන්වීමක් අවශ්‍ය වන අතර දෘශ්‍යාබාධිත සිසුන්ගේ ගුරුවරුන්ට ඉගැන්වීමේ කටයුතු කිරීම සඳහා නව උපකාරක තාක්ෂණයන් අවශ්‍ය වන බවත් එම උපකාරක තාක්ෂණය දෘශ්‍යාබාධිත සිසුන් හෝ ඔවුන්ගේ ආචාර්යවරුන් භාවිතා කිරීම සම්බන්ධව උපදේශාත්මක උපායමාර්ග ඔවුන්ට ලබාදිය යුතු බව මෙම අධ්‍යයනයෙන් වැඩිදුරටත් යෝජනා කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල මත පදනම්ව සිදු කර ඇති නිගමන අතර ප්‍රධාන නිගමනයක් වන්නේ දෘශ්‍යාබාධිත ශිෂ්‍යයින් උපකාරක තාක්ෂණය ඇසුරින් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා රුකුළක් වීමට මෙම සමීක්ෂණය නැවත නැවතත් සිදු කළ යුතු බවයි (Smith & Kelley, 2007).

## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දෙවර්ගයේම දත්ත රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා මූලිකවම ප්‍රශ්නාවලි ක්‍රමයක් භාවිතා කරන ලදී. එසේම අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදු කරන ලද පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන හා සඟරා මගින් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙම අධ්‍යයනයට අදාළව දත්ත ප්‍රාථමික දත්ත එක්රැස් කරගැනීම සඳහා අදාළ ප්‍රශ්නාවලිය උප ලේඛනයක් ආකාරයට සකසන ලදී. මෙම පර්යේෂණය තුළදී දත්ත දායකයා ලෙස හඳුනාගනු ලැබූ දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීයාගෙන් විමසා ලබාගන්නා පිළිතුරු සටහන් කරගැනීම විමර්ශකයා විසින්ම සිදු කරන ලදී. මෙලෙස ප්‍රාථමික දත්ත රැස්කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මෙන්ම දුරකථන මාර්ගික ක්‍රමය ද යොදා ගන්නා ලදී. ඒ අනුව මෙම අධ්‍යයනයේදී උප ලේඛනයක් ආකාරයට සකස් කරන ලද ප්‍රශ්නාවලියේ යෝග්‍යතාව, ගුණාත්මකභාවය, නිවැරදිභාවය, ප්‍රමාණවත් බව සහ කාර්යක්ෂමතාවය පිළිබඳව සලකා බැලීම සඳහා පූර්ව පරික්ෂාවක් හා නියාමක පරීක්ෂාවක් ද සිදුකරන ලදී.

මෙහිදී ප්‍රතිචාරකයන් කිහිප දෙනකුගෙන් ප්‍රාථමික දත්ත ලබාගෙන ඉන් පසුව උප ලේඛනයේ අඩුපාඩු නැවත සකස් කර පසුව අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල පහළොව අතරින් විශ්වවිද්‍යාල හයක දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් එකසිය දසදෙනකු සංගහනය ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී රාජ්‍ය විශ්වවිද්‍යාල පහළොව අතරින් හයක් පමණක් තෝරා ගැනීමට හේතුව වන්නේ දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් එම විශ්වවිද්‍යාල හයෙහි පමණක් අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබීමයි (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 2020). මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා සමස්ත සංගහනයම යොදා ගන්නා ලදී. එහෙත් නොනියැදුම් දෝෂයක් වන නිෂ්ප්‍රතිචාර අභිනතියට අධ්‍යයනය යටත් වූ නිසා අධ්‍යයනයේ මුළු සංගහනයම අධ්‍යයනය කරනු ලැබුවත් නියැදිය වශයෙන් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් සිය දෙනෙකු පමණක් තෝරා ගත හැකි විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ වර්තමානය වන විට ජීවත්ව සිටින දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ ප්‍රමාණයද, රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරනු ලබන දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ ප්‍රමාණයද, විවිධ සඟරා, පොත්, විවිධ සමීක්ෂණ, අන්තර්ජාල වාර්තා සහ විමර්ශන ග්‍රන්ථ තුළින් අධ්‍යයනය ආරම්භයේ සිටම සෑම පරිච්ඡේදයක් තුළදීම තොරතුරු ලබා ගන්නා ලදී. විශේෂයෙන්ම පරායත්ත විචල්‍යය කෙරෙහි බලපාන ස්වායත්ත විචල්‍යයන් හඳුනාගැනීම, සංකල්පීය රාමුව හඳුනාගැනීම හා භාවිතා කළ හැකි ක්‍රමවේදය ආදිය පිළිබඳ තොරතුරු මේ ආශ්‍රයෙන් හඳුනා ගන්නා ලදී.

දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපෑම් කරනු ලබන අධ්‍යාපනික සාධකයන් පිළිබඳව ප්‍රධාන සංරචක විශ්ලේෂණයක් සිදු කරන ලදි. සාධක විශ්ලේෂණය යනු නිරීක්ෂණය කරන ලද සහසම්බන්ධිත විචල්‍යයන් අතර විචලතාවයන් විස්තර කිරීම සඳහා භාවිතා කරන සංඛ්‍යානමය ක්‍රමයකි. උදාහරණ ලෙස සහසම්බන්ධතා න්‍යාසයෙහි ඉහළ සහසම්බන්ධතා සංගුණකය හා පහළ සහසම්බන්ධතා සංගුණකය පවතින විට ඒ අනුව සාධක වර්ගීකරණය කළ හැක. මෙහිදී සාධක විශ්ලේෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරනු ලබන දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන විවිධ අධ්‍යාපනික සාධක අතරින් ප්‍රබලතම සාධක හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

සාධක විශ්ලේෂණය තුළදී මූලික විශ්ලේෂණය මගින් එක් එක් විචල්‍යයන්ට අදාළ සාධක විශ්ලේෂණය සිදු කරනු ලබයි. ඒ අනුව සංඛ්‍යාතය, මධ්‍යන්‍යය හා සම්මත අපගමනය ගණනය කරනු ලබයි. එමෙන්ම මෙහිදී සහසම්බන්ධතා න්‍යාසය මගින් විචල්‍යයන්ගේ සංගුණකයන් හා වෙසෙසියා මට්ටම් දක්වනු ලබයි. සාධක විශ්ලේෂණයේදී KMO පරීක්ෂාව (Kaiser Meyer Olkin) සහ Bartlett’s පරීක්ෂාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී මෙමගින් සාධක විශ්ලේෂණය සඳහා යොදා ගන්නා දත්තයන්හි වලංගුභාවය පරික්ෂා කරනු ලබයි. එහිදී KMO අගය මගින් නියැදියේ ප්‍රමාණවත් බවත්, Bartlett’s පරීක්ෂාව මගින් නියැදියේ Sphericity පරීක්ෂා කරනු ලබයි.

## 4. දත්ත විශ්ලේෂණය

සාධක විශ්ලේෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරනු ලබන දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන විවිධ සාධක අතරින් ප්‍රබලතම සාධක හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

ඒ අනුව දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක හඳුනාගැනීම සඳහා වන සාධක විශ්ලේෂණයේදී ප්‍රධාන වශයෙන් බලපාන සාධක පහත පරිදි හඳුනාගත හැකිය.

i. පෞද්ගලිකව පරිගණකයක හිමිකම
ii. පෞද්ගලික පරිගණකය අධ්‍යයන කටයුතු සඳහා යොදාගැනීම
iii. පරිගණක අධ්‍යයන කටයුතු සඳහා යහළු /යෙහෙළියන්ගේ සහ දෙමව්පියන්ගේ සහයෝගය ලැබීම
iv. පරිගණක අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සහයෝගය ලැබීම
v. විෂය සමගාමී තොරතුරු ගවේෂණය කිරීම සඳහා පරිගණකය යොදා ගැනීම
vi. පවුලේ සිටින අනෙකුත් අධ්‍යාපනය හදාරනු ලබන සාමාජිකයන් ගණන
vii. විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට පෙර පරිගණක පාඨමාලා හදාරා තිබීම
viii. බ්‍රේල් තාක්ෂණය අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කිරීම
ix. පරිගණක තාක්ෂණික කටයුතු පිළිබඳව යාවත්කාලීන වීම
x. පුස්තකාල පහසුකම් පරිගණකය මගින් ලබාදීම
xi. ආචාර්යවරුන් විසින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථන් සඳහා ඉගැන්වීමේදී තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතා කිරීම

විචලතා ආකෘතියක් විස්තර කළ හැකි වඩාත් හොඳම රේඛීය සම්බන්ධතා කාණ්ඩය තෝරා ගැනීම සඳහා ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කරයි. ඒ අනුව මෙහිදී දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳව විශ්ලේෂණය කිරීම සඳහා විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක 11 ක් පිළිබඳව රැස් කරගත් දත්තවල ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කොට ඇත.

වගු අංක 1 : KMO සහ Bartlett’s පරීක්ෂාව


| | | |
|---|---|---|
| Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy. | | .630 |
| Bartlett's Test of Sphericity | Approx. Chi-Square | 110.476 |
| | Df | 55 |
| | Sig. | .000 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

සාධක න්‍යාසය ආශ්‍රය කොට ගෙන එක් විචල්‍යයක් අනෙක් විචල්‍යයට කොපමණ ගැලපේද යන්න පරීක්ෂා කළ හැකිය. එම අගය 0.5 ට අඩු නම් එහි ගැලපීමේ ප්‍රමාණය අඩුය. මෙහි 0.5 ට අඩු අගයක් නොමැති බැවින් එවැන්නක් නිගමනය කළ නොහැකිය.

අයිගන් අග හා සාධක අගයන් පිළිබඳ දැක්වෙන ප්‍රස්තාර සටහනට අනුව එහි පළමු සාධකයේ අගය ඉහළ අගයක් ගනී. එය ක්‍රමයෙන් පහත වැටී ඇති අතර දෙවැනි සාධකයේ අයිගන් අගය 1 ට ආසන්න අගයක් ගනී. එම නිසාවෙන් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක ප්‍රධාන වශයෙන් 5 ක් වේ.

රූපය 1 : අයිගන් අග හා සාධක අගයන්




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

ඉහත දැක්වෙන ප්‍රස්තාර සටහන අනුව ප්‍රධාන සංරචකයන් ගණන ගණනය කිරීමට හැකියාව පවති. ඒ අනුව 0 ට ආසන්න ලක්ෂයේ පවතින ප්‍රධාන සංරචක ප්‍රමාණය අධ්‍යයනයට යොදා ගනී. මෙම අධ්‍යයනය තුළදී මෙම ප්‍රස්තාර සටහනට අනුව ප්‍රධාන සංරචකයන් 5 ක් යැයි තීරණය කළ හැකිය.

වගු අංක 2 : සංරචක නිර්මාණය කිරීම


| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** |
| පෞද්ගලික පරිගණකයක හිමිකම නිසා | 0.580 | | | | |
| පවුලේ සිටින අනෙකුත් අධ්‍යාපනය හදාරනු ලබන සාමාජිකයන් ගණන | 0.661 | | | | |
| පරිගණක අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සහයෝගය ලැබීම නිසා | | 0.177 | | | |

| | | | | |
|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට පෙර පරිගණක පාඨමාලා හදාරා තිබීම නිසා | 0.664 | | | |
| පුස්තකාල පහසුකම් පරිගණකය මගින් ලබාදීම නිසා | 0.819 | | | |
| පෞද්ගලික පරිගණකය අධ්‍යයන කටයුතු සඳහා යොදාගැනීම නිසා | | 0.539 | | |
| පරිගණක අධ්‍යයන කටයුතු සඳහා යහළු /යෙහෙළියන්ගේ සහ දෙමව්පියන්ගේ සහයෝගය ලැබීම නිසා | | 0.676 | | |
| බ්‍රේල් තාක්ෂණය අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කිරීම නිසා | | | 0.522 | |
| පරිගණක තාක්ෂණික කටයුතු පිළිබඳව යාවත්කාලීන වීම නිසා | | | 0.793 | |
| විෂය සමගාමී තොරතුරු ගවේෂණය කිරීම සඳහා පරිගණකය යොදා ගැනීම නිසා | | | | 0.861 |
| ආචාර්යවරුන් විසින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථන් සඳහා ඉගැන්වීමේදී තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතා කිරීම නිසා | | | | 0.070 |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

පෞද්ගලික පරිගණකයක හිමිකම නිසා සහ පවුලේ සිටින අනෙකුත් අධ්‍යාපනය හදාරනු ලබන සාමාජිකයන් ගණන යන සාධක දෙක එක් ප්‍රධාන සංරචකයක් ලෙසත්, පරිගණක අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සහයෝගය ලැබීම නිසා සහ විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට පෙර පරිගණක පාඨමාලා හදාරා තිබීම නිසා සහ පුස්තකාල පහසුකම් පරිගණකය මගින් ලබාදීම නිසා යන සාධක ත්‍රිත්වය තවත් එක් ප්‍රධාන සංරචකයක් ලෙසත්, පෞද්ගලික පරිගණකය අධ්‍යයන කටයුතු සඳහා යොදාගැනීම නිසා සහ පරිගණක අධ්‍යයන කටයුතු සඳහා යහළු /යෙහෙළියන්ගේ සහ දෙමව්පියන්ගේ සහයෝගය ලැබීම නිසා යන සාධක යුගලය තවත් එක් ප්‍රධාන සංරචකයක් ලෙසත්, බ්‍රේල් තාක්ෂණය අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කිරීම නිසා සහ පරිගණක තාක්ෂණික කටයුතු පිළිබඳව යාවත්කාලීන වීම නිසා යන සාධක 2 තවත් එක් ප්‍රධාන සංරචකයක් ලෙසත්, විෂය සමගාමී තොරතුරු ගවේෂණය කිරීම සඳහා පරිගණකය යොදා ගැනීම නිසා සහ ආචාර්යවරුන් විසින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන් සඳහා ඉගැන්වීමේදී තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතා කිරීම නිසා යන සාධක යුගලය අවසාන ප්‍රධාන සංරචකය ලෙසත් මෙම වගුවට අනුව හඳුනාගත හැකිය.

*වගු අංක 3 : ප්‍රධාන සංරචක නිර්මාණය කිරීම*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

මෙම සටහනේ දැක්වෙන පරිදි දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන සාධක ප්‍රධාන සංරචක 5 ක් යටතේ බෙදා දක්වා ඇත. ඒවා නම් විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන අනධ්‍යයන සාධක, අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යයන සාධක, අධ්‍යයන කටයුතු උදෙසා විශ්වවිද්‍යාලයේ බලපෑමකින් තොරව ලබාගත හැකි සාධක, අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපයෝගී කරගත හැකි සාධක සහ ස්වයං අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපකාරී වන සාධක ලෙසයි.

ඒ අනුව දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන ප්‍රධාන සාධක ලෙස පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන අනධ්‍යයන සාධක, අධ්‍යයන සාධක, විශ්වවිද්‍යාලයේ බලපෑමකින් තොරව ලබාගත හැකි සාධක, අධ්‍යයන කටයුතු සඳහා සහයෝගය ලබා දෙන සාධක සහ ස්වයං අධ්‍යයනයට උපකාරී වන සාධක ලෙස නිගමනය කළ හැකිය.

**5. සමාලෝචනය**

විශ්වවිද්‍යාල දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ට පවතින පෙනීමේ දුර්වලතාවය නිසා පරිගණක විෂය හැදෑරීම සඳහා විවිධ අභියෝග සහ දුෂ්කරතා පැවතීම ගෝලීය මට්ටමේ ගැටලුවකි. මෙම ගැටලු සම්බන්ධව ලෝකය පුරා විවිධ පර්යේෂණ පවත්වා තිබේ. නමුත් ඒ එක් එක් පර්යේෂණ මගින් ලබාගත් නිගමනයන් එකිනෙකට වෙනස් වේ. එයට හේතුව එම පර්යේෂණ මගින් ලබාදුන් නිගමන එම පර්යේෂණය සිදුකළ ප්‍රදේශයට හෝ රටට පමණක් අදාළ වීමයි. උදාහරණ ලෙස අපරදිග රටවල දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක ශක්‍යතාව පිළිබඳ සිදුකර ඇති සමීක්ෂණවලට සාපේක්ෂව පෙරදිග රටවල දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ගේ පරිගණක ශක්‍යතාව පිළිබඳ සිදුකර ඇති සමීක්ෂණවල විවිධ වෙනස්කම් පවතී.

දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන ප්‍රධාන අධ්‍යාපනික සාධක ලෙස පරිගණක විෂය හැදෑරීම සඳහා ඇති ශක්‍යතාව කෙරෙහි බලපානු ලබන අනධ්‍යයන සාධක, අධ්‍යයන සාධක, විශ්වවිද්‍යාලයේ බලපෑමකින් තොරව ලබාගත හැකි සාධක, අධ්‍යයන කටයුතු සඳහා සහයෝගය ලබා දෙන සාධක සහ ස්වයං අධ්‍යයනයට උපකාරී වන සාධක ලෙස ප්‍රධාන සංරචක විශ්ලේෂණය තුළින් නිගමනය කළ හැකිය. මෙම පංච සාධකයන් කෙරෙහි අවධානය යොමුකර එම සාධකයන් දියුණු කිරීම සඳහා කටයුතු සංවිධානය කිරීම තුළින් එම ප්‍රධාන සාධක තුළ පවතින කුඩා සාධක 11 ක් සංවර්ධනය කරගත හැකි බව අධ්‍යයනය තුළින් නිගමනය කරනු ලැබේ. එවිට දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව කෙරෙහි බලපෑම් කරනු ලබන අධ්‍යාපනික සාධක බිම් මට්ටමේ සිටම සංවර්ධනය වීමක් සිදුවන බවද අධ්‍යයනයේ තවත් එක් නිගමනයකි. විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය හදාරනු ලබන විද්‍යාර්ථීන් හට දැනුම ගවේෂණය කිරීම සඳහා පරිගණක තාක්ෂණය අත්‍යවශ්‍ය වේ. අනාගත සමාජයේ විශාල කාර්යභාරයක් සිදුකල හැකි එම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ස්වයං අධ්‍යයනයේ යෙදීම තුළින් ලබාගන්නා අත්දැකීම් සම්භාරය රටකට ඉතාමත් වැදගත්ය.

ඒ අනුව දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ද පරිගණකය භාවිතා කිරීම තුළින් දැනුම ගවේෂණය කරමින් තම අත්දැකීම් දියුණු කරගැනීම අත්‍යවශ්‍ය වේ. මෙලෙස ප්‍රධාන සංරචක විශ්ලේෂණය මගින් සොයා ගන්නා ලද එක් ප්‍රධාන සාධකයක් වන්නේ ස්වයං අධ්‍යයන කටයුතු සඳහා උපකාරී වන සාධකයි. ඒ අනුව අධ්‍යයනය තුළින් නිගමනය කරනු ලබන්නේ ස්වයං අධ්‍යයනය සඳහා උපකාරී වන සාධක වන විෂය සමගාමී තොරතුරු ගවේෂණය කිරීම සඳහා පරිගණකය යොදා ගැනීම සහ ආචාර්යවරුන් විසින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථන් සඳහා ඉගැන්වීමේදී තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතා කිරීම යන සාධක කෙරෙහි අවධානය යොමුකර එම සාධකයන් සංවර්ධනය කිරීම තුළින් දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ ස්වයං අධ්‍යයන කටයුතු සංවර්ධනය කළ හැකි බවයි. මෙම අධ්‍යයනයේ තවත් නිගමනයක් ලෙස දෘශ්‍යාබාධිත විද්‍යාර්ථීන්ගේ පරිගණක විෂය හැදෑරීමට ඇති ශක්‍යතාව කෙරෙහි අධ්‍යයන සාධකවලට අමතරව අනධ්‍යන සාධකද බලපෑම් කරනු බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Andrew, O. (2015). The Challenges of Educating the Visually Impaired and Quality Assurance in Tertiary Institutions of Learning in Nigeria. *International Journal of Educational Administration and Policy Studies, 7(7)*, 129-133. Retrieved from https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://files.eric.ed.gov/fulltext/EJ1077784.pdf&ved=2ahUKEwjXmb2k9a3sAhULXSsKHQkeALoQFjAPegQIHRAL&usg=AOvVaw1Z0dnkqjKsVrisdayYVDT7

Armano, T., Capietto, A., Illengo, M., Murru, N., & Rossini, R. (2015). An Overview on ICT for the Accessibility of Scientific Texts by Visually Impaired Students. *Congresso Nazionale SIREM 2014*, 119-122. Retrieved from https://iris.unito.it/bitstream/2318/151291/1/151291_4aperto.pdf

*Census of population and housing - 2012*. Department of Census and Statistics. Retrieved from https://www.google.com/url?client=internal-element-cse&cx=013749929662309201285:4xeddvv4v2w&q=http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/Pages/Activities/Reports/FinalReport/FinalReportE.pdf&sa=U&ved=2ahUKEwjv8suI4q_qAhUgH7cAHXikCtIQFjAAegQIABAC&usg=A

*Computer Literacy Statistics - 2019(First six months).* Department of Census and Statistics. Retrieved from https://www.google.com/url?client=internal-element-cse&cx=007858764713875602894:uictpomj1s9&q=http://203.94.94.89/mainsite/PressReleases/ComputerLiteracystatistics-2019-Firstsixmonths&sa=U&ved=2ahUKEwj6j-P63avqAhXl6XMBHdPbBfMQFjAAegQIAxAB&usg=AOvVaw08v2Za

Dror, J. (2019, June 19). *Quora*. Retrieved from https://www.quora.com: https://www.quora.com/Why-call-people-differently-abled-instead-of-disabled

Lankathilake, M. (2018). Assistive Technologies for the Visually Impaired Undergraduates of the University of Colombo. *Library Research Symposium*. Retrieved from http://192.248.16.117:8080/research/handle/70130/4597

Smith, D. W., & Kelley, P. (2007). A Survey of Assistive Technology and Teacher Preparation Programs for Individuals with Visual Impairments. *Journal of Visual Impairment & Blindness*, *101(7)*, 429-433. Retrieved from https://files.eric.ed.gov/fulltext/EJ772094.pdf

*University students*. (2003-2012). Retrieved from the free dictionary.com: https://www.thefreedictionary.com/university+student

World Health Organization (2015). *Change the Definition of Blindness.* World Health Organization. Retrieved from https://www.who.int/blindness/ Change%20the%20Definition%20of%20Blindness.pdf?ua=1

# සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණයට බලපාන සාධක

එන්. බී. පී. උපේක්ෂානී

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
prathibha.upeksha825@gmail.com

***සංක්ෂේපය***

*ආර්ථික සංවර්ධනය සඳහා සාම්ප්‍රදායික කර්මාන්තවල දායකත්වය සැලකිය යුතු අතර මෙම කර්මාන්තවල දියුණුව භාණ්ඩ නිෂ්පාදන අලෙවිකරණය මත තීරණය වේ. පර්යේෂණයේ අරමුණ ලෙස සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණයට බලපාන සාධක විශ්ලේෂණය කර ඇත. පර්යේෂණ ප්‍රදේශ ලෙස යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරාගත් අතර පිත්තල, රිදී, පිළිම නෙළීම, බෙර හා වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් 58ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදිය යටතේ ලබාගනිමින් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව අධ්‍යයනය කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා සාධක විශ්ලේෂණය, කයිවර්ග පරීක්ෂාව යොදාගෙන ඇත. සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා බලපාන සාධක විශ්ලේෂණය මගින් භාණ්ඩවල ගුණාත්මකභාවය හා අලෙවිකරණය සීමා වීම, වෙළෙඳපොළ ධාරිතාවය අවම වීම, භාණ්ඩ වටිනාකම අවම වීම, අඩු සහන අඩු පාරිභෝගිකයින් හා ශ්‍රමයට අවම මිලක් හිමිවීම, ණය මූලාශ්‍ර ප්‍රවාහන අපහසුතා හා ආනයන භාණ්ඩ යන බාහිර සාධක පැවතීම, නිසි අපනයන ක්‍රමවේදයක් නොමැති වීම ලෙස නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා බලපාන ප්‍රධාන සංරචක 06ක් හඳුනාගෙන ඇත. කයිවර්ග පරීක්ෂාව මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද ලෙස පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම, දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවිය, අතරමැදියන් හරහා වෙළෙඳපොළට ලබා දීම, වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමු වීම හා පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම යන්න හඳුනාගෙන ඇත. පර්යේෂණ යෝජනා ලෙස සාම්ප්‍රදායික කර්මාන්තවල නිෂ්පාදන අලෙවිකරණය වර්ධනය කිරීම සඳහා සුදුසු නව අලෙවිකරණ ක්‍රමවේද භාවිතයට යොමුවීම, භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම, ණය ලබාදීම හා විධිමත් මූල්‍ය කළමනාකරණ දැනුම ලබාදීම, නිසි වෙළෙඳපොළක් පැවතීම වැනි යෝජනා ඉදිරිත් කළ හැකිය.*

***මුඛ්‍ය පදඃ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්, නිෂ්පාදන අලෙවිකරණය, ශ්‍රී ලංකාව***

## 1. හැඳින්වීම

සාම්ප්‍රදායික කර්මාන්ත යනු ඈත අතීතයේ පටන් පැවතගෙන එන පරම්පරානුගතව පවත්වාගනු ලැබූ ගෘහ කර්මාන්තයි. මෙම කර්මාන්ත හුදෙක් ම පදනම් වූයේ මිනිසා වාසය කළ පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍යය භාවිත කරමින් තම දෛනික අවශ්‍යතා සපුරාගනු වස් නිර්මාණය කළ නිර්මාණ ඇසුරිනි (Bandara, 2015). Oxford Encyclopedia of the Modern World යන කෘතිය මගින් Stearns (2008) ප්‍රකාශ කරන්නේ සාම්ප්‍රදායික කර්මාන්ත යනු පූර්ව කර්මාන්ත කාල පරිච්ඡේදයේ සිදු කළ හස්ත කර්මාන්ත

නිෂ්පාදන ක්‍රම වන අතර කර්මාන්තශාලා පාදක කාර්මීකරණ වර්ධනයේ දී පවා අඛණ්ඩව නිෂ්පාදන පවත්වාගෙන ගිය කර්මාන්ත වන බවයි. සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ පවතින බහුතර සාම්ප්‍රදායික කර්මාන්ත සේවකයින් කුඩා ප්‍රමාණයක්, සුළු ප්‍රාග්ධනයක් යටතේ පවත්වාගෙන යන බැවින් මේවා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට අයත් වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්ත යනු නිෂ්පාදන අංශයට අයත් වන සුළු පරිමාණ වශයෙන් නිෂ්පාදනයන් සිදු කරන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වේ (Arachchge, 2017).

ඈත අතීතයේ භාණ්ඩ හුවමාරු ක්‍රමයත් සමඟ ආරම්භ වූ නිෂ්පාදන අලෙවිය යන්න සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව සලකා බැලීමේ දී වැදගත් වේ. නිෂ්පාදන අලෙවිය යන්න භාණ්ඩ නිෂ්පාදනය සඳහා සැලකිය යුතු බලපෑමක් සිදුකරන මූලාශ්‍රයකි. භාණ්ඩ නිෂ්පාදනය හා නිෂ්පාදන අලෙවිය අතර ධන සබඳතාවක් තිබීම එම කර්මාන්තයන්ගේ වර්ධනයට හේතුවන අතර එය සමස්ත ආර්ථික වර්ධනයට හේතු වේ. වර්තමානයේ දී සෑම ව්‍යාපාර හිමියෙක්ම තම නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කරනුයේ නිෂ්පාදන අලෙවිකරණය මත කර්මාන්තයේ පැවැත්ම හා ව්‍යාපාර හිමියන්ගේ පැවැත්ම තීරණය වන බැවිනි (Aydin, Ozer & Cetin, 2007). අලෙවිකරණය යනු පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් විසින් භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීම, පිරිනැමීම සහ අවශ්‍ය දේ ලබා ගන්නා සමාජ ක්‍රියාවලිය වන අතර මෙහි දී වටිනාකම් සහිත නිෂ්පාදන සහ සේවාවන් වෙනත් අය සමඟ නිදහසේ හුවමාරු කර ගනී (Kumar & Rajeev, 2019). භාණ්ඩ අලෙවිකරණය සෑම සමාජයකම මූලික සංසිද්ධියක් ලෙස හැඳින්විය හැකි අතර අලෙවිකරණයේ පරමාර්ථය වන්නේ නිෂ්පාදන බෙදා දීම වේ. වර්තමානයේ දී ඉල්ලුමට අනුව අලෙවිකරණය තවදුරටත් සරල ව්‍යායාමයක් නොවන්නේ එය වෙනස්කම්වලට භාජනය වී ඇති බැවිනි. මිලදී ගැනීමේදී පාරිභෝගිකයින් වඩාත් තාර්කික වන නිසාම අලෙවිකරණය සඳහා නවෝත්පාදන අවශ්‍ය වේ (Bhayani, 2018).

පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව ලෙස සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණයට බලපාන සාධක මොනවාද යන්න ද පර්යේෂණයේ අරමුණ ලෙස සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණයට බලපාන සාධක විශ්ලේෂණය ද කර ඇත.

## 2. සාහිත්‍ය විමර්ශනය

සාම්ප්‍රදායික නිෂ්පාදන කර්මාන්ත යනු බාධාවකින් හා වෙනස්වීමක් නොමැතිව දීර්ඝ කාලයක් තිස්සේ පවතින භාණ්ඩ නිෂ්පාදනය කිරීම් සම්බන්ධ අංශයයි. මෙම කර්මාන්ත මෑත කාලයේ දී ගෝලීයකරණය නිසා පරිහාණියට පත් වී ඇත (Barber, Villar & Sarria, 2020). සාම්ප්‍රදායික කුඩා කර්මාන්ත ග්‍රාමීය ආර්ථිකයේ වැදගත් අංගයක් වන අතර සමස්ත ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය සැලකිය යුතුය. වර්තමානයේ දී මෙම සාම්ප්‍රදායික කර්මාන්ත සමාජ හා ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙයි. සාම්ප්‍රදායික කර්මාන්තවල පැවැත්මට සහ තිරසර බවට එවැනි අභියෝග සැළකිව යුතු ලෙස බලපායි (Navaratne & Ratnayake, 2015).

කෙසේ වුවත් සාම්ප්‍රදායික කර්මාන්ත අංශය තුළ සංවර්ධනයෙන් ලැබෙන ප්‍රතිලාභ බෙදා හැරීමේ අසමානතා අඩු කිරීම, ජනගහනයේ භූගෝලීය ව්‍යාප්තිය සමතුලිත කිරීම, රැකියා

හා විදේශ විනිමය උත්පාදනයන් වැඩි කිරීම මගින් අඩු සංවර්ධිත රටවල සංවර්ධනයට සාම්ප්‍රදායික කර්මාන්ත හරහා වැදගත් දායකත්වයක් ලබා දිය හැකිය (Huddle & Ho-yhi, 1975). වර්තමානය වන විට සංවර්ධිත රටවල සාම්ප්‍රදායික කර්මාන්ත ගණනාවක් ජාත්‍යන්තරයේ තරඟ කිරීම සඳහා උපාය මාර්ග අනුගමනය කරමින් සිටී (Barber, Villar & Sarria, 2020). Senevirathne, Wewala, Jayasekara, Vidanapathirane සහ Oshadie (2010) ට අනුව සෑම රටකම සාම්ප්‍රදායික සහජ දැනුම යහපැවැත්ම සඳහා යොදාගත යුතු බවත් ලෝකයේ පවත්නා සමාජ ආර්ථික ප්‍රවණතා මත මෙම ආවේණික උරුම පදනම් කරගත් ශිල්පීය භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ලෝකයේ අනාගත සමාජ වෙළෙඳ කටයුතු අනුව වර්ධනය වීමේ විභවතාවයක් පවතින බවත් පෙන්වා දෙයි (Senevirathne, Wewala, Jayasekara, Vidanapathirane & Oshadie, 2010).

සාම්ප්‍රදායික කර්මාන්ත රාශියක් ශ්‍රී ලංකාවේ හඳුනාගත හැකි අතර මෙම කර්මාන්ත තවමත් පවතින්නේ සාම්ප්‍රදායික කර්මාන්තයට ආදරය කරන මිනිසුන් නිසාය. මෙම කර්මාන්ත පවත්වාගෙන යාමට මොවුන් ඊළඟ පරම්පරාවන් ඇති කළ අතර නව්‍යකරණයන් ද හඳුන්වා දෙන ලදී. මොවුන් එම කර්මාන්ත හා සම්බන්ධ ක්‍රම හා වෙනත් විවිධ සාධක ප්‍රශස්තීකරණය කළහ. නමුත් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තවල වර්තමාන තත්ත්වය ඉතා කණගාටුදායකය (Osadith, 2015). ශ්‍රී ලංකාවේ භාවිතා කරන ශිල්ප ක්‍රම ලෙස කලාව සහ මූර්ති සම්ප්‍රදායිකයින්, ලැකර් සහ සේසත්, බතික්, ලෝහ පදනම්කරගත්, වේවැල් සහ උණ, විවිධ අත්කම්, වෙස් මුහුණු කැටයම් කිරීම, සංගීත භාණ්ඩ, මැටි වැඩ, සිහිවටන, පොල්, කිතුල් හා තල් පදනම් කරගත් නිෂ්පාදන, ගල් පාදක හස්ත කර්මාන්ත, දුම්බර, රෙදි පිළි හා රෙදි පිළි පදනම් කරගත් නිෂ්පාදන, තන්තු, කොළ හා තණකොළ වැඩ, ලී පාදක අත්කම්, ආභරණ, සම් භාණ්ඩ හා ලෙස ආශ්‍රිත කර්මාන්ත පෙන්වාදිය හැකිය (Silva, 2019).

ශ්‍රී ලංකාවේ මානව අනන්‍යතාවය පිළිබිඹු කරන මාධ්‍යයක් ලෙස මෙරට සාම්ප්‍රදායික කර්මාන්ත හැඳින්විය හැකි අතර එවැනි කර්මාන්ත අතරට වේවැල්, රෙදි, සේසත් හා බෙර ආදිය අයත් වේ. මෙම කර්මාන්තවල නියැලෙන කුල ද සමාජය තුළ දක්නට ලැබෙන අතර සමාජය තුළ පහත් යැයි පවතින සමාජ පිළිගැනීම නිසා තම කුලයට අදාළ සාම්ප්‍රදායික කර්මාන්තය තුළ තවදුරටත් නියැලීම කර්මාන්තකරුවන් විසින් ප්‍රතික්ෂේප කරයි (මදුසංඛ සහ චතුරිකා, 2017). නිදහසට පෙර ශ්‍රී ලංකාවේ කර්මාන්ත මූලික අපනයන සැකසුම් කර්මාන්ත පදනම්ව පැවති අතර 1939 දී දෙවන ලෝක යුද්ධයේ ආරම්භයත් සමඟම රාජ්‍යය මැදිහත්වීම් තුළින් කර්මාන්ත පිහිටුවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. 1947 අංක 73 දරණ සැසි වාර්තාව තුළින් රජය වඩාත් මැදිහත්වන කර්මාන්ත ප්‍රතිපත්තියකට අවතීර්ණ විය (Ministry of Industry and Commerce, Sri Lanka, 2020).

නිදහසින් පසු කාලයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍යය අංශය මූලික වූ කර්මාන්ත ප්‍රතිත්තියක් අනුගමනය කෙරුණු අතර ආනයන ආදේශන කර්මාන්තකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. 1960-1970 දශකය තුළ දේශීය කර්මාන්ත කෙරෙහි දැඩි ආරක්ෂණ පිළිවෙතක් අනුගමනය කළ අතර ඒ සඳහා විශාල වශයෙන් දිරි ගැන්වීමක් කරන ලදී (Ministry of Industry and Commerce, Sri Lanka, 2020).

1977 දී ආරම්භ කරන ලද ලිබරල් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව තුළ විවෘත ආර්ථිකයක් ඇති විය. මෙම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය තුළ විශාල වෙනස්කම් ඇති වූ අතර පෞද්ගලික අංශවලට නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ප්‍රධාන ස්ථානයක් හිමිවිය (Athukorala & Jayasuriya, 2004). කාර්මික නිෂ්පාදන නූතන ලෝකයේ දී වෙළෙඳපොළ අතපත් කරගෙන තිබුණ ද තවමත් සාම්ප්‍රදායික අත්කම් නිර්මාණවලට වෙළෙඳපළ තුළ ජනප්‍රියත්වයක් පවතින්නේ එම නිර්මාණවල අව්‍යාජ භාවය හා කලාත්මක වටිනාකම මතයි (Silver & Kundu, 2013). Shah සහ Patel (2019) ට අනුව රෙදි විවීම, ගල් කැටයම් කිරීම, පබළු වැඩ, මැටි භාණ්ඩ නිෂ්පාදනය සුවිශේෂ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත වේ. මොවුන් විසින් සාම්ප්‍රදායික කරමාන්තකරුවන්ගේ කර්මාන්තයේ නිරත වූ කාලය මත කර්මාන්තකරුවන් ලබන ආදායම තීරණය වේ ද යන්න සෙවීම සඳහා ඉන්දියාවේ සුරේන්ද්‍රනගර් දිස්ත්‍රික්කයේ අවම වශයෙන් අවුරුදු පහක සේවා පළපුරුද්දක් ඇති කර්මාන්තකරුවන් 316ක් කර්මාන්ත 8ක් ආවරණය වන පරිදි අහඹු නියැදි ක්‍රමය යටතේ යොදා ගනිමින් ප්‍රාථමික හා ද්විතීක දත්ත රැස්කර ඇත. කයිවර්ග පරීක්ෂාව හරහා දත්ත විශ්ලේෂණය සිදුකර ඇති අතර මෙම දත්ත විශ්ලේෂණය අනුව මෙම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් ලබන ආදායම මත මේවායේ පැවැත්ම තීරණය වුවත් ආදායම වැඩි වීමේ දී භාණ්ඩ අලෙවිකරණයෙහි වෙනසක් ඇති නොවන බව පර්යේෂණයේ දී තහවුරු විය. එමෙන් ම ශිල්පීන්ගේ ආදායම සහ නව තාක්ෂණය භාවිතය අතර සැලකිව යුතු සබඳතාවක් නොමැති බව පර්යේෂණයේ සොයා ගැනීම්වලින් පෙන්වා දෙයි (Shah & Patel, 2019).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ පුළුල් වශයෙන් සාම්ප්‍රදායික කර්මාන්ත ව්‍යාප්තව පැවතිය ද ප්‍රධාන වශයෙන් සාම්ප්‍රදායික කර්මාන්ත රාශියක් මහනුවර දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබේ. මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති සාම්ප්‍රදායික කර්මාන්ත අතුරින් බහුතර ප්‍රමාණයක් යටිනුවර හා උඩුනුවර ප්‍රදේශ ඇසුරින් ආවරණය කළ හැකි බැවින් මෙම පර්යේෂණයේ පර්යේෂණ ප්‍රදේශය ලෙස යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය කොට්ඨාස තෝරාගෙන ඇත. යටිනුවර හා උඩුනුවර ප්‍රදේශ තුළ වැඩි ප්‍රසිද්ධියක් ලබා ඇති පිත්තල, රිදී, පිළිම නෙලීම්, බෙර, වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්ත 05ක් ඇසුරෙන් මෙම පර්යේෂණයට අදාළව ප්‍රාථමික දත්ත රැස්කරගෙන ඇත. සමස්ත ප්‍රදේශය තුළ පවතින සියලුම සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳ වූ දත්ත යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා ගනිමින් ද්විතීක දත්ත සඳහා නියැදිය නිර්මාණය කර ඇත. නියැදිය තේරීමේ දී සමස්ත යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය කොට්ඨාස තුළ පවතින සියලුම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් ගණනින් 10% ප්‍රමාණයක් යමානි ක්‍රමවේදය හරහා තෝරාගෙන අධ්‍යයන කටයුතු සඳහා යොදාගෙන තිබේ. නියැදි ක්‍රමය ලෙස ස්තෘත සසම්භාවී නියැදි ක්‍රමය යොදා ගනී.

පර්යේෂණයේ දත්ත රැස් කිරීම සඳහා සසම්භාවී නියැදි ක්‍රමය භාවිත කරයි. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා සසම්භාවී නියැදි ක්‍රමයක් වන ස්තෘත සසම්භවී නියැදි ක්‍රමය යොදාගත් අතර යටිනුවර හා උඩුනුවර ප්‍රදේශවල පිත්තල, රිදී, පිළිම නෙලීම්, බෙර, වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් ස්තර පහක් ලෙස ගෙන එම ස්ථරවල සිටින කර්මාන්තකරුවන් ගණන මත පදනම්ව මෙහිදී නියැදිය

තෝරාගෙන ඒ අනුව ප්‍රාථමික දත්ත රැස් කරගෙන ඇත. පර්යේෂණයට අදාළව යටිනුවර ප්‍රදේශයේ සාම්ප්‍රදායික කර්මාන්තයන්හි නිරතවන සියලුම කර්මාන්තකරුවන්ගේ ලැයිස්තුවක් යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබාගන්නා අතර ඉන් පර්යේෂණය සඳහා තෝරාගත් නියැදියට අදාළ කර්මාන්තකරුවන් සමාන සසම්භාවිතාවයක් සහිතව තෝරාගෙන ඇත. මෙහි දී දත්ත දායකයන් වන සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් පිළිබඳ විශේෂත්වයක් නොදක්වා අවම අභිනතියක් යටතේ සමස්ත සංගහනයෙන් අහඹු ලෙස කර්මාන්තකරුවන් පිරිසක් තෝරාගෙන ඇත. ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් ලබා ගෙන ඇත.

සමස්ත ශ්‍රී ලංකාව තුළ ම සාම්ප්‍රදායික කර්මාන්ත ව්‍යාප්තව පැවතිය ද යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළින් සාම්ප්‍රදායික කර්මාන්ත වැඩි ප්‍රමාණයක් ආවරණය කළ හැකි බැවින් පර්යේෂණ ප්‍රදේශය ලෙස යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පමණක් තෝරාගෙන ඇත. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිත්තල, රිදී, ලී කැටයම්, ගඩොල්, කුබල්, බතික්, වේවැල්, පන් පැදුරු, හුණුගල්, හඳුන්කූරු, කිතුල් වැනි සාම්ප්‍රදායික කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර රාශියක් පැවතිය ද අධ්‍යයන කටයුතු සඳහා යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ බහුලවම පවතින කර්මාන්තවන පිත්තල, රිදී, පිළිම නෙලීම්, බෙර, වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්ත පමණක් අධ්‍යයනය කරයි.

### 4. දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි හරහා රැස්කරගත් දත්ත අනුව මෙහිදී දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා සාධක විශ්ලේෂණය ද, මෙලෙස කර්මාන්තකරුවන් අලෙවිකරණයේ දී මුහුණදෙන ගැටලුවලට බලපාන සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද පිළිබඳව විමසා බැලීම සඳහා කයිවර්ග පරීක්ෂාව ද මෙහි දී දත්ත විශ්ලේෂණය සඳහා යොදාගෙන ඇත. දත්ත විශ්ලේෂණය කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී SPSS මෘදුකාංගය හා Microsoft Excel පැකේජය යොදාගෙන ඇත.

### 4.1 අලෙවිකරණ ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක හඳුනා ගැනීම පිළිබඳ ප්‍රධාන සංරචක විශ්ලේෂණය

සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා කරන ලද දත්ත රැස්කිරීමේ දී ප්‍රශ්නාවලී 58ක් යොදාගනිමින් අලෙවිකරණ ගැටලුවලට බලපාන සාධක 15ක් අනුසාරයෙන් ලබාගත් දත්ත යොදාගනිමින් අලෙවිකරණ ගැටලුවලට වැඩි වශයෙන් හේතුවෙන සාධක මොනවාද යන්න හඳුනාගැනීම සඳහා SPSS මෘදුකාංගය යොදාගනිමින් සාධක විශ්ලේෂණය සිදුකර ඇත. SPSS මෘදුකාංගය හරහා සිදුකළ දත්ත විශ්ලේෂණයේ දී විස්තරාත්මක සංඛ්‍යානය වගුව මගින් දත්තවල මධ්‍යයනය, සම්මත අපගමනය හා සංඛ්‍යාතය ගණනය කර ඇත.

සාධක විශ්ලේෂණයේ දී KMO හා Bartlett's පරීක්ෂා යොදාගනිමින් දත්ත පුරෝකතන සඳහා ප්‍රමාණවත් දැයි තීරණය කරයි. මෙමගින් දත්තවල වලංගුභාවය පරීක්ෂා කරයි. විශ්ලේෂිත දත්ත ප්‍රතිඵල අනුව KMO අගය 0.578ක් වේ. මෙම අගය 0.5ට වඩා විශාල වන බැවින් යොදාගත් නියැදිය ප්‍රමාණවත් වන බව ප්‍රකාශ කළ හැකිය. Bartlett's පරීක්ෂාව මගින් නියැදියේ Sphericity බව පරීක්ෂා කරනු ලබන අතර Bartlett's පරීක්ෂාව මගින් යොදාගත් P අගය .000 වන අතර මෙම අගය 0.05ට වඩා අඩු අගයක් වන බැවින් මෙය සංඛ්‍යානමය වශයෙන් වෙසෙසි වන බව පැවසිය හැකිය.


*වගු අංක 1: KMO හා Bartlettszs පරීක්ෂාව*

| | | |
|---|---|---|
| Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy. | | .578 |
| | Approx. Chi-Square | 285.098 |
| Bartlett's Test of Sphericity | df | 105 |
| | Sig. | .000 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

ප්‍රරූපී න්‍යාසයෙහි සහසම්බන්ධතාවයට අදාළ දත්තවල විකර්ණයේ සියලුම අගයන් 0.5ට වඩා විශාල වන බැවින් සාධක කිසිවක් ඉවත් නොකර දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. ඉහත උපකල්පන සියල්ල තෘප්තකර ඇති නිසා මෙම සාධක විශ්ලේෂණය සංඛ්‍යානමය වශයෙන් නිරවද්‍ය වේ. අයිගන් අග 1ට ආසන්න වන විචල්‍යය සංඛ්‍යාව පදනම් කරගෙන සාම්ප්‍රදායික කර්මාන්තවල නිෂ්පාදන අලෙවියට බලපාන සාධක හඳුනාගත හැකිය.

*ප්‍රස්තාර සටහන 1: අයිගන් අග හා සාධක අගයන්*




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

අයිගන් අග හා සාධක අගයන් දැක්වෙන ප්‍රස්තාර සටහන 1ට අනුව පළමු සාධකයේ අයිගන් අගය ඉහළ අගයක් ගන්නා අතර එය ක්‍රමයෙන් පහලට ගොස් 4 සාධකයේ දී අයිගන් අගය 1ට ආසන්න වේ. අයිගන් අග අනුව නිර්මාණය වී ඇති ප්‍රස්තාර සටහන අනුව ප්‍රධාන සංරචක ගණනය කළ හැකිය. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන ප්‍රධාන සාධක 6කි.

*වගු අංක 2: සාධක විශ්ලේෂණයට අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන ප්‍රධාන සංරචක.*

| | සාධක | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** | **6** |
| භාණ්ඩ සඳහා නිසි ඇගයුමක් නොමැති වීම | .786 | | | | | |
| භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය ඇතැම් ප්‍රදේශවලට පමණක් සීමා වීම | .741 | | | | | |
| තත්ත්ව සහතික ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම | .703 | | | | | |
| ආදේශන භාණ්ඩ | .660 | | | | | |
| නිෂ්පාදිත භාණ්ඩ සඳහා නිසි වෙළෙඳපොළක් නොමැති වීම | | .912 | | | | |
| ගැනුම්කරුවන් සොයා ගැනීමේ අපහසුතාවන් | | .911 | | | | |
| භාණ්ඩ සඳහා නියමිත වෙළෙඳපොළ වටිනාකමක් නොමැති වීම | | | .943 | | | |
| අඩු මිලක් යටතේ භාණ්ඩ විකිණීම | | | .943 | | | |
| රජයෙන් සහන නොලැබීම | | | | .272 | | |
| ශ්‍රමයට සරිලන මිලක් නොමැති වීම | | | | .848 | | |
| පාරිභෝගිකයන් සුළුතරයකට පමණක් සීමා වීම | | | | .597 | | |
| නිසි ණය ලබා ගැනීමේ ක්‍රමවේද නොමැති වීම | | | | | .853 | |
| ප්‍රවාහන අපහසුතා | | | | | .628 | |
| ආනයන භාණ්ඩ | | | | | .427 | |
| භාණ්ඩ අපනයනය කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම | | | | | | .851 |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

*රූප සටහන 1: සාධක විශ්ලේෂණයට අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක*

| | |
|---|---|
| ▪ භාණ්ඩ සඳහා නිසි ඇගයුමක් නොමැති වීම<br>▪ භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය ඇතැම් ප්‍රදේශවලට පමණක් සීමා වීම<br>▪ තත්ත්ව සහතික ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම<br>▪ ආදේශන භාණ්ඩ | භාණ්ඩවල ගුණාත්මක භාවය හා අලෙවිකරණය සීමා වීම |
| ▪ නිෂ්පාදිත භාණ්ඩ සඳහා නිසි වෙළෙඳපොළක් නොමැති වීම<br>▪ ගැනුම්කරුවන් සොයා ගැනීමේ අපහසුතාවන් | වෙළෙඳපොළ ධාරිතාවය අවම වීම |
| ▪ භාණ්ඩ සඳහා නියමිත වෙළෙඳපොළ වටිනාකමක් නොමැති වීම<br>▪ අඩු මිලක් යටතේ භාණ්ඩ විකිණීම | භාණ්ඩ වටිනාකම අවම වීම |
| ▪ රජයෙන් සහන නොලැබීම<br>▪ ශ්‍රමයට සරිලන මිලක් නොමැති වීම<br>▪ පාරිභෝගිකයන් සුළුතරයකට පමණක් සීමා වීම | අඩු සහන, අඩු පාරිභෝගිකයින් හා ශ්‍රමයට අවම මිලක් හිමිවීම |
| ▪ නිසි ණය ලබා ගැනීමේ ක්‍රමවේද නොමැති වීම<br>▪ ප්‍රවාහන අපහසුතා<br>▪ ආනයන භාණ්ඩ | ණය මූලාශ්‍ර, ප්‍රවාහන අපහසුතා හා ආනයන භාණ්ඩ යන බාහිර සාධක පැවතීම |
| ▪ භාණ්ඩ අපනයනය කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැති වීම | නිසි අපනයන ක්‍රමවේදයක් නොමැති වීම |

මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත (2020)

ඉහත 2 වගුව මගින් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක ප්‍රධාන සංරචක 06ක් අනුව පෙන්වා ඇත. ඒ අනුව රූප සටහන 1 හි දක්වා ඇති ආකාරයට භාණ්ඩවල ගුණාත්මක භාවය හා අලෙවිකරණය සීමා වීම, වෙළෙඳපොළ ධාරිතාවය අවම වීම, භාණ්ඩ වටිනාකම අවම වීම, අඩු සහන, අඩු පාරිභෝගිකයින් හා ශ්‍රමයට අවම මිලක් හිමිවීම, ණය මූලාශ්‍ර, ප්‍රවාහන අපහසුතා හා ආනයන භාණ්ඩ යන බාහිර සාධක පැවතීම, නිසි අපනයන ක්‍රමවේදයක් නොමැති වීම ලෙස සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක 06ක් දැකිවිය හැකිය.

### 4.2 සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිත කරන අලෙවිකරණ ක්‍රමවේද හඳුනාගැනීම සඳහා කයිවර්ග පරීක්ෂාව

සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිත කරන අලෙවිකරණ ක්‍රමවේද හඳුනාගැනීම සඳහා ගොඩනගාගත් කල්පිත පරීක්ෂා කිරීමට SPSS මෘදුකාංගය හරහා කයිවර්ග පරීක්ෂාව සිදුකරයි. මෙහි දී නිෂ්පාදන අලෙවි මට්ටම හා එක් එක් අලෙවිකරණ ක්‍රමවේදය යන විචල්‍යයන් දෙක අතර ස්වායත්තතාවය පරීක්ෂා කරයි. දත්ත සසම්භාවිව ව්‍යාප්තව තිබේ ද යන්න මෙම පරීක්ෂාව තුළින් විශ්ලේෂණය කළ හැකිය. ඒ අනුව ගොඩනගාගත් කල්පිතයන් පිළිගන්නේ ද යන්න පිළිබඳ මෙහිදී පරීක්ෂා කරයි. පහත වගු අංක 3 මගින් ගොඩනගාගත් අභිශූන්‍ය කල්පිත 09ක් හරහා කයිවර්ග පරීක්ෂාව මගින් ලබාගත් පියර්සන් කයිවර්ග අගය හා වෙසෙසියා මට්ටම දැක්වෙන අතර වෙසෙසියා මට්ටම අනුව අභිශූන්‍යය කල්පිතය පිළිගනී ද ප්‍රතික්ෂේප කරයි ද යන්න දක්වා ඇත.

*වගු අංක 3: සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිත කරන අලෙවිකරණ ක්‍රමවේද හඳුනාගැනීම*

| අංකය | $H_0$ කල්පිතය | පියර්සන් කයිවර්ග අගය | (Sig) | තීරණය |
|---|---|---|---|---|
| 1 | පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 9.883 | 0.042 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| 2 | දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවි කරනය හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 14.051 | 0.007 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| 3 | අතරමැදියන් හරහා නිෂ්පාදිත භාණ්ඩ වෙළෙඳපොළට ලබා දීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 11.564 | 0.021 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| 4 | අන්තර්ජාලය හරහා අලෙවිකරණය සිදුකිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 1.636 | 0.802 | $H_0$ කල්පිතය පිළිගැනීම |
| 5 | විද්‍යුත් ලිපිනය (Email) හරහා ගනුදෙනු කිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 4.024 | 0.403 | $H_0$ කල්පිතය පිළිගැනීම |
| 6 | සමාජ මාධ්‍යයජාලා හරහා අලෙවිකරණ කටයුතු සිදුකිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 1.872 | 0.759 | $H_0$ කල්පිතය පිළිගැනීම |

| | | | | |
|---|---|---|---|---|
| 7 | වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමුවී තිබීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 11.048 | 0.026 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| 8 | භාණ්ඩ අපනයනය කිරීමට යොමු වීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 3.029 | 0.553 | $H_0$ කල්පිතය පිළිගැනීම |
| 9 | පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නැත | 10.542 | 0.032 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත වගුව අනුව පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් පවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන ඇත. දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවි කරනය හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් පවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවි කිරීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන ඇත. අතරමැදියන් හරහා නිෂ්පාදිත භාණ්ඩ වෙළෙඳපොළට ලබා දීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් පවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් අතරමැදියන් හරහා නිෂ්පාදිත භාණ්ඩ වෙළෙඳපොළට ලබා දීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන ඇත. අන්තර්ජාලය හරහා අලෙවිකරණය සිදුකිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නොපවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් අන්තර්ජාලය හරහා අලෙවිකරණය සිදු කිරීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නැත.

විද්‍යුත් ලිපිනය (Email) හරහා ගනුදෙනු කිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නොපවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් විද්‍යුත් ලිපිනය හරහා ගනුදෙනු සිදු කිරීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නැත. සමාජ මාධ්‍යයජාලා හරහා අලෙවිකරණ කටයුතු සිදුකිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නොපවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් සමාජ මාධ්‍යයජාලා හරහා අලෙවිකරණ කටයුතු සිදුකිරීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නැත. වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමුවී තිබීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් පවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමුවීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන ඇත. භාණ්ඩ අපනයනය කිරීමට යොමු වීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නොපවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් භාණ්ඩ අපනයනය කිරීමට යොමු වීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නැත.

පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම හා නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය අතර සම්බන්ධතාවයක් නොපවතින බව තහවුරු වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම මගින් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන ඇත.

ඉහත දත්ත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ අන්තර්ජාලය හරහා අලෙවිකරණය සිදුකිරීම, විද්‍යුත් ලිපිනය හරහා ගනුදෙනු කිරීම හා සමාජ මාධ්‍යජාලා හරහා අලෙවිකරණ කටයුතු සිදුකිරීම වැනි නවීන තාක්ෂණික ශිල්පීය ක්‍රම හරහා මෙම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නොමැති බවයි. එමෙන් ම මොවුන් අපනයනය කිරීම හරහා ද නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නොමැත. පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම, දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවිය, අතරමැදියන් හරහා වෙළෙඳපොළට ලබා දීම, වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමු වීම හා පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම යන සාම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රමවේද නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිත කරන බවයි.

## 5. සමාලෝචනය

සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් කර්මාන්තකරුවන් අලෙවිකරණ ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක, නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද පිළිබඳව නිගමනවලට එළඹී ඇත.

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිත්තල, රිදී, පිළිම නෙලීම, බෙර හා වෙස් ඇදුම් කට්ටල නිර්මාණය යන සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් 58ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදිය යටතේ ලබාගනිමින් මෙම කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව අධ්‍යයනය කර ඇත. සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයේ දී ගැටලුවලට මුහුණ දීමට බලපාන සාධක මොනවාද යන්න පර්යේෂණයේ ගැටලුව වන අතර මෙහිදී කර්මාන්තකරුවන් අලෙවිකරණයේ දී මුහුණදෙන ගැටලුවලට බලපාන සාධක හඳුනාගැනීම අරමුණ විය. මෙලෙස කර්මාන්තකරුවන් අලෙවිකරණයේ දී මුහුණදෙන ගැටලුවලට සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද මගින් වල බලපෑම නිසා මෙහිදී මේ පිළිබඳව ද විමසා බලා ඇත.

පර්යේෂණය සඳහා දත්ත රැස්කිරීමේදී ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද යොදාගත් අතර මෙලෙස රැස්කරගත් දත්ත විශ්ලේෂණයේ දී සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක හඳුනාගැනීම සඳහා සාධක විශ්ලේෂණය ද, සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන් තම නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද පිළිබඳව විමසා බැලීම සඳහා කයිවර්ග පරීක්ෂාව ද සුදුසු පරිදි විස්තරාත්මක සංඛ්‍යානයද යොදාගෙන ඇත.

ප්‍රජා විද්‍යාත්මක දත්ත විශ්ලේෂණය හරහා විශ්ලේෂිත දත්ත ප්‍රතිඵල අනුව 53.6%ක බහුතර කර්මාන්තකරුවන් ජීවන වෘත්තියක් ලෙස මෙම කර්මාන්තයේ නිරතවන අතර දෙවනුව 39.3%ක වැඩිම කර්මාන්තකරුවන් ප්‍රමාණයක් පරම්පරාවෙන් මෙම කර්මාන්තය උරුම වූ නිසා මෙම කර්මාන්තයේ නිරත වේ. මෙම කර්මාන්තකරුවන්ගෙන් 86.4%ක් ම පරම්පරාවෙන් මෙම කර්මාන්ත පුහුණු වූවන් වේ. මෙම සාම්ප්‍රදායික කර්මාන්තවල නිරතවන්නන්ගෙන් 60%ක් පුරුෂයින් වන අතර 40%ක සුලු පිරිසක් ස්ත්‍රීන් වේ. කර්මාන්තකරුවන්ගේ වයස පිළිබඳව අවධානය යොමුකළ විට පිත්තල හා බෙර යන කර්මාන්තවල බහුතර කර්මාන්තකරුවන් වයස අවුරුදු 55ට වඩා වැඩිවන අතර රිදී කර්මාන්තය තුළ වයස අවුරුදු 36ත් 55 අතර මධ්‍යයම වයසේ වැඩි ප්‍රමාණයක් සේවා නියුක්තවේ. අනෙකුත් කර්මාන්තවලට සාපේක්ෂව තරුණ පිරිසක් පිළිම නෙලීම හා වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්තවල නිරත වේ. සමස්තයක් ලෙස ගත්විට සාම්ප්‍රදායික කර්මාන්තවල 46.6%ක වැඩි කර්මාන්තකරුවන් ප්‍රමාණයකගේ පවුලේ සාමාජිකයින් ගණන 4ත් 5ත් අතර වේ. තෝරාගත් පිත්තල, රිදී, බෙර, පිළිම නෙලීම හා වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්ත සියල්ලේම 65.6%ක බහුතර කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම රුපියල් 20000ට වඩා වැඩි වෙයි. සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගෙන් 44.8%ක් සාමාන්‍යය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර 27.6%ක සුලු ප්‍රමාණයක් පමණක් උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇත. බහුතර කර්මාන්තකරුවන් ප්‍රමාණයක් වසර 6ට වඩා වැඩි කාලයක් කර්මාන්තයේ නිරතව ඇති අතර එය 56.9%ක ප්‍රතිශතයකි.

සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන සාධක විශ්ලේෂණය මගින් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා ගැටලුවලට මුහුණදීමට බලපාන ප්‍රධාන සංරචක 06ක් හඳුනාගෙන ඇති අතර ඒවා නම් භාණ්ඩවල ගුණාත්මක භාවය හා අලෙවිකරණය සීමා වීම, වෙළෙඳපොළ ධාරිතාවය අවම වීම, භාණ්ඩ වටිනාකම අවම වීම, අඩු සහන අඩු පාරිභෝගිකයින් හා ශ්‍රමයට අවම මිලක් හිමිවීම, ණය මූලාශ්‍ර ප්‍රවාහන අපහසුතා හා ආනයන භාණ්ඩ යන බාහිර සාධක පැවතීම, නිසි අපනයන ක්‍රමවේදයක් නොමැති වීම යන්නයි.

නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිතයට ගන්නා අලෙවිකරණ ක්‍රමවේද පිළිබඳව විමසා බැලීම සඳහා සිදුකළ කයිවර්ග පරීක්ෂාව මගින් පෞද්ගලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම, දේශීය වශයෙන් පවතින වෙනත් වෙළෙඳපොළවල් තුළ භාණ්ඩ අලෙවිය, අතරමැදියන් හරහා වෙළෙඳපොළට ලබා දීම, වෙළෙඳ දැන්වීම් කෙරෙහි යොමු වීම හා පෞද්ගලික ප්‍රවාහන සේවයක් භාවිත කිරීම යන සාම්ප්‍රදායික අලෙවිකරණ ක්‍රමවේද නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගැනීම සඳහා භාවිත කරන බව හඳුනාගත් අතර අන්තර්ජාලය හරහා අලෙවිකරණය සිදුකිරීම, විද්‍යුත් ලිපිනය හරහා ගනුදෙනු කිරීම හා සමාජ මාධ්‍යයජාලා හරහා අලෙවිකරණ කටයුතු සිදුකිරීම වැනි නවීන තාක්ෂණික ශිල්පීය ක්‍රම හරහා මෙම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නොමැති බව ද හඳුනාගෙන ඇත. එමෙන් ම මොවුන් අපනයනය කිරීම හරහා ද නිෂ්පාදන අලෙවි මට්ටම වර්ධනය කර ගෙන නොමැත.

## ආශ්‍රිත ග්‍රන්ථ


මදුසංඛ, එච්. ඒ., සහ චතුරිකා, බී. එල්. (2017). සමාජයේ සංස්කෘතික සට්ටනය මතින් අපට අභිමිවන සාම්ප්‍රාදායික බෙර කර්මාන්තය ;කුරගල ගම්මානය ඇසුරින් විමර්ශනය. *2nd Undergraduates' Research Conference*. http://repository.kln.ac.lk/bitstream/handle/123456789/7/5.pdf?sequence=1&isAllowed=y

Arachchge, S. A. (2017). Modernization of Tradition for Endurance: Future and Challenges of Traditional Brass Industry of Pilimatalawa, Sri Lanka. *4th International Conference on Rural Development and Entrepreneurship - 2017*.

Athukorala, P.-c., & Jayasuriya, S. K. (2004). Complementarity of Trade and FDI Liberalization in Industrial Growth: Lessons from Sri Lanka. *ASARC*. Retrieved from https://www.researchgate.net/publication/5223777

Aydin, S., Ozer, G., & Cetin, A. T. (2007). The Relationship Between Marketing And Product Development Process And Their Effects On Firm Performance. *Academy of Marketing Studies Journal*, 53-68. Retrieved from https://www.researchgate.net/publication/278300250

Bandara, K. E. (2015). Retrieved from www.slideshare.net: https://www.slideshare.net/kanchanaeranga/ss-56361247

Barber, J. P., Villar, C., & Sarria, G. B. (2020). Configurational Theory in Traditional Manufacturing Industries: A New Model of High-Performing Small and Medium-Sized Enterprises. *Sustainability 2020*, *12*(17). doi:doi:10.3390/su12176818

Bhayani, S. (2018). Internet Marketing vs Traditional Marketing: A Comparative Analysis. https://www.researchgate.net/publication/327645389

Huddle, D. L., & Ho-yhi, M. (1975). Small-Scale and Traditional Industries, *A Development Alternative. 61*(4), 113-125. Retrieved from https://scholarship.rice.edu/bitstream/handle/1911/63207/article_RIP614_part7.pdf?sequence=1&isAllowed=y

Kumar, D., & Rajeev, P. V. (2019). A New Strategic Approach for Marketing of Handicraft Products. https://www.researchgate.net/publication/331233388

Ministry of Industry and Commerce, Sri Lanka. (2020). *Ministry of Industry and Commerce, Sri Lanka*. Retrieved from http://www.industry.gov.lk/web/index.php/en/about-us/organization-structure.html

Navaratne, T. L., & Ratnayake, R. M. (2015). Sustainability of Small Scale Traditional Industries in Sri Lanka – With Specific Reference to the Handicraft Industry. *Inclusive Growth towards Economic Transformation Sri Lanka Economics Research Conference, 4*, 214-225.

Osadith, U. (2015). *linkedin*. Retrieved from https://www.linkedin.com/pulse/problems-face-traditional-industries-sri-lanka-udara-osadith

Senevirathne, S. R., Wewala, W. H., Jayasekara, B. M., Vidanapathirane, T. R., & Oshadie, M. N. (2010). *Study to Identify the Posibilities and Constraints in Developing Curricular for Sri Lankan Traditional Handicraft Sector under the National Vocational Qualification Frame.* Tertiary and Vocational Education Commission. Retrieved from http://www.tvec.gov.lk/wp-content/uploads/2018/02/unvotec-02.pdf

Shah, A., & Patel, R. (2019). Transitional Trend in Handicraft Practices & its Impact on the Income of Artisans. *8*(1). Retrieved from https://www.researchgate.net/publication/333918221

Silva, A. d. (2019). *Craft Artisans and State Institutions in Sri Lanka.* Horizon Printing (Pvt) Ltd. 1616/6, Hatharaman Handiya, Malabe Road, Kottawa, Pannipitiya. Retrieved from http://ices.lk/wp-content/uploads/2019/06/Craft-Artisans-and-State-Institutions-in-Sri-Lanka.pdf

Silver, G. D., & Kundu, P. K. (2013). Handicraft Products: Identify the Factors that Affecting the Buying Decision of Customers (The Viewpoints of Swedish Shoppers). Retrieved from https://www.diva-portal.org/smash/get/diva2:666130/FULLTEXT01.pdf

Stearns, P. N. (2008). *Oxford Encyclopedia of the Modern World.* Oxford University Press. https://www.oxfordreference.com/view/10.1093/oi/authority.201108 0310522 5109

# තේ කර්මාන්තය වතු කම්කරු ආර්ථිකයට ඇති කරන බලපෑම

ආර්. එම්. ආර්. පී. රාජපක්ෂ

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
rajapakshapriyadarshani953@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝගයක් සහ ප්‍රධානතම විදේශ විනිමය ඉපැයීම් අංශයක් ලෙස තේ කර්මාන්තය හඳුනාගත හැකි ය. තේ කර්මාන්තය මගින් වතු කම්කරු ආර්ථිකයට ඇති කරන බලපෑම කවරාකාරද යන්න හඳුනා ගැනීම හා තේ කර්මාන්ත ආශ්‍රිතව පවතින ගැටලු මොනවාද යන්න හඳුනා ගැනීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත බහුපියවර පොකුරු නියැදීම මගින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳපොළ ග්‍රාම නිලධාරී වසමේ තේ වතු කම්කරුවන් 100කින් සමන්විත නියැදියක් මගින් එක් රැස් කර ගන්නා ලදි. ප්‍රාථමික දත්ත රැස් කර ගැනීම සඳහා මූලික වශයෙන් භාවිතා කොට ගනු ලැබූවේ ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු සහ ප්‍රස්තාර සටහන් භාවිතා කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයිවර්ග පරීක්ෂාව ආදී සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදි. තේ වතු කම්කරු ආර්ථිකයට ඇති වන්නා වූ බලපෑම් වශයෙන්, තේ කර්මාන්තය ආශ්‍රිතව තේ වතු කම්කරුවන් හට රැකියා ලබා දීමේ දී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වා තිබීම, තේ වතු කම්කරුවන්ගෙන් බහුතරයක් ජීවත් වන ලයින් කාමර (ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ එය 77%කි) ඔවුන් හට ලබා දීමේ දී කිසිදු මුදලක් අය නොකිරීම දැක්විය හැකිය. තේ වතු කම්කරුවන්ගේ මාසික වැටුප ඔවුන්ගේ කුටුම්භ වියදම් සඳහා ප්‍රමාණවත් නොවීම ආර්ථිකයට ඇතිවන අයහපත් බලපෑමකි. මේ හේතුවෙන් තේ වතු කම්කරුවන්ගෙන් 87%ක ප්‍රතිශතයක් වෙනත් ආදායම් මාර්ග සඳහා යොමු වී ඇත. තේ වතු කම්කරුවන් යොමු වී ඇති වෙනත් ආදායම් මාර්ග ලෙස කුලී වැඩ, සත්ත්ව පාලනය හා ගොවිතැන හඳුනාගත හැකිය. තේ කර්මාන්තය දියුණු නොවීමට බලපාන හේතු සාධක ලෙස, තේ කර්මාන්තය තුළ අඩු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කිරීම, ශ්‍රම හිඟතාවයක් මේ වන විට ඇති වී තිබීම, වර්තමානය වන විට අතීතයේ මෙන් නිසියාකාරව නඩත්තු කටයුතු සිදු නොවීම, නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් මේ වන විට තේ කර්මාන්තය පාඩු ලැබීම, ස්වභාවික උවදුරු හේතුවෙන් තේ වගාවන් සඳහා හානි සිදු වීම හඳුනාගත හැකිය. තේ වතු කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම උදෙසා කටයුතු සම්පාදනය කරමින් ඉදිරියේ දී තේ කර්මාන්තය ඉතා දියුණු තත්ත්වයකට පත් කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතුය.*

***මුඛ්‍ය පදඃ තේ කර්මාන්තය, වතු කම්කරු ආර්ථිකය, තේ වතු කම්කරුවන්***

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජ සහ පාරිසරික යන අංශයන්ගෙන් ඉතා වැදගත් කාර්යභාරයක් වැවිලි අංශයන් මගින් ඉටු කරනු ලබයි. ප්‍රධාන වැවිලි බෝග අතරට තේ, පොල්, රබර් යන බෝග හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව තුළ වතු වැවිලි වගාවන්වල වර්ධනය ආරම්භ වූයේ

බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයයෙහිදී ය. කැමිලියා සිනෙන්සිස් (*camillia senesis*) යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන තේ, වර්තමානය වන විට ලෝකයේ බොහෝමයක් රටවල බහුල ව භාවිතා කරන පානයක් වශයෙන් සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ අපනයන බෝග අතර ප්‍රධාන තැනක් ගනු ලබන්නේ තේ ය. ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන ප්‍රධානතම වැවිලි කර්මාන්තය වන්නේ තේ කර්මාන්තයයි. ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වාදෙනු ලැබූයේ ඉංග්‍රීසි ජාතික ජේම්ස් ටේලර් විසිනි. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ තේ වගාව, විශාල වතු වශයෙන් මෙන් ම කුඩා තේ වතු වශයෙන් ද ව්‍යාප්තව පවතී (ජයවර්ධන, 2008).

ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එනම් උඩරට තේ (Upcountry Tea ) – 1220m ට වැඩි උස් බිම් ප්‍රදේශ, මැදරට තේ (Midcountry Tea ) - 610m ත් 1220m ත් අතර උස් බිම් ප්‍රදේශ හා පහතරට තේ (Lowcountry Tea ) – 610m ට අඩු උස් බිම් ප්‍රදේශ වශයෙනි. මෙරට මෙම ප්‍රදේශයන්හි තේ වගාවේ ව්‍යාප්ත වීම සඳහා බලපාන ලද හේතු සාධකයන් වන්නේ, 1900mm – 5400mm දක්වා වූ වර්ෂාපතනය, $15^{o}$ C – 27 $^{o}$C දක්වා සාමාන්‍ය උෂ්ණත්වය, ලෝම් ලැටරයිට් පස සහ ජලය හොඳින් බැස යන මද බෑවුම් සහිත ප්‍රදේශ පැවතීම ආදිය දැක්විය හැකිය. තේ කර්මාන්තය ආශ්‍රිතව රැකියා අවස්ථාවන් රැසක් බිහි වී ඇත. එනම් බිම් සැකසීම, තේ පැළ සිටුවීම, තේ දළු නෙලීම, තේ ගස් කප්පාදු කිරීම, තේ දළු ඇසුරුම්කිරීම, තේ දළු කර්මාන්තශාලා වෙත ප්‍රවාහනය කිරීම, තේ දළු වියළීම, තේ දළු ඇඹරීම ආදී රැකියා රාශියක් පවතී. තේ කර්මාන්තයත් සමඟ බිහි වූ තේ වතු කම්කරුවන්ගේ ආර්ථික මට්ටම සැලකිය යුතු අයුරින් සංවර්ධනයකට ලක් නොවනු දැකගත හැකිය. ශ්‍රී ලංකාවේ ජන සමාජයේ තේ වතු අංශයේ සංවර්ධන මට්ටම අඩු සංවර්ධන තත්ත්වයක් දක්නට ලැබුණ ද ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට තේ වතු කම්කරුවන්ගේ දායකත්වය ඉතා සුවිශේෂී වේ (දිසානායක, 2010).

මෙම තේ වතු ක්ෂේත්‍රයේ සේවා නියුක්ත කම්කරුවෝ පරම්පරා ගණනාවක සිට දිගුකාලීනව දරිද්‍රතාවයෙන් පෙළෙති. මේ හේතුවෙන් තේ වතු කම්කරු කුටුම්භ ආර්ථික පසුබිම හඳුනා ගැනීම සඳහා, තේ කර්මාන්තය මගින් වතු කම්කරු ආර්ථිකයට ඇති කරන බලපෑම කවරාකාරද යන්න හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ එක් අරමුණක් ලෙස දැක්විය හැකිය. තවද තේ කර්මාන්ත ආශ්‍රිතව පවතින ගැටලු මොනවාද යන්න හඳුනා ගැනීම මෙහි තවත් අරමුණක් වශයෙන් හඳුන්වා දිය හැකිවේ.

## 2. සාහිත්‍ය විමර්ශනය

1867 දී ස්කොට්ලන්ත ජාතික ජේම්ස් ටේලර් විසින් මහනුවර හේවාහැට ලූල්කඳුර නම් කෝපි වත්තේ මෙරට ක්‍රමවත් තේ වගාව ආරම්භ කරන ලදි. එමෙන්ම ඔහු විසින් ක්‍රමවත් අයුරින් තේ දළු නෙළීම, තේ දළු සකස් කිරීම, හා තේ අලෙවි කිරීම ආදිය ද ආරම්භ කර ඇත (දිසානායක, 2010). 1830 ගණන්වල සිට ශ්‍රී ලංකාවේ තේ පිළිබඳ අතහදා බැලීම් ගැන සඳහන් වුව ද ඒවා එතරම් ජනප්‍රිය නොවී ය. කෝපි වගාවට වැළඳුනු, දිලීර රෝගයක් නිසා එය විනාශ වීමත්, බ්‍රිතාන්‍ය තුළ තේ ජනප්‍රිය වීමත් යන සාධක නිසා වැවිලිකරුවන් තේ කෙරේ අවධානය යොමු කළ බව කිව හැකිය.

මේ අනුව වාණිජමය බෝගයක් ලෙස 1867 දී ජේම්ස් ටේලර් (James Taylor) විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ලූල් (Loole Condera) වත්තේ අක්කර 19ක පමණ (හෙක්ටයාර 8ක පමණ) තේ වගාවක් ආරම්භ කර ඇත (විද්‍යාරත්න, 2001). මෙලෙස ප්‍රථමයෙන් වගා කළ තේ වගාවෙන් වෙළඳපොළේ දී ඉහළ ම මිලක් ලැබී ඇත. මෙලෙස වාණිජමය තේ වැවිල්ල 1877 දී හෙක්ටයාර 1094 (අක්කර 2700) දක්වා 1890 හෙක්ටයාර 89,100 ක් ලෙස ද, 1900 වන විට හෙක්ටයාර 155,520 දක්වා ද ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත (විද්‍යාරත්න, 2001). මේ ආකාරයට තේ වගාවේ ශීඝ්‍ර වර්ධනයත් සමගම තේ ලංකා ආර්ථිකයේ ඉතා වැදගත්ම වැවිලි බෝගය බවට පත් වී තිබේ. වර්ෂ 2018 දී සමස්ත තේ නිෂ්පාදනය කි. ග්‍රෑ. මිලි. 303.84 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 1.26%ක පහළ යෑමකි. කුඩා තේ වතු අංශයේ උඩරට හා පහතරට කලාපයන්ට මෙන්ම උඩුපුස්සැල්ලාව කෘෂි දේශගුණික කලාපයන්ට බලපෑනු ලැබූ අයහපත් කාලගුණ තත්ත්වය මීට හේතු විය (වාර්ෂික කාර්යසාධන වාර්තාව, 2018).

අතීතයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවට විදේශ විනිමයක් අත්කරදුන් වතු කම්කරුවන්ගේ, වතුකරය තුළ වරින් වර ක්‍රියාත්මක වූ ව්‍යුහාත්මක වෙනස්කම් නිසා ඒවායේ හිමිකාරීත්වය මෙන්ම කළමනාකාරීත්වය ද වෙනස් වී ඇත. මෙම වෙනස්කම් වතුකරයේ පරම්පරා ගණනාවකට බලපාන ලදි. වතු කම්කරුවන් යම් ආකාරයකට පීඩාවකට ලක් කරමින් මුල් කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට, වතු ජනසතුකරණය, ඉඩම් ප්‍රතිසංස්කරණය මෙන්ම 1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමය ද හේතු විය. ඉඩම් ප්‍රතිසංස්කරණවලට පෙර වතු පාලකයා වූයේ බ්‍රිතාන්‍ය ජාතිකයෝ ය. අනතුරුව ස්වදේශිකයන් වතු ප්‍රධානීන් වීමත් සමඟ වතු කම්කරු අධ්‍යාපනය, සෞඛ්‍ය හා සුභසාධන කටයුතු කෙරෙහි රජයේ මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද අවධානය යොමු කරන ලදි. එහි දී වතුකරයේ අධ්‍යාපනය යම් ප්‍රමිතියකට සිදු වූ අතර 1977 දී හඳුන්වා දෙන ලද විවෘත ආර්ථිකය නිසා කම්කරුවන්ගේ දෙවැනි පරම්පරාවට නව රැකියා සඳහා යොමු වීමට ද නිදහස ලැබිණි (රත්නායක, 2016). ඒ අනුව වර්ෂ දෙකකට වාරයක් සාමූහික ගිවිසුම අත්සන් කරන ලද අතර වර්තමානය සඳහා 2019 වර්ෂයේ දී, තේ වතු කම්කරු වෘත්තීය සමිති සහ ලංකා හාම්පුතුන්ගේ සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම බලපැවැත් වේ. සේවා නියුක්ත කාන්තාවන් පෙ. ව. 7.30 කාලයට සේවය සඳහා වාර්තා කළ යුතු අතර ප. ව. 4.30 කාලයට සේවය නතර කල යුතු ය. පුරුෂ පාර්ෂවය පෙ. ව. 7.30 කාලයට සේවය සඳහා වාර්තා කලයුතු අතර මධ්‍යාන්‍යය 12.30 සේවය නිම වේ. අත්සන් කරන ලද නව සාමූහික ගිවිසුමට අනුව මූලික දෛනික වැටුප රු.500 සිට රු.700 දක්වා රු.200 කින් සහ මිල දර්ශක දීමනාව රු.30 සිට රු.50 දක්වා රු.20 කින් වැඩි කර ඇත. නමුත් මේ දක්වා කරන ලද පැමිණීමේ දීමනාව සහ දිරි දීමනාව අහෝසි කර ඇත. ඒ අනුව වර්තමානය වන විට වතු කම්කරුවකු සඳහා රු.750 කට ආසන්න දෛනික වැටුපක් ගෙවනු ලැබේ (Sinnathamby & Vijesandirana, 2018).

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් දක්වනු ලබයි. ඒ විදේශ විනිමය උපයාදීම අතින් හා දේශීය වශයෙන් රැකියා අවස්ථා සලසා දීම යන අංශ දෙකින්ය. එසේ වුවත් වර්තමානයයේ දී තේ කර්මාන්තය විශාල ගැටලු හා අභියෝග කීපයකට මුහුණ දී ඇත. ඒවා නම්, ඩොලර් බිලියන 1 ක් තරම් වූ වාර්ෂික ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම, ගුණාත්මක භාවයෙන් ඉහළ තේ අපනයනය කිරීම, තොග

තේ වෙනුවට එකතු කළ වටිනාකමක් සහිත තේ අපනයනය වැඩි කිරීම, තේ වගාවෙන් ලැබෙන ඵලදාව වැඩි කර ගැනීම, තේ නිෂ්පාදනය වැඩිකර ගැනීම සහ නිෂ්පාදන පිරිවැය පහළ මට්ටමක පවත්වා ගෙන යාම ආදිය වේ. තේ අපනයන ආදායම, අපනයන ප්‍රමාණය හා අපනයන මිල යන කරුණු දෙක මත තීරණය වේ. මෙයින් තේ අපනයන ප්‍රමාණය ලෝක ඉල්ලුමට සරිලන පරිදි වැඩි කර ගතහොත් පවතින මිල ගණන් යටතේම අපනයන ආදායම වැඩිකර ගත හැකි වනු ඇත (දිසානායක,2010). මෙරට තේ අපනයනයෙන් 55%-60% මිල දී ගැනීමෙන් මැදපෙරදිග රටවල් ප්‍රධාන ගැනුම්කරුවන් බවට පත්ව ඇත. ඒ අනුව 1984 දී ඉරාකය විශාලම ගැනුම්කරුවා බවට පත්ව ඇත. නමුත් 1985-1990 කාලය තුළ රුසියාව ප්‍රමුඛ ස්ථානයට පත්වීම නිසා ඉරාකයට දෙවන ස්ථානය හිමි වී ඇත. එම ස්ථානය 1991 දී ඉරානයට හිමි වී ඇත.1991 සහ 1992 දී ප්‍රධාන ගැනුම්කරුවන් අතරට එක් නොවූ CIS රටවල් (ස්වාධීන රාජ්‍යයන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය) 1993 දී විශාලම ගැනුම්කරු බවට පත් වී ඇත. මෙම රටවල් සඳහා මෙරට මුළු තේ නිෂ්පාදනයම මිල දී ගැනීමට තරම් ශක්තිමත් වෙළඳපොලක් විය. ඒ අනුව 1992 දී තේ කිලෝග්‍රෑම් දස ලක්ෂ 4.9 ක් මිල දී ගත් අතර එම ප්‍රමාණය 1993 දී දස ලක්ෂ 27.7 ක් දක්වා ද 1999 දී දස ලක්ෂ 56.5 ක් දක්වා ද වැඩි වී ඇත (ආර්ථික විමසුම, 2001).

රුපියල් බිලියන 212.6 ක අපනයන ආදායමක් උපයාගනිමින් 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය (ප්‍රති අපනයනය ද ඇතුළුව) කිලෝග්‍රෑම් මිලියන 327.3ක් විය. මෙම වසර අපනයන ඉපැයුම් රුපියල් බිලියන 200 ඉක්මවූ පළමු වර්ෂයයි. මෙම ඉහළ අපනයන ප්‍රමාණයන් සහ වටිනාකම් සමඟ, 2014 මැද භාගය වන විට ශ්‍රී ලංකා තේ අපනයනයන් චීනය අභිබවා යමින් ගෝලීය තේ අපනයනකරුවන් අතර දෙවැනි ස්ථානයේ පසුවිය (ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 2014).

*වගු අංක 1: 2013 හා 2014 වර්ෂවල ශ්‍රී ලංකා තේ අපනයනය කරන රටවල්*

| රට | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | **ස්ථානය** | **ප්‍රමාණය** | **අපනයන කොටස %** | **ස්ථානය** | **ප්‍රමාණය** | **අපනයන කොටස %** |
| තුර්කිය | 1 | 44,746,301 | 13.7 | 3 | 32,234,506 | 16.4 |
| රුසියාව | 2 | 44,100,849 | 13.5 | 1 | 46,371,885 | 16.1 |
| ඉරානය | 3 | 30,076,649 | 9.2 | 2 | 39,647,808 | 11 |
| ඉරාකය | 4 | 24,749,386 | 7.6 | 4 | 22,517,810 | 9.1 |
| එ. අ. එ. රා. | 5 | 19,813,573 | 6.1 | 6 | 18,070,812 | 7.3 |
| සිරියාව | 6 | 12,917,421 | 3.9 | 5 | 21,058,866 | 4.7 |
| ලිබියාව | 7 | 12,650,300 | 3.9 | 14 | 6,642,742 | 4.6 |
| කුවේටය | 8 | 12,222,651 | 3.7 | 7 | 16,112,076 | 4.5 |
| අසර්බයිජානය | 9 | 11,154,552 | 3.4 | 8 | 10,780,779 | 4.1 |
| ජපානය | 10 | 9,108,279 | 2.8 | 10 | 8,938,038 | 3.3 |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා තේ මණ්ඩලය (2014)

ඉහත වගු අංක 1 හි සඳහන් වන ආකාරයට, 2014 වර්ෂයේ දී තුර්කිය මුළු ශ්‍රී ලංකා තේ අපනයනයෙන් 13.7%ක් ආනයනය කරමින් රුසියාවේ ස්ථානය අභිබවා යමින් ශ්‍රී ලංකා තේ අපනයනය කරන ප්‍රධානතම රට බවට පත්ව ඇත. 2013 වර්ෂයේ දී තුර්කිය ශ්‍රී ලංකා තේ අපනයනය කරන තෙවන රට වූ අතර මුළු තේ අපනයනයෙන් 11.8% ක් ආනයනය කර තිබුණි. 2013 වර්ෂය හා සැසඳීමේ දී 2014 වර්ෂයේ දී 39%ක ප්‍රමාණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. 2014 වර්ෂයේ දී ඉරානය 9.2%ක අපනයන දායකත්වයක් ලබා දෙමින් ශ්‍රී ලංකා තේ අපනයනය කරන රටවල් අතර තෙවැනි ස්ථානයේ පසුවූ අතර එය 2013 වර්ෂය හා සැසඳීමේ දී අපනයන ප්‍රමාණයේ 24% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත (ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 2014).

*වගු අංක 2: 2017 හා 2018 වර්ෂයන්වල ශ්‍රී ලංකා තේ අපනයනය කරන රටවල්*

| ප්‍රධාන රටවල් 10 | 2017 | | 2018 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි. ග්‍රෑ.) | මුළු අපනයනයේ % | ප්‍රමාණය (කි. ග්‍රෑ.) | මුළු අපනයනයේ % | ප්‍රමාණය (කි. ග්‍රෑ.) | % |
| ඉරාකය | 35,032,772 | 12.12 | 38,435,935 | 13.61 | 3,403,163 | 9.71 |
| තුර්කිය | 37,815,700 | 13.09 | 35,634,255 | 12.62 | -2,181,445 | -5.77 |
| රුසියාව | 33,379,977 | 11.55 | 30,580,653 | 10.82 | -2,799,324 | -8.39 |
| ඉරානය | 27,418,910 | 9.49 | 23,914,223 | 8.47 | -3,504,688 | -12.78 |
| ලිබියාව | 11,609,461 | 4.02 | 13,686,442 | 4.85 | 2,076,981 | 17.89 |
| එ.අ.එ.රා. | 15,785,266 | 5.46 | 11,077,796 | 3.92 | -4,707,470 | -29.82 |
| අසර්බ-යිජානය | 1,227,107 | 4.25 | 10,550,857 | 3.74 | -1,720,251 | -14.02 |
| සිරියාව | 7,399,616 | 2.56 | 10,180,344 | 3.61 | 2,780,728 | 37.58 |
| චීනය | 9,903,199 | 3.43 | 10,020,245 | 3.55 | 117,046 | 1.18 |
| චිලී | 7,096,964 | 2.46 | 7,540,045 | 2.67 | 443,081 | 6.24 |

මූලාශ්‍රයඃ කාර්යසාධන වාර්තාව (2018)

2018 වර්ෂය තුළ සමස්ත නිෂ්පාදනයෙන් කිලෝග්‍රෑම් මිලියන 271.78 ක් හෙවත් 89% ක් අපනයනය කර ඇති අතර ප්‍රතිඅපනයනය කිලෝග්‍රෑම් මිලියන 10.59කි. ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 10 අතරින් තුර්කිය, රුසියාව, ඉරානය, එක්සත් අරාබි එමිර් රාජ්‍ය හා අසර්බයිජානය යන රටවලට සිදුකළ තේ අපනයනය පිළිවෙලින් 5.72%, 8.39%, 12.78%, 29.82%හා 14.02%කින් පහළ යනු ලැබීය. නමුත් ඉරාකය, ලිබියාව, සිරියාව, චීනය හා චිලී යන රටවල් සඳහා වූ අපනයනයන් පිළිවෙලින් 9.71%, 17.89%, 37.58%, 1.18% හා 6.24% කින් ඉහළ යනු ලැබීය. තේ අපනයන ආදායම රු.බිලියන 237.7 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 0.69%කින් පහළ යෑමකි (වාර්ෂික කාර්යසාධන වාර්තාව, 2018).


## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත බහුපියවර පොකුරු නියැදීම මගින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳපොළ ග්‍රාම නිලධාරී වසමේ තේ වතු කම්කරුවන් 100 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් මගින් එක් රැස් කර ගන්නා ලදි. මෙහි දී දත්ත රැස් කර ගැනීම සඳහා මූලික වශයෙන් භාවිතා කොට ගනු ලැබුවේ ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි. ද්විතීක දත්ත ලබා ගැනීම සඳහා පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත සඟරා සහ වාර්ෂික වාර්තා අධ්‍යයනය කිරීමට සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී SPSS මෘදුකාංගය හා Microsoft Excel යන පරිගණක මෘදුකාංග යොදා ගෙන ඇත. දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු සහ ප්‍රස්තාර සටහන් භාවිතා කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයිවර්ග පරීක්ෂාව ආදී සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදි.

## 4. දත්ත විශ්ලේෂණය

### 4.1. තේ වතු කම්කරුවන්ගේ මාසික ආදායමේ සංයුතිය

*ප්‍රස්තාර සටහන 1: තේ වතු කම්කරුවන්ගේ මාසික ආදායමේ සංයුතිය*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

තේ වතු කම්කරුවන්ගේ මාසික ආදායමෙහි සංයුතිය ඉහත අංක 1 ප්‍රස්තාර සටහන මගින් නිරූපණය වේ. රු. 5000 - රු. 10000 අතර ආදායම ලබන තේ වතු කම්කරුවන්ගේ ප්‍රතිශතය 13%ක් ලෙස ඉහත ප්‍රස්තාර සටහනෙහි දැක්වේ. තේ වතු කම්කරුවන්ගෙන් 45%ක පමණ ප්‍රතිශතයක් රු. 10000 - රු. 15000 අතර ආදායමක් ලබා ගනී. එමෙන්ම 42%ක තේ වතු කම්කරුවන් රු. 15000 - රු. 20000 අතර ආදායමක් ලබා ගන්නා බව ප්‍රස්තාර සටහන ඔස්සේ පැහැදිළිව හඳුනාගත හැකිය.

### 4.2 තේ වතු කම්කරුවන් වෙනත් ආදායම් මාර්ග වෙත යොමු වීමේ සංයුතිය

*ප්‍රස්තාර සටහන 2: තේ වතු කම්කරුවන් අමතර ආදායම් මාර්ග වෙත යොමු වීමේ සංයුතිය*





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත(2020)

ඉහත අංක 2 ප්‍රස්තාර සටහන මගින් අමතර ආදායම් මාර්ග වෙත යොමු වී සිටින 87%ක තේ වතු කම්කරු ප්‍රතිශතය තුළට අමතර ආදායම් මාර්ගය ලැබෙන ආකාරය නිරූපණය වේ. ඒ අනුව 17%ක තේ වතු කම්කරු ප්‍රතිශතයක් අමතර ආදායම් මාර්ගය ලෙස යොමු වී ඇත්තේ කුලී වැඩ සඳහා ය. තේ වතු කම්කරුවන්ගෙන් 21%ක පමණ ප්‍රතිශතයක් යොමු වී ඇත්තේ සත්ත්ව පාලනය සඳහා ය. 23%ක තේ වතු කම්කරුවන් ගොවිතැන් කටයුතු ඔස්සේ අමතර ආදායමක් උපයා ගනී. එමෙන්ම 39%ක ප්‍රතිශතයක් ඉහත ආදායම් මාර්ග අතරින් දෙකක් හෝ කිහිපයක් සඳහා යොමු වී ආදායම් ලබා ගැනීම සිදු කරනු ලබයි.

### 4.3 තේ වතු කම්කරුවන්ගේ කුටුම්භ මාසික වියදම

*ප්‍රස්තාර සටහන 3: තේ වතු කම්කරුවන්ගේ කුටුම්භ මාසික වියදම*




මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත (2020)


තේ වතු කම්කරුවන්ගේ කුටුම්භ මාසික වියදම ඉහත අංක 3 ප්‍රස්තාර සටහන මගින් නිරූපණය වේ. ඒ අනුව 19%ක ප්‍රතිශතයක් රු.10000 ත් - රු.15000 ත් අතර මුදලක් මසකට වියදම ලෙස සඳහන් කරයි. 27%ක ප්‍රතිශතයක් සඳහා මසකට රු. 15000 ත් - රු.20000 ත් අතර මුදලක් වැය වන බව ඉහත ප්‍රස්තාර සටහන ඔස්සේ හඳුනාගත හැකිය. තේ වතු කම්කරුවන්ගෙන් 35%ක ප්‍රතිශතයක් සඳහා වැය වන මුදල රු. 20000 ත් - රු. 25000 ත් අතර අගයක් ගනු ලැබේ. එමෙන්ම 19%ක ප්‍රතිශතයක් සඳහා රු.25000 ට වැඩි මුදලක් මාසික වියදම සඳහා වැය වන බව ඉහත ප්‍රස්තාර සටහන ඔස්සේ පැහැදිළිව අවබෝධ කර ගත හැකිය.

### 4.4 තේ කම්කරුවන් රැකියාව ආශ්‍රිතව මුහුණදෙන දුෂ්කරතා

තේ වතු කම්කරුවන් මුහුණ දෙනු ලබන ප්‍රධාන දුෂ්කරතාවයන් ලෙස දිනකට ඔවුන් හට ගෙවනු ලබන වැටුප ප්‍රමාණවත් නොවීම, වැඩකරන අතරවාරයේ දී සිදු වන්නා වූ අනතුරු සඳහා වන්දි මුදලක් නොලැබීම, දිනට නියමිත දළු ප්‍රමාණය කැඩීමට නොහැකි වූ විට වැඩ කළ කාලය වරුවක් ලෙස සටහන් වීම (එක් පුද්ගලයෙකු විසින් දළු කිලෝ ග්‍රෑම් 18ක් කැඩිය යුතුවේ. එක කිලෝවක් හෝ අඩු වූ විට වැඩ කළ කාලය වරුවක් ලෙස සටහන් වේ), නිරන්තරයෙන් බඹර ප්‍රහාරවරට මුහුණ දීමට සිදු වීම, අධික වැසි සහිත දිනයන්හිදී පවා වැඩට යාමට සිදු වීම හේතුවෙන් දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වීම දැක්විය හැකිය.

### 4.5 තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය

ප්‍රස්තාර සටහන 4: තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය ඉහත අංක 4 ප්‍රස්තාර සටහන මගින් නිරූපණය වේ. ඒ අනුව තේ වතු කම්කරුවන්ගෙන් 53% ප්‍රතිශතයක් තේ දළු නෙලීමෙහි නිරතවන බව සමීක්ෂණ දත්ත මගින් අනාවරණය කර ගත හැකිය. 19% ක ප්‍රතිශතයක් තේ ගස් කප්පාදු කිරීමෙහි නිරතවන බව දැකගත හැකිය. එමෙන්ම 21%ක පමණ ප්‍රතිශතයක් තේ දළු ප්‍රවාහනය කිරීම සඳහා ඇසුරුම් කිරීම සිදු කරනු ලබයි.

වතු කම්කරුවන්ගෙන් 20%ක පමණ ප්‍රතිශතයක් නිරත වන්නේ තේ දළු බෑග් එසවීමෙහි ය. එනම් ප්‍රවාහනය සඳහා තේ දළු බෑග් තේ දළු ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගනු ලබන ට්‍රැක්ටර් වෙත පැටවීම මොවුන් විසින් සිදු කරනු ලබයි. 31%ක පමණ වතු කම්කරුවන් ප්‍රමාණයක් වෙනත් කටයුතු වල නිරත වේ. තේ පැළ සඳහා අවශ්‍යය පොහොර යෙදීම, තේ පැළ වටා උදලු ගෑම ආදී වෙනත් කටයුතුවල නිරත වේ. ඉහත ප්‍රස්තාර සටහන ඔස්සේ පැහැදිළි වන තවත් කරුණක් වන්නේ ඇතැම් කම්කරුවන් විසින් එක් කාර්යයක් සඳහා සීමා වී නොසිටින බවයි.

### *4.6 වර්තමානය වන විට තේ කර්මාන්තයේ දියුණු වීම*

*ප්‍රස්තාර සටහන 5: වර්තමානය වන විට තේ කර්මාන්තයේ දියුණු වීම*




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත අංක 5 ප්‍රස්තාර සටහනට අනුව 53%ක ප්‍රතිශතයක් වර්තමානය වන විට තේ කර්මාන්තය දියුණු නොවී ඇති බව සඳහන් කරනු ලබයි. 47%ක ප්‍රතිශතයක් තේ කර්මාන්තය දියුණු වී ඇති බවට පිළිගනී.

තේ කර්මාන්තය දියුණු නොවීමට බලපාන හේතු සාධක ලෙස, තේ කර්මාන්තය තුළ අඩු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කිරීම, ශ්‍රම හිඟතාවයක් මේ වන විට ඇති වී තිබීම (මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ රැකියා අවස්ථාවන් සඳහා වැඩි වශයෙන් වතුකරයේ ජනයා වෙනත් පළාත්වලට සංක්‍රමණය වීමයි), වර්තමානය වන විට අතීතයේ මෙන් නිසියාකාරව නඩත්තු කටයුතු සිදු නොවීම ( කලට වේලාවට පොහොර දැමීම, ගස් කප්පාදු නොකිරීම, ප්‍රමිතියෙන් තොර තේ පැළ වගා කිරීම ආදිය), නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් මේ වන විට තේ කර්මාන්තය පාඩු ලැබීම, ස්වභාවික උවදුරු හේතුවෙන් තේ වගාවන් සඳහා හානි සිදු වීම හඳුනාගත හැකිය.

### *4.7 කයි වර්ග පරීක්ෂාව මගින් විචල්‍යය අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීම*

ගොඩනගා ගන්නා ලද කල්පිතයන් මත පිහිටා කාල් පියර්සන්ගේ කයි වර්ග පරීක්ෂාව මගින් විචල්‍යයන්ගේ ස්වායත්තතාව පරීක්ෂා කිරීම සිදු කරන ලදි. මේ සඳහා 95% විශ්වාස මට්ටම යොදා ගන්නා ලදි. එනම් $\alpha = 0.05$ වේ.

*කල්පිත ගොඩනැංවීම*

$H_0$: විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත වේ.

$H_1$: විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත නොවේ.

*තීරණ නීතිය*

$p < \alpha$ නම් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ.

*වගු අංක 3: කයි වර්ග පරීක්ෂාවේ ප්‍රතිඵල*

| පරීක්ෂාව | | පියර්සන් කයි වර්ග පරීක්ෂා අගය | වෙසෙසියා මට්ටම | කල්පිතය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම |
|---|---|---|---|---|
| 1 | තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවය | 0.000 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. |
| 2 | තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා වයස් කාණ්ඩ අතර ඇති සම්බන්ධතාවය | 0.002 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. |
| 3 | තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර ඇති සම්බන්ධතාවය | 0.988 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. |
| 4 | තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ඔවුන්ගේ මාසික ආදායම අතර ඇති සම්බන්ධතාවය | 0.603 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

### *4.7.1 තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවය*

$H_0$ : තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවයක් නැත.

$H_1$ : තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවයක් ඇත.

තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සඳහා සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව, $x^2 = 58.129$ සහ $p = 0.000$ වේ. එහි දී $p = 0.000 < \alpha = 0.05$ වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එනම් තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකි ය.

### *4.7.2 තේ වතු කම්තරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා වයස් කාණ්ඩ අතර ඇති සම්බන්ධතාවය*

$H_0$: තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ වයස් කාණ්ඩ අතර සම්බන්ධතාවක් නැත.

$H_1$: තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ වයස් කාණ්ඩ අතර සම්බන්ධතාවක් ඇත.

තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා වයස් කාණ්ඩ අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සඳහා සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව, $x^2 = 36.805$ සහ $p = 0.002$ වේ. එහි දී $p = 0.002 < \alpha = 0.05$ වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එනම් තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ වයස් කාණ්ඩ අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකි ය.

### *4.7.3 තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර ඇති සම්බන්ධතාවය*

$H_0$ ፡ තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවයක් නැත.

$H_1$ ፡ තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවයක් ඇත.

තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සඳහා සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව, $x^2 = 3.746$ සහ $p = 0.988$ වේ. එහි දී $p = 0.988 > \alpha = 0.05$ වන බැවින් $H_0$ කල්පිතය පිළිගනී. එනම් තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවයක් නැති බව හඳුනාගත හැකි ය.

### *4.7.4 තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය හා ඔවුන්ගේ මාසික ආදායම අතර ඇති සම්බන්ධතාවය*

$H_0$: තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් නැත.

$H_1$: තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් ඇත.

තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ අධ්‍යාපනය අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම සඳහා සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව, $x^2 = 6.392$ සහ $p = 0.603$ වේ. එහි දී $p = 0.603 > \alpha = 0.05$ වන බැවින් $H_0$ කල්පිතය පිළිගනී. එනම් තේ වතු කම්කරුවන්ගේ රැකියාවේ ස්වභාවය සහ ඔවුන්ගේ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් නොමැති බව හඳුනාගත හැකිය.

## 5. සමාලෝචනය

ඒ අනුව දත්ත විශ්ලේෂණය මගින් මෙසේ නිගමනයන්ට එළඹිය හැකිය. තේ කර්මාන්තය ආශ්‍රිතව තේ වතු කම්කරුවන් හට රැකියා ලබා දීමේ දී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වා ඇති බව හඳුනා ගත හැකිය. මේ හේතුවෙන් අඩු අධ්‍යාපන මට්ටමක් පවතින අයෙකුට පවා රැකියා ලබා ගැනීමේ පහසුවක් සැලසී ඇති බව පසක් වේ. ආර්ථිකය තරමක් දුරට නගා සිටුවා ගැනීම උදෙසා එය යහපත් බලපෑමක් බවට පත් වී ඇති බව නිගමනය කළ හැකිය. තවද, බහුතරයක් තේ වතු කම්කරුවන් ජීවත් වන්නේ ලයින් කාමරවලය. ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ එය 77%කි. ඔවුන් හට මෙම ලයින් කාමර ලබා දී ඇත්තේ කිසිදු මුදලක් අය නොකර ය. එමෙන්ම මෙම නිවාසවල වහල සඳහා 74%ක් ඇස්බැස්ටොස් සෙවිලි යොදා ඇති අතර 87%ක ප්‍රතිශතයක් බිත්ති කපරාරු කර ඇත.

තේ වතු කම්කරුවන් සියල්ලම පාහේ කිසිදු පිරිවැයකින් තොරව තම අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා ජලය සපයා ගැනීම සිදු කර ගනු ලබයි. 97%ක ප්‍රතිශතයක් පොදු ස්ථානයකින් ජල අවශ්‍යතාවයන් සපුරා ගනී. 3%ක ප්‍රතිශතයක් ළිං මගින් ජල අවශ්‍යයතාවයන් සපුරා ගැනීම සිදු කරනු ලැබීම ද  තේ කර්මාන්තය මගින් ඔවුන් හට හිමි වී ඇති යහපත් බලපෑම් අතරට අයත්  වේ. රැකියාවෙන් ලැබෙන ආදායම පිළිබඳව තේ වතු කම්කරුවන්ගේ තෘප්තිමත්භාවය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී වැඩි පිරිසක් මෙම රැකියාවෙන් ලැබෙන ආදායම පිළිබඳව සෑහීමකට පත් නොවන බව හඳුනා ගත හැකිය. ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 67%ක් රැකියාවෙන් ලැබෙන ආදායම පිළිබඳව සෑහීමකට පත් වන්නේ නැත. 31% ප්‍රතිශතයක් ආදායම පිළිබඳව තරමක් දුරට සෑහීමකට පත් වේ. 2%ක පමණ ඉතා සුළු ප්‍රතිශතයක් රැකියාවෙන් ලැබෙන ආදායම පිළිබඳව සෑහීමකට පත් වනු දැකගත හැකිය.

තේ වතු කම්කරුවන්ගේ මාසික වැටුප කම්කරුවන්ගේ කුටුම්භ වියදම් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් තේ වතු කම්කරුවන්ගෙන් 87%ක ප්‍රතිශතයක් වෙනත් ආදායම් මාර්ග සඳහා යොමු වී ඇත. තේ වතු කම්කරුවන් යොමු වී ඇති වෙනත් ආදායම් මාර්ග ලෙස කුලී වැඩ, සත්ත්ව පාලනය හා ගොවිතැන හඳුනාගත හැකිය. 13%ක ප්‍රතිශතයක් වෙනත් ආදායම් මාර්ග සඳහා යොමු වී නොමැත. මෙහි දී තේ වතු කම්කරුවන් මුහුණ දෙනු ලබන ප්‍රධාන දුෂ්කරතාවයන් ලෙස, දිනකට ඔවුන් හට ගෙවනු ලබන වැටුප ප්‍රමාණවත් නොවීම, වැඩකරන අතරවාරයේ දී සිදු වන්නා වූ අනතුරු සඳහා වන්දි මුදලක් නොලැබීම, දිනට නියමිත දළු ප්‍රමාණය කැඩීමට නොහැකි වූ විට වැඩ කළ කාලය වරුවක් ලෙස සටහන් වීම (එක් පුද්ගලයෙකු විසින් දළු කිලෝ ග්‍රෑම් 18ක් කැඩිය යුතුවේ. එක කිලෝවක් හෝ අඩු වූ විට වැඩ කළ කාලය වරුවක් ලෙස සටහන් වේ), නිරන්තරයෙන් බඹර ප්‍රහාරවරට මුහුණ දීමට සිදු වීම, අධික වැසි සහිත දිනයන්හි දී පවා වැඩට යාමට සිදු වීම හේතුවෙන් ඇති වන්නා වූ ගැටලුකාරී තත්ත්වයන් දැක්විය හැකිය.

තේ කර්මාන්තය තුළ අඩු තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කිරීම, ශ්‍රම හිඟතාවයක් මේ වන විට ඇති වී තිබීම (මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ රැකියා අවස්ථාවන් සඳහා වැඩි වශයෙන් වතුකරයේ ජනයා වෙනත් පළාත්වලට සංක්‍රමණය වීමයි), වර්තමානය වන විට අතීතයේ මෙන් නිසියාකාරව නඩත්තු කටයුතු සිදු නොවීම ( කලට වේලාවට පොහොර දැමීම, ගස් කප්පාදු නොකිරීම, ප්‍රමිතියෙන් තොර තේ පැළ වගා කිරීම ආදිය),

නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් මේ වන විට තේ කර්මාන්තය පාඩු ලැබීම, ස්වභාවික උවදුරු හේතුවෙන් තේ වගාවන් සඳහා හානි සිදු වීම, තේ කර්මාන්තය ආශ්‍රිතව පවතින්නා වූ ගැටලු වශයෙන් හඳුනාගත හැකි විය. මෙහිදි ඉදිරිපත් කල හැකි යෝජනා ලෙස වතු කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය යහපත් කරලීම උදෙසා සුදුසු වැඩපිළිවෙළක් සම්පාදනය කිරීම සඳහා රජය මූලිකත්වයෙන් කටයුතු සම්පාදනය කිරීම, තේ වතු කම්කරුවන්ගේ වැටුප් සාධාරණ මුදලකින් වැඩි කර දීම සඳහා කටයුතු කිරීම, ඔවුන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවා ගැනීම උදෙසා ඉඩම් හිමිකිරිත්වය ද බලපාන බැවින් ඒ සඳහා වැඩ කටයුතු සම්පාදනය කිරීම, තේ වතු කම්කරුවන්ගේ ගැටලු සඳහා උපකාරක වැඩසටහන් ක්‍රියාත්ම කිරීම, දැනට පවතින තේ කර්මාන්තශාලා අලුත්වැඩියා කටයුතු නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම උදෙසා ක්‍රියා පටිපාටියක් සැකසීම සහ රාජ්‍ය අනුග්‍රහය මගින් නව තේ කර්මාන්ත ශාලා මෙරට ස්ථාපිත කිරීම හරහා දියුණු තාක්ෂණික ක්‍රම ඔස්සේ මෙරට තේ නිෂ්පාදනයන් සිදු කිරීමට කටයුතු සම්පාදනය කිරීම දැක්විය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආර්ථික විමසුම. (2001). මහජන බැංකු පර්යේෂණ අංශය , කොළඹ.

ජයවර්ධන, සරත්චන්ද්‍ර (2008). ඔසු ගුණ පිරි තේ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

දිසානායක, ඩී. එම්. කේ. (2010). *ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය- තේ වගාවේ ඉතිහාසය, වර්තමානය හා අනාගත ප්‍රවණතා.* භූගෝලවිද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.

රත්නායක, එච්. පී. එන්. එන්. (2016). *වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා සහ ආර්ථිකමය බලපෑම.*

වාර්ෂික කාර්යය සාධන වාර්තාව. (2018). වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, සෙත්සිරිපාය දෙවන අධියර, බත්තරමුල්ල.

විද්‍යාරත්න, ඒ. (2001). *ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය තුළ කුඩා තේ වතු අංශයේ දායකත්වය පිළිබඳ විග්‍රහය.* කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය. (2014). *වාර්ෂික වාර්තාව 2014.* කොළඹ 03.

Sinnathamby< M., & Vijesandirana, S. (2018). *Living Wage foor the Sri Lankan Tea Estate Workers.* Kandy Sri Lanka: Institute of Social Development.

# ඇඟලුම් කර්මාන්තවල සේවකයන්ගේ ආර්ථික තත්ත්වයට කොවිඩ්-19 හි බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (ග්‍රාමීය අංශ ඇසුරෙන්)

ඩබ්. එම්. එස්. එස්. මැණිකේ

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
sriyanim818@gmail.com

***සංක්ෂේපය***

*ඇඟලුම් කර්මාන්තවල සේවකයන්ගේ ආර්ථික තත්ත්වයට කොවිඩ්-19 හි බලපෑම පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කළ අතර අධ්‍යයන ගැටලුව වූයේ කොවිඩ්-19 වෛරසය හේතුවෙන් ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ පවුල්වලට හා සේවක සේවිකාවන්ට ආර්ථිකමය වශයෙන් සිදු වූ බලපෑම් මොනවා ද යන්න හඳුනා ගැනීමයි. මෙහි අරමුණ වූයේ කොවිඩ්-19 වෛරසය නිසා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ පවුල්වලට සිදු වූ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීමයි. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ස්තෘත නියැදි ක්‍රමය යටතේ 91 ක නියැදියක් තෝරා ගත් අතර දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කර ඇත. ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව, බහුගුණ ප්‍රතිපායනය, යුගල T පරීක්ෂාව වැනි දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගෙන තිබේ. කොවිඩ්-19 හේතුවෙන් පනවා තිබූ ඇඳිරි නිතී සමයේ කුටුම්භ පරිභෝජනය කෙරෙහි බලපාන සාධක ලෙස ඇඳිරි නිතී සමයේ පවුලේ මාසික ආදායම, ප්‍රාදේශිය තත්ත්වය, ඇඳිරි නීති සමයේ රජය මගින් ලබා දුන් ආධාර හා යැපුම් සමාජිකයන් ගණන ආදී සාධක බලපා ඇති බව හඳුනා ගත හැකි විය. කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප්වල මධ්‍යන්‍යය රු. 22,033/= ක් ද ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු මධ්‍යන්‍යය රු. 15,038/= ක් දක්වාත් කොවිඩ්-19 වෛරසයට පෙර පවුල්වල සමස්ත ආදායම මධ්‍යන්‍යය රු. 45,874/= ක් සිට ඇඳිරි නීති සමයේ පවුවල් සමස්ත ආදායමේ මධ්‍යන්‍යය රු. 12,148/= ක් දක්වා පහත වැටී තිබේ. එමෙන්ම කොවිඩ් - 19 හේතුවෙන් 8.8 % කට සිය රැකියාව අහිමි වී තිබෙන අතර 6.6% ක් ප්‍රවාහන පහසුකම් අහිමි වීම, වැටුප් අඩු කිරීම සහ අනෙකුත් පහසුකම් අහිමි වීම හේතුවෙන් සිය කැමැත්තෙන්ම රැකියාවෙන් ඉවත් වී තිබේ. ශ්‍රී ලංකාවටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීති පැන වූ සමයේ බොහෝ පිරිසකට තම දෛනික කටයුතු පවත්වා ගෙන යාමට හැකියාවක් ලැබී නොමැති අතර රජය විසින් ලබා දුන් ආධාර මුදල් ඔවුන්ට විශාල පිටුවහලක් වී තිබේ.*

***මුඛ්‍ය පද : ඇඟලුම් කර්මාන්ත, සේවක සේවිකාවන්, කොවිඩ් - 19, ආර්ථික තත්ත්වය***

## 1. හැඳින්වීම

ගෝලීය ආර්ථිකයේ කුළුණක් ලෙස ඇඟලුම් අංශය හඳුන්වන අතර වසර ගණනාවක් පුරා බොහෝ රටවල කාර්මීකරණයේ පළමු අදියර ඇඟලුම් කර්මාන්තයයි. ශ්‍රී ලංකාව ද කාර්මීකරණයට පෙළඹවීමේ මූලික පියවර වශයෙන් ඇඟලුම් කර්මාන්තයට යොමු වී තිබේ (Fonseka, 2004).

ශ්‍රී ලංකාවේ පැරණිතම කර්මාන්තය ලෙස පේෂ කර්මාන්තය හැඳින්විය හැකිය. විජය කුමරු සහ පිරිස තම්බපන්නියට ගොඩ බසින විට කුවේණිය කපු කෙටීමේ කාර්යයේ නිරත වී සිටි බව මහවංශයේ සඳහන් වේ. ක්‍රි. ව. 1148 දී පරාක්‍රමබාහු රජතුමා විසින් එක් දිනයක් තුළ කපු නෙලා පඩු පොවා රෙදිවියා එදිනම සිවුරු 80 ක් පූජා කළ බව ද මහ වංශයේ සඳහන් වේ (හෙට්ටිආරච්චි, 1994). ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉතා දියුණු රෙදිපිළි කර්මාන්තයක් තිබූ බව හෙළි වේ. ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ ඇඟලුම් පැවතියත් එය කර්මාන්ත ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය වීම අරම්භ වන්නේ 1960 දශකයේ සිටයි. ඉන් පසු 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ ශීඝ්‍රයෙන් වර්ධනය විය (Kelegama, 2004). මෙලෙස වර්ධනය වූ කර්මාන්තශාලා මඟින් ගම්බඳ රැකියා අහිමි බොහෝ තරුණ තරුණියන්ට රැකියා අවස්ථා හිමි වූ අතර ඇඟලුම් ලෝක වෙළෙඳපළට අපනයනය කිරීම මඟින් ලබන ආදායම ශ්‍රී ලංකාවේ සරු ආදායම් මාර්ගයක් බවට පත්විය. නාගරික ප්‍රදේශවල ඇඟලුම් කර්මාන්තවලින් උපයන අපනයනයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දක්වන්නේ විශාල දායකත්වයකි. එමෙන්ම විශාල තරුණ තරුණියන් පිරිසකට රැකියා අවස්ථා උදාකර දී තිබේ. කෙසේ වෙතත් ග්‍රාමීය ප්‍රදේශවල ද වර්තමානය වන විට ඇඟලුම් කර්මාන්ත ආශ්‍රයෙන් විශාල වර්ධනයක් අත්කර ගනිමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් දිවයින පුරා ඇඟලුම් කර්මාන්ත බිහිවීම දක්නට ලැබේ (හෙට්ටිආරච්චි, 1994). වර්තමානය වන විට සමස්ත ලෝකයටම බලපා ඇති Covid 19 වෛරසය හේතුවෙන් ශ්‍රී ලාංකාවේ පමණක් නොව අනෙකුත් රටවල්වල ද සමස්ත ආර්ථිකය කඩා වැටී තිබේ. ඒ අනුව ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයට ද එහි සේවක සේවිකාවන්ගේ ජන ජීවිතයට බලපෑම එල්ල වී තිබේ. මෙම වෛරස තත්ත්වයත් සමඟ රටේ සියලුම ඇඟලුම් කර්මාන්ත වසා දැමීමට සිදු වූ අතර ඉන් පසු රට නැවත විවෘත වුවත් බොහෝ ඇඟලුම් සේවක සේවිකාවන්ට තම රැකියාව පවා අහිමි වී තිබේ.

වර්තමානය වන විට කොවිඩ් - 19 හේතුවෙන් ඇඟලුම් ක්ෂේත්‍රයේ ගැටලු රැසක් ඇති වී තිබෙන අතර එම අංශයේ සේවයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ ජන ජීවිතය ද විශාල කඩා වැටීමකට ලක්ව තිබේ. ඔවුන්ගේ ආර්ථික තත්ත්වය පහත වැටී ඇති අතර ඒ තුළින් එම පවුල්වල සමාජිකයන්ට ද එහි බලපෑම එල්ල වී තිබේ. ඇඳිරි නීති සමයේ වැටුප් හා දීමනා කිසිවක් නොමැතිව අන්ත අසරණ තත්ත්වයකට පත් වීමට ඔවුන්ට සිදු වී තිබේ. සමහර පවුල්වල පවුලේ එකම ශක්තිය ඇඟලුම් කර්මාන්තයේ නියුතු සේවක සේවිකාවන් වන අතර ඔවුන්ට සිය වැටුප පවා අහිමි වූ තැන මහත් අපහසුවකට ලක් වේ. එපමණක් නොව කොවිඩ් 19 න් වලින් පසු නැවත ශ්‍රී ලංකාව විවෘත වුවත් ඇඟලුම් කර්මාන්තවල නිරත වු සමාජික සමාජිකාවන්ගේ රැකියා පවා අහිමිව ගොස් ඇත. ආනයන, අපනයන සීමාවන් හේතුවෙන් ඇඟලුම් නිෂ්පාදන සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය අපනයනය ද සීමා වී ඇති අතර මෙරට නිෂ්පාදිත රෙදිපිළි හා ඇඟලුම් ආනයනය ද සිමා වී තිබේ. එබැවින් ඇඟලුම් කර්මාන්තවල නිෂ්පාදනය ද සීමා සහිත වීම හේතුවෙන් එහි සේවක සේවිකාවන්ට වැටුප් ගෙවීමට තරම් වත්කමක් ඇඟලුම්හිමියන්ට නොවීම බොහෝ සේවක සේවිකාවන්ට තම රැකියාව අහිමි කර තිබේ.

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ COVID 19 වෛරසය නිසා ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ පවුල්වලට සිදු වූ ආර්ථික බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

ඇඟලුම් කර්මාන්තයේ කාන්තාවන්ගේ ජීවිත කෙරෙහි Covid 19 හි බලපෑම පිළිබඳ අධ්‍යනයක් Demeke, Hardy, Kagy, Meyer සහ Witte යන අය විසින් සිදු කර ඇති අතර එහි මූලික අරමුණ වී ඇත්තේ Covid 19 වෛරසය හේතුවෙන් ඇඟලුම් සේවකයන්ගේ ජීවිතය වෙනස් වන ආකාරය අධ්‍යයනය කිරීමයි. මෙහිදී ඉතියෝපියාවේ හවාසා නගරයේ විශාලතම කාර්මික උද්‍යානයේ ඇඟලුම් කර්මාන්තශාලාවල සේවකයින් 4600 කගේ නියැඳියක් තෝරා ගෙන ඇති අතර ඒ අතරින් 3163 ක්ම කාන්තාවන් වී තිබේ. එබැවින් නියැඳීයෙන් 90% ක් ම කාන්තාවන් වන බැවින් මෙම අධ්‍යනයේ දී කාන්තාවන් පිළිබඳ අවධානය යොමු කර තිබේ. දුරකථන මාර්ගයෙන් සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කර තිබේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රතිචාර දැක්වූ දත්තදායකයින්ගේ 56% ක් ඒ වන විට ඇඟලුම් කර්මාන්ත තුළ සේවය කරන අතර 24% ක් වැටුප් සහිත නිවාඩු ලබා තිබේ. රැකියා අවස්ථා අහිමි වූ බොහෝ අය වෙනත් ජීවනෝපාය මාර්ගයක් සොයමින් සිටින අතර  කිසිවෙකුටත් වෙනත් රැකියාවක් සොයා ගැනීමට හැකි වී නොමැත. බොහෝ දෙනෙකු නැවත හවාසා කාර්මික උද්‍යානයේ සේවයට කැඳවන තෙක් බලා සිටී. රැකියා අහිමි වූ අයගෙන් 81% ක් ම නැවත සිය රැකියාවට යාමට කැමැත්තෙන් මග බලා සිටී. ආහාර හිඟතාවය ඉහළ මට්ටමක පවතින අතර ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 40-60 අතර ප්‍රමාණයක් සතියක සිට තමන්ට ප්‍රමාණවත් ආහාර නොමැතිවීම හේතුවෙන් කනස්සල්ලෙන් සිටී. බොහෝ පිරිසක් වයස අවුරුදු 21-22 වයස් කාණ්ඩයේ වන අතර ප්‍රතිචාර දැක්වූ පිරිසෙන් 8% ක් වැනි සුළු පිරිසක් විවහා දිවියක් ගත කරන අතර ආහාර මිල හා කුලී ගෙවීම් ද ඉහළ මට්ටමක පවතින අතර ඉතිරි කිරීම් ශූන්‍ය මට්ටමට පත්ව තිබේ. Covid 19 වෛරසය පිළිබඳව ඔවුන් හොඳින් දැනුවත් වී කටයුතු කරන ආකාරය ද මෙම අධ්‍යනයෙන් හඳුනා ගෙන තිබේ (Demeke et al., 2020).

ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ආසියොවේ හා පැසිෆික් කලාපයේ ඇඟලුම් කම්කරුවන්ට සහ කර්මාන්තශාලාවලට සිදුව ඇති බලපෑම පිළිබඳ අධ්‍යනයක් සිදු කර තිබේ. මෙහිදී බංග්ලාදේශය, කාම්බෝජය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මියන්මාරය, පාකිස්ථානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, වියට්නාමය යන ප්‍රධාන වශයෙන් ඇඟලුම් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් කෙරෙහි අවධානය යොමු කර තිබේ. 2020 මුල් භාගයේ දී ඇඟලුම් වෙළෙඳාම් සියල්ලම පාහේ බිඳවැටී ඇති අතර අපනයනය 70% කින් පහත වැටී ඇති බව මෙම අධ්‍යනයෙන් සොයා ගෙන ඇත. බොහෝ ඇඟලුම් කම්කරුවන්ට සති 2-4 අවම වශයෙන් හෝ වැඩ අහිමි වී තිබෙන බවත් කම්කරුවන් පස් දෙනෙකුගෙන් තුන් දෙනෙකු පමණක් සේවයට කැඳවා තිබේ. Covid 19 වෛරසයේ අවදානම අවම කර ගැනීමට බොහෝ ඇඟලුම් කර්මාන්ත කටයුතු කරන නමුත් සමහර ඇඟලුම් කර්මාන්තවල එවැනි තත්ත්වයක් හඳුනා ගත නොහැක. සේවයෙන් ඉවත් කර ඇති කම්කරුවන් 40% ක් පමණ 2020 තුන්වන කාර්තුව වන විට නැවත සේවයට වාර්තා නොකරන අතර සේවයට වාර්තා කළ බොහෝ කම්කරුවන්ගේ කම්කරු අයිතිවාසිකම් අහිමි වීමේ අවධානමක පවතී. අධ්‍යනයට ලක් කළ බංග්ලාදේශ දත්ත දායකයන්ගෙන් 72% ක්ම කාන්තාවන් වන අතර කම්කරුවන් වැටුපෙන් 98% ක ප්‍රමාණයක් සෞඛ්‍ය හා ආරක්ෂිත උපකරණ මෙන්ම

ආහාර සඳහා වියදම් කරයි. මේ අතරින් 27% ක් ආහාර සඳහා වියදම් අඩු කිරීම හේතුවෙන් පෝෂණ ඌණතාවයට ලක්ව තිබේ. කර්මාන්තශාලාවල ආහාර හා ප්‍රවාහන පහසුකම් සැපයුම් ද සීමා කර තිබේ. මෙම වෛරසය හේතුවෙන් ජීවිතය පවත්වා ගෙනයාම සඳහා 52% ක් පමණ ණය ලබා ගෙන ඇති අතර තවදුරටත් ඔහුන් ණයවෙමින් පවතින පවත් පෙන්වා දේ (International Labour Organisation -ILO, 2020).

**3. අධ්‍යයන ක්‍රමවේදය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ඇඟලුම් කර්මාන්ත අතරින් ග්‍රාමීය වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කෙරෙහි මෙහිදී අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්ත ව්‍යාප්තිය දෙස අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමිනි. බස්නාහිර පළාත හැරුණු විට අනෙකුත් සෑම පළාතකම ග්‍රාමීය වශයෙන් ඇඟලුම් කර්මාන්ත ක්‍රියාත්මක වේ. එබැවින් පහසු නියැදීමට අනුව රත්නපුර දිස්ත්‍රික්කය තෝරා ගන්නා ලදී. ඒ අනුව මෙම අධ්‍යනයේ සංගහන රාමුව රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවන්ය. රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ඇඟලුම් කර්මාන්තවල සේවක සේවිකාවන් නියෝජනය වන ආකාරයට සසම්භාවී නියැදී ක්‍රමයක් වන ස්තෘත නියැදි ක්‍රමය හෙවත් ස්ථරගත නියැදිය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ඇඟලුම් කර්මාන්ත කර්මාන්ත වර්ගීකරණය පිළිබඳ අවධානය යොමු කරමින් ස්ථර දෙකකට කොටස් කරන ලදී. එනම් සුළු හා මධ්‍ය පරිමාණ ඇඟලුම් කර්මාන්ත සහ මහා පරිමාණ ඇඟලුම් කර්මාන්ත වශයෙනි.

මෙම ස්ථර දෙකෙන් එක් ඇඟලුම් කර්මාන්තය බැගින් සරල සසම්භාවීව ඇඟලුම් කර්මාන්ත දෙකක සේවක සේවිකාවන් නියැඳිය වශයෙන් තෝරා ගන්නා ලදී. ඒ අනුව නියැඳිය වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය නියෝජනය වීමට අයගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ඔරිට් ඇපරල් පුද්ගලික සමාගමේ සේවකයන් ද මහා පරිමාණ ඇඟලුම් කර්මාන්ත අංශය නියෝජනය වීමට කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රීගල් කැලිබර් පුද්ගලික සමාගමේ සේවකයන් ද තෝරා ගන්නා ලදී.


නියැදි ප්‍රමාණය තීරණය කිරීමේ දී සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ සේවකයන් 91 කට අයත් පවුල් නියැඳිය වශයෙන් තෝරා ගනු ලබයි. මෙම පර්යේෂණය ප්‍රාථමික හා ද්වීතියික දත්ත පදනම් කරගෙන පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරිම සඳහා යොදාගත් මූලාශය වූ අතර සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද මේ සඳහා යොදා ගන්නා ලදී. පර්යේෂණය සඳහා අවශ්‍ය ද්වීතීයික දත්ත රැස් කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා, ලිපි ලේඛණ, අන්තර්ජාල හා මාධ්‍ය වාර්තා, පර්යේෂණ මාර්තෘකාවට අදාළ ග්‍රන්ථ, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සතු සම්පත් පැතිකඩෙහි වාර්තා, ආශ්‍රයෙන් පරීක්ෂණය සිදු කරයි. රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම, බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව සහ යුගල T පරීක්ෂාව (Paired T test) ආදී දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගනු ලබයි. ඒ සඳහා SPSS ( Statistical package for social sciences ) හා Excel යන පරිගණක මෘදුකාංග භාවිත කරනු ලබයි.

## 4. දත්ත විශ්ලේෂණය

### 4.1 ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු

ප්‍රස්තාර සටහන 4-1 ට අනුව ග්‍රාමීය ඇඟලුම් කර්මාන්ත කේෂත්‍රයේ නිරත වන ස්ත්‍රී සේවා නියුක්ති ප්‍රමාණය 76% ක් වන අතර පුරුෂ සේවා නියුක්ති ප්‍රමාණය 24%ක් වශයෙන් වාර්තා වේ.


*ප්‍රස්තාර සටහන 4-1 : සේවක සේවිකාවනගේ ස්ත්‍රී පුරුෂ භාවය*




මූලාශ්‍රයः සමීක්ෂණ දත්ත (2020)

ග්‍රාමීය ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන සේවක සේවිකාවන ජීවත් වන ප්‍රදේශිය තත්ත්වය පිළිබඳ විමසීමේ දී ග්‍රාමීය අංශය සහ වතු අංශය වශයෙන් හඳුනා ගත හැකි විය. ප්‍රස්තාර සටහන 4-2 ට අනුව ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගෙන් 74% ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙන් වාර්තා වන අතර 26% ක ප්‍රමාණයක් වතු අංශයෙන් වාර්තා වේ.

*ප්‍රස්තාර සටහන 4-2 : සේවක සේවිකාවන් අයත් ප්‍රදේශය*





මූලාශ්‍රයः සමීක්ෂණ දත්ත (2020)

## 4.2 කොවිඩ්-19 වෛරසය හේතුවෙන් ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ පවුල්වලට සිදු වූ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම.

කොවිඩ්-19 වෛරසය ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීමත් සමඟ ලංකාවටම ඇඳිරි නීතිය පැනවූ අවස්ථාවේ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන් විශාල ආර්ථිකමය ගැටලු රැසකට මුහුණ දීමට සිදු වී තිබේ. එහිදී රජය විසින් රුපියල් 5000 ක දීමනාවක් එක් මාසයකට ලබා දෙන ලදී. එහිදී එම ආධාර මුදල් ලබා ගත් ප්‍රතිශතය පහත පරිදි වේ.

*ප්‍රස්තාර සටහන 4-3 : ඇඳිරි නීතී සමයේ රාජ්‍ය ආධාර ලබා ගැනීම.*





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත (2020)

ශ්‍රී ලංකාවටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීති පැන වූ සමයේ බොහෝ පිරිසකට තම දෛනික කටයුතු පවත්වා ගෙන යාමට හැකියාවක් නොලැබුණි. එහිදි රජය විසින් මසකට රුපියල් 5,000/= ක දීමනාවක් ලබා දෙන ලදී. මෙහිදී මාස දෙකක් සඳහා එම දීමනාව හිමි වූ අතර *ප්‍රස්තාර සටහන 4-3* ට අනුව එම දීමනාව හිමි වූ සේවක සේවිකාවන්ගේ ප්‍රතිශතය 86.81% ක් වන අතර 13.19% කට එම දීමනාව ලැබී නොමැත. බොහොමයක් සේවක සේවිකාවන්ට ඇඳිරි නීති සමයේ කිසිදු ආදායම් මාර්ගයක් ලැබී නොමැති අතර ඔවුන් ජීවත් වී තිබෙන්නේ රජය විසින් ලබා දුන් ආධාර මුදල් හේතුවෙනි. එක් සේවිකාවක් ප්‍රකාශ කර සිටියේ "මගේ තාත්තා අසනීපයෙන් ඉන්නේ. අම්මා කුලියට දළු කඩනවා. මල්ලි තාමක් පොඩියි. මගේ පඩියෙන් තමා ගෙදර අය මං ජීවත් කරන්නේ. මාර්තු මාසයේ භාගයක් වැඩ කළ නිසා ඒ මාසෙම පඩිය ලැබුණා. ආයේ රැකියාවට එනකම් කිසිම දීමනාවක් අපිට ලැබුණේ නැහැ. රජයෙන් ලබා දුන්න සහනයත් තාත්තා අමාරුවෙන් කුලී වැඩ කරපු නිසා තමයි අපි තාමත් ජීවත් වෙන්නේ" යැයි ඇය පැවසීය.

ඇඳිරි නීතිය ඉවත් කිරීමෙන් පසු ක්‍රමක්‍රමයෙන් ඇඟලුම් කර්මාන්ත යථා තත්ත්වයට පත් විය. නමුත් කොවිඩ් - 19 හේතුවෙන් බොහෝ සේවක පිරිසකට තම රැකියාව අහිමි විය. *ප්‍රස්තාර සටහන 4-4* ට අනුව ඇඳිරි නීතියෙන් පසු 84.6% ක් නැවතත් එම ආයතනවල සේවයට වාර්තා කර තිබෙන අතර 8.8% කට සිය රැකියාව අහිමි වී තිබේ. 6.6% ක් සිය කැමැත්තෙන්ම රැකියාවෙන් ඉවත් වී තිබේ.


ප්‍රස්තාර සටහන 4-4 : ඇඳීරි නිතීයෙන් පසු සේවක සේවිකාවන්ගේ රැකියාවේ තත්ත්වය




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

මෙහිදී ඇඟලුම් කර්මාන්ත අංශයේ රැකියාවල නිරත වූ සේවක සේවිකාවන් රැකියාවෙන් ඉවත් කිරීමට බලපෑ හේතු පිළිබඳ විමසීමේ දී පහත හේතු සාධක බලපා තිබේ.

*ප්‍රස්තාර සටහන 4-5 : රැකියාවෙන් ඉවත් කිරීමට බලපෑ හේතු සාධක*





මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

*ප්‍රස්තාර සටහන 4-5* ට අනුව ලබා ගත් දත්තවලට අනුව ආධුනික වීම නිසා රැකියාවෙන් ඉවත් කිරීම ප්‍රතිශතයක් වශයෙන් 25% ක් ලෙස දැක්විය හැක. ඒ අනුව කොවිඩ්-19 හේතුවෙන් රැකියාවට පැමිණ මාස 3 ක් නොඉක්මවූ පුද්ගලයන් රැකියාවෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබේ. එමෙන්ම වයස අවුරුදු 50 ඉක්ම වූ පුද්ගලයන් ද රැකියාවෙන් ඉවත් කර තිබෙන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 62% කි. එමෙන්ම දීර්ඝ කාලයක් රැකියාවේ නිරත වීම එනම් වසර 5 කට ආසන්න කාලයක් සේවය කළ පුද්ගලයන් ද රැකියාවෙන් ඉවත් කර තිබේ. එය 13% ප්‍රතිශතයකි. දීර්ඝ කාලයක් එනම් වසර පහකට ආසන්නව සේවය කළ සේවකයින් රැකියාවෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර සේවකයන් චෝදනා කරනු ලබන්නේ වසර පහකට වඩා සේවය කිරීමෙන් ලබා දිය යුතු දීමනාවන් ලබා දීමට සිදුවන නිසා මෙවැනි ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙන බවයි.

එසේ දීර්ඝ කාලයක් ආරක්ෂක සේවා තනතුරේ සේවය කළ සේවකයෙකු ප්‍රකාශ කර සිටියේ "ඇඳිරි නීති සමයේ ද මම සේවයට වාර්තා කළ අතර මෙම ආයතනයේ වසර 5 ට ආසන්න කාලයක් සේවය කළා. ඒත් නැවත කර්මාන්තශාලාව තුළ වැඩ ආරම්භ කළත් මට රැකියාව අහිමි වුණා. ඔවුන් පැවසුවේ කොවිඩ් නිසා විශාල සේවකයන් පිරිසක් සේවයට වාර්තා නොකරන නිසා ඉවත් කළ බව. මගේ සේවා කාලයට වඩා අඩු කාලයක් සේවය කළ අය එම ආයතනයේ තවමත් සේවය කරනවා. රැකියාව අහිමි වීම නිසා මාස දෙකක පමණ කාලයක් රැකියාවක් නොමැතිව හිටියා. ඉන් පසු මම සේවය කළ ආයතනය විසින් මා හට වෙනත් ඇඟලුම් කර්මාන්ත ශාලාවක ආරක්ෂක තනතුර සඳහා යොමු කළා. එම ආයතනයේ පඩි ගොඩක් අඩුයි. වෙනත් රැකියාවක් ලැබෙන තෙක් මෙම ආයතනයේ සේවය කරන්න තීරණය කළා." බවයි. රැකියාවෙන් ඉවත් කළ තවත් සේවිකාවක් ප්‍රකාශ කර සිටියේ ඇය වසර 6 ක් ආරක්ෂක අංශයේ සේවය කළ බවත් ඇයට රැකියාව අහිමි වූ බවත් ය. ඇය ආයතනයෙන් නිරන්තරයෙන් නැවත සේවයට බඳවා ගන්නා ලෙස ඉල්ලීම් කිරීම හේතුවෙන් නවක සමාජිකාවක් ලෙස ආපනශාලාවේ සේවයට ඇතුළත් කර තිබේ. වැටුප් ඉතාමත් අඩු බවත් සැමියාට රැකියාවක් නොමැති වීම නිසාත් දරුවන් තුන් දෙනා නිසාත් එම රැකියාවට පැමිණෙන බව ඇය පැවසීය. එමෙන්ම දීමනා සහ වැටුප් අඩු වීම නිසා බොහෝ සේවකයන් වෙනත් රැකියාවලට ගිය බවත් ආයතනයේ සේවය කිරීමට වඩා කුලී වැඩ කිරීමෙන් ආදායමක් ලබා ගත හැකි බවත් ඇය තවදුරටත් අදහස් දක්වමින් පැවසීය.

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන් කොවිඩ්-19 වෛරසය නිසා ආයතනය විසින් රැකියාවෙන් ඉවත් කිරීමට අමතරව ඔවුන් සිය රැකියාවෙන් ඉවත් වීමට ද තීරණය කර තිබේ. ඒ සඳහා ද විවිධ හේතු සාධක බලපා තිබේ.

*ප්‍රස්තාර සටහන 4-6 : රැකියාවෙන් ඉවත්වීමට බලපෑ හේතු සාධක*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

කොවිඩ් - 19 හේතුවෙන් සේවකයන් සිය කැමැත්තෙන්ම සේවයෙන් ඉවත් වීමට තීරණය කර තිබේ. මෙහිදී ඇඳිරි නීතියෙන් පසු කර්මාන්තශාලා නැවත විවෘත වූ පසු වැටුප් කප්පාදු කිරීම සහ බොහෝ දීමනාවන් කපා හැර තිබේ. බොහෝ සේවකයන් පිරිසයක් රැකියාවෙන් ඉවත් වීමට තීරණය කර තිබෙන්නේ ප්‍රවාහන පහසුකම් ලබා නොදීම හේතුවෙනි. එය ප්‍රතිශතයක් වශයෙන් 56% කි. දුර බැහැර ප්‍රදේශවල සිට රැකියාවට එන බොහෝ පිරිසක් පොදු ප්‍රවාහන සේවය භාවිත කිරීමට සිදු වීමෙන් විශාල මුදලක් වැය වන

බවත් වැටුප් කප්පාදු කිරීම මෙන්ම අමතර දීමනා කිසිවක් නොලැබීම නිසා ඔවුන්ට වැටුපෙන් ඉතාමත් සුළු මුදලක් ඉතිරි වීම මෙයට හේතු වී තිබේ. එමෙන්ම වැටුප් කප්පාදුව නිසා රැකියාවෙන් ඉවත් වූ පිරිස 44% ක් වන අතර ඉන් සමහර සේවකයන් වෙනත් රැකියාවන් සඳහා යොමු වී තිබේ. රීගල් කැලිබර් පුද්ගලික සමාගමේ සේවිකාවක් ප්‍රකාශ කළේ "අවුරුදු 50 ට වැඩි අය සේවයෙන් ඉවත් කළා. ගොඩක් අය රැකියාවෙන් ඉවත් වුණේ ප්‍රවාහන පහසුකම් නැති නිසා. බස් එක දෙන්නේ නැති නිසා රැකියාවට එන්න ගොඩක් අමාරුයි. තවත් අය දීමනා, පඩි අඩු නිසා රැකියාවෙන් ඉවත් වුණා. ගොඩක් අය වෙන රස්සාවකට යන්නේ නැහැ. අපිටත් ගොඩක් පඩි අඩුයි. අපිට වෙන කරන්න දෙයක් නැති නිසයි රැකියාවට එන්නේ." යැයි ඇය පැවසීය.

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ වැටුප් හිමි වීම සම්බන්ධයෙන් ලබා ගත් දත්ත අනුව කොවිඩ්-19 වෛරසයට පෙර ඔහුන්ගේ වැටුප් මට්ටම සහ ඇඳිරි නීති ඉවත් කිරීමෙන් පසු නැවත රැකියාවට වාර්තා කිරීමෙන් පසු ඔහුන්ගේ වැටුප් පිළිබඳව දත්ත රැස් කරන ලදී. ඒ අනුව *ප්‍රස්තාර සටහන 4-7* ට අනුව කොවිඩ්-19 වෛරස ව්‍යාප්තියට පෙර වැටුප් සහ ඇඳිරි නීතියෙන් පසු වැටුප්වල විචලනයන් දක්වා තිබේ.


*ප්‍රස්තාර සටහන 4-7 : කොවිඩ්-19 වෛරසයට පෙර ආදායම සහ ඇඳිරි නීතියෙන් පසු ආදායම (මාසික ආදායම රුපියල්වලින් )*




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

*ප්‍රස්තාර සටහන 4-7* ට අනුව කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප්වල මධ්‍යන්‍යය රු. 22,033/= ක් වන අතර ඇඳිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප්වල සාමාන්‍යය රු. 15,038/= ක් වේ. පෙර වැටුප්වල උපරිම අගය රු. 40,000/= ක් වන අතර අවම අගය රු. 18,000/= කි. ඇඳිරි නීතියෙන් පසු උපරිම වැටුප් මට්ටම රු. 32,000/= ක් වන අතර රැකියාව අහිමි වීම හේතුවෙන් අවම වැටුප් මට්ටමක්වත් ලබා ගැනීමට හැකියාව ලැබී නොමැත. කොවිඩ්-19 වෛරසයට පෙර සේවකයන්ගේ පවුලේ සමස්ත ආදායම සහ ශ්‍රී ලංකාවටම බල පැවැත්වෙන පරිදි පනවා තිබූ ඇඳිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම පිළිබඳව නියැදි නිරීක්ෂණ මඟින් ලබා ගත් දත්ත *ප්‍රස්තාර සටහන 4-8* මඟින් ඉදිරිපත් කර ඇත.

*ප්‍රස්තාර සටහන 4-8 : කොවිඩ්-19 වලට පෙර පවුලේ සමස්ත ආදායම සහ ඇඳිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම (මාසික ආදායම රුපියල්වලින් )*




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

*ප්‍රස්තාර සටහන 4-8* ට අනුව කොවිඩ්-19 වෛරසයට පෙර පවුල්වල සමස්ත ආදායම මධ්‍යනයය රු. 45,874/= ක් වන අතර ඇඳිරි නීති සමයේ පවුල්වල සමස්ත ආදායමේ මධ්‍යනයය රු. 12,148/= කි. කොවිඩ්-19 වලට පෙර ආදායමේ උපරිම අගය රු. 120,000/= ක් වන අතර අවම ආදායම් මට්ටම රු. 15,000/= ක් වන අතර ඇඳිරි නීති සමයේ පවුලේ උපරිම ආදායම රු. 90,000/= ක් සහ අවම ආදායම් මට්ටම රු. 5000/= දක්වා පහත වැටී තිබේ.

ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන්ගේ කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප හා ඇඳිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප් අතර වෙනස පරීක්ෂා කිරීමට යුගල T පරීක්ෂාව සිදු කරන ලදී.

- ➢ $H_0$ : කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප හා ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප් අතර වෙනසක් නොමැත.
- ➢ $H_1$ : කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප හා ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප් අතර වෙනසක් ඇත.

යුගල T පරීක්ෂාවට අනුව $t = 9.78$ සහ $p = 0.000$ වන අතර $0.000 < 0.05$ බැවින් 5% වෙසෙසියා මට්ටම යටතේ $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එබැවින් කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප හා ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප් අතර වෙනසක් පවතින බව නිගමනය කළ හැක.

ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන්ගේ කොවිඩ්-19 වෛරසයට පෙර පවුලේ සමස්ත ආදායම හා ඇදිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම අතර වෙනස පරීක්ෂා කිරීමට යුගල T පරීක්ෂාව සිදු කරන ලදී.

- ➢ $H_0$ : කොවිඩ්-19 වෛරසයට පෙර පවුලේ සමස්ත ආදායම හා ඇදිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම අතර වෙනසක් නොමැත.
- ➢ $H_1$ : කොවිඩ්-19 වෛරසයට පෙර පවුලේ සමස්ත ආදායම හා ඇදිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම අතර වෙනසක් ඇත.

යුගල T පරීක්ෂාවට අනුව $t = 2.8$ සහ $p = 0.007$ වන අතර $0.007 < 0.05$ බැවින් 5% වෙසෙසියා මට්ටම යටතේ $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එබැවින් කොවිඩ්-19 වෛරසයට පෙර පවුලේ සමස්ත ආදායම හා ඇඳිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම අතර වෙනසක් පවතින බව නිගමනය කළ හැක.

කොවිඩ්-19 වෛරසය ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීමත් සමඟ 2020 මාර්තු මස 20 වන දින ශ්‍රී ලංකාවටම බල පැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය පනවන ලැබූ අතර ඉන් පසු මැයි මස මෙම අඟුළු දැමීම ඉවත් කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වූ සේවක සේවිකාවන්ගේ පවුල්වලට සිදු වූ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා දත්ත රැස් කරනු ලැබීය. ඒ අනුව මෙම ඇඳිරි නීති සමයේ පවුලේ වියදම කෙරෙහි බලපාන ලද සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මඟින් විශ්ලේෂණය සිදු කරන ලදී. එහිදී පරායත්ත විචල්‍ය ලෙස ඇඳිරි නීති සමයේ පවුලේ සමස්ත වියදම යන විචල්‍ය යොදා ගනු ලැබූ අතර ස්වායත්ත විචල්‍ය ලෙස එම කාලය තුළ රජය විසින් ලබා දුන් ආධාර මුදල් ලබා ගැනීම, පවුලේ යැපුම් සාමාජිකයන්, ඇඳිරි නීති සමයේ පවුලේ ආදායම, කුටුම්භ ස්ථානගත වී ඇති ප්‍රදේශය (ග්‍රාමීය, වතු) සහ ගෘහ මූලිකයාගේ ස්ත්‍රී පුරුෂභාවය යන විචල්‍යය යොදා ගනු ලැබීය. මෙහිදී බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා රැස් කරනු ලැබූ දත්තවල බහුඒකරේඛීයතාවය සහ විෂමප්‍රවිචලතාවය යන ගැටලු පවතී ද යන්න පරීක්ෂා කිරිමක් සිදු කරන ලදී.

පරිදි ඇස්තමේන්තු කරන ලද ආකෘතියේ අනුසීහුමේ හොඳකම පරීක්ෂා කරන ලදී. ඒ අනුව නිර්ණන සංගුණකයේ අගය 0.993 වන බැවින් මෙම ආකෘතිය මඟින් පරායත්ත විචල්‍යයේ මුළු විචලනයෙන් 99% ක් ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපායන ආකෘතිය මඟින් විස්තර කෙරේ. ඒ අනුව සමස්ත වෙසෙසියාව පරීක්ෂා කිරීමේ දී $F = 2443.88$ වන අතර $P = 0.000$ වේ. ඒ අනුව $P = 0.000 < 0.05$ බැවින් 5% වෙසෙසියා මට්ටම යටතේ $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එබැවින් ආකෘතියේ සමස්ත වෙසෙසියාව සංඛ්‍යානමය වශයෙන් විශ්වසනීය බව නිගමනය කළ හැකිය.

කොවිඩ්-19 හේතුවෙන් ලංකාවටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීති පැනවූ කාල වකවානුව තුළ පවුලේ වියදමේ සාමාන්‍ය අගය හෙවත් මධ්‍යන්‍යය රු. 11,681/= ක් වන අතර පවුලේ සමස්ත ආදායමේ මධ්‍යන්‍යය රු. 12,148/= කි. යැපුම් සාමාජිකයන්ගේ සාමාන්‍ය 3 කි. ඇඳිරි නීතී සමයේ ඇඟලුම් කර්මාන්ත සේවකයන්ගේ පවුල්වලට සිදු වූ බලපෑම විශ්ලේෂණය කිරීම සඳහා නියැඳි දත්ත ආශ්‍රයෙන් ගොඩනංවන ලද බහුගුණ ප්‍රතිපායන ආකෘතිය පහත පරිදි වේ.

$$Y = \beta_0 + \beta_1 x_1 + \beta_2 x_2 + \beta_3 D_3 + \beta_4 D_4 + \beta_5 D_5 + e_i$$

$Y$ = ඇඳිරි නීති සමයේ පවුලේ මාසික වියදම

$X_1$ = ඇඳිරි නීතී සමයේ පවුලේ සමස්ත ආදායම

$X_2$ = පවුලේ යැපුම් සාමාජිකයන් ගණන

$D_3 =$ { රජයේ ආධාර ලබා ගත්තේ නම්
එසේ නොවේ නම්

$D_4 =$ { කුටුම්භ ස්ථානගත වී ඇති ප්‍රදේශය වතු නම්
එසේ නොවේ නම්

$D_5 =$ { ගෘහ මූලිකයා පුරුෂ නම්
එසේ නොවේ නම්

මෙම ආකෘතියේ පදනම් ප්‍රවර්ගය වන්නේ රාජ්‍ය ආධාර ලබා නොගැනීම, ග්‍රාමීය අංශය සහ ගෘහ මූලිකයා ස්ත්‍රී කුටුම්භ වේ. ඇස්තමේන්තු කරන ලද බහුගුණ ප්‍රතිපායන ආකෘතිය පහත පරිදි වේ.

$$\hat{Y} = 5318.31 + 0.832 X_1 - 282.671X_2 - 1942.620D_3 - 640.161D_4 - 95.936D_5$$

$$P = (0.000) \quad (0.000) \quad (0.003) \quad (0.000) \quad (0.000) \quad (0.457)$$

ඇස්තමේන්තු කරන ලද ඉහත ආකෘතියේ P අගය අනුව $D_5$ විචල්‍යයේ සංගුණකය හැර අනෙකුත් සියලුම සංගුණක 5% වෙසෙසියා මට්ටමින් සංඛ්‍යානමය වශයෙන් විශ්වසනිය වේ. $D_5$ විචල්‍යයේ සංගුණකය සංඛ්‍යානමය වශයෙන් විශ්වසනීය නොවන නිසා ස්ත්‍රී ගෘහමූලික කුටුම්භ හා පුරුෂ ගෘහමූලික කුටුම්භ අතර ඇඳීරි නීති සමයේ මාසික පරිභෝජන වියදමේ සංඛ්‍යානමය වශයෙන් වෙනසක් නැත. අනෙකුත් ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට පරායත්ත විචල්‍ය කෙරෙහි බලපාන වෙනත් සාධක $\beta_0$ මඟින් අර්ථ දැක්වේ. මෙම අගය පදනම් ප්‍රවර්ගයේ ඇස්තමේන්තු කළ අගය ද වේ. ඒ අනුව ඇඳීරි නිතී සමයේ රාජ්‍ය ආධාර ලබා නොගත් කුටුම්භවල සාමාන්‍යය මාසික පරිභෝජන වියදම ආසන්න වශයෙන් රු. 5,318/= කි. ඇඳීරි නීති සමයේ රාජ්‍ය ආධාර ලබාගත් කුටුම්භවල සාමාන්‍යය මාසික පරිභෝජන වියදම ආසන්න වශයෙන් රු. 3,376/= කි. ග්‍රාමීය අංශයේ කුටුම්භවල සාමාන්‍යය මාසික පරිභෝජන වියදම රු. 5,318/= වන අතර වතු අංශයේ කුටුම්භවල සාමාන්‍යය මාසික පරිභෝජන වියදම රු. 4,678/= කි.

$\beta_1$ මඟින් අර්ථ දැක්වෙන්නේ ඇඳීරි නීති සමයේ පවුලේ මාසික ආදායම එක් ඒකකයකින් ඉහළ යන විට පරිභෝජන වියදම 0.832 කින් වැඩි වන බවයි. ඒ අනුව ඉහත පරිභෝජන ශ්‍රිතයේ ආන්තික පරිභෝජන හෙවත් බැවුම් සංගුණකය 0.832 කි. $\beta_1$ අගය ධන අගයක් ගන්නා බැවින් ඇඳීරි නීති සමයේ පවුලේ මාසික වියදම සහ ඇඳීරි නීති සමයේ සමස්ත ආදායම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව හඳුනා ගත හැක. $\beta_2$ මඟින් අර්ථ දැක්වෙන්නේ යැපුම් සාමාජිකයන් එක් ඒකකයකින් අඩු වන විට මාසික පරිභෝජන වියදම ආසන්න වශයෙන් 283 කින් අඩු වන බවයි.

ඇඟලුම් සේවකයන් රැකියාවලින් ඉවත් වීම හෝ රැකියාවෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ආයතන දෙක අතර වෙනසක් පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා කයි වර්ග පරීක්ෂාව සිදු කරන ලදී.

- $H_0$ : රැකියාවෙන් ඉවත් කිරීම හෝ රැකියාවෙන් ඉවත් වීම සම්බන්ධයෙන් ආයතන දෙක අතර වෙනසක් නොමැත.
- $H_1$ : රැකියාවෙන් ඉවත් කිරීම හෝ රැකියාවෙන් ඉවත් වීම සම්බන්ධයෙන් ආයතන දෙක අතර වෙනසක් ඇත.

කයි වර්ග පරීක්ෂණ සංඛ්‍යාතිය ($\chi^2$ = 10.284 , P = 0.006), 0.006 < 0.05 බැවින් 95% මට්ටමේ දී $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එබැවින් රැකියාවෙන් ඉවත් කිරීම හෝ රැකියාවෙන් ඉවත් වීම සම්බන්ධයෙන් ආයතන දෙක අතර වෙනසක් පවතින බව නිගමනය කළ හැක.

## 5. සමාලෝචනය

රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ඇඟලුම් කර්මාන්ත නියෝජනය වන ආකාරයට ස්තෘත නියැදී ක්‍රමය යටතේ රීගල් කැලිබර් පුද්ගලික සමාගම සහ ඔරිට් ඇපරල් පුද්ගලික සමාගම යන ආයතන දෙක අතරින් තෝරා ගත් නියැදී 91 ක් තුළින් මෙම නිගමන කරා එළඹිණි.

කොවිඩ්-19 හේතුවෙන් ලංකාවටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීති පැනවූ කාල වකවානුව තුළ පවුලේ වියදමේ සාමාන්‍ය අගය හෙවත් මධ්‍යනය රු. 11,681/= ක් බවත් පවුලේ සමස්ත ආදායමේ මධ්‍යනය රු. 12,148/= ක් බවත් මෙම අධ්‍යනය තුළින් සොයා ගත හැකි විය. කොවිඩ්-19 වෛරසයට පෙර ඇඟලුම් සේවක සේවිකාවන්ගේ වැටුප හා ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප් අතර වෙනසක් පවතිනවා ද යන්න පරීක්ෂා කිරීමට යුගල T පරීක්ෂාව සිදු කරන ලදී. ඒ අනුව පෙර වැටුප් හා පසු වැටුප් අතර වෙනස පරීක්ෂා කිරීමේ දී මෙම විචල්‍ය දෙක අතර වෙනසක් පවතින බව නිගමනය කළ හැකි විය. කොවිඩ්-19 වෛරසයට පෙර වැටුප්වල මධ්‍යනය රු. 22,033/= ක් වන අතර ඇදිරි නීති ඉවත් කිරීමෙන් පසු වැටුප්වල මධ්‍යනය රු. 15,038/= ක් බවත් පෙර වැටුප්වල උපරිම අගය රු. 40,000/= ක් වන අතර අවම අගය රු. 18,000/= කි. ඇඳිරි නීතියෙන් පසු උපරිම වැටුප් මට්ටම රු. 32,000/= ක් වන අතර රැකියාව අහිමි වීම හේතුවෙන් අවම වැටුපක්වත් ලබා ගැනීමට හැකියාව ලැබී නොමැත.

ඇඟලුම් කර්මාන්ත සේවක සේවිකාවන්ගේ කොවිඩ්-19 වෛරසයට පෙර පවුලේ සමස්ත ආදායම හා ඇඳිරි නීති සමයේ පවුලේ සමස්ත ආදායම අතර වෙනස පරීක්ෂා කිරීමට යුගල T පරීක්ෂාව සිදු කරනු ලැබූ අතර මෙම විචල්‍යය දෙක අතර ද වෙනසක් පවතින බව නිගමනය කළ හැකි විය. කොවිඩ්-19 වෛරසයට පෙර පවුල්වල සමස්ත ආදායමේ මධ්‍යනය රු. 45,874/= ක් සහ ඇඳිරි නීති සමයේ පවුල්වල සමස්ත ආදායමේ මධ්‍යනය රු. 12,148/= ක් බව මෙම අධ්‍යනය තුළින් සොයා ගත හැකි විය. පෙර ආදායමේ උපරිම අගය රු. 120,000/= ක් සහ අවම ආදායම් මට්ටම රු. 15,000/= ක් ලෙසත් ඇඳිරි නීති සමයේ පවුලේ උපරිම ආදායම රු. 90,000/= ක් සහ අවම ආදායම් මට්ටම රු. 5,000/= දක්වා පහත වැටී තිබෙන බව සොයාගත හැකි විය.

එමෙන්ම ශ්‍රී ලංකාවටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීති පැන වූ සමයේ බොහෝ පිරිසකට තම දෛනික කටයුතු පවත්වා ගෙන යාමට හැකියාවක් නො ලැබීම නිසා රජය විසින් මසකට රුපියල් 5000 ක දීමනාවක් ලබා දෙන ලදී. එම දීමනාව හිමි වූ සේවක සේවිකාවන්ගේ ප්‍රතිශතය 87% ක් වන අතර 13% කට එම දීමනාව ලැබී නොමැති බවත් සොයා ගත හැකි විය. ඇඳිරි නීති සමයේ  අත්‍යවශ්‍ය සේවා  වශයෙන් සේවයට වාර්තා කළ පිරිස  4% ක් ද 96% ක ප්‍රමාණයක්  රැකියාවට යාමට නොහැකි වීම හේතුවෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වී තිබෙන බව හඳුනාගත හැකි විය. එබැවින් කොවිඩ්-19 වෛරසයත් සමඟ පවුලේ ආර්ථිකයේ විශාල කඩා වැටීමක් සිදු වී තිබෙන බවත් බොහෝ දෙනෙකුගේ ජීවිතය රජය මඟින් ලබාදුන් ආධාර මත තීරණය වූ බවත් නිගමනය කළ හැකි විය. කොවිඩ් - 19 හේතුවෙන් බොහෝ සේවක පිරිසකට තම රැකියාව අහිමි වී ඇති බවත් ඇඳිරි නීතියෙන් පසු 84.6% ක් නැවතත් එම ආයතනවල සේවයට වාර්තා කර තිබෙන අතර 8.8 % කට සිය රැකියාව අහිමි වී තිබේ. 6.6% ක් සිය කැමැත්තෙන්ම රැකියාවෙන් ඉවත් වී තිබේ. රැකියාව අහිමි වීම නිසාත් රැකියාවෙන් ඉවත් වීමට තීරණය කිරීම නිසාත් ඔවුන්ගේ පවුල්වල ආර්ථිකමය වශයෙන් පහළ බැසීමක් ඇති වී තිබෙන බව නිගමනය කළ හැකි විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


හෙට්ටිආරච්චි, ඒ. අයි. (1994) ශ්‍රී ලංකාවේ ඉතිහාසය, අනුරාධපුර යුගය. අධ්‍යාපන ප්‍රකාශන, දේපාර්තමේන්තුව

Demeke, E., Hardy, M., Kagy, G., Meyer, C. J., & Witte, M. (2020). The impact of covid-19 in the lives of women in the garment industry: Evidence from Ethiopia.

Fonseka , T., & Fonseka, D. (2004). Competitive Strength of the Garment Industry and Planning Process at the Firm Level. Retrieved from https://www.ips.lk/ready-made-garment-industry-in-sri-lanka-facing-the-global-challenge-2/

International Labour Organisation -ILO. (2020). *How COVID-19 is affecting garment workers and factories in Asia and the Pacific".* Clean Cothes Champaign. Retrieved 10 22, 2020, from https://cleanclothes.org/news/2020/live-blog-on-how-the-coronavirus-influences-workers-in-supply-chains

Kelegama, S. (2004). *Ready-made garment industry in Sri Lanka: Facing the global challenge.* Institute of Policy Studies. Retrieved from http://172.16.21.42/handle/123/63

# ශ්‍රී ලංකාවේ සතිපොල වෙළඳුන්ගේ ආර්ථික පසුබිම එම කුටුම්භයන්හි දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන ආකාරය


ඩබ්ලිව්. ඩී. ආර්. කුලතුංග

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

rajitha1996k@gmail.com



***සංක්ෂේපය***

*කුටුම්භයක් ලෙස දරිද්‍රතාවයෙන් මිදීමටත් සංවර්ධනය කරා ළඟා වීමටත් පවතින හොඳම ක්‍රමවේදය අධ්‍යාපනය වේ. සතිපොල යනු මුළු ශ්‍රී ලංකාව පුරාවටම ක්‍රියාත්මක වන වෙළඳ ජාලයකි. ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ බේදයකින් තොරව සතිපොල වෙළඳාම ක්‍රියාත්මක වේ. දෛනික ආදායම් උපයන බොහෝ පරිසක් සතිපොල වෙළඳාමෙහි නිරත වන තත්වයක් දැකිය හැක. සතිපොල වෙළඳාමෙහි නිරත වන දෙමාපියන්ගේ ආර්ථික තත්වය ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට බලපානු ලබන්නේ ද යන්න මෙම අධ්‍යනයේ ගැටලුව වේ. මෙම අධ්‍යනයේ මූලික අරමුණ, දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක මොනවාද යන්න සොයා බැලීම වන අතර උප අරමුණු බවට පත්ව ඇත්තේ දරුවන්ගේ අධ්‍යාපනයට දෙමාපියන්ගේ ආර්ථික තත්වය බලපාන්නේ ද යන්න සොයා බැලීම හා දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරිම සඳහා යෙදිය හැකි පිළියම් මොනවා ද යන්න සොයා බැලීමයි. මෙම අධ්‍යනය සඳහා අවශ්‍ය දත්ත ස්ථර නියදීම හා සරල සසම්භාවී නියදීම යටතේ සිදුකරන ලද අතර ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වන ප්‍රධාන සතිපොල තුනක් වන බැලුම්මහර, යක්කල හා කිරිල්ලවල සතිපොල තුනෙහි වෙළඳාමෙහි නිරත වන වෙළඳ කුටුම්භයන් 50 කින් යුත් නියැදියක් මගින් රැස් කරගන්නා ලදී. ඒ සඳහා මූලිකවම ප්‍රශ්නවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව සහ බහුගුණ ප්‍රතිපායන පරීක්ෂාව ආදී සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේද යොදා ගන්නා ලදී. මෙම සතිපොල වෙළඳාමෙහි නිරත වන බොහෝ කුටුම්භවල ස්ථිර ආදායම මෙය වන අතර අමතර ආදායම් පවතින කුටුම්භ ප්‍රතිශතය 38% ක් ලෙසත් පෙන්වාදිය හැක. මෙම කුටුම්භයන් හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ මධ්‍යනය දරුවන් දෙදෙනෙකි. තම ආර්ථික පසුබිම කුටුම්භයේ වෙනත් වියදම් හා සමඟ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් නොමැතිබව 84% ක දෙමාපිය ප්‍රතිශතයක් පෙන්වා දී ඇත. කුටුම්භ මාසික ආදායම එම කුටුම්භවල දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි බලපෑමක් එල්ල කරනු ලබන බව නිගමනය විය. දරුවන්ගේ අධ්‍යාපනික මට්ටම කෙරෙහි දෙමාපිය අධ්‍යාපනය මට්ටම මගින් කිසිඳු බලපෑමක් ඇති නොකරන බව තවදුරටත් නිගමනය විය. කුටුම්භයක අධ්‍යාපන වියදම ප්‍රධාන වශයෙන් ම කුටුම්භයේ මාසික ආදායම සහ කුටුම්භයේ අධ්‍යාපනය ලබන වයසේ දරුවන් ගණන යන සාධකයන්ගේ හැසිරීම මත වෙනස් වේ. මෙවැනි කුටුම්භයන් හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ පාසල් අධ්‍යාපනයට අවශ්‍යය පහසුකම් සපයාදීම හා අමතර පන්ති සඳහා සහන මුදලක් ලබාදීම වඩාත් සුදුසු වන අතරම සතිපොල වෙළඳපල තත්වයන් තවදුරටත් සංවර්ධනය කිරීමට අදාළ පාර්ශවයන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.*



***මුඛ්‍ය පද :- සතිපොල වෙළඳාම , අධ්‍යාපනය , ආර්ථික පසුබිම***

## 1. හැඳින්වීම

සිංහල භාෂාවේ "පොල" හා දෙමළ භාෂාවේ "සන්දෛ" ලෙස හැඳින්වෙන වෙළඳපල ක්‍රමය ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාවේ ගැමි දිවියෙහි වැදගත් කාර්යයක් ඉටු කරන්නා වූ සතිපතා පැවැත්වෙන වෙළඳපල තත්වයකි. ගැමි ආර්ථිකයෙහි ප්‍රධාන අංගයක් වශයෙන් ක්‍රියාත්මක වන සතිපොල ප්‍රජාව එකිනෙකා මුණ ගස්වන ස්ථානයක් ලෙසද පෙන්වාදිය හැක. ග්‍රාමීය වෙළඳපල සාමාන්‍යයෙන් විවිධ ස්ථානවල ජීවත්වන පුද්ගලයන්ට විවිධ වූ භාණ්ඩ මිල දී ගැනීම හා විකිණීම සඳහා පහසුවෙන්ම පැමිණිය හැකි ස්ථානයක පිහිටා ඇත. බොහෝවිට අතීතයේ දී මෙන්ම වර්තමානයේ දී ද මෙම සතිපොල සාමාන්‍යයෙන් ගඟක් , ඇළක් , මාර්ග හන්දියක් හෝ දුම්රිය මාර්ගයක් අසල පිහිටා ඇත. මෙම ග්‍රාමීය වෙළඳපල තත්වය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් දෛනික වෙළඳපල සහ සතිපතා වෙළඳපල වේ (Prime Minisre's Office, 2009).

ග්‍රාමීය අලෙවිකරණය පිළිබඳ අධ්‍යනය කරන විට එය සියලු මෙහෙයුම්වලින් සමන්විත වන අතර, එම ක්‍රියාවලිය මෙහෙයවන ආයතන, ගොවිපළෙන් නිපදවන ආහාර, අමුද්‍රව්‍යය, රෙදිපිළි හා ඒවා ආශ්‍රිත නිෂ්පාදනයන් ගොවිපලවල හෝ නිෂ්පාදන ස්ථානයන් හි සිට අවසාන පාරිභෝගිකයා දක්වා ගෙන යාම හා සම්බන්ධ වන අතර නිෂ්පාදකයන්, අතරමැදියන් හා පාරිභෝගිකයන් මත එවැනි මෙහෙයුම්වල බලපෑම රඳා පවතී. නාගරික වෙළඳපල තත්වයෙන් මිදි වෙනමම පවතින ඒකකයක් ලෙස මෙම ග්‍රාමීය වෙළඳපල එසේත් නැතිනම් සතිපොල පෙන්වාදිය හැක. නාගරික වෙළඳපල දෛනිකව ක්‍රියාත්මක වුවද සතිපොල බොහෝවිට සතියකට වරක් හෝ දෙවරක් පමණක් පැවැත්වේ. සතිපොල තුල සාමාන්‍යයෙන් ගත් කල එළවළු, පළතුරු, කරවල, රෙදි හා එදිනෙදා ජීවිතයට අවශ්‍යය වෙනත් භාණ්ඩ වැනි බොහොමයක් දෑ අලෙවි කිරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුල මෙන්ම ලෝකයේ සෑම රටක් තුලම පොදුවේ දැකිය හැකි ආර්ථිකමය තත්වයක් ලෙස මෙම සතිපොල වෙළඳාම් ක්‍රියාවලිය පෙන්වාදිය හැක.

සතිපොල තුල වෙළඳාම් කටයුතු වල නිරත වන අයවලුන් වෙළඳුන් ලෙසින් හඳුන්වනු ලබයි. සමස්තයක් ලෙස ගත් කල සතිපොල තුල වෙළඳාම් කටයුතු වල නිරත වන වෙළඳ පිරිස 100 කට වඩා අධික වන අවස්ථා ද පවතී. අතීතයේ දී මෙන්ම වර්තමානයේ දී ද සාමාජය තුළ ජීවත් වන්නා වූ විවිධ අධ්‍යාපන මට්ටම්වලට උරුමකම් කියන විවිධ තරාතිරම්වලට උරුමකම් කියන පිරිස් බේදයකින් තොරව නිරත වන රැකියාවක් ලෙස මෙම සතිපොල වෙළඳාම් තත්වය පෙන්වාදිය හැක. මොවුන් අතර සුළු පරිමාණයෙන් වෙළඳාම් කටයුතු ආරම්භ කොට තම උත්සාහයෙන් හා මහන්සියෙන් වර්තමානය වන විට මහා පරිමාණ වෙළඳාම් තත්වයක් කරා ගමන් කිරීමට මංපෙත් විවර කර ගත් අයවලුන් ද සිටී. කෙසේ වෙතත් එදා වේල සරිකර ගනු පිණිස වෙහෙස වන්නාවූ පිරිසක් ද මේ වෙළඳුන් අතර වේ. සතිපොල ගත් කල තරමක් දුරට සෝෂාකාරී හා අපිරිසිදු ස්භාවයක් පෙන්නුම් කරන ස්ථානයක් වුව ද වර්තමානය වන විට රජයෙන් ක්‍රියාත්මක වන්නා වූ වැඩපිළිවෙල ඔස්සේ සතිපොල නවීකරණය කිරීම සිදුවෙමින් පවතී. එය වෙළඳාම් කටයුතු වල නිරත වන්නන්ට මහත් වූ අස්වැසිල්ලකි. මෙහිදී අවධානය යොමු කර යුතු වැදගත්ම පැතිකඩ බවට පත්වන්නේ මෙම සතිපොල වෙළඳුන්ගේ ආර්ථික තත්වයයි. බොහෝවිට මොවුන්ගේ ආර්ථික තත්වය එසේත් නැතිනම් ආදායම සතිපොල පැවැත්වෙන දිනෙන් දිනට වෙනස් වේ.

එනම් ඇතැම් දිනවල දී යහපත් ආර්ථික තත්වයක් පැවතිය ද ඇතැම් දිනවල දී එයට පරස්පර විරෝධී ආදායම් තත්වයක් ද පවතී. මෙලෙස ආදායමෙහි ඇති වන්නා වූ වෙනසට බලපානු ලබන හේතූන් රාශියක් පවතී. එනම් පවතින්නා වූ කාලගුණික තත්වය, රට තුල උද්ගත වන හදිසි තත්වයන්, බෝවන රෝග වැනි විවිධ වූ හේතූන් බලපායි. අධ්‍යාපනය යන්න හඳුන්වා දිමේදී එය ඉතා පුළුල්වත්, සීමිතවත් හඳුන්වාදිය හැකිය. පුද්ගලයකුගේ මුළු මහත් ජීවිත කාලය තුලම සාමාජයේ සෑම අංශයකින්ම ලබන සියළුම අත්දැකීම්, අධ්‍යාපනය ලෙස පුළුල්ව පෙන්වාදිය හැක. පාසලේ දී , විශ්වවිද්‍යාලයේ දී හෝ වෙනත් කිසියම් ආයතනයකදී ලබන ඉගෙනීම, අධ්‍යාපනය ලෙස සීමිතව පෙන්වාදිය හැක. අධ්‍යාපනය යනු බොහෝ විට අනෙක් අය විසින් සකස් කරන ලද යම් සැලැස්මකට අනුව මිනිසුන් තුල ඉගෙනීම විදහා දැක්වීමට දරන උත්සාහයයි (Paulo Freire, 1973).

එසේම අධ්‍යාපනය යන්න පෞද්ගලිකවත් පොදු අර්ථයෙනුත් පෙන්වාදිය හැක. සර් පර්සි නන් නම් වූ අධ්‍යාපනඥයා ප්‍රකාශ කරනු ලබන ආකාරයට අධ්‍යාපනය යනු මිනිසාගේ පෞද්ගලිකත්වය තව තවත් වර්ධනය කිරීමට තුඩ දෙන අත්දැකීම් ලබා ගැනීම වේ. එඩ්ගා ෆෝරේ ඇතුළු පිරිස විසින් අධ්‍යාපනය වූ කලී එයටම සීමා වූ ලෝකයක් ද සමස්ථ ලෝකයේ ප්‍රතිබිම්බයද වන්නේය. එය සාමාජයේ ඉලක්ක කරා ලඟා කර ගැනීමට උපකාර වන අතරම ඊට යටත් වේ. එසේම අධ්‍යාපනය අවශ්‍යය මානව සම්පත් සංවර්ධනය කරන බවට වග බලා ගන්නේ නම් සාමාජයේ ඵලදායී ශක්තීන් ප්‍රයෝජනයට ගැනීමට සමාජයට ආධාරකයක් ද වෙයි යනුවෙන් දක්වා ඇත (Ruby< 2017). කෙසේ වෙතත් අධ්‍යාපනය ගත් කල මිනිසාට උපතේ සිටම මරණය දක්වාම විටින් විට විවිධ වූ දේ පිළිබඳ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව උදා වේ. මෙහි දී ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය කොටස් තුනකට බෙදා දැක්විය හැක. එනම් ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීක අධ්‍යාපනය සහ තෘතීක අධ්‍යාපනය ලෙසය. තෘතීක අධ්‍යාපනයෙන් අනතුරුව බොහෝ අයවලුන් උසස් අධ්‍යාපනය කරා යොමු වුවද ඒ සඳහා සුදුසුකම් ලබන්නේ ඉතාමත් සුළු පිරිසක් පමණී. සමහර අයවලුන් උසස් අධ්‍යාපනය යටතේ කාර්මික පුහුණු විද්‍යායතන කරා ද යොමු වේ. අධ්‍යාපනය අපගේ ජීවිතයේ කොටසකි. එනම් මිනිසාගේ ජීවත් වීමත් , වර්ධනයත් , අත්දැකීම් ඇතුල් කිරීම තුලින් සමාජ ක්‍රියාවලියට සම්බන්ධ වීමත් අධ්‍යාපනය බවයි. ඒ අනුව පුද්ගල සංවර්ධනයෙන් සමාජයත් , සමාජ සංවර්ධනයෙන් පුද්ගලයාත් සංවර්ධයන වන බව තහවුරු වේ (Prime Minisre's Office, 2009). "උගතමනා ශිල්පයමයි මතු රැකෙනා" යන කියමනෙන් ද එය මනාව පිළිඹිබු වේ. අධ්‍යාපනය වූ කලී සාමාජීය ස්වරූපයෙන් හා සාමාජීය ක්‍රියාවන්ගෙන් වෙන්කල නොහැකි දෙයක් වන අතර ළමයා පරිසරය හා ගැටීමෙන් ලබා ගන්නා අත්දැකීම් රාශිය ද අධ්‍යාපනය ලෙස සැලකිය හැක. අධ්‍යාපනයේ සාමාජීය ක්‍රියාවලිය විය යුත්තේ පුද්ගලයා සමාජයට ප්‍රයෝජනවත් සාමාජිකයකු බවට පත් කිරීම වන අතරම පෞද්ගලික ක්‍රියාවලිය විය යුත්තේ පුද්ගලයාට සාර්ථකව නව අත්දැකීම් හුරු කරමින් සතුටුදායක හා ප්‍රයෝජනවත් ජීවිතයක් ගත කිරීමට සැලැස්වීමයි.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ පළමු ව්‍යවස්ථාව අනුව වයස අවුරුදු 18 ට අඩු සියළුම මනුෂ්‍යයන් ළමයින් ලෙසට අර්ථ දක්වා ඇත. මෙම වයස සම්පූර්ණ වීමට ප්‍රථම කිසිඳු දරුවකුට රැකියාවක නිරත වීමට ඉඩ ප්‍රස්තාවක්

නොමැත. මන්දයත් දරුවකුගේ ප්‍රථම රාජකාරිය බවට පත්වන්නේ හොඳ අධ්‍යාපනයක් ලැබීමයි. එලෙසම අධ්‍යාපනය ලැබීම ලෝකවාසී සෑම දරුවකුම සතු වූ අයිතිවාසිකමක් ද වේ. පවුල ගත්කල පාසලෙන් ඔබ්බට අධ්‍යාපනය ලබා දෙන ස්ථානයක් විය යුතුය. සමාජ ක්‍රමයේ මූලික ඒකකයක් ලෙස, හොඳ අධ්‍යාපනයක් හා සම්ප්‍රදායක් ඇති පවුලක් රටේ සහ ජාතියේ සංවර්ධනයට සහ සමාජ සමඟිය සඳහා උත්තේජකයක් ද වේ. දෙමව්පියන් තම දරුවන්ට පළමු ගුරුවරුන් ලෙස සේවය කරන "පළමු පන්ති කාමරය " ලෙස පවුල සලකනු ලබන්නේ එබැවිනි. පවුල තුලින් දරුවකුට ලැබෙන්නා වූ මූලික අඩිතාලම ජීවිත කාලය පුරාවටම බලපානු ලබයි. එයට හේතුව නම් කෙනෙකු උපතේ පටන් හැදී වැඩෙන ස්ථානය පවුල වන අතරම ඉගෙනීමේ හා සමාජ ජීවිතයේ ද ආරම්භය පවුලම වන නිසාවෙනි.

කෙසේ වෙතත් දරුවන්ට යහපත් අධ්‍යාපනයක් ලබා දීම සෑම දෙමාපියකුගේම ඒකායන අරමුණ හා බලාපොරොත්තුවයි. දෙමාපියන් වෙහෙස මහන්සි වී කෙසේ හෝ තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට කටයුතු කරයි. තම ආදායම් තත්වය යහපත් මට්ටමක පැවතිය ද නොපැවතිය ද ඔවුන් ඒ සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම සකසාලයි. නමුත් ඇතැම් අවස්ථා වල දී දරුවන් විසින්ම අධ්‍යාපනය මග නවතා දමන අවස්ථා නැතුවාද නොවේ. ඇතැම් අවස්ථා වලදි අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන වෙනත් සාධකයන් ද පවතී. දෙමාපිය අත්දැකීම් හා සමාජ තත්වය අනුවද ඔවුන් දරුවනට හොඳින් උගන්වන්නට වෙහෙසෙයි. "ලෝකය වෙනස් කිරීමට ඔබට භාවිතා කල හැකි එකම ආයුධය අධ්‍යාපනයයි (නෙල්සන් මැන්ඩෙලා) ( Ellis, 2019). කෙසේ වෙතත් මෙම අධ්‍යනය තුළින් අවධාරණය කිරීමට බලාපොරොත්තු වන්නා වූ ප්‍රධානතම කාරණාව වන්නේ දෙමාපිය ආදායම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව විමසා බැලීමයි. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සතිපොල වෙළඳාමෙහි නිරත වන්නා වූ වෙළඳ දෙමාපියන්ගේ ආර්ථික තත්වය ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයේ සාර්ථකත්වය කෙරෙහි කොතෙක් දුරට බලපා ඇත් ද? යන්න මෙමගින් මින් ඉදිරියට විශ්ලේෂණාත්මකව අධ්‍යනය කරනු ලබයි.

මූලික අධ්‍යාපන දර්ශකවලට අනුව ශ්‍රී ලංකාව අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා කැපී පෙනෙන ප්‍රගතියක් අතපත් කරගෙන ඇත. බාලාංශයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වාම අධ්‍යාපනය ලබන්නවුන්ට ඒ සඳහා අවශ්‍යය සියළුම පහසුකම් අතුරින් සැලකිය යුතු තරම් පහසුකම් ප්‍රමාණයක අධ්‍යාපනික පහසුකම් නොමිලේ සැපයීමට රජය මගින් කටයුතු කරනු ලබයි. පෙර සඳහන් කර පරිදි අධ්‍යාපනය අතහැර හෝ මඟ නවතා දැමූ දරුවන් ගණන ප්‍රතිශතාත්මකව ඉතා සුළු අගයක් වුවද එය සංඛ්‍යාත්මකව සැලකිය යුතු තරම් විශාල අගයක් වේ. අධ්‍යාපනය ලැබීම සෑම දරුවකුම සතු වූ අයිතිවාසිකමක් වන අතර එය කිසිඳු දරුවකු විසින් අත්නොහැරිය යුතුය. දරුවන් අධ්‍යාපනය ලැබීමෙන් දුරස් වූ විට ඔවුන්ගේ ජීවිත ඇතැම් විට ඛේදනීය වේ.

මෙහි දී ප්‍රධාන වශයෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක මොනවාද? යන්න සොයා බැලීම ප්‍රමුඛතම පරමාර්ථය වන අතර දරුවන්ගේ අධ්‍යාපනයට දෙමාපියන්ගේ ආර්ථික තත්වය බලපාන්නේ ද යන්න සොයා බැලීම සහ දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා යෙදිය හැකි පිළියම් මොනවා ද යන්න සොයා බැලීම මෙහි අවශේෂ පරමාර්ථයන් වේ.

## 2. සාහිත්‍ය විමර්ශනය

අධ්‍යාපනය වැනි වියුක්ත සංකල්පයක් පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා යමෙකුට එම සංකල්පය පිළිබඳව හෝ එයින් ඉටුවන කාර්යයන් සම්බන්ධව මනා අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍යය වේ. ඇතැම් අයවලුන් අධ්‍යාපනය යන්න උපකරණයක් ලෙස සලකනු ලබන අතර එමගින් පුද්ගල හෝ සාමාජීය වශයෙන් වෙනස්කම් සිදුවන නිසාවෙන් එය නිවැරදියයි කිව නොහැක. පසුකාලීනව අධ්‍යාපනය සම්බන්ධව අර්ථ නිරූපණය කරන ලද ආර්ථික විද්‍යාඥයන් පෙන්වාදෙන ලද්දේ අධ්‍යාපනය ප්‍රජාවට ආයෝජනය කල හැකි ලාභදායි වෙළඳ භාණ්ඩයක් ලෙසයි. සාමාජ විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ අධ්‍යාපනය යනු සාමාජීයකරණ බලවේගයක් වන අතර ගුරුවරුන් යනු එය සාමාජගත කරන ආයතනය ලෙසටයි. භෞතික සාමාජය තුල පවතින සෑමදේම අධ්‍යාපන ක්‍රියාවලිය හා සම්බන්ධව ඇති අතර ඒ සියල්ලටම වඩා ඉහළින් අධ්‍යාපනය පිහිටා ඇත (Dagar , 2017).

අධ්‍යාපනය යන වචනය සෑදී ඇත්තේ "educare" හා "educere" යන ලතින් වචනයන් හි එකතුවෙනි. "educare" යන්නෙන් අදහස් කරන්නේ "ඇති දැඩි කිරීම" හෝ "පෝෂණය කිරීම" යන්නයි. "educere" යන්නෙහි තේරුම "බිහි කිරීම" හෝ "පිටතට ඇද ගැනීම" යන්නයි. මෙම වචන විශ්ලේෂණය කිරීම මගින් පෙනී යන්නේ අධ්‍යාපනය තුලින් දරුවෙකුට හෝ ඉගෙනුම ලබන්නෙකුට තමා තුල සැඟවී ඇති සැඟවුණු හැකියාවන් හා දක්ෂතාවන් පිටතට ගෙන ඒමට හා පෝෂණය කිරීමට අවශ්‍යය පසුබිම සකස් කිරීම බවයි. කෙසේ වෙතත් අධ්‍යාපනය සම්බන්ධව දාර්ශනිකයන් විසින් විවිධ වූ මත ඉදිරිපත් කිරීම සිදු කර ඇත. රූසෝ පැවසුවේ අධ්‍යාපනය යනු දරුවාගේ අභ්‍යන්තර වර්ධනයේ සිට ආරම්භවන දෙයක් ලෙසයි . ප්ලේටෝ පෙන්වාදෙන ආකාරයට අධ්‍යාපනය සිසුවාගේ ශරීරය හා ආත්මය තුල සියලු සුන්දරත්වය වර්ධනය කරන හා ඔහුව පරිපූර්ණ තත්වයට වර්ධනය කරන සාධකයක් බවයි. මහත්මා ගාන්ධි පවසන ආකාරයට අධ්‍යාපනය යනු දරුවාගේ හා මිනිසාගේ ශරීරය , මනස හා ආත්මය තුල ඇති හොඳම දේ වලින් ලබා ගත හැකි වටපිටාව බවයි. අධ්‍යාපනය යනු දරුවාගේ පෞද්ගලිකත්වයේ සම්පූර්ණ වර්ධනය වන අතර එමගින් ඔහුගේ උපරිම හැකියාවන් අනුව මිනිස් ජිවිතයට අවශ්‍යය මුල් අඩිතාලම සැපයේ (Kagan, 2020).

බොහෝ විට අධ්‍යාපනය ඉගෙනීම, ඉගැන්වීම, පුහුණුව, සහජ බුද්ධිය, පාසල් අධ්‍යාපනය වැනි වචනයන් හා සමඟ සමානවේ. මෙම සියලු ක්‍රියාකාරකම්වලට අදාළ ක්‍රියාවන්ට අධ්‍යාපනය හා සම්බන්ධ වුවද අධ්‍යාපනය යන සංකල්පය ඒ තුලින් මනාව නිරූපණය නොවේ. අධ්‍යාපනය ඉගෙනීම සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වයි. ඉගෙනීම යනු පුහුණුවීම් හෝ අත්දැකීම් සම්භාරයක එකතුවකි. ඉගෙනීමට සාපේක්ෂව අධ්‍යාපනය පුද්ගලයකුගේ සමස්ත පෞර්ෂය හැඩගැස්වීමට උත්සහ කරයි. මානව දෘෂ්ටිකෝණයෙන් බලන කල භෞතික, මානසික, සාමාජීය හා අධ්‍යාත්මික වශයෙන් පැතිකඩයන් පවතින අතර පුද්ගලයෙකු සතු මෙම සහජ ශක්තීන් සහජීවනයෙන් යුතුව පවත්වා ගැනීමටත් සමබරව වර්ධනය කරගැනීමටත් අධ්‍යාපනයෙන් ලැබෙන්නා වූ දායකත්වය ඉමහත්ය. ආදායම යනු උපයන මුදල් ප්‍රමාණයයි. එනම් යම් පුද්ගලයකු විසින් ගුණාත්මකභාවයෙන් ඉහළ සේවාවක් සැපයීම නිසාවෙන් හෝ නිෂ්පාදන ආයතනයක් ප්‍රාග්ධනය ආයෝජනය කිරිම මගින් හෝ උපයන මුදල් ප්‍රමාණයයි. වෙනත් ආකාරයකින් ගත් කල ආදායම යනු ශ්‍රමය සැපයීම මගින් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීම මගින් හෝ ප්‍රාග්ධන

ආයෝජනය මගින් නිෂ්පාදන ආයතනයකට හෝ පුද්ගලයකුට ලැබෙන මුදල් ප්‍රමාණයයි. සාමාන්‍යය පුද්ගලයකු ගත් විට ඔහු ආදායම ඉපැයීම සිදු කරනු ලබන්නේ වැටුප මඟිනි. නිෂ්පාදකයන් විසින් නිෂ්පාදන පිරිවැයට වඩා වැඩි මුදලකට භාණ්ඩ ආලෙවි කිරීම මගින් ලබන ලාභය ඔස්සේ ආදායම් උපයතs (Kagan, 2020).

පවුලේ ආදායම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි සැලකිය යුතු තරම් බලපෑමක් ඇති කරන බවයි. එලෙසම පවුලේ ආදායම නිර්මාණය කිරිම මගින් ඔවුන්ගේ අධ්‍යාපනය වැඩිදියුණු කල හැකි බවයි. එය ග්‍රාමීය අංශය කෙරෙහි මනාව ගැලපෙන බවද ඔවුන් සොයාගෙන ඇත. මේ සඳහා ඔවුන් ප්‍රධාන යෝජනාවන් දෙකක් ඉදිරිපත් කොට ඇත. පළමුවැන්න වන්නේ අන්තර්ගෝලීය සම්ප්‍රේෂණයේ අසමානතාවය අවම කිරිම සඳහා රජය විසින් වඩාත් සාධාරණ අධ්‍යාපන අවස්ථාවන් හා සහනාධාර ලබා දිය යුතුය යන්නයි. එනම් අධ්‍යාපන කාර්යංශ මගින් නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර පවතින්නා වූ අධ්‍යාපනික සම්පත් බෙදීයාමේ විෂමතාව අවම කිරිමට කටයුතු කිරිමයි. දෙවැන්න වන්නේ දෙමාපියන් තම කාර්යයභාර්යය හොඳින් ඉටුකල යුතු අතර තම දරුවන් තුල ඉගෙනීම සම්බන්ධව ධනාත්මක වාතාවරණයක් නිර්මාණය කිරීමයි (Tao & Han, 2017) .

දෙමාපියන්ගේ ආදායම සහ සාක්ෂරතා මට්ටම සහ ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට දක්වන දායකත්වයේ ගුණාත්මකභාවය අතර සැලකිය යුතු සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. මෙහිදී ළමයින්ගේ අධ්‍යාපනික සාර්ථකත්වය කෙරෙහි ගෘහස්ථ දරිද්‍රතාව විශාල බාධාවක් වී ඇති අතරම දෙමාපියන් තම දරුවන්ගේ එදිනෙදා පැවැත්ම සඳහා අවශ්‍ය අධ්‍යාපන කටයුතුවලට මුල්තැන නොදී වෙනත් ක්‍රියාවන්වල යෙදීම හේතුවෙන් දෙමාපියන් හා දරුවන් අතර අන්තර්ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින බව ද පවසයි. රජය සිවිල් සේවකයන් සඳහා වැටුප් වැඩි වීමක් සහතික කිරීම, යටිතල පහසුකම් වර්ධනය කිරීම , අධ්‍යාපනයේ වටිනාකම වැදගත්කම සම්බන්ධව ප්‍රදේශයේ වැඩිහිටියන් හරහා දෙමාපියන් දැනුවත් කිරීම හා රටපුරා වැඩිහිටි අධ්‍යාපන වැඩසටහනක් දියත් කිරීම. දෙවනුව උසස් අධ්‍යාපන හා සාක්ෂරතා කුසලතා මට්ටම් ඇති දෙමාපියන් සහ ප්‍රජා මට්ටමින් අඩු අධ්‍යාපන පසුබිමක් ඇති දෙමාපියන් අතර දෙමාපිය හවුල්කාරීත්වයක් වර්ධනයක් ඇති කල යුතු බව යෝජනා කල අතර එමගින් දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් දෙමාපියන්ට එකිනෙකාට උපකාර කරගත හැක (Alice & Carmel , 2014).

### 3. අධ්‍යයන ක්‍රමවේදය


මෙම අධ්‍යනය යටතේ සංගහනය බවට පත්ව ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති ප්‍රධාන සතිපොල තුනක් වන බැලුම්මහර, යක්කල හා කිරිල්ලවල යන සතිපොලවල වෙළදාමෙහි නිරත වන වෙළඳුන් ප්‍රමාණයයි. එම සතිපොල තුනෙහි වෙළඳාමෙහි නිරත වන වෙළඳුන් ප්‍රමාණය පිළිවෙලින් 390, 400 සහ 45 කි. මෙම අධ්‍යනය යටතේ ඉලක්කගත සංගහනය බවට පත්ව ඇති සතිපොල තුනෙහි වෙළඳාමෙහි නිරතවන සමස්ත වෙළඳුන් ප්‍රමාණය 835 කි. මෙම අධ්‍යනයේ දී පොලෙහි වෙළඳාම් කරනු ලබන ද්‍රව්‍යය අනුව ස්ථරවලට බෙදා ඉන් අනතුරුව සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ නියැදිය තෝරා ගැනීම සිදු කරන ලදී. ඒ අනුව නියැදුම් ක්‍රම කිහිපයක් යටතේ මෙම නියැදිය තෝරා ගන්නා ලදි. මෙහි දී යමානී ක්‍රමය භාවිතා කරමින් දෝෂය අවම වන පරිදි නියැදියේ ප්‍රමාණය තෝරා ගන්නා ලදි.

ආසන්න වශයෙන් නියදිය 90 ක් ලෙස තෝරාගත්තද වර්තමානයේ දී සමස්ත ශ්‍රී ලංකාවට මෙන්ම ලෝකයටම බලපා ඇති වසංගත තත්වය හා සමඟ පවතින ගැටලුකාරී ස්භාවය නිසාවෙන් අධ්‍යනයට භාජනය කරනු ලබන නියදියෙහි ප්‍රමාණය නියදි ඒකක 50 කට සීමා කරන ලදී. මෙම අධ්‍යනයේ දී ප්‍රාථමික සහ ද්විතියික දත්ත යන දත්ත දෙවර්ගයම යොදා ගනිමින් දත්ත රැස් කිරීම සිදු කල අතර ඒ යටතේ ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් අවශ්‍යය ප්‍රාථමික දත්තයන් රැස්කර ගන්නා ලදී. පවතින තත්වය හා සමඟ නියදි ප්‍රමාණය 50 දක්වා අඩුවීම හා සමඟම පොල තත්ව තුනෙහි වෙළඳාම් කරන ප්‍රමාණය පදනම් කරගනිමින් වැඩි ප්‍රමාණයක් යක්කල සතිපොල පෙදෙසෙන් ද , දෙවනුවට බැලුම්මහර සතිපොල පෙදෙසෙන් ද , සුළු ප්‍රමාණයක් කිරිල්ලවල සතිපොල පෙදෙසෙන් ද තෝරා ගනිමින් ප්‍රාථමික දත්ත රැස්කරගන්නා ලදී. ද්විතීක දත්තයන් පොත්, පත්තර, සඟරා හා අග්‍රාමාත්‍ය කාර්යාල වෙබ් පිටුව මගින් ලබාගන්නා ලදී. අධ්‍යනය සඳහා අවශ්‍යය ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත දෙවර්ගයම ප්‍රශ්නාවලිය ඔස්සේ ලබා ගත් අතරම අවශ්‍ය අවස්ථාවල දී අතිරේක ප්‍රශ්න අසමින් අධ්‍යනයේ ගුණාත්මක බව වර්ධනය කරගැනීමට උපකාරී වන ප්‍රාථමික දත්තයන් සම්මුඛ සාකච්ජා ක්‍රමයද උපයෝගී කරගනිමින් රැස් කර ගන්නා ලදි.

## 4. දත්ත විශ්ලේෂණය

මෙම අධ්‍යනය සඳහා අවශ්‍ය වු නියදිය තෝරා ගනු ලැබුවේ ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ප්‍රධාන සතිපොල තුනක් මුලික කරගනිමින්ය. සතිපොලෙහි වෙළඳාමෙහි නිරතවන වෙළඳුන් ප්‍රමාණය පදනම් කරගනිමින් හා ඇති වු අපහසුතාවන් පදනම් කරගනිමින් තෝරා ගන්නා ලද නියදියේ ප්‍රමාණය 50 කට අඩු වු අතර එම සතිපොල තත්ව තුන අතර නියදිය ව්‍යාප්ත වී ඇති ආකාරය මෙලෙස පෙන්වාදිය හැක.

*ප්‍රස්තාර සටහන 4 . 1 : සතිපොල අනුව නියදි ව්‍යාප්තිය*





මුලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

මෙම අධ්‍යනය සඳහා යොදාගත් නියැදිය ව්‍යාප්ත වී ඇති ආකාරය 4.1 ප්‍රස්තාර සටහන මගින් නිරූපණය කරයි. නියැදිය ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ප්‍රධාන සතිපොල තුනක වෙළඳාම් කරන වෙළඳුන් මුලික කරගනිමින් , අධ්‍යාපනය ලබන වයසේ දරුවන් සහිත කුටුම්භ 50 ක් පදනම් කරගනිමින් නියැදිය තෝරාගන්නා ලදී. ඒ අනුව තෝරාගත් නියැදිය තුළ වැඩිම දත්ත දායක වෙළඳුන් ප්‍රමාණයක් යක්කල සතිපොල

නියෝජනය කරන අතර එහි ප්‍රතිශතය 48% ක් වේ. ප්‍රතිචාරක වෙළඳුන් සංඛ්‍යාවෙන් 46% ක ප්‍රතිශතයක් බැලුම්මහර සතිපොල නියෝජනය කරයි. කිරිල්ලවල සතිපොල නියෝජනය කරමින් 6% ක පිරිසක් ප්‍රතිචාර සපයා ඇත. මෙසේ සමස්ත සංගහනය ම නියෝජනය වන පරිදි ලබාගත් නියැදිය ඇසුරින් දත්ත විශ්ලේෂණය සිදු කොට ඇත.


*ප්‍රස්තාර සටහන 4 . 2 : නියදියේ අධ්‍යාපන පසුබිම*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

ඉහත ප්‍රස්තාර සටහන මගින් නිරූපණය කරනු ලබන්නේ අධ්‍යනයට අදාළව තෝරාගන්නා ලද නියඳියේ අධ්‍යාපන පසුබිමයි. ඒ අනුව ප්‍රධාන අධ්‍යාපන මට්ටම් හතරක් ලබා දී ඇති අතර පිළිවෙලින් 12% ක් ප්‍රාථමික අධ්‍යාපනය ද, 42% ක් 5 සිට 10 වසර දක්වා ද, 36% ක් සාමාන්‍යය පෙළ දක්වාද, 10% ක් උසස්පෙළ දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. මේ අනුව අපට පැහැදිලි වන්නේ අධ්‍යාපන මට්ටම් බේදයකින් තොරව සතිපොල වෙළඳාමෙහි පුද්ගලයන් නිරත වන බවයි. කෙසේ වෙතත් 5 සිට 10 වසර දක්වා වූ අධ්‍යාපන මට්ටම තුල අධ්‍යාපනය අවසන් කරන ලද බොහෝ පිරිසක් පොල වෙළඳාම කෙරෙහි යොමු වී ඇති බවක් පෙනීයයි. සාමාන්‍යය පෙළ දක්වා වූ අධ්‍යාපන මට්ටම දක්වා අධ්‍යාපනය අවසන් කරන ලද සැලකිය යුතු ප්‍රමාණයක් ද මෙම ආර්ථික ක්‍රියාවලිය කරා යොමු වී ඇත. සමස්තයක් ලෙස බලන කල යම්තාක් දුරකට සාර්ථක අධ්‍යාපනයක් ලද පිරිසක් මෙන්ම සාර්ථකව අධ්‍යාපනය නිම කල පිරිසක් වෙළඳාමෙහි නිරත වන ස්ථානයක් ලෙස සතිපොල පෙන්වාදිය හැක.

*ප්‍රස්තාර සටහන 4 . 3 : මාසික සතිපොල ආදායම*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

4.3 ප්‍රස්තාර සටහන මගින් නිරූපණය කරනු ලබන්නේ සතිපොල වෙළඳාමෙහි නිරතවන වෙළඳුන්ගේ මාසික ආදායමයි. අධ්‍යනයට භාජනය කරන ලද නියදි දත්තයන්ට අනුව පෙනීයන්නේ මෙම වෙළඳුන්ගේ මාසික සතිපොල ආදායම විවිධ වු පරාසයන් හි පිහිටන බවයි. ඒ අනුව ආදායම රු. 25000ට අඩු පරාසය තුල එක් වෙළෙන්දෙකු ද, රු. 25000- රු. 100000 අතර ආදායම් උපයන වෙළඳුන් ප්‍රමාණය 42 ක් වන අතර, ආදායම රු. 100000- රු. 200000 ත් අතර උපයන වෙළඳුන් ප්‍රමාණය 6 දෙනෙකු වන අතර රු. 200000 ට වඩා ආදායමක් උපයන්නේ එක් වෙළෙන්දෙකු පමණි. කෙසේ වෙතත් සතිපොලෙහි බොහෝ වෙළඳුන් මාසිකව ලබන ආදායම පිහිටා ඇත්තේ දෙවන පරාසය තුලය. පළමු , තෙවන හා සිව්වන පරාසයන්හි ආදායම් උපයන වෙළඳුන් සතිපොල තුල අඩු ප්‍රමාණයක් බැගින් දක්නට ලැබේ. සතිපොල වෙළඳුන්ගේ මාසික ආදායමෙහි මධ්‍යන අගය (ඇමුණුම1.1) රු. 85236 ක් වේ. සිව්වන පරාසය තුල ආදායම් ලබන්නන් මහා පරිමාණ ලෙස සතිපොල වෙළඳාමෙහි නිරත වන්නවුන්ය. කෙසේ හෝ සෑම වෙළඳ සාමාජිකයකුගේම මාසික ආදායම සාමාන්‍යය යහපත් මට්ටමක පවතින බව මේ අනුව නිගමනය කල හැක.

*වගුව 4 . 1 : අධ්‍යාපනික සානුබලය*


| සානුබලය | ඔව් | ප්‍රතිශතය | නැත | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| දරුවන්ගේ පාසල හා ඔබ නිරන්තර සම්බන්ධකම් පවත්වයි ද? | 44 | 88% | 6 | 12% |
| දරුවාගේ හෝ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ගැන ඔබ සෑහීමකට පත්වේද? | 45 | 90% | 5 | 10% |
| ඔබ දරුවාට අධ්‍යාපනයට ලබාදුන් සානුබලය ප්‍රමාණවත් ද? | 42 | 84% | 8 | 16% |
| ඔබගේ අධ්‍යාපනයට ඔබගේ දෙමාපියන්ගෙන් ලැබුණු දායකත්වය සම්බන්ධව සෑහීමකට පත්වේද? | 25 | 50% | 25 | 50% |

මුලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

මෙම වගු සටහන මගින් නිරූපණය කරනු ලබන්නේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සානුබල අවස්ථාවන් කිහිපයක් සම්බන්ධවය. ප්‍රථමයෙන්ම දෙමාපියන් දරුවන්ගේ පාසල් හෝ පාසල හා සමඟ පවත්වන සම්බන්ධතාවයේ ශක්තිමත් බව කෙරෙහි අවධානය යොමු කරන විට 88% ක දෙමාපිය ප්‍රතිශතයක් නිරන්තරයෙන් පාසල හා සම්බන්ධව කටයුතු කිරීමට යොමු වන බවත් , 12% ක පමණ දෙමාපිය ප්‍රතිශතයක් එම කටයුතු සඳහා සම්බන්ධ නොවන බවත් පෙනී යන්නට විය. ඒ ලෙසටම 90% ක් වෙළඳාමෙහි නිරතවන දෙමාපියන් ප්‍රතිශතයක් තම දරුවන්ගේ අධ්‍යාපන මට්ටම සම්බන්ධව යහපත් ආකල්පයක් දරන අතර , 10% ක දෙමාපිය ප්‍රතිශතයක් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම සම්බන්ධව දරන්නේ පරස්පර විරෝධී අදහසකි. දෙමාපිය පැතිකඩ ඔස්සේ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතාව පසුරාලීම කෙරෙහි බලපාන මගපෙන්වීමේ ප්‍රමාණාත්මක බව 84% ක දෙමාපිය පිරිසක් යටත් පිරිසෙන් සපුරා ඇති නමුදු 16% ක දෙමාපිය ප්‍රතිශතයක් අතින් එම වගකීම නිසිපරිදි ඉටු නොවී ඇති බවක් පෙනීයයි. අවසන්

වශයෙන් තම අධ්‍යාපනයට තම දෙමාපිය දායකත්වය කෙසේදැයි යන්න වෙළඳ ප්‍රජාවගෙන් විමසුකල 50% ක ප්‍රතිශතයක් ඒ සම්බන්ධව තෘප්තිමත් වන අතර 50% ක ප්‍රතිශතයක් ඒ සම්බවන්ධව තෘප්තිමත් නොවේ. ඇතැමුන්ගේ මතය වුයේ තම දෙමාපියන්ගේ අයහපත් ක්‍රියාකලාපයන් හේතුවෙන් හා දුප්පත්කම හේතුවෙන් මෙවැනි ඉරණමක් තමාට අත් වු බවයි.


*ප්‍රස්තාර සටහන 4 . 4 :දරුවන්ගේ මාසික අධ්‍යාපනය වියදම*




මුලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

4.4 ප්‍රස්තාර සටහනට අනුව නිරූපණය වන්නේ සතිපොල වෙළඳ දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මාසිකව වැය කරන මුදලයි. මෙහිදී කුටුම්භයක සිටින අධ්‍යාපනය ලබන සියළුම දරුවන්ගේ පාසල් අධ්‍යාපනය සඳහා මෙන්ම අමතර පන්ති සඳහා දරන වියදම කෙරෙහිද මෙහි දී අවධානය යොමු කොට ඇත. ඒ අනුව අධ්‍යාපනය සඳහා දරන මාසික වියදම කාණ්ඩකොට ඇති අතර රු 10000 ට වඩා අඩුවෙන් 16% ක කුටුම්භ ප්‍රතිශතයක් අධ්‍යාපනය සඳහා මාසික වියදමක් දරන අතර, 52% ක කුටුම්භ ප්‍රතිශතයක් රු 10000 ත් රු 25000 ත් අතර ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා මාසිකව වියදම් කරනු ලබයි. 30% ක කුටුම්භ ප්‍රතිශතයක් , රු 25000 ත් රු 50000 ත් අතර අධ්‍යාපනය සඳහා මාසික වියදමක් දරන අතර, රු 50000ට වඩා අධ්‍යාපනය සඳහා වියදම් කරනු ලබන කුටුම්භ ප්‍රතිශතය 2% ක් පමණි. කෙසේ වෙතත් වැඩි මාසික අධ්‍යාපනික වියදමක් පවතින්නේ රු 10000 ත් රු 25000 ත් අතර කාණ්ඩය තුලය. රු 50000 ට වඩා වැඩි කාණ්ඩය තුල 2% ක් වැනි කුඩා අගයක් පැවතීමෙන් පෙනීයන්නේ අධ්‍යාපනය සඳහා එතරම් විශාල මුදලක් වැය කිරීමේ හැකියාව අවම මට්ටමක පවතින බවයි. කෙසේ වෙතත් මෙම දරුවන්ගෙන් බොහෝ ප්‍රමාණයක් රජයේ පාසල් හි අධ්‍යාපනය ලැබීම හේතුවෙන් අධ්‍යාපනය සඳහා පාසල දරන වියදමෙහි යම් අඩුවක් පවතින බව දෙමාපියන් පවසයි. නමුත් පාසල් වැන් , අමතර පන්ති සඳහා මෙන්ම අවශ්‍ය අධ්‍යාපනික උපකරණ සඳහා වැයවන වියදම අධික බව වෙළඳාමෙහි නිරත දෙමාපිය මතයයි.


*ප්‍රස්තාර සටහන 4 . 5 : ආදායමේ ප්‍රමාණවත් බව*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

ප්‍රස්තාර සටහන 4.5 මගින් නිරූපණය කරනු ලබන්නේ සතිපොල වෙළඳාමෙන් ලබන ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ ප්‍රමාණවත් වන්නේ ද යන්න පිළිබඳවයි. ඊට අනුව 18% ක වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ ප්‍රමාණවත් වන බවයි. 28% ක වෙළඳිමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ තරමක් ප්‍රමාණවත් බවයි. 20% ක වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ මධ්‍යස්ථ බලපෑමක් එල්ල කරන බවයි. 24% ක වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ ප්‍රමාණවත් නොවන බවයි. 10% ක වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමගම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ තරමක් ප්‍රමාණවත් නොවන බවයි. වැඩි වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයකගේ පිළිතුර බවට පත්ව ඇත්තේ තම ආදායම තරමක් දුරට ප්‍රමාණවත් බවයි. කෙසේ හෝ තම ආදායම් මට්ටම කවර තත්වයක පිහිටියද ඔවුන්ගේ ප්‍රමුඛතම අරමුණ බවට පත්ව ඇත්තේ දරුවන්ගේ අධ්‍යාපනය කටයුතු සාර්ථක කිරීම සඳහා අවශ්‍යය පිටුවහල සපයා දීමයි.

*ප්‍රස්තාර සටහන 4 . 6 :දරුවන්ගේ මාසික අධ්‍යාපනය වියදම*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

4.6 ප්‍රස්තාර සටහනට අනුව නිරූපණය වන්නේ සතිපොල වෙළඳ දෙමාපියන් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් මාසිකව වැය කරන මුදලයි. මෙහිදී කුටුම්භයක සිටින අධ්‍යාපනය ලබන සියළුම දරුවන්ගේ පාසල් අධ්‍යාපනය සඳහා මෙන්ම අමතර පන්ති සඳහා දරන වියදම කෙරෙහිද මෙහි දී අවධානය යොමු කොට ඇත. ඒ අනුව අධ්‍යාපනය සඳහා දරන මාසික වියදම කාණ්ඩකොට ඇති අතර රු 10000 ට වඩා අඩුවෙන් 16% ක කුටුම්භ ප්‍රතිශතයක් අධ්‍යාපනය සඳහා මාසික වියදමක් දරන අතර, 52% ක කුටුම්භ ප්‍රතිශතයක් රු 10000 ත් රු 25000 ත් අතර ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා මාසිකව වියදම් කරනු ලබයි. 30% ක කුටුම්භ ප්‍රතිශතයක් , රු 25000 ත් රු 50000 ත් අතර අධ්‍යාපනය සඳහා මාසික වියදමක් දරන අතර, රු 50000ට වඩා අධ්‍යාපනය සඳහා වියදම් කරනු ලබන කුටුම්භ ප්‍රතිශතය 2% ක් පමණි. කෙසේ වෙතත් වැඩි මාසික අධ්‍යාපනික වියදමක් පවතින්නේ රු 10000 ත් රු 25000 ත් අතර කාණ්ඩය තුලය. රු 50000 ට වඩා වැඩි කාණ්ඩය තුල 2% ක් වැනි කුඩා අගයක් පැවතීමෙන් පෙනීයන්නේ අධ්‍යාපනය සඳහා එතරම් විශාල මුදලක් වැය කිරීමේ හැකියාව අවම මට්ටමක පවතින බවයි. කෙසේ වෙතත් මෙම දරුවන්ගෙන් බොහෝ ප්‍රමාණයක් රජයේ පාසල් හි අධ්‍යාපනය ලැබීම හේතුවෙන් අධ්‍යාපනය සඳහා පාසල දරන වියදමෙහි යම් අඩුවක් පවතින බව දෙමාපියන් පවසයි. නමුත් පාසල් වෑන් , අමතර පන්ති සඳහා මෙන්ම අවශ්‍ය අධ්‍යාපනික උපකරණ සඳහා වැයවන වියදම අධික බව වෙළඳාමෙහි නිරත දෙමාපිය මතයයි.

### 4.1 දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක සොයා බැලීම

මෙම අධ්‍යනය යටතේ පවතින ප්‍රධානතම අරමුණ බවට පත්වන්නේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපානු ලබන සාධක සොයා බැලීමයි. ඒ අනුව ප්‍රධාන සාධක කිහිපයක් ඉදිරිපත්කොට ඇති අතර එම සාධක දරුවන්ගේ අධ්‍යාපනයට බලපෑමක් එල්ල කරනු ලබන ආකාරය සම්බන්ධව පහත වගු සටහනේ දැක්වේ.

*වගුව 4 . 2 : අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක*

| සාධකය | ඔව් | ප්‍රතිශතය | නැත | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 01. පවුලේ ආදායම | 50 | 100% | 0 | 0% |
| 02. පෝෂණය | 32 | 64% | 18 | 36% |
| 03. සෞඛ්‍යය තත්වය | 16 | 32% | 34 | 68% |
| 04. යහපත් මානසික මට්ටමක් පැවතීම | 33 | 66% | 17 | 34% |
| 05. යහපත් සමාජ සම්බන්ධතා පැවතීම | 37 | 74% | 13 | 26% |
| 06. අධ්‍යාපනයට ඇති කැමැත්ත | 38 | 76% | 12 | 24% |
| 07. ක්‍රීඩාවට ඇති කැමැත්ත | 6 | 12% | 44 | 88% |


මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

4.2 මෙම වගු සටහනට අනුව පෙනීයන්නේ අධ්‍යනයට භාජනය කරන ලද නියදිය විසින් අධ්‍යාපනයට බලපානු ලබන සාධක කෙරේ දක්වන ලද ප්‍රතිචාරයන්ය. මේ අනුව බහුතරයකගේ මතය බවට පත්ව ඇත්තේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපාන ප්‍රබලතම

සාධකය පවුලේ ආදායම බවටයි. එය ප්‍රතිචාරාත්මක ප්‍රතිශතය 100% කි. සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ඔවුන් හා කතාබහ කිරීමේ දී ඇතැමුන් පැවසූ ආකාරයට ඔවුන්ට අධ්‍යාපනය ලැබීමට පැවති ප්‍රබලතම අඩුපාඩුව වන්නේ පවුලේ ආදායමෙහි පැවති ප්‍රමාණාත්මක නොවන බවයි. දෙවනුවට 76% ක ප්‍රතිශතයක් පවසනු ලබන්නේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපානු ලබන තවත් ප්‍රබලම සාධකයක් වන්නේ අධ්‍යාපනයට ඇති කැමැත්ත බවයි. දරුවකු අධ්‍යාපනයට ඇලුම් කරයි නම් ආශා කරයිනම් එම දරුවා කවර හෝ බාධක මැද අධ්‍යාපනයේ යෙදෙන බව දැඩි මතයකි. ඇතැමුන් අධ්‍යාපනයට දක්වන දැඩි අකමැත්ත හේතුවෙන් අධ්‍යාපනය අතරමග නවතා දැමූ අවස්ථාවන් කෙරෙහි ද මෙහි දී අසන්නට ලැබුණි. එලෙසම සමහර දෙමාපියන් විසින් පවසා සිටියේ ද ඔවුන් කෙසේ හෝ මහන්සි වී මුදල් උපයා දරුවන් අධ්‍යාපනය වෙත යොමු කල ද ඇතැම් දරුවන් අධ්‍යාපනය කෙරේ දැඩි ඇල්මක් නොදක්වන බවයි.

74% කගේ මතය වන්නේ යහපත් සමාජ සම්බන්ධතාවන් ද දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපෑම් කරන බවයි. ඔවුන් දරන මතය නම් යහපත් සමාජ ඇසුරක් ලද දරුවන් අධ්‍යාපනය මෙන්ම ජීවිතය ද සාර්ථක කරගන්නා බවයි. එසේ නොලද අයවලුන්ගේ ජීවිතයම පවා අයහපත් සමාජ ඇසුර නිසාවෙන් විනාශවිය හැකි බවයි. ඔවුන්ගේ බොහෝ මතයන් ඔවුන් ගොඩනංවන ලද්දේ තම ජීවිත අත්දැකීම් පාදක කොටගෙනය. 66% කගේ මතය වන්නේ අධ්‍යාපනය කෙරෙහි දරුවාගේ මානසික මට්ටම බලපාන බවයි. අත්‍යවශ්‍යයෙන්ම හොඳ අධ්‍යාපනයක් ලැබීමට නම් දරුවාගේ මානසික මට්ටම යහපත් තත්වයක පැවතීම අත්‍යයවශ්‍යය වේ. 64% කගේ මතය වන්නේ අධ්‍යාපන සාර්ථකත්වය කෙරෙහි පෝෂණයෙහි ද වැඩි බලපෑමක් පවතින බවයි. සෞඛ්‍යය තත්වය මෙන්ම ක්‍රීඩාවට ඇති කැමැත්ත යන සාධකයන් අධ්‍යාපන සාර්ථකත්වය කෙරේ එතරම් බලනොපාන බව ඔවුන්ගේ මතයයි.

*ප්‍රස්තාර සටහන 4 . 7 : අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

### 4.2 ආකෘතිය ඇස්තමේන්තු කිරීම

මෙම ආකෘතිය තුළ දී $\hat{\beta}0$ , $\hat{\beta}1$ , $\hat{\beta}2$ අගයන් 95% විශ්වාස මට්ටම තුළ දී වෙසෙසි වේ.

$$\hat{Y} = 6591.145 + 0.058\ X1 + 4630.052\ X2$$

(0.004) (0.000) (0.000)

ඇස්තමේන්තු කරන ලද බහුගුණ ප්‍රතිපානය ආකෘතියෙහි $\hat{\beta}0$ යනු මාසික කුටුම්භ ආදායම හා පවුලේ අධ්‍යාපනය ලබන සිසුන් යන ස්වායත්ත විචල්‍යයන් දෙකෙහි අගය ශුන්‍යය වනවිට කුටම්භයක දරුවන්ගේ මාසික අධ්‍යාපනික වියදමයි. එය 6591.145 ක් වේ. ඒ අනුව මෙම ආකෘතියෙහි $\hat{\beta}1$ මගින් දැක්වෙන්නේ ආකෘතියට ඇතුළත් කර ඇති අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් ( පවුලේ අධ්‍යාපනය ලබන සිසුන් ගණන ) ස්ථාවරව තිබිය දී කුටුම්භ මාසික ආදායම එම කුටම්භයන්හි දරුවන්ගේ මාසික අධ්‍යාපනික වියදම කෙරෙහි ඇති කෙරෙන බලපෑම වේ. එනම් අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් ස්ථාවරව තිබිය දී කුටුම්භ මාසික ආදායම එක් එකකින් වෙනස් වන විට කුටම්භයන්හි මාසික අධ්‍යාපනික වියදම රු 0.058 කින් වැඩි වේ. එනම් කුටුම්භ මාසික ආදායම සහ එම කුටම්භයන්හි මාසික අධ්‍යාපනික වියදම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින බවක් නිරූපණය කරයි.

එමෙන්ම මෙම ආකෘතියෙහි $\hat{\beta}2$ මගින් ආකෘතියට ඇතුළත් කර ඇති අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් (පවුලේ මාසික ආදායම) ස්ථාවරව තිබිය දී පවුලේ අධ්‍යාපනය ලබන සිසුන් ගණන එම කුටුම්භයන්හි මාසික අධ්‍යාපනික වියදම කෙරෙහි ඇති කෙරෙන බලපෑම දැක්වේ. එනම් අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් ස්ථාවරව තිබිය දී පවුලේ අධ්‍යාපනය ලබන සිසුන් ගණන, එක් පුද්ගලයකුගෙන් වෙනස් වන විට කුටුම්භයන්හි මාසික අධ්‍යාපනික වියදම රු 4630.052 කින් වැඩි වේ. මෙහි පවතින ධන සම්බන්ධතාවය හේතුවෙන් පවුලේ අධ්‍යාපනය ලබන සිසුන් ගණන සහ එම කුටුම්භයන්හි මාසික අධ්‍යාපනික වියදම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින බව පෙන්වාදිය හැක.

### 4.3 කයි වර්ග පරික්ෂාව මගින් විචල්‍යය අතර සම්බන්ධතාව පරික්ෂා කිරීම

සතිපොල වෙළඳ කුටුම්භවල ආර්ථික පසුබිම සහ එම කුටුම්භවල දරුවන්ගේ අධ්‍යාපන පසුබිම අතර පවතින සම්බන්ධතාවය හඳුනාගැනීම මෙම අධ්‍යනයේ මූලික අරමුණ වේ. ඒ අනුව හඳුනාගත් ආර්ථික සාධක සහ අධ්‍යාපනික පසුබිමට අදාළ සාධක අතර සම්බන්ධතාවක් පවතින්නේ ද? යන්න ගොඩනගා ගත් කල්පිත මත පිහිටා, කාල් පියර්සන්ගේ කයි වර්ග පරික්ෂාව මගින් පරීක්ෂා කරන ලදී. කයි වර්ග පරීක්ෂාව සඳහා 95% ක විශ්වාස මට්ටමක් යොදා ගත් අතර ඒ අනුව මෙහි දී සලකා බලනු ලබන දෝෂ මට්ටම වන්නේ $\alpha$=0.05 වේ.

$P > 0.05 = H_0$ කල්පිතය පිළිගනී.

$P < 0.05 = H_0$ කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි.

**4.3.1 දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරයි ද යන්න විමසා බැලීම.**

$H_0$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල නොකරයි.

$H_1$- දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරයි.

දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය යන විචල්‍යයන් හි ස්වායත්තතාව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද කයි වර්ග පරීක්ෂාවට අනුව ගණනය කරන ලද වගු අගය ලෙස $P = 0.000$ ත් වෙසෙසියා මට්ටම $\propto=0.05$ ලෙසත් වේ. මෙයට අනුව $0.000 < 0.05$ හේතුවෙන් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. එනම් එමගින් පැහැදිලි වන්නේ දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරනු ලබන බවයි.

**4.3.2 අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව හා අධ්‍යාපනය සඳහා දරන වියදම අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න පරීක්ෂා කිරිම.**

$H_0$ = අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව හා අධ්‍යාපනය සඳහා දරන වියදම සම්බන්ධතාවයක් නොපවතී.

$H_1$= අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව හා අධ්‍යාපනය සඳහා දරන වියදම සම්බන්ධතාවයක් පවතී.

අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව හා අධ්‍යාපනය සඳහා දරන වියදම යන විචල්‍යයන් හි ස්වායත්තතාව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද කයි වර්ග පරීක්ෂාවට අනුව ගණනය කරන ලද වගු අගය ලෙස $P = 0.000$ ත් වෙසෙසියා මට්ටම $\propto=0.05$ ලෙසත් වේ. මෙයට අනුව $0.000 < 0.05$ හේතුවෙන් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. එනම් එමගින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය සඳහා දරන වියදම කෙරෙහි අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව බලපෑමක් එල්ල කරනු ලබන බවයි.

**4.3.3 කුටුම්භ ආදායම පරිභෝජන වියදමට හා අධ්‍යාපනික වියදමට ඇති කරනු ලබන බලපෑමේ ස්භාවය**

$H_0$ = කුටුම්භ ආදායම පරිභෝජන වියදම කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

$H_1$ = කුටුම්භ ආදායම පරිභෝජන වියදමට කෙරෙහි බලපෑමක් ඇති කරයි.

කුටුම්භ ආදායම පරිභෝජන වියදම කෙරෙහි ඇති කරනු ලබන බලපෑමේ ස්භාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද කයි වර්ග පරීක්ෂාවට අනුව ගණනය කරන ලද වගු අගය ලෙස $P = 0.428$ ත් වෙසෙසියා මට්ටම $\propto=0.05$ ලෙසත් වේ. මෙයට අනුව $0.428 > 0.05$ හේතුවෙන් $H_0$ කල්පිතය පිළිගනු ලබයි. එනම් එමගින් පැහැදිලි වන්නේ කුටුම්භ ආදායම පරිභෝජන වියදම කෙරෙහි බලපෑමක් ඇති නොකරන බවයි. එනම්

ආදායම කුමන තත්වයක පැවතියද පරිභෝජන අවශ්‍යතාවන් ඉටු කරගැනීම සඳහා පුද්ගලයන් උත්සුක වන බවයි.

$H_0$ = කුටුම්භ ආදායම අධ්‍යාපනික වියදමට කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

$H_1$ = කුටුම්භ ආදායම අධ්‍යාපනික වියදමට කෙරෙහි බලපෑමක් ඇති කරයි.

කුටුම්භ ආදායම අධ්‍යාපනික වියදමට කෙරෙහි ඇති කරනු ලබන බලපෑමේ ස්භාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද කයි වර්ග පරීක්ෂාවට අනුව ගණනය කරන ලද වගු අගය ලෙස $P = 0.000$ ත් වෙසෙසියා මට්ටම $\alpha=0.05$ ලෙසත් වේ. මෙයට අනුව $0.000 < 0.05$ හේතුවෙන් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. එනම් එමගින් පැහැදිලි වන්නේ කුටුම්භ ආදායම අධ්‍යාපනික වියදම කෙරෙහි බලපෑමක් ඇති කරන බවයි.

**4.3.4 දෙමාපිය අධ්‍යාපන මට්ටම හා දරුවන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවක් පවතීද යන්න සොයා බැලීම**.

$H_0$ = දෙමාපිය අධ්‍යාපන මට්ටම දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි බලපෑමක් ඇති නොකරයි.

$H_1$ = දෙමාපිය අධ්‍යාපන මට්ටම දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කරයි.

*වගුව 4 . 3 : කයි වර්ග පරීක්ෂාව*

| **පරීක්ෂාව** | **කයි වර්ග අගය** | **වෙසෙසියා මට්ටම** | **තීරණය** |
|---|---|---|---|
| දෙමාපිය අධ්‍යාපන මට්ටම හා පළමු දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම | 0.067 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනියි |
| දෙමාපිය අධ්‍යාපන මට්ටම හා දෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම | 0.377 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනියි |
| දෙමාපිය අධ්‍යාපන මට්ටම හා තෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම | 0.190 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනියි |
| දෙමාපිය අධ්‍යාපන මට්ටම හා සිව්වන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම | 0.155 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනියි |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත 2020

දෙමාපිය අධ්‍යාපන මට්ටම දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී පවුලේ අධ්‍යාපනය ලබන සියළුම දරුවන් කෙරේ අවධානය යොමු කිරීම සිදු කරන ලදී. ඒ හේතුවෙන් එක් එක් දරුවාගේ අධ්‍යාපන මට්ටම කෙරෙහි දෙමාපිය අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල කිරීම හෝ නොකිරීම සම්බන්ධව වෙන වෙනම අවධානය යොමු කරන ලදී. දෙමාපිය අධ්‍යාපන මට්ටම හා පළමු දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී වගු සටහනට අනුව $P = 0.067$ ලෙස ලැබී ඇති අතර මෙහි වෙසෙසියා මට්ටම $\propto = 0.05$ ලෙස පවතී . කෙසේ වෙතත් $0.067 > 0.05$ වීම හේතුවෙන් $H_0$ කල්පිතය පිළිගැනීමට සිදුවේ. එනම් දෙමාපිය අධ්‍යාපන මට්ටම හා පළමු දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවක් නොමැතිබව පෙනීයයි.

දෙමාපිය අධ්‍යාපන මට්ටම හා දෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී වගු සටහනට අනුව $P = 0.377$ ලෙස ලැබී ඇති අතර මෙහි වෙසෙසියා මට්ටම $\propto = 0.05$ ලෙස පවතී . කෙසේ වෙතත් $0.377 > 0.05$ වීම හේතුවෙන් $H_0$ කල්පිතය පිළිගැනීමට සිදුවේ. එනම් දෙමාපිය අධ්‍යාපන මට්ටම හා දෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවක් නොමැතිබව පෙනීයයි. දෙමාපිය අධ්‍යාපන මට්ටම හා තෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී වගු සටහනට අනුව $P = 0.190$ ලෙස ලැබී ඇති අතර මෙහි වෙසෙසියා මට්ටම $\propto = 0.05$ ලෙස පවතී . කෙසේ වෙතත් $0.190 > 0.05$ වීම හේතුවෙන් $H_0$ කල්පිතය පිළිගැනීමට සිදුවේ. එනම් දෙමාපිය අධ්‍යාපන මට්ටම හා තෙවන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවක් නොමැතිබව පෙනීයයි.

දෙමාපිය අධ්‍යාපන මට්ටම හා සිව්වන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී වගු සටහනට අනුව $P = 0.155$ ලෙස ලැබී ඇති අතර මෙහි වෙසෙසියා මට්ටම $\propto = 0.05$ ලෙස පවතී . කෙසේ වෙතත් $0.155 > 0.05$ වීම හේතුවෙන් $H_0$ කල්පිතය පිළිගැනීමට සිදුවේ. එනම් දෙමාපිය අධ්‍යාපන මට්ටම හා සිව්වන දරුවාගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවක් නොමැතිබව පෙනීයයි. එනම් සමස්තයක් ලෙස ගත්කල පෙනී යන්නේ දෙමාපිය අධ්‍යාපනය මට්ටම කිසිඳු විටෙක තම දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි බලපෑමක් එල්ල නොකරණ බවයි.

## 5. සමාලෝචනය

කුටුම්භ මූලික ආර්ථික ආදායම සතිපොළ වෙළඳාම කරගත් ශ්‍රී ලංකාවේ සතිපොළ වෙළඳුන්ගේ ආර්ථික පසුබිම ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදුකර ඇත. සතිපොළ වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ ආර්ථික පසුබිම දරුවන්ගේ අධ්‍යාපනයට බලපාන්නේ ද? යන්න මෙම අධ්‍යනයේ අධ්‍යන ගැටලුව වේ. මෙම අධ්‍යනයේ මූලික අරමුණ වූයේ සතිපොළ වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සාධක මොනවාද? යන්න සොයා බැලීමයි. මීට අමතරව දරුවන්ගේ අධ්‍යාපනයට දෙමාපියන්ගේ ආර්ථික පසුබිම බලපාන්නේ ද? යන්න සොයා බැලීම හා දරුවන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරිම සඳහා යෙදිය හැකි පිළියම් මොනවා ද? යන්න සොයා බැලීම මෙම

අධ්‍යනයේ උප අරමුණු විය. මෙම අරමුණු තෘප්ත කර ගැනීම සඳහා අවශ්‍යය දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට මෙම අධ්‍යනයේ දී පොලෙහි වෙළඳාම් කරනු ලබන ද්‍රව්‍යය අනුව ස්ථරවලට බෙදා ඉන් අනතුරුව සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ නියැදිය තෝරා ගැනීම සිදුකරන ලදී. එලෙස නියැදුම් ක්‍රම කිහිපයක් යටතේ මෙම අධ්‍යනයට අදාළ නියැදිය තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යනය යටතේ සංගහනය බවට පත්ව ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල පිහිටා ඇති ප්‍රධාන සතිපොල තුනක් වන බැලුම්මහර , යක්කල හා කිරිල්ලවල යන සතිපොල හි වෙළදාමෙහි නිරත වන වෙළඳුන් ප්‍රමාණයයි. එම සතිපොල තත්වයන් තුන යටතේ සතිපොල තුනම නියෝජනය කරමින් වෙළඳාමෙහි නිරතවන පිරිස ප්‍රතිශතාත්මකව නියදි ඒකක 50 කින් යුත් නියැදියකට තෝරා ගන්නා ලදී. දත්ත රැස් කිරීම සඳහා මූලිකවම ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇත. ඒ අනුව ලබාගත් දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු සහ ප්‍රස්තාර සටහන් භාවිත කර ඇති අතර විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේද භාවිතා කර ඇත. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේදය, කයි වර්ග පරීක්ෂාව සහ බහුගුණ ප්‍රතිපායන පරීක්ෂාව ආදී දත්ත විශ්ලේෂණ සඳහා භාවිතා කරන ක්‍රමවේදයන් කිහිපයක් මෙයට යොදා ගන්නා ලදී.

මෙහිදී අවධානය යොමු කරන ලද පැතිකඩ වූයේ සතිපොල වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ ආර්ථික පසුබිම ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන සාධක පිළිබඳව සොයා බැලීමයි (වගුව 4.2). ඒ අනුව යොමු කරන ලද ගැටලුවට පිළිතුරු සපයමින් සමස්ත දෙමාපිය නියදියෙහිම එකඟත්වය වූයේ ඔවුන්ගේ ආදායම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන ප්‍රබලතම සාධකය බවටයි. ඒ අනුව දෙමාපිය ආදායම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපානු ලබන ප්‍රබලතම සාධකය ලෙස නිගමනය කල හැක. එය මත පදනම්ව මෙම අධ්‍යනය ක්‍රියාත්මක කරන ලද අතර ඊට අමතරව දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපාන ප්‍රබල සාධකයන් ලෙස අධ්‍යාපනයට ඇති කැමැත්ත හා යහපත් සමාජ සම්බන්ධතාවන් පැවැත්වීම නිගමනය කල හැක. බොහෝවිට ඔවුන් මෙවැනි ප්‍රකාශයන් ඉදිරිපත් කරන ලද්දේ ඔවුන්ගේ ජීවිතය තුල ඔවුන් ලද අත්දැකීම් පාදක කොටගෙනය. කෙසේ වුවද දෙමාපිය අධ්‍යාපන මට්ටම ඉක්මවූ අධ්‍යාපනයක් දරුවන් වෙත ලබාදීමට ඔවුන් උපරිමයෙන් වගබලාගන්නා බව සතිපොල වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් කෙරේ අවධානය යොමු කරන විට නිගමනය කල හැක.

අධ්‍යයන ගැටලුවට විසඳුම් සෙවීම සඳහා නිර්මාණය කර ගන්නා ලද ප්‍රධාන අරමුණ හා උප අරමුණු අනුව සතිපොල වෙළඳ කුටුම්භයන්හි ආර්ථික පසුබිම සහ ඔහුගේ දරුවන්ගේ අධ්‍යාපන පසුබිම අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී, කුටුම්භ ආර්ථික පසුබිම සහ එම දරුවන්ගේ අධ්‍යාපනය අතර සම්බන්ධතාවයක් පවතින බව කයි වර්ග පරීක්ෂාව මගින් සොයාගත හැකි විය. එමගින් කුටුම්භ මාසික ආදායම එම කුටුම්භවල දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි බලපෑමක් එල්ල කරනු ලබන බව නිගමනය කල හැක. එලෙසම කුටුම්භයක අධ්‍යාපනය සඳහා දරන වියදම කෙරෙහි එම කුටුම්භයෙහි අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව ද බලපෑමක් එල්ල කරනු ලබන නිගමනය කල හැක. ඒ අනුව කුටුම්භයක අධ්‍යාපනය සඳහා දරන වියදම කෙරෙහි එම කුටුම්භයේ අධ්‍යාපනය ලබන දරුවන් සංඛ්‍යාව අනුව තීරණය වන බව නිගමනය කල හැක. කුටුම්භ ආදායම පරිභෝජන වියදම කෙරෙහි බලපෑමක් ඇති නොකරන අතර

කුටුම්භ ආදායම අධ්‍යාපනික වියදම කෙරෙහි පමණක් බලපෑම් ඇති කරන බව තවදුරටත් තහවුරු වී ඇත. කෙසේ වෙතත් කයි වර්ග පරීක්ෂාව ඔස්සේ  දරුවන්ගේ අධ්‍යාපනික මට්ටම කෙරෙහි දෙමාපිය අධ්‍යාපනය මට්ටම මගින් කිසිඳු බලපෑමක් ඇති නොකරණ බව තවදුරටත් නිගමනය විය.

බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණයට අනුව කුටුම්භයේ අධ්‍යාපනය ලබන දරුවන් ගණන යන සාධකය ස්ථාවරව තිබිය දී කුටුම්භ මාසික ආදායම එක් ඒකකින් වැඩිවන විට කුටුම්භය අධ්‍යාපනය සඳහා දරන වියදම රු. 0.058 කින් වැඩිවන බව නිගමනය කල හැක. මාසික ආදායම ස්ථාවරව පවතින අවස්ථාවේ දී  කුටුම්භයේ අධ්‍යාපනය ලබන දරුවන් ගණන එක් දරුවකුගෙන් වෙනස්වීමේ දී කුටමුභය අධ්‍යාපනය සඳහා මාසිකව දරනු ලබන වියදම රු. 4630.052 කින් වැඩිවන බව නිගමනය කල හැක . කුටුම්භ මාසික ආදායම සහ කුටුම්භයේ අධ්‍යාපනය ලබන සිසුන් ගණන යන විචල්‍යයන් අධ්‍යාපන සඳහා වන කුටුම්භ පිරිවැය තීරණය කිරීමට ප්‍රබලව බලපාන සාධක ලෙස නිගමනය කල හැකි අතර එම සාධක සහ අධ්‍යාපන වියදම අතර අනුලෝම සම්බන්ධතාවයක් පවතින බවද තවදුරටත් නිගමනය කල හැක.

නියදියට අදාළ සමස්ත කුටුම්භයන් හි අධ්‍යාපනය ලබන දරුවන් 112 (ඇමුණුම1.2) ක් සිටින අතර මෙම සතිපොල වෙළඳ කුටුම්භයන් හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ මධ්‍යන අගය 2 ක් ලෙස පෙන්වාදිය හැක. එනම් මෙම කුටුම්භයන්හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ මධ්‍යන අගය දරුවන් දෙදෙනෙකු බව නිගමනය කල හැක. සතිපොල වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ දරුවන්ගෙන් 10% ක දරුවන් ප්‍රතිශතයක් පෙර පාසල් අධ්‍යාපනය ද, 17% ක දරුවන් ප්‍රතිශතයක් ප්‍රාථමික අධ්‍යපනය ද, 40% ක දරුවන් ප්‍රතිශතයක් ද්වීතීක අධ්‍යාපනය ද, 23% දරුවන් ප්‍රතිශතයක් තෘතියික අධ්‍යාපනය ද, 10% ක දරුවන් ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ද නිරත වේ. මෙම දරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් මේ වන විට ද්වීතීක අධ්‍යාපනයේ නිරත වන අතර සම ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ හා පෙර පාසල් අධ්‍යාපනයේ නිරත වේ. සෑම අධ්‍යාපන මට්ටමකම අධ්‍යාපන කටයුතුවල නිරත වන දරුවන් මෙම කුටුම්භයන් තුල දක්නට ලැබේ. දෙමාපිය අධ්‍යාපන මට්ටම හා බලන කල සෑම දරුවකුම වාගේ යහපත් අධ්‍යාපන මට්ටමක පවත්නා බව මේ අනුව නිගමනය කල හැක.

සතිපොල වෙළඳුන්ගේ අධ්‍යාපන තත්වය දෙස බලන කල 12% ක් ප්‍රාථමික අධ්‍යාපනය ද, 42% ක් 5 සිට 10 වසර දක්වා ද, 36% ක් සාමාන්‍යය පෙළ දක්වාද, 10% ක් උසස් පෙළ දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. මේ අනුව අධ්‍යාපන මට්ටම් බේදයකින් තොරව සතිපොල වෙළඳාමෙහි පුද්ගලයන් නිරත වන බව නිගමනය කල හැක. කෙසේ වෙතත් 5 සිට 10 වසර දක්වා වු අධ්‍යාපන මට්ටම තුල අධ්‍යාපනය අවසන් කරන ලද බොහෝ පිරිසක් පොල වෙළඳාම කෙරෙහි යොමු වී ඇති බවක් පෙනීයයි. සාමාන්‍යය පෙළ දක්වා වු අධ්‍යාපන මට්ටම දක්වා අධ්‍යාපනය අවසන් කරන ලද සැලකිය යුතු ප්‍රමාණයක් ද මෙම ආර්ථික ක්‍රියාවලිය කරා යොමු වී ඇත. රටෙහි යම්තාක් දුරකට අධ්‍යාපනය ලද පිරිසක් සතිපොල වෙළඳාම හා සම්බන්ධව කටයුතු කරන බව මේ අනුව පෙන්වාදිය හැක. කෙසේ වෙතත් දෙමාපිය තහවුරුවට අනුව කුටුම්භ ආදායම, අධ්‍යාපනයට ඇති කැමැත්ත, යහපත් සමාජ සම්බන්ධතා හා යහපත් මානසික මට්ටමක් පැවතීම වැනි සාධකයන් දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ බලපාන සාධක ලෙස නිගමනය හැක.

අධ්‍යාපනය යනු සෑම පුද්ගලයකුගේම ජීවිතයට අත්‍යවශ්‍ය වූ මූලිකම සාධකයකි. මෙම අධ්‍යනය තුලදී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරන ලද්දේ සතිපොල වෙළඳාමෙහි නිරතවන කුටුම්භ 50 ක නියැදියක් කෙරේ වන අතර මෙහිදී මූලිකවම අවධානය යොමු කරන ලද්දේ එම වෙළඳ කුටුම්භයන්හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපනය කෙරේ සතිපොල වෙළඳ දෙමාපියන්ගේ ආර්ථික පසුබිම කවර බලපෑමක් එල්ල කරන්නේද? යන්න පිළිබඳවයි. දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපිය ආදායමෙහි ප්‍රමාණාත්මක බව විමසූ කල 18% ක වෙළඳාමෙහි නිරතවන දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමඟම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ ප්‍රමාණවත් වන බවයි. 28% ක වෙළඳමෙහි නිරතවන දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමඟම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ තරමක් ප්‍රමාණවත් බවයි. 20% ක වෙළඳාමෙහි නිරතවන දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමඟම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ මධ්‍යස්ථ බලපෑමක් එල්ල කරන බවයි. 24% ක වෙළඳාමෙහි නිරතවන දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමඟම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ ප්‍රමාණවත් නොවන බවයි. 10% ක වෙළඳාමෙහි නිරතවන දෙමාපිය ප්‍රතිශතයක් පවසා සිටින්නේ තම ආදායම පවුලේ අනෙකුත් අවශ්‍යතාවන් හා සමඟම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරේ තරමක් ප්‍රමාණවත් නොවන බවයි. කෙසේ වුවද 18% ක වෙළඳාමෙහි නිරත දෙමාපිය ප්‍රතිශතයකට හැර අනෙක් බොහෝ අයවලුන්ගේ ප්‍රකාශවලින් කුටුම්භය තුල පවතින අනෙකුත් වියදම් හා සමඟ දරුවන්ගේ අධ්‍යාපන වියදම දරාගැනීමට අපහසුබව නිගමනය කල හැක.

අධ්‍යනයට සම්බන්ධ වූ දත්ත දායකයන්ගෙන් 60% ක් පුරුෂයින් වන අතර 40% ක් ස්ත්‍රීන් වේ. වයස 30-40 ත් අතර වයස් කාණ්ඩයේ 38% ක්ද, 40-50 ත් අතර 30% ක්ද, 50-60 ත් අතර වයස් කාණ්ඩයේ 26% ක්ද, 60ට වැඩි වයස් කාණ්ඩයේ 6% ක් ද වේ. මෙයින් පෙනීයන ආකාරයට පොලෙහි වෙළඳාමෙහි නිරතවන වැඩි පිරිසක් වයස 30 ත් 40 ත් අතර පිරිසය කෙමෙන් වයස් ප්‍රමාණය වැඩිවීම හා සමඟ පොල වෙළඳාමෙහි නිරතවීමේ අඩුවීමක් දක්නට ලැබේ. වයස අවුරුදු 60 ට වඩා ඉහළ අයවලුන්ගෙන් 6% ක් පමණක් ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත්වීම මගින් එය නිගමනය කල හැක. නියැදිය හා සම්බන්ධ සෑම වෙළඳ දෙමාපියකුම අවම වශයෙන් සතිපොල තුනක් මූලික කරගනිමින් තම වෙළඳාම් කටයුතුවල නිරතවන අතර ඔවුන් විවිධ වූ භාණ්ඩ අලෙවියේ නිරත වෙති. කෙසේ වෙතත් මොවුන් සතිපොල තුලින් මාසිකව උපයන ආදායමෙහි මධ්‍යනය රු. 85236 ක් බව (ඇමුණුම1.1) නිගමනය කල හැක.

සමස්තයක් ලෙස ගත් කල කුටුම්භ මූලික ආර්ථික ආදායම සතිපොල වෙළඳාම කරගත් ශ්‍රී ලංකාවේ සතිපොල වෙළඳුන්ගේ ආර්ථික පසුබිම ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි සැලකිය යුතු තරමේ බලපෑමක් එල්ල කරනු ලබන බව නිගමනය කල හැක. සතිපොල යනු මොවුන්ගේ ස්ථිර ආදායම් මාර්ගය වූ පමණින්ම එය ස්ථිර ලෙස අර්ථ දැක්විය නොහැකිය. මන්දයත් මොවුන් ලබන දෛනික ආදායම තීරණය වන්නේ භාණ්ඩ මිලදී ගන්නා පාරිභෝගිකයන් සංඛ්‍යාව හා දෛනික පාරිසරික තත්වය, පාරිභෝගික රුචිය මතයි. සෑම දිනකම ඔවුන්ගේ ආදායම් තත්වය ඒ තරම් සුබදායක තත්වයක් නොපෙන්වයි. මෙවැනි අපහසුතාවන් මත්තේ දිවිගෙවන කුටුම්භයන් හි දරුවන් වෙනුවෙන් අධ්‍යාපනික ශිෂ්‍යාධාරයක් හෝ එම පවුල් වෙත සහනාධාර ක්‍රියාපිළිවෙතක් අනුගමනය කිරීම වඩාත්

සුදුසු වේ. මන්දයත් මෙම දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් කෙරේ බැලුකල පෙනීයන්නේ මෙම දරුවන්ගේ අධ්‍යාපනික සිහිනය මල්ඵල ගැන්වීමට ඔවුනට උපකාර කිරීමට රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට ද හැකියාවක් පවතින නිසාවෙනි. තවද වර්තමානය වන විට පාසල් අධ්‍යාපනයට මෙන්ම අමතර පන්ති සඳහා ද අධික වියදමක් දැරීමට සිදුවේ. මෙවැනි කුටුම්භයන් හි අධ්‍යාපනය ලබන දරුවන්ගේ අමතර පන්ති සඳහාද සහන මුදලක් ලබාදීම වඩාත් සුදුසුවේ. එය ඔවුනය මහත් අස්වැසිල්ලක් වේ.

වෙළඳාමෙහි නිරතවන දෙමාපියන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන මෙම සතිපොල වෙළඳාම ක්‍රියාත්මක වන භූමි ප්‍රදේශය තවදුරටත් සංවර්ධන කරමින් ඔවුන්ට වෙළඳාම සඳහා අවශ්‍යය පහසුකම් වඩාත් සාර්ථකව හා පුළුල් ලෙස ලබාදීම මගින් මෙම වෙළඳ ප්‍රජාවගේ ආදායම දියුණු කරගැනීමට අතහිත ලබාදීමට රාජ්‍යය අංශය හා පෞද්ගලික අංශය උත්සුක විය යුතු බව තවදුරටත් පෙන්වාදිය හැක. ඒ රාජ්‍යය අංශය හරහා මෙන්ම පෞද්ගලික අංශය හරහා ද ක්‍රියාත්මකවන සතිපොල පවතින බැවිනි. පොල පවතින ප්‍රදේශය මෙන්ම වෙළඳකුටි තවදුරටත් අළුත්වැඩියා කිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම පොල වෙත මිනිසුන් ආකර්ෂණය කරගැනීමට හෝ ගෙන්වා ගැනීමට කටයුතු කිරිමට සතිපොල ක්‍රියාත්මක කරනු ලබන ආයතන හෝ පුද්ගලයන් වග බලාගත යුතු වේ.

එලෙසම වර්තමානය තුල අධ්‍යාපනය හා සමගාමීව උපයෝගී කරගනු ලබන ලැප්ටොප් පරිගණක වැනි විද්‍යුත් උපාංගයන් මෙන්ම දුරකථන හරහා ක්‍රියාත්මකවන zoom වැනි අධ්‍යාපනික මෘදුකාංග කෙරෙහි ද දෙමාපියන්ගේ දැනුවත්භාවය දුර්වල මට්ටමක පවතී. ඒ හේතුවෙන් මෙම වසංගත සමය තුල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බාධාවන් එල්ල වු බව ඔවුන් දැඩි සේ පවසා සිටි අතර ඒ සඳහා මෙම විද්‍යුත් උපාංගයන් හා මෘදුකාංගයන් සම්බන්ධව හා ඒවායෙහි ක්‍රියාකාරීත්වය සම්න්ධව දෙමාපියන් දැනුවත් කිරිම සඳහා ඒ හා සම්බන්ධව කටයුතු කරන ආයතනයන් හෝ පුද්ගලයන් පාසල් මට්ටමින් හෝ ග්‍රාමීය මට්ටමින් කටයුතු කිරීම වඩාත් සුදුසු වේ. එනම් අධ්‍යාපනික උපකරණයන් පිළිබඳව නිසි දැනුවත්භාවය වඩාත් ඵලදායී අධ්‍යාපනයක් ලැබිමට හේතුවන නිසාවෙනි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Alice, J., & Carmel, O. (2014). Influence of Parental Education and Family Income on Children's Education in Rural Uganda. Global Education Review, 147-166.

Dagar, B. (2017). Unit 1 Concept and Meaning of Education. Retrieved from http://www.egyankosh.ac.in

Ellis, P. (2019). How Nelson Mandela created the conditions for success. Retrieved from Cambridge Assessment International Education: https://blog.cambridgeinternational.org/

Kagan, J. (2020). Income Definition. Retrieved from Retrieved from Investopedia : https://www.investopedia.com/

Paulo Freire. (1973). Education for Critical Consciousness. New York,Seabury.

Prime Minisre's Office. (2009). Consulate General Of Sri Lanka, Toronto. Retrieved from "Adopt a Village Market": http://www.torontoslcg.org/

Ruby. (2017). The cone of experience by edgar dale. The e- learning Network.

Tao, L., & Han, L. (2017). The effects of family income on children’s education: An empirical analysis of CHNS data . Research on Modern Higher Education .

# ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව

ඩී. කේ. තාරුකා

*සමාජ සංඛ්‍යාන අධ්‍යනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය*
kasunitharuka966@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාව පිළිබඳව අවධානය යොමු කිරීමේදී ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බවත් මෑත කාලීනව රැකියා ක්ෂේත්‍රයේ සෑම අංශයක් සඳහාම අතවශ්‍ය වන මූලික සුදුසුකමක් බවට පරිගණක සාක්ෂරතාවක් තිබීම වැදගත් වේ. මෙවැනි පසුබිමක් යටතේ මෙම පර්යේෂණයේ මූලික අධ්‍යන ගැටලුව වන්නේ වූයේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක කවරේද යන්නයි. මෙම ගැටලුව මත පදනම්ව ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හා ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම සඳහා බලපාන සාධක පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම හඳුනා ගැනීම මෙහි අරමුණු වේ. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෝපෙ 5 ග්‍රාම සේවා වසමෙහි වෙසෙන සේවා නියුක්තිකයන් රැකියාවේ ස්වභාවය මත පදනම්ව සේවා නියුක්තකයින් 100ක නියැදියක් සසම්භාවී නියැදි ක්‍රමවේදයක් වන ස්තෘත සම්භාවිතා නියැදි ක්‍රමය ඔස්සේ තෝරා ගන්නා ලදී. නියැදිය තෝරා ගැනීමේදී ග්‍රාමීය අංශය නියෝජනය කිරීම සඳහා දෝපෙ 5 ග්‍රාම සේවා වසම පමණක් තෝරා ගැනීමට සිදුවීම මෙම අධ්‍යයනයේ ප්‍රධානතම සීමාව වේ. නියැදි දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කර ඇත. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, බහු ප්‍රතිචාර විශ්ලේෂණය, සාධක විශ්ලේෂණය, කයිවර්ග පරීක්ෂාව යන විශ්ලේෂණ ක්‍රමවේද යොදා ගෙන ඇත. අධ්‍යයන ප්‍රතිඵල අනුව ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන ප්‍රධාන හතරක් හඳුනා ගැනීමට හැකි වූ අතර එනම් පරිගණක භාවිතයේ දැක්ම පිළිබඳ පුද්ගලික බලපෑම, රැකියා ස්ථානය හා සම්බන්ධ ආයතනික බලපෑම, පාසැල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික බලපෑම, පරිගණක භාවිතයට අවශ්‍ය වන යටිතල පහසුකම්වල බලපෑම සහ පරිගණක භාවිතය සම්බන්ධයෙන් ඇති පුහුණු අවස්ථා යන ප්‍රධාන සංරචක පහක් හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම මෙම සාධක හා පරිගණක සාක්ෂරතා මට්ටම අතර සම්බන්ධතාවක් පවතින බව ද 95% ක විශ්වාසනීයත්වය මට්ටමකින් නිගමනය කළ හැක.*

***මුඛ්‍ය පදඃ ග්‍රාමීය අංශය, සේවා නියුක්තිකයා, පරිගණක සාක්ෂරතාව***

## 1. හැඳින්වීම

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ වර්තමාන සමාජය සංඛ්‍යාංක යුගයකට පිවිස ඇති පසුබිමක් යටතේ පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම පැවතීම අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව ඇත. පරිගණක සාක්ෂරතාව යනු, පරිගණකය භාවිත කරමින් කුමක් හෝ කාර්යයක් ඉටු කර ගැනීමට ඇති දැනුම සහ හැකියාවයි (Tumburku,

et al., 2019). එනම් පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම හා ඒවා කාර්යක්ෂමව භාවිතා කිරීමට ඇති හැකියාවයි. පරිගණක සාක්ෂරතාවයේ තවත් වැදගත් අංශයක් වන්නේ පරිගණක ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න දැන සිටීමයි. Dincer (2016) පරිගණක සාක්ෂරතාව අර්ථ දක්වන්නේ පුද්ගල අරමුණු සඳහා පරිගණකය හා තාක්ෂණය ඵලදායීව භාවිත කිරීම පිළිබඳව පවතින දැනුම හා කුසලතා මට්ටම ලෙසයි. පරිගණක තාක්ෂණය අද වන විට ලෝකයේ බොහෝ උනන්දුවක් හා වැදගත්කමක් ඇති පර්යේෂණ විෂයක් ලෙස හැඳින්විය හැකි අතර වර්තමානය වන විට මෙය වඩාත් වැදගත් වන්නේ පරිගණක තාක්ෂණයේ සංවර්ධනයටත් වඩා ඒ හා බැඳුණු අනෙකුත් ක්ෂේත්‍ර සංවර්ධනය උදෙසාය. ආර්ථික සංවර්ධනයේ දිගුකාලීන උත්ප්‍රේරකය වන්නේ තාක්ෂණකි දියුණුව හා නව්‍යකරණයයි. එනම් පරිගණක තාක්ෂණය රටක සංවර්ධනයට විවිධාකාරයෙන් යොදාගත හැකිය. වර්තමානයේ පුද්ගලයන්ගේ දෛනික කටයුතු සහ ආයතනයන්හි කාර්යයසාධනය, නිෂ්පාදනය කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව දියුණු කිරීම සඳහා භාවිත කළ හැකි මෙවලමක් ලෙස පරිගණක තාක්ෂණය හඳුනාගෙන ඇත. එදිනෙදා ජීවිතයෙදි අපිට මුහුණ පෑමට සිදුවන සමහර ගැටළු වලට ඉක්මන් වගේම සාර්ථක විසඳුම් තොරතුරු තාක්ෂණය භාවිතා කර ලබාගත හැක.

Gupta(2006) විසින් කරන ලද අධ්‍යයනය මගින් සොයාගෙන ඇත්තේ පරිගණක හා තොරතුරු තාක්ෂණය බැංකු , සන්නිවේදන, ප්‍රවාහන, මාධ්‍ය, වෛද්‍ය, අධ්‍යාපන හා ආරක්ෂක ආදි බොහොමයක් ක්ෂෙත්‍රයන්හි භාවිත වන බැවින් පරිගණක සාක්ෂරතාව පැවතීම ළමා, තරුණ, වැඩිහිටි හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආදී සියලුම වයස් මට්ටම්වල පුද්ගලයන් හට ප්‍රතිලාභ රැසක් ලබාදෙන බවයි. 2005 දී මූලික පරිගණක හැකියාව පැවතීම දියුණු රටවල සැලකිය යුතු ලක්ෂණයක් වූ අතර පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය මගින් වැදගත් පියවර කිහිපයක් ගන්නා ලදී. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ බොහෝ පාසල් සඳහා පරිගණක විද්‍යාගාරයක් තිබීම, සියලුම පාසල් වල කනිෂ්ඨ අංශයේ සිට අ.පො.ස. සාමාන්‍ය පෙළ, උසස් පෙළ පමණක් නොව උපාධි, පශ්චාත් උපාධි සඳහා ද පරිගණක හා තොරතුරු තාක්ෂණ විෂය ඇතුළත් කොට තිබීම, විදාතා, නැණසල වැනි ආයතන පිහිටවීම මේ අතර ප්‍රධාන වේ. මෙම විෂයෙන් උපාධිය ලබා ගැනීමට විශාල පිරිසක් ඉදිරිපත් වන බව මෙරට විශ්වවිද්‍යාල දෙස බලන විට පෙනී යයි. එපමණක් නොව අද වන විට ආයතනයනහි බොහෝ කාර්යයන් පරිගණක තාක්ෂණය භාවිතයෙන් සිදු වේ. එබැවින් දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා සඳහා පරිගණක සාක්ෂරතාව පැවතීම අත්‍යාවශ්‍ය සුදුසුකමක් බවට පත්ව ඇත. මෙවැනි පසුබිමක් යටතේ ශ්‍රී ලංකාව තුළ පරිගණක භාවිතය හා පරිගණක අධ්‍යාපනය පිළිබඳ දැනුම පැවතීම අත්‍යාවශ්‍යම අංගයකි. 2019 දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කොට ඇති පරිගණක සාක්ෂරතා සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5-69 අතර ජනගහනයේ පරිගණක සාක්ෂරතාව 32% ක් පමණ වන බවත් ප්‍රාදේශීය වශයෙන් නාගරික, ග්‍රාමීය හා වතු අංශ අතරින් ඉහළම පරිගණක සාක්ෂරතා අනුපාතයක් 41.5%ක් නාගරික අංශයෙන් බවත්, ග්‍රාමීය හා වතු අංශවල පරිගණක සාක්ෂරතාව පිළිවලින් 28.6%ක් හා 13.7%ක් බවත් පෙන්වා දෙයි (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව, 2019).

ප්‍රායෝගිකව සලකා බලන විට මෙමගින් පැහැදිලි වන්නේ පරිගණක භාවිතය මෙන්ම පරිගණක අධ්‍යාපනය ද ශ්‍රී ලංකාවේ තදාසන්න ප්‍රදේශ වලට පමණක් සීමා වී ඇති බවයි. මේ හේතුව නිසාම ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම ශ්‍රී ලංකාවේ සංවර්ධනයට වැදගත් වනු ඇත. Kumar ඇතුළු පිරිස (2014) විසින් ලද අධ්‍යයනය මගින් සොයාගෙන ඇත්තේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම සඳහා පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම්, පරිගණක භාවිතය පිළිබඳව පවතින දැනුවත් බව, පාසල් අධ්‍යාපනයෙන් සිදුවන බලපෑම, පරිගණක භාවිතය පිළිබඳව පවතින අත්දැකීම් ආදී බලපාන බවයි. තවද දේවාලවත්ත (2019) විසින් කරන ලද අධ්‍යයනයේ දී පරිගණක සාක්ෂරතාව තීරණය වීම සඳහා බලපාන ප්‍රබල සාධක ලෙස පරිගණකය පිළිබඳව පවතින ආකල්ප සහ රැකියා ස්ථානය තුළ පවතින තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියේ සංවිධානාත්මක බව යන සාධක හඳුනාගෙන ඇත. අද වන විට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජන ජීවිතය තුළට ද විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් මුල් බැසගෙන හමාරය. අධ්‍යාපන, රැකියා, කලා, විනෝදාස්වාද, ක්‍රීඩා වැනි බොහොමයක් ක්ෂේත්‍ර සඳහා පරිගණකය නැතුවම බැරි මෙවලමක් බවට පත්ව ඇත. එබැවින් ශ්‍රී ලංකාව තුළ පරිගණක භාවිතය හා පරිගණක අධ්‍යාපනය පිළිබඳ දැනුම පැවතීම අත්‍යාවශ්‍යම අංගයකි.

ශ්‍රී ලංකාව තුළ පරිගණක සාක්ෂරතාව පිළිබඳව පර්යේෂකයන් විසින් අවධානය යොමු කොට තිබුණද පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනයන් ඇත්තේ ඉතා අඩුවෙනි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳව අවධානය යොමු කොට ඇති අධ්‍යයනයක් සොයා ගැනීමට නොමැති තරම්ය. මෙවැනි පසුබිමක් යටතේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම කාලීන වශයෙන් වැදගත් වේ. මෙලෙස මෙම අධ්‍යනයේ දී සාහිත්‍ය විමර්ශනය ඇසුරින් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳව සොයා බැලූ අතර ප්‍රධාන සංරචක පහක් යටතේ එම සාධක හඳුනා ගන්නා ලදී. මෙලෙස ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධකත් පරිගණක සාක්ෂරතා මට්ටම අතර සම්බන්ධතාවක් පවතී ද යන්න විමසීමේදී සොයාගත හැකි වූයේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධකත් පරිගණක සාක්ෂරතා මට්ටමත් අතර සම්බන්ධතාවක් පවතින බවයි.

රටක් සංවර්ධනය කරා ඉදිරියට යන ගමනේදී නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය ද අනිවාර්යෙන්ම සංවර්ධනය විය යුතුය. රටක බොහොමයක් රැකියා ක්ෂේත්‍රයන්හි කාර්යයන් සිදු වන්නේ පරිගණක තාක්ෂණය භාවිතයෙන් ය. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතියද පරිගණක සාක්ෂරතාව පහළ මට්ටමක පවතී. තවදුරටත් කිව හැකි කරුණක් වන්නේ නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව පහළ මට්ටමක පැවතීමයි. මේ පිළිබඳව ප්‍රායෝගිකව සලකා බලන විට පැහැදිලි වන්නේ පරිගණක භාවිතය මෙන්ම පරිගණක අධ්‍යාපනය ද ශ්‍රී ලංකාවේ තදාසන්න නගරවලට පමණක් සීමා වීම විශාල ගැටළුවක් බවයි. වර්තමානය වන විට බොහෝ රැකියා සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව පරිගණක හැකියාවක් පැවතීම අත්‍යවශ්‍යම සුදුසුකමක් බවට පත්ව ඇත. තවද පරිගණක උපාධිධාරීන් සඳහා දේශීය මෙන්ම විදේශ රැකියා වෙළෙඳපොළ සැම විටම විවෘතය.

ගෝලීය වශයෙන් සැලකූ විට ලෝකයේ බොහෝ රටවල් පරිගණක අධ්‍යාපනයේ දියුණුවත් සමඟ නිසි ප්‍රයෝජන ලබා ගන්නා බව පැහැදිලිය. ශ්‍රී ලංකාවට ද මෙම තත්ත්වය කරා පැමිණිය හැකිය. මේ අනුව සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් තාක්ෂණයක් සමඟ සංවර්ධනය කරා ඉදිරියට යන ගමනේදී ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාවය ඉහළ නැංවීම අනිවාර්ය වේ. ගැටලුව වී ඇත්තේ පරිගණක සාක්ෂරතාව නාගරික ප්‍රදේශවලට සාපේක්ෂව බලන කල ග්‍රාමීය අංශයේ පහළ මට්ටමක පැවතීමයි. මෙම සියලු කරුණු මගින් පැහැදිලි වන්නේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක කවරේද යන ගැටලුව පිළිබඳ විමසා බැලිය යුතු බවයි. මේ අනුව ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක කවරේද යන්න අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යන ගැටලුවයි.

මෙම අධ්‍යයනයේ අරමුණු ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සහ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම සඳහා බලපාන සාධක පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි කරනු ලබන බලපෑම හඳුනා ගැනීම විය.

## 2. සාහිත්‍ය විමර්ශනය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක සඳහා හඳුනා ගැනීමය. එබැවින් මෙම අරමුණ ඉටුකර ගැනිමට ප්‍රථමව පරිගණක සාක්ෂරතාව පිළිබඳව විවිධ විද්වතුන් විසින් පෙර කරන ලද පර්යේෂණ අධ්‍යයනය කිරීම වැදගත් වේ. එනම් පෙර පර්යේෂණ අධ්‍යයනය කිරීම තුළින් මෙම පර්යේෂණය කිරීමට යෝග්‍ය පර්යේෂණ හිඩැස හඳුනා ගැනීමට පහසු වනු ඇත. මෙම පරිච්ඡේදය තුළ සාක්ෂරතාව සහ පරිගණක සාක්ෂරතාව හඳුනා ගැනීම, පරිගණක සාක්ෂරතාව මිනුම් කරන ආකාරය හඳුනා ගැනීම, ග්‍රාමීය අංශය හඳුනා ගැනීම සහ ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සාහිත්‍ය විමර්ශනය පෙළගැස්ම නිර්මාණය කොට තිබේ.

සාක්ෂරතාව පිළිබඳව මෙන්ම සාක්ෂරතාවේ එක් පැතිකඩක් වන පරිගණක සාක්ෂරතාව පිළිබඳව ද විවිධ අර්ථ දැක්වීම් ඇති අතර මෙම අධ්‍යයනය සඳහා පහත දැක්වෙන නිර්වචන යොදා ගනු ලබයි. සාක්ෂරතාව යන්න අර්ථ දැක්වීමේදී ඒ පිළිබඳ නිශ්චිත වූ නිර්වචනයක් ඉදිරිපත් කිරීම ඉතා අපහසු කාර්යයකි. මන් ද විවිධ පුද්ගලයින් සාක්ෂරතාව යනු කුමක් ද යන්න පිළිබඳ විවිධ ස්වරූපයන්ගෙන් නිර්වචනය කර තිබීමයි. සාක්ෂරතාව යන සංකල්පය පටු හෝ පුළුල් ලෙස අර්ථ දැක්විය හැකිය. පටු අර්ථයෙන් ගත් කළ සාක්ෂරතාව යනු කඩදාසියක් මත සංකේත කර ඇති දෙයක් ලිවීමට හා කියවීමට ඇති තාක්ෂණික හැකියාව වේ. මෙය සාම්ප්‍රදායික සාක්ෂරතාව නම් වේ. එදිනෙදා ජීවිතයේ දී කිසියම් පුද්ගලයෙකුට කෙටි සරල ප්‍රකාශයක් අවබෝධ කර ගනිමින් කියවීමට හා ලිවීමට ඇති හැකියාව සාක්ෂරතාව ලෙස හැඳින්විය හැකිය (UNESCO, 2006). එමෙන්ම Blake සහ Hanley (1995) සාක්ෂරතාව අර්ථ දක්වන්නේ චතුර ලෙස ලිවීමට හා කියවීමට ඇති හැකියාව ලෙසයි.

ඊට සමාන නිර්වචනයක් ඉදිරිපත් කරමින් සාක්ෂරතාව The National Literacy Trust (2012) වාර්තාව අර්ථ දක්වන්නේ හොඳින් කියවීමට, ලිවීමට, කතා කිරීමට සහ සවන් දීමට ඇති හැකියාව ලෙසයි. සාක්ෂරතාව ඇති පුද්ගලයකුට අනෙකා සමඟ ඵලදායිව කටයුතු කිරීමට සහ ලිඛිතව ඇති යම් තොරතුරක් හොඳින් තේරුම් ගැනීමටත් හැකියාවක් ඇති බව එමගින් තව දුරටත් අවධාරණය කරයි. පරිගණක සාක්ෂරතාව අර්ථ දැක්වීමේදී ඒ පිළිබඳව නිශ්චිත වූ නිර්වචනයක් ඉදිරිපත් කිරීම ඉතා අපහසු කාර්යයකි. මන්ද විවිධ පර්යේෂකයන්, විවිධ තාක්ෂණික විද්‍යාලවල හා විශ්වවිද්‍යාලවල විද්වතුන් පරිගණක සාක්ෂරතාව යනු කුමක් ද යන්න පිළිබඳව විවිධ ස්වරූපයෙන් නිර්වචනය කර තිබීමයි. එනමුත් පරිගණක සාක්ෂරතාව යනු කුමක් ද යන්න හැඳින්වීමට ඉදිරිපත් වී ඇති නිර්වචන ගැන විද්වතුන් අතර නිශ්චිත එකඟතාවයක් නැත. 1992 දී Smith සහ Crawford යන පර්යේෂකයින් දෙදනා සඳහන් කර ඇත්තේ තොරතුරු තාක්ෂණයේ විප්ලවයත් සමඟ පරිගණක සාක්ෂරතාව යන සංකල්පය දිනෙන් දින වෙනස් වන බවයි. මේ නිසා පරිගණක සාක්ෂරතාව යනු කුමක්ද යන්න පිළිබඳ අවබෝධ කරගැනීම සඳහා මෙවැනි විද්වතුන් කිහිපදෙනෙකුගේ නිර්වචන කිහිපයක් සලකා බැලීම වටී. ඉන්පසු එම නිර්වචන සියල්ල පදනම් කරගෙන අපට පොදු නිර්වචනයක් ගොඩනගා ගත හැකිය. පරිගණක සාක්ෂරතාව Smith සහ Crawford (1992) අර්ථ දක්වන්නේ පුද්ගලයකුට පරිගණකය තම කාර්යයන් සඳහා භාවිත කිරීමට ඇති හැකියාව සහ දැනුම ලෙසයි. එමෙන්ම Oseghale සහ John (2014) පරිගණක සාක්ෂරතාව සංකල්පය "පුද්ගලයෙකුට පරිගණකය අදාළ තාක්ෂණයන් සමඟ කාර්යක්ෂමව භාවිතා කිරීමේ දැනුම සහ හැකියාව" ලෙස අර්ථ දක්වා ඇත. තවද ඇතැම් පර්යේෂකයන් දක්වා ඇත්තේ පරිගණක සාක්ෂරතාව යනු පරිගණකය ඊට අදාළ තාක්ෂණයත් සමඟ භාවිත කිරීමේ හැකියාව හා දැනුම මෙන්ම කාර්යක්ෂමව වැඩසටහන් එනම් ක්‍රමලේඛ භාවිත කිරීම සහ යම්කිසි ගැටලුවක් පරිගණකය භාවිතයෙන් විසඳීමට අවශ්‍ය නිපුනණතාවද ඊට අඩංගු විය යුතු බවයි (Michael & Igenewari, 2018; Railkar & Katyare, 2014).

තවද Ezziane (2007) අනුව පරිගණක සාක්ෂරතා යනු පරිගණක භාවිතයේ දී ඒ හා සම්බන්ධ මූලික යෙදුම් (Applications) භාවිතයයි. එමෙන්ම Alarape සහ Suleiman (2014) පරිගණක සාක්ෂරතා සංකල්පය තවදුරටත් පුළුල් කළේය. ඔවුන්ට අනුව පරිගණක සාක්ෂරතාව පරිගණක යෙදුම් භාවිතා කිරීමේ දැනුම සහ හැකියාව ලෙසත් විශේෂයෙන් සන්නිවේදන අරමුණු සඳහා අන්තර්ජාල තාක්‍ෂණයත් සමඟ පරිගණකය කාර්යක්ෂමව භාවිත කිරීමේ හැකියාව ලෙසත් අර්ථ දක්වා ඇත. මෙහිදී වඩාත්ම වැදගත් වන්නේ තාක්ෂණික දැනුම බව විශ්වාස කෙරේ. කෙසේ වෙතත්, ඔහු තවදුරටත් දක්වා සිටියේ පරිගණකය භාවිතයේ අරමුණු පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකි බැවින් පරිගණක සාක්ෂරතාව සම්බන්ධයෙන් පැහැදිලි නිර්වචනයක් ඉදිරිපත් කළ නොහැකි බවයි.

Gupta (2006) පවසන පරිදි පරිගණක සාක්ෂරතාව යනු කිසියම් පුද්ගලයෙකුට පරිගණක පද්ධතියක් තනිව ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවයි. එනම් පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක කිරීම (මෙහෙයුම් පද්ධතිය) පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතු අතර ඒවා නම් පරිගණකයේ ඇති ගොනු තැන්පත් කිරීම, පිටපත් කිරීම පිටපත් තබා ගැනීම හා ගබඩා කිරීම, මකා දැමීම, විවෘත කිරීම, ලේඛනයක් මුද්‍රණය කිරීමට, සංයුක්ත තැටියක්

ආකෘතිගත කිරීමට, පරිගණක යෙදුම් මෘදුකාංග පුද්ගලික හෝ රැකියා සම්බන්ධ යම්කිසි කාර්යයක් ඉටු කිරීමට යොදා ගැනීම, වෙබ් බ්‍රවුසර් සහ අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට සෙවුම් යන්ත්‍ර භාවිත කිරීම, විද්‍යුත් තැපෑල භාවිතය (විද්‍යුත් තැපැල් යැවීම සහ ලබා ගැනීම) මගින් සන්නිවේදන කටයුතු සිදු කිරීමට පවතින හැකියාව ලෙස ඔහු පරිගණක සාක්ෂරතාව තව දුරටත් විස්තරාත්මකව අර්ථ දක්වා ඇත. මේ අනුව පැහැදිලි වන්නේ පරිගණක සාක්ෂරතාව පිළිබඳ විවිධ අර්ථකථන ඇති බවයි.

නමුත් මෙම අධ්‍යයනය සඳහා පරිගණක සාක්ෂරතාව සම්බන්ධයෙන් Hsu ඇතුළු පිරිස (2009) ඉදිරිපත් කර ඇති නිර්වචනය යොදා ගන්නා ලදී. ඔවුන්ට අනුව පරිගණක නිපුණතාව කොටස් හයකින් සමන්විත වේ. එනම් දෘඩාංග හා මෘදුකාංග පිළිබඳ දැනුම, පරිගණක යෙදුම් මූලධර්ම පිළිබඳ සංකල්ප, පරිගණක භාවිතයේ කුසලතා, පරිගණක භාවිතයේදී ඇති සීමාවන්, පුද්ගලික සහ සමාජ ගැටලු සහ පරිගණකය කෙරෙහි ඇති ආකල්ප යනාදී වශයෙනි. පරිගණක සාක්ෂරතාව මිනුම් කරන අකාරය පිළිබඳව විවිධ පර්යේෂකයින් විසින් විවිධාකාරයෙන් අදහස් දක්වා ඇත. Ezziane (2007) පවසන්නේ පරිගණක සාක්ෂරතාව මැනීම පිළිබඳ විද්වතුන් අතර සම්මුතියක් නොමැති බවයි. සමහර පර්යේෂකයන් පරිගණක සාක්ෂරතාවය මනිනු ලබන්නේ සම්පුර්ණ කරන ලද පරිගණක පාඨමාලා අනුව, පරිගණකය සමඟ ගත කරන කාලය සහ පරිගණකයක හිමිකම තිබීම සහ නිවසේ සාමාජිකයන්ට පරිගණක යෙදුම් පිළිබඳව තිබෙන අත්දැකීම් හා හැකියාව මත බව ඔහු තවදුරටත් දක්වා ඇත.

Kegel සහ Wieringa (2016) විසින් කරන ලද අධ්‍යයනයේදී පරිගණක සාක්ෂරතාව මනින මිනුම් කාණ්ඩ පහක් යටතේ හඳුනාගෙන ඇති අතර ඒවා මෙලෙස දැක්විය හැකිය. එනම් නිපුණතා පරිගණක හා සම්බන්ධ කුසලතා, යතුරුපුවරුව සහ මූසිකය භාවිතා කරන්නේ කෙසේදැයි දැන ගැනීම වැනි මූලික පරිගණක මෙහෙයුම් කුසලතා මෙයට ඇතුළත් වන අතර ක්‍රමලේඛන කුසලතා (Programming skills) වැනි වඩා දියුණු සංකල්ප ද මෙයට අඩංගු විය හැකිය. දැනුම යටතේ පරිගණකයේ ලක්ෂණ, හැකියාවන් සහ සන්දර්භය පිළිබඳ දැනුම, සාමාන්‍ය පරිගණකය පාරිභාෂිතය සහ මෘදුකාංග සංකල්ප යනාදිය මෙයට ඇතුළත් වන අතර පරිගණකය භාවිත කිරීමේදී පිළිපැදිය යුතු ආචාරධර්ම ද ඇතුළත් ය. ආකල්ප පුද්ගලයෙකුට පරිගණක කෙරෙහි තිබිය හැකි සංජානන, චර්යාත්මක බලපෑම්වලින් යුත් ආකල්ප එකතුව, පරිගණක කාංසාව, පරිගණක භාවිතයට ඇති උනන්දුව සහ පරිගණක පිළිබඳ විශ්වාසයන් වැනි හොඳින් ආවරණය වූ සංකල්ප මෙයට ඇතුළත් වේ. පළපුරුද්ද යටතේ එනම් පුද්ගලයෙකු පරිගණකයක් භාවිතා කරන කාලය හා සංඛ්‍යාතය මැනීම මගින් පළපුරුද්ද පිළිබඳ නිගමනය කරනු ලබයි. මෙහිදී පරිගණකය භාවිතා කරන කාලය පරිගණක දැනුම හා කුසලතා සඳහා හේතු වන බව උපකල්පනය කෙරේ. තොරතුරු යටතේ මෙහිදී තොරතුරු සාක්ෂරතාවය (තොරතුරු ලබා ගැනීම, සැකසීම හා සන්නිවේදනය කිරීමේ කුසලතාව) පරිගණක සාක්ෂරතාවයට සමගාමීව මනිනු ලැබේ. බොහෝ විට, පරිගණකයක සියලුම යෙදුම් තොරතුරු හැසිරවීමට සම්බන්ධ නොවන අතර එය පරිගණක සාක්ෂරතාවේ එක් මානයක් ලෙස ඇතුළත් වේ.

මීට අමතරව Tumburku ඇතුළු පිරිස (2019) පරිගණක සාක්ෂරතාව මනිනු ලැබුවේ මූලික කොන්දේසි කිහිපයක් පදනම් කර ගනිමිනි. එනම් පරිගණකයට හෝ අන්තර්ජාලයට ප්‍රවේශවීමේ හැකියාව, පරිගණක පිළිබඳ පවතින දැනුම, පරිගණක ක්‍රියාත්මක කිරීමේ කුසලතාව සහ ඩිජිටල් උපාංග භාවිතා කිරීම පිළිබඳ ආකල්ප යනාදී වශයෙනි.

අද වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ පරිගණකය ආර්ථික, සමාජයීය, දේශපාලන යන සෑම ක්ෂේත්‍රයකටම නැතුවම බැරි මෙවලමක් බවට පත්ව ඇත. එබැවින් වර්තමාන පැවැත්ම තුළ, ඕනෑම වෘත්තියක හෝ කාර්යයක නියැලී සිටින පුද්ගලයන්ට පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකේ. අධ්‍යාපනය, කළමනාකරණය, පරිපාලනය, නීතිය, වෛද්‍ය, සෞඛ්‍ය සේවා, විද්‍යාව, තාක්‍ෂණය, ඉංජිනේරු විද්‍යාව යනාදී විවිධ ක්ෂේත්‍රයන්හි කාර්යයන් සහ රැකියා රාජකාරි සිදු කරනු ලබන්නේ පරිගණක භාවිතයෙනි. පුද්ගලයන්ට තොරතුරු සෙවීමට, අන්තර්ජාලය හරහා සන්නිවේදනය කිරීමට හෝ වාර්තා, ලිපි, ලේඛන, ව්‍යාපෘති සකස් කිරීමට අවශ්‍ය වූ විට පරිගණක භාවිතා කිරීම වඩාත් සුලභ වේ (Gupta, 2006). එබැවින් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීම ඉතා වැදගත්වනවා මෙන්ම එමගින් ග්‍රාමීයව අංශයේ පරිගණක සාක්ෂරතාව ඉහළ නංවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම ද වැදගත් වේ. මෙම පර්යේෂණය මගින් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක පිළිබඳව අවධානය යොමු කරයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ එක් පරමාර්ථයක් වන්නේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීමයි.

විවිධ අධ්‍යයන මගින් පරිගණක භාවිතය සඳහා අවශ්‍යය යටිතල පහසුකම් තිබීම පරිගණක සාක්ෂරතාව බලපාන ප්‍රධාන ලෙස හඳුනාගෙන ඇත Kumar ඇතුළු පිරිස, 2014; Poynton 2005; Seretse ඇතුළු පිරිස, 2018 ). පරිගණක සාක්ෂරතාව වර්ධනය කර ගැනීමට නම් ඒ සඳහා අවශ්‍යය වන මූලික පහසුකම් තිබිය යුතුය. එනම් Kumar සහ Kumara, (2018) ග්‍රාමීය පාසැල් සිසුන්ගේ පරිගණක සාක්ෂරතාව සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයේදී පරිගණකයක් පහසුකම් , විදුලි බලය අක්‍රීය වීම ග්‍රාමීය අංශයේ පාසැල්වල පරිගණක සාක්ෂරතාව සඳහා බලපෑ හේතු ලෙස හඳුනාගෙන ඇත. Kumar සහ Basavaraja (2016) මෙම අධ්‍යයනයේ දී පරිගණක සාක්ෂරතාව සඳහා අන්තර්ජාල පහසුකම් බලපාන බව හඳුනා ගන්නා ලදී. ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව අඩු වුවත් පරිගණකය භාවිතා කිරීම පිළිබඳ දැඩි අවශ්‍යතාවයක් ග්‍රාමීය සිසුන්ට පවතින බවද මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. ඔවුන්ගේ අදහස් වූයේ අන්තර්ජාලය පහසුකම් තිබෙනවා නම් පරිගණක සාක්ෂරතාවය වර්ධනය කරගත හැකි බවයි. Kumar ඇතුළු පිරිස (2014) පෙන්වා දෙන්නේ ඇතැම් ග්‍රාමීය පාසල්වල පරිණකයක් තිබුණත් පරිගණකය පිළිබඳව ඉගෙන ගැනීමට ගුරුවරුන්ගෙන් සහයක් නොලැබීම පරිගණක සාක්ෂරතාව අඩු වීමට හේතු වී ඇති බවයි.

Vengerfeldt (2003) පවසන්නේ සමාජ, ආර්ථික, අධ්‍යාපනික යන සාධකයන්ගේ බලපෑම පරිගණක සාක්ෂරතා කුසලතා අඩුවීමට හේතුවන බවයි. ඔහුගේ අධ්‍යයනයට අනුව පරිගණක කුසලතාව සහිත අඩු පිරිසක් ග්‍රාමීය අංශයේ සිටින අතර ඔවුන් සේවා නියුක්ත

හා උසස් අධ්‍යාපනය හදාරන අය විය. ඒ අනුව පැහැදිලි වන්නේ පරිගණක කුසලතාවය තීරණය වීම සඳහා අධ්‍යාපන මට්ටම සහ රැකියාව යනාදී සාධක බලපාන බවයි. Seretse ඇතුළු පිරිස (2018) විසින් කරන ලද අධ්‍යයනයේදී ග්‍රාමීය ප්‍රදේශවල පරිගණක කුසලතා නොමැති ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි දෙනෙක් වයස අවුරුදු 31-40 දක්වා පුද්ගලයින් වූ අතර එම පුද්ගලයින්ගෙනුත් වැඩි පිරිසක් මූලික අධ්‍යාපනයක් නොමැති අය විය. තවද සේවා වියුක්තිකයන් බොහෝ දෙනෙකුට පරිගණක කුසලතා නොමැති බව මෙම අධ්‍යයනයේ දී සොයා ගන්නා ලදී. ඒ අනූව මොවුන් දක්වා සිටියේ ග්‍රාමීය වෙසෙන්නන්ගේ පරිගණක සාක්ෂරතාව කෙරෙහි වයස, අධ්‍යාපන මට්ටම සහ විරැකියාව යන සාධක බලපෑමක් කරන බවයි. Gupta (2006) පවසන්නේ ද පරිගණක සාක්ෂරතාව තීරණය වීමට නිසි පාසල් අධ්‍යාපනයක් නොමැතිකම බාධාවක් වී ඇති බවත් එය හේතු කොටගෙන පරිගණක උපාංග භාවිතා කිරීමට දැනුමක් නොමැති බවත්ය. Gallagher ඇතුළු පිරිස (2005) පවසන්නේ පරිගණක සාක්ෂරතාව වැඩි දියුණු කර ගැනීමට නම් සාක්ෂරතාව වර්ධනය කර කර ගැනීම වැදගත් වන බවත් ඒ සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයක් තිබීම අත්‍යාවශ්‍ය සාධකයක් වන බවයි.

Seretse ඇතුළු පිරිස (2018) සහ Poynton (2005) අධ්‍යයනයන්ට අනූව ග්‍රාමීය මිනිසුන්ගෙන් වැඩි දෙනෙක් කිසිවිටෙකත් පරිගණක පුහුණු පාඨමාලාවක් හදාරා නොමැති බව අනාවරණය විය. එමෙන්ම Seretse ඇතුළු පිරිස (2018) විසින් කරන ලද අධ්‍යයනයේදී පරිගණක පුහුණු පාඨමාලාවකට සහභාගි වීමට දක්වන කැමැත්ත හා පරිගණක කුසලතා මට්ටම අතර ධන සම්බන්ධයක් ඇති බව සොයා ගත් අතර ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාවය තිරණය වීම කෙරෙහි පරිගණක පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ නොතිබීම හේතුවක් වන බව සොයා ගන්නා ලදී. තවද පරිගණකය භාවිතය පිළිබඳ අත්දැකීම් ග්‍රමීය අංශයේ බොහෝ දෙනෙකුගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන තවත් හේතුවක් ලෙස හඳුනා ගත හැකිය. බොහෝ අධ්‍යයනයන්ට අනූව පරිගණක සාක්ෂරතාවක් නොමැති ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි දෙනෙක් ජීවිතයේ කෙදිනකවත් පරිගණකයක් භාවිතා කර නොමැති බව දක්වයි (Seretse ඇතුළු පිරිස 2018; Poynton 2005; Awang සහ Jaffar, 2004).

Kamaruddin සහ Jusoh, 2008 ග්‍රාමීය අංශයේ වැඩිහිටියන්ගේ පරිගණක සාක්ෂරතාව සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයේ දී පරිගණක භාවිතය පිළිබඳව අත්දැකීම්, පරිගණකය ක්‍රියා කිරීමට හැකියාව , වයස, රැකියාව, පරිගණක පාරිභාෂිතය දැනුවත්බව හෝ නොදැනුවත් බව, අඩු ඉංග්‍රීසි භාෂා දැනුම යනාදි සාධක පරිගණක සාක්ෂරතාව තිරණය වීම කෙරෙහි බලපාන සාධක ලෙස හඳුනා ගෙන ඇත. තවද ඉහළ සමාජ ආර්ථික තත්ත්වයන් ඇති අයගේ පරිගණක සාක්ෂරතාව වැඩි අතර පහළ සමාජ ආර්ථික තත්ත්වයන් ඇති අයගේ පරිගණක සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව ද මෙම අධ්‍යයනයේදී හෙළි වී ඇත. මේ අනුව පැහැදිලි වන්නේ ආර්ථික හා සමාජ තත්ත්වය පරිගණක සාක්ෂරතාවය තීරණය වීම සඳහා යම් බලපෑමක් ඇති කරන බවයි. පරිගණක විෂය ඉගැන්වීමේ ක්‍රමවේදයන්, පරිගණක පන්ති වල ඇති පහසුකම්, පරිගණක විද්‍යාගාර පහසුකම්, ඉගැන්වීමේදී ගුරුවරු පරිගණක මෘදුකාංග භාවිත කිරීම යනාදිය ද පරිගණක සාක්ෂරතාව පැවතීම සඳහා බලපාන අනෙකුත් සාධක ලෙස මෙහිදී හඳුනාගෙන ඇත.

තවද පරිගණක භාවිතය පිළිබඳ පවතින ආකල්ප පරිගණක සාක්ෂරතාව තිරණය වීම කෙරෙහි බලපාන ප්‍රබල සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. එනම් පරිගණක භාවිතය පිළිබඳව යම් කෙනෙකුගෙන් අසා දැන ගැනීමට ඇති ලැජ්ජාශීලී බව, පරිගණකය භාවිතය පිළිබඳ අත්දැකීම් නොමැති වීම නිසා පරිගණකය භාවිතයට ඇති බිය, අඩු ආත්මාභිමානය සහ පරිගණකය හොඳින් භාවිත කිරීමට හැකිවේද යන්න පිළිබඳ විශ්වාසයක් නොමැතිකම සහ පරිගණක භාවිතය ඉගෙන ගැනීමට අන් අයට කරදර කිරීමට ඇති අකමැත්ත යනාදිය ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපෑ ආකල්පමය හේතු ලෙස හඳුනාගෙන ඇත (Awang සහ Jaffar, 2004; Kamaruddin සහ Jusoh, 2008).

## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ග්‍රාමීය අංශය මූලික කොටගෙන සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ මහ නගර සභා සහ නගර සභාවල පළාත් පාලන බලදාරීන්ගෙන් පිටත ප්‍රදේශ ග්‍රාමීය අංශය ලෙස භූගෝලීය වශයෙන් වෙන් කොට ඇත (Wickramasinghe, 2010) එබැවින් මෙම අධ්‍යයනයේදී ග්‍රාමීය අංශය නියෝජනය වන අයුරින් ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයව අයත් දෝපෙ 5 ග්‍රාම සේවා වසම අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගැන්නා ලදී. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වෙසෙන සේවා නියුක්තිකයන් නියෝජනය කිරීම මෙහිදී ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් එක් ග්‍රාම සේවා වසමක් පමණක් යොදා ගැනීම එක් සීමාවකි. තවද මෙම අධ්‍යයනයේදී ඉලක්ක කණ්ඩායම් වෙතින් නිවැරදි හා සැබෑ තොරතුරු ලබාගැනීම දුෂ්කර වීම, තොරතුරු ගුණාත්මක ස්වරූපයක් ගැනීම, පුළුල් නියැදියක් කරා යොමු වීමට නොහැකි වීම වැනි කරුණු මෙම පර්යේෂණයේ ඇති තවත් සීමා ලෙස හඳුනා ගැනීමට හැකි විය.

මෙම අධ්‍යයනය දෝපෙ 5 ග්‍රාම සේවා වසමේ වෙසෙන සේවා නියුක්තිකයන්ගෙන් ඇසුරින් ප්‍රාථමික දත්ත ලබාගෙන සිදු කරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නියැදිය සකස් කර ගැනීමේදි ස්තෘත සසම්භාවී නියදුම් ක්‍රමය භාවිතා කර ඇත. ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. එසේම අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වර්තා සහ සඟරා මගින් ලබා ගනිමින් අධ්‍යනය සිදු කරන ලදි.

### 3.1 නියැදිය තෝරා ගැනීම

සංගහනයෙන් තෝරා ගන්නා කුඩා කොටසක් හෙවත් උපකුලකය නියැදිය ලෙස හැඳින්වේ. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක අධයානය කිරීම සඳහා නියැදිය තෝරා ගත් ආකාරය පැහැදිලි කරනු ලබයි. මෙම අධ්‍යනයේදී ස්තෘත සසම්භාවී නිහැදීම යටතේ නියැදිය තෝරාගැනීම සිදු වේ. යම් යම් ගුණාංග හෝ නිර්ණායක මත, විවිධ ස්ථර වශයෙන්, වෙන් වෙන් ව, හඳුනාගත හැකි විවිධත්වයෙන් යුතු පුද්ගලයින් සහිත සංගහනයක, ඒ ඒ සමාජ ස්ථරයේ සියලු දෙනා නියෝජනය වන ලෙස සෑම ස්ථරයකින් ම සම විභේදනය හෝ විෂම විභේදනය යටතේ කුඩා නියැදියක් තෝරාගෙන එම එක් එක් ස්ථරයට අයත් කුඩා නියැදි එකතු කොට, සමස්ත සංගහනයම නියෝජනය වන පරිදි නියදියක් සකස් කර ගැනීම ස්තෘත සසම්භාවී නියැදි තේරීම ලෙස හැඳින් වේ (දිසානායක, 2016).


ඒ අනුව මෙම පර්යේෂණයේදී අධ්‍යයන සංගහනය වන දෝපෙ 5 ග්‍රාම සේවා වසමේ මුළු සේවා නියුක්ත ජනගහනය රැකියාවේ ස්වභාවයත්, ස්ත්‍රී පුරුෂ යන නිර්ණායක මත ස්ථර හතරක් යටතේ හඳුනා ගත හැකි බැවින් ස්තෘත සසම්භාවී නියැදීම යටතේ නියැදිය තෝරා ගැනීම යෝග්‍ය වේ. මෙම අධ්‍යයනයේ නියැදි තරම නිශ්චය කිරීම සඳහා වඩාත් විශ්වාසනීය නියැඳුම් ක්‍රමයක් වන යමානේ (Yamane) නියැදුම් ක්‍රමය යොදා ගත් අතර මෙහිදි 90%ක විශ්වාසනීය මට්ටම යටතේ සේවා නියුක්තකයින් 100ක නියැදියක් මෙහිදී යොදා ගන්න ලදී. එය පහත පරිදි ස්තෘත සසම්භාවී නියැදිම යටතේ තෝරා ගන්නා ලදී. ප්‍රධාන දත්ත එක්රැස් කිරීමේ තාක්ෂණය පර්යේෂකයා විසින් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් මත හා සම්මුඛ සාකච්ඡා මත පදනම්වය. දත්ත එකතු කිරීමේ දී පර්යේෂකයාට මග පෙන්වීම සඳහා ප්‍රශ්ණාවලිය භාවිතා කරයි. මෙයට විවෘත හා ව්‍යුහාත්මක ප්‍රශ්න ඇතුළත් කර ඇත.

රැස් කරගනු ලබන ප්‍රාථමික හා ද්විතියික දත්ත යොදා ගනිමින් නියැදිය තුළ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන් රැකියාවේ ස්වභාවය අනුව නියැදිය තුළ සංයුක්ත වී ඇති ආකාරය, ස්ත්‍රී පුරුෂ බව අනුව නියැදිය තුළ සංයුක්ත වී ඇති ආකාරය, අධ්‍යාපන මට්ටම අනුව නියැදිය තුල සංයුක්ත වී ඇති අකාරය, පරිගණක සාක්ෂරතාව අනුව නියැදිය තුළ සංයුක්ත වී ඇති ආකාරය විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම හා බහු ප්‍රතිචාර විශ්ලේෂණය සිදු කරන ලද අතර, ග්‍රාමීය වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපා බලපාන සාධක කවරේද යන්න හඳුනා ගැනීම සඳහා සාධක විශ්ලේෂණය ක්‍රමවේදය භාවිත කර ඇත. ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධකත් පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම අධ්‍යනය කිරීම සඳහා මෙහිදී කයි වර්ග පරික්ෂාව යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කිරීම සඳහා SPSS මෘදුකාංග භාවිතා කර ඇත.

## 4. දත්ත විශ්ලේෂණය

ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව අධ්‍යයනය කිරීම සඳහා තෝරා ගන්නා ලද නියැදිය රැකියාවේ ස්වභාවය මත කොටස් පහක් යටතේ හඳුනා ගන්නා ලදී. එනම් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු, පෞද්ගලික අංශයේ සේවයේ නියුතු, අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු, ස්වයං රැකියාවල නියුතු සහ කුලී රැකියාවල සේවයේ නියුතු යනාදී වශයෙනි.


*ප්‍රස්තාර සටහන 1: රැකියාවේ ස්වභාවය අනුව නියැදියේ ව්‍යාප්තිය*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

නියැදිය තුළ රැකියාවන් 5ක් යටතේ ප්‍රතිචාරකයින් 100 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලි හරහා දත්ත ලබා ගන්නා ලදී. ප්‍රස්තාර අංක 1 ට අනුව නියැදිය තුළ වැඩිම ප්‍රමාණයක් ලෙස පුද්ගලයින් 71දෙනෙකු පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වන පුද්ගලයන් වේ. එමෙන්ම අඩුම සංඛ්‍යාවක් සහ ස්වයං රැකියාවල සහ අර්ධ රාජ්‍යය අංශයේ රැකියා වල නියුතු පුද්ගලයන් වන අතර එම ප්‍රමාණය 5 දෙනෙකු බැගින් වේ. රාජ්‍ය අංශයේ රැකියාවල නියුතු පිරිස 13 දෙනෙකු වශයෙන් ද, කුලී රැකියාවල නියුතු පිරිස 6 දෙනෙකු වශයෙන් ද හඳුනා ගත හැකිය.


*ප්‍රස්තාර සටහන 2: රැකියාවේ ස්වභාවය සහ ස්ත්‍රී පුරුෂ බව අනුව නියැදියේ ව්‍යාප්තිය*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

රැකියාවේ ස්වභාවය මත ස්ත්‍රී පුරුෂ අනුව නියැදියේ ව්‍යාප්තිය සැලකුවිට රාජ්‍ය අංශයේ, අර්ධ රාජ්‍ය අංශයේ ස්වයං රැකියාවල සේවයේ නියුතු පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් වැඩි ප්‍රතිශතයක් සිටින බව හඳුනාගත හැකිය. එමෙන්ම පෞද්ගලික අංශයයේ සහ කුලී රැකියාවල නියුතු පුරුෂයින් ප්‍රමාණය ස්ත්‍රීන්ට සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් වේ.


*ප්‍රස්තාර සටහන 3: රැකියාවේ ස්වභාවය සහ අධ්‍යාපන මට්ටම අනුව නියැදියේ ව්‍යාප්තිය*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

ප්‍රස්තාර සටහන් අංක 3 දැක්වෙන්නේ රැකියාවේ ස්වභාවය සහ අධ්‍යාපන මට්ටම අනුව නියැදියේ ව්‍යාප්තිය වේ.ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳව විමසා බැලීමේ දී රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයගෙන් වැඩි පිරිසක් විශ්වවිද්‍යාල මට්ටම තෙක් අධ්‍යාපනය හදාරා ඇති බවත් රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සියලුදෙනාම අපොස සාමාන්‍ය පෙළින් ඉහළට අධ්‍යාපනය හදාරා ඇති බවත් හඳුනා ගැනීමට හැකි විය. ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය හදාරා ඇති අය රාජ්‍ය අංශයේ රැකියාවල නිරත නොවීමක් දක්නට නොමැති වීම මෙහි දී දැකගත හැකි විශේෂත්වයකි. එමෙන්ම පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පිරිස්ගෙන් වැඩි පිරිසක් අපොස සාමාන්‍ය පෙළින් ඉහළට අධ්‍යාපනය හා හැදෑරූ අය වන අතර ඒ අතරිනුත් වැඩි පිරිසක් අපොස උසස් පෙළ දක්වා අධ්‍යාපනයට යොමු වීමක් හඳුනා ගැනීමට හැකි විය. පෞද්ගලික අංශයේ සේවා නියුක්ත අයගෙන් 11% ක තරම් ප්‍රතිශතයක් ප්‍රාථමික සහ ද්විතීක අධ්‍යාපන මට්ටම තෙක් පමණක් දායකත්වය අධ්‍යාපනය හදාරා ඇති අය වෙයි. අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සියලු දෙනාම අපොස උසස් පෙළ සහ ඉන් ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත වීම විශේෂත්වයකි. තවද ස්වයං රැකියාවේ නියුතු වූවන් ගෙන් වැඩි පිරිසක් අපොස උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇති බවත් කුලී රැකියාවේ නියුතු සේවා නියුක්තිකයන් ප්‍රාථමික අධ්‍යාපන මට්ටම සිට අපොස උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇති අයගෙන් සමන්විත විය.


*ප්‍රස්තාර සටහන් 4: පරිගණක සාක්ෂරතාව අනුව නියැදි සංයුතිය*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

මෙම අධ්‍යයනයේදී පරිගණක සාක්ෂරතා මට්ටම මනිනු ලැබුවේ ද්විමය ආකාරයටය. එනම් සාක්ෂරතාවයක්යක් ඇත සහ පරිගණක සාක්ෂරතාවක් නැත ආදී වශයෙනි. නියැදියේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් එනම් 56%ක් පරිගණක සාක්ෂරතාව සහිත පුද්ගලයන් බවත් අඩු ප්‍රතිශතයක් පරිගණක සාක්ෂරතාවක් නොමැති පුද්ගලයන් බවත් අනාවරණය විය. සමස්තයක් ලෙස පරිගණක සාක්ෂරතාව සහිත පිරිස වැඩි වුවත් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයකට පරිගණක සාක්ෂරතාවක් නොපවතින බව ප්‍රකාශ කළ හැකිය.


*ප්‍රස්තාර සටහන 5: රැකියාවේ ස්වභාවය අනුව පරිගණක සාක්ෂරතාව*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

රැකියාවේ ස්වභාවය අනුව පරිගණක සාක්ෂරතාව සැලකීමේදී පෞද්ගලික අංශයේ සේවයේ නියුතු වැඩි ප්‍රතිශතයකට පරිගණක සාක්ෂරතාවයක් නොමැති අතර එය 75%ක ප්‍රතිශතයක් වේ. රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් පරිගණක සාක්ෂරතාවක් සහිත අය වීම විශේෂයකිත්වයකි. රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩු ප්‍රතිශතයක් පරිගණක සාක්ෂරතාව නොමැති අය වේ. ස්වයං රැකියාවල සහ කුලී රැකියාවල නියුතු ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි පිරිසක් පරිගණක සාක්ෂරතාව නොමැති අය බව හඳුනාගත හැකිය.

*ප්‍රස්තාර සටහන 6: අධ්‍යාපන මට්ටම අනුව පරිගණක සාක්ෂරතාව*





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

අධ්‍යාපන මට්ටම අනුව පරිගණක සාක්ෂරතාව සැලකීමේදී අපොස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වැඩි ප්‍රතිශතයකට පරිගණක සාක්ෂරතාවක් පවතින බවත් විශ්වවිද්‍යාල මට්ටම තෙක් අධ්‍යාපනය ලැබූ පුද්ගලයන්ගෙන් වැඩි

ප්‍රතිශතයකට පරිගණක සාක්ෂරතාවක් පවතින බවත් හඳුනා ගැනීමට හැකි විය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ද්විතික අධ්‍යාපනය සහ අපොස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ පුද්ගලයන්ගෙන් වැඩි ප්‍රතිශතයකට පරිගණක සාක්ෂරතාවක් නොමැති බව හඳුනාගත හැකිය. තවද ප්‍රාථමික අධ්‍යාපනයය ලැබූ ප්‍රතිචාර දැක්වූවන් සියල්ලටම පරිගණක සාක්ෂරතාවක් නොමැති බව අනාවරණය විය. මේ අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපන මට්ටම පරිගණක සාක්ෂරතාව ඇති තිබීම හෝ නොතිබීම කෙරෙහි බලපෑමක් කරන බවයි.


*ප්‍රස්තාර සටහන් 7: වයස් කාණ්ඩ අනුව පරිගණක සාක්ෂරතාව*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

ප්‍රස්තාර අංක 7ට අනුව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් පරිගණක සාක්ෂරතාව සහිත වැඩිම පිරිසක් වයස අවුරුදු 21-30 අතර වයස් කාණ්ඩයේ වේ. පරිගණක සාක්ෂරතාව සහිත අඩුම පිරිසක් වයස අවුරුදු 51ට වැඩි වයස් කාණ්ඩයේ වන අතර එය 3%ක් වේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් වයස අවුරුදු 21-30 වයස් කාණ්ඩයේ පරිගණක සාක්ෂරතාවක් නොමැති පුද්ගලයන්35% ප්‍රතිශතයක් ගන්නා අතර එය විශේෂත්වයකි.

*ප්‍රස්තාර සටහන 7: පරිගණකය භාවිත කරන වාර ගණන අනුව පරිගණක සාක්ෂරතාව*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

පරිගණකය භාවිත කරන වාර ගණන අනුව පරිගණක සාක්ෂරතාව සැලකීමේදී පරිගණක සාක්ෂරතාව සහිත වැඩිම පිරිසක් දිනපතා පරිගණකය භාවිතා කරන පුද්ගලයන් වන අතර එය 57%ක ප්‍රතිශතයකි. මසකට කලාතුරකින් පරිගණකය භාවිතා කරන පුද්ගලයන්ගෙන් වැඩි පිරිසකට පරිගණක සාක්ෂරතාවක් නොමැති බවද හඳුනාගත හැකිය.

### 4.1 පරිගණක සාක්ෂරතාව කෙරෙහි බලපාන සාධක පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි කරනු ලබන බලපෑම හඳුනාගැනීම

ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන් පරිගණකය භාවිත කිරීමේ අරමුණු, අන්තර්ජාලය භාවිත කිරීමේ අරමුණු යන විචල්‍ය මගින් ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම කෙරෙහි බලපාන සාධක පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි කරනු ලබන බලපෑම හඳුනාගැනීම සඳහා බහු ප්‍රතිචාර විශ්ලේෂණය යොදා ගන්නා ලදී. ඒ අනුව අදාළ විචල්‍ය සඳහා ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන් ප්‍රතිචාර ලබා දී තිබූ ආකාරය මත සමස්ත නියැදිය තුළ පරිගණක සාක්ෂරතා තීරණය වීම කෙරෙහි බලපාන සාධක පරිගණක සාක්ෂරතා මට්ටම කෙරෙහි කරනු ලබන බලපෑම නිරූපණය වේ.

*වගු අංක 1: ග්‍රාමීය වෙසෙන සේවා නියුක්තිකයන් පරිගණකය භාවිත කිරීමේ අරමුණු*

| පරිගණකය භාවිත කිරීමේ අරමුණු | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතාත්මක අගය |
|---|---|---|
| 1. පද සැකසීම(MS word) | 59 | 67.0% |
| 2. එක්සෙල් (MS Excel) | 53 | 60.2% |
| 3. පවර්පොයින්ට්(PowerPoint) | 58 | 65.9% |
| 4. දත්ත සමුදාය වැඩසටහන් (Database Package) | 39 | 44.3% |
| 5. පැතුරුම්පත් (Spreadsheet) | 31 | 35.2% |
| 6. විද්‍යුත් තැපැල(Email) | 45 | 51.1% |
| 7. අන්තර්ජාලය(Internet) | 68 | 77.3% |
| 8. ලෝක විසිරි වියමන(www) | 66 | 75.0% |
| 9. ඡායා රූප/විඩියෝ සංස්කරණය (Photo/video Editing) | 31 | 35.2% |
| 10. බහුමාධ්‍ය (audio & video) | 40 | 45.5% |
| 11. භාෂා මෘදුකාංග-Language software (CD-ROM) | 26 | 29.5% |
| 12. සමාජ මාධ්‍ය භාවිතයට | 28 | 31.8% |
| 13. පරිගණක ක්‍රීඩා (Computer games) | 55 | 62.5% |
| එකතුව | 599 | 680.7% |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

මෙම නියැදියට අනුව 100ක ප්‍රචාරකයින් ප්‍රමාණයකින් 599ක් පරිගණකය භාවිත කිරීමේ අරමුණු පිළිබඳ ප්‍රතිචාර ලබා දී ඇත. ඒ අනුව නියැදිය තුළ වැඩිම ප්‍රතිචාරකයින් ප්‍රතිශතයක් පරිගණකය භාවිත කිරීමේ අරමුණු වී ඇත්තේ අන්තර්ජාලය භාවිතය වන අතර එම සංඛ්‍යාව 68කි. නියැදියට අදාළව නම් එම ප්‍රතිශතය 77.3% ක් වන අතර ප්‍රතිචාර දැක්වූ ප්‍රමාණය අනුව නම් එහි ප්‍රතිශතය 11.4%කි .

*වගු අංක 2: ග්‍රාමීය වෙසෙන සේවා නියුක්තිකයන් අන්තර්ජාලය භාවිත කිරීමේ අරමුණු*

| **අන්තර්ජාල භාවිතයේ අරමුණ** | **ප්‍රතිචාර සංඛ්‍යාව** | **ප්‍රතිශතාත්මක අගය** |
|---|---|---|
| විද්‍යුත් තැපැල(Email) සඳහා | 80 | 80.0% |
| ගූගල්(Google) සඳහා | 90 | 90.0% |
| පරිගණක භාවිතය පිළිබඳව ඉගෙන ගැනීමට | 51 | 51.0% |
| සාප්පු සවාරි සඳහා(Online shopping) සඳහා | 55 | 55.0% |
| විනෝදාස්වාදය සඳහා | 92 | 92.0% |
| එකතුව | 368 | 368.0% |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

අන්තර්ජාලය භාවිත කිරීමේ අරමුණු මත ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම කෙරෙහි බලපාන අතර මෙම නියැදියට අනුව 100ක ප්‍රචාරකයින් ප්‍රමාණයකින් 368ක් අන්තර්ජාලය භාවිත කිරීමේ අරමුණු පිළිබඳ ප්‍රතිචාර ලබා දී ඇත. ඒ අනුව නියැදිය තුළ  අඩුම ප්‍රතිචාරකයින් ප්‍රතිශතයක් අන්තර්ජාලය භාවිත කිරීමේ අරමුණක් ලෙස පරිගණකය භාවිතය  පිළිඳව ඉගෙන ගැනීම දක්වා ඇති අතර එම සංඛ්‍යාව 51කි. නියැදියට අදාළව නම් එම ප්‍රතිශතය 51% ක් වන අතර ප්‍රතිචාර දැක්වූ ප්‍රමාණය අනුව නම් එහි ප්‍රතිශතය 13.9%කි.

**4.2 ග්‍රාමීය සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක**

ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක සොයා ගැනීම සඳහා ගවේෂණාත්මක සාධක විශ්ලේෂණය සිදු කරන ලදී. දත්ත වල සාධක විශ්ලේෂණයේ වලංගුභාවය මැනීම සඳහා Kaiser-Meyer-Olkin (KMO) මිනුම සහ Bartlett's පරීක්ෂණය යන දෙකම භාවිතා කරයි. මෙහිදී නියැදියේ ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීම සඳහා KMO භාවිතා කරන අතර නියැදියෙහි ගෝලාකාර බව පරීක්ෂා කිරීම සඳහා Bartlett's පරීක්ෂණය භාවිතා කරයි. ඒ අනුව KMO සංඛ්‍යාලේඛන අවම වශයෙන් 0.5 ට වඩා වැඩි විය යුතු අතර Bartlett ගේ නියැදියෙහි ගෝලාකාරභාවය පිළිබද පරීක්ෂණය සැලකිය යුතු මට්ටමක ($P < 0.05$) තිබිය යුතුය. මෙම අධ්‍යනයේ දී KMO අගය 0.762 ක් වන බැවින් මෙය සාධක විශ්ලේෂණය සඳහා සුදුසු වේ. තනි විචල්‍යයන් සඳහා වන KMO අගයන් Anti-image වගුවෙහි විකර්ණය මත පිහිටයි. මෙම අගයන් 0.5 ට වඩා වැඩි විය යුතුය. ඒ අනුව පරිගණකය භාවිත කරන අකාරය හොඳින් ඉගෙන ගැනීමට හැකි බවට පවතින දැඩි ආත්ම විශ්වාසයක් තිබීම, සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම පරිගණක භාවිතයට ප්‍රමාණවත් වීම, ප්‍රදේශයේ ඇති පරිගණක පුහුණු පාඨමාලා අවස්ථා, පරිගණකය භාවිතයට අවශ්‍ය සම්පත් නිසි ලෙස නිසි පරිදි නිවසේ තිබීම, පරිගණකය භාවිතයට අවශ්‍ය සම්පත් නිසි ලෙස නිසි පරිදි රැකියා ස්ථානයේ තිබීම යන අයිතමයන් සම්බන්ධව ඇති විචල්‍යය 0.5 ට වඩා අඩු වීම හේතුවෙන් ඒවා ඉවත් කර නැවත සාධක විශ්ලේෂණය සිදු කරන ලදී.

ඒ අනුව ලැබුණු KMO අගය 0.818 කි. ඒ අනුව Bartlett's පරික්ෂණයේ කයි වර්ග අගය 630= 4950.398 වේ. එබැවින් මෙම අගයන් මගින් තහවුරු වනුයේ නියැදිය සාධක විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත් වන බවයි.

සාධක විශ්ලේෂණයට අදාළ වගුව අනුව මුළු විචලතාව විස්තර කිරීම සඳහා වන (Total Variance Explained) වගුව නිස්සාරණයට පෙර, පසු හා භ්‍රමණයෙන් පසු එක් එක් රේඛීය සංරචක සාධක හා සම්බන්ධවන අයිගන් අගය ප්‍රතිදානය කරයි. නිස්සාරණයට පෙර රේඛීය සංරචක 36ක් හඳුනාගෙන ඇත. එබැවින් සමස්ත විචල්‍යයෙන් 49.826%ක් පළමු විචල්‍යය මගින් පැහැදිලි කරයි. පළමු සාධක කිහිපය ප්‍රමාණය පැහැදිලි කරන අතර පසු සාධක පැහැදිලි කරන්නේ විචලතාවය පමණි. මෙහිදී Rotation Sums of Squred Loding කොටස මගින් සියලු සාධක අතරින් එකට වඩා වැඩි අගයක් උකහා ගන්නා අතර එමගින් සාධක 5ක් මෙම විශ්ලේෂණය යටතේ තේරා ගනී. මෙමගින් භ්‍රමණයෙන් පසු සාධකවල සමාන්‍ය අගයන් පෙන්වනු ලැබේ. භ්‍රමණය සාධක ව්‍යුහය ප්‍රශස්තිකරණය කිරීමේ බලපෑමක් ඇති අතර මෙම දත්ත සඳහා එක් ප්‍රතිඵලයක් වනුයේ සාධක හතරේ සාපේක්ෂ වැදගත්කම සමාන වීමයි. භ්‍රමණය වීමට පෙර, සාධකය 1 ඉතිරි හතරට වඩා සැලකිය යුතු ලෙස විචල්‍යතාවයට හේතු වේ (10.970%, 7.759%, 5.309% සහ 3.511%ට සාපේක්ෂව 49.826%), කෙසේ වෙතත් නිස්සාරණයෙන් පසුව එය විචල්‍යතාවයෙන් 22.838% ක් පමණි අනෙක්වා පිළිවෙලින් 16.758%, 14.340%, 13.089% සහ 10.350% වේ. ප්‍රධාන සංරචක විශ්ලේෂණය සියලු විචල්‍යතාවයන් ආරම්භක උපකල්පනය මත ක්‍රියා කරයි. එබැවින්, නිස්සාරණයට පෙර Communalities අග සියල්ලම 1 වේ. නිස්සාරණය ලෙස නම් කර ඇති තීරුවේ ඇති වර්ගීකරණයන් දත්ත ව්‍යුහයේ පොදු විචල්‍යතාවය පිළිබිඹු කරයි. මෙම අවස්ථාවෙහිදී සාධක විශ්ලේෂණය මගින් සාධක පහක් උපුටා ගෙන ඇත. සාධක විශ්ලේෂණය ගවේෂණාත්මක මෙවලමක් වන අතර එය විවිධ තීරණ ගැනීමට පර්යේෂකයාට මග පෙන්වීම සඳහා භාවිතා කරයි. එක් වැදගත් තීරණයක් වන්නේ නිස්සාරණය කළ යුතු සාධක ගණනයි. ඒ අනුව සාධක විශ්ලේෂණය යටතේ සංරචක නිර්මාණය කිරීම කිරීමට අදාළ වගුව අංක 3 මගින් දක්වා ඇත.

*වගු අංක 3: සංරචක නිර්මාණය කිරීම*

| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 |
| අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි පරිගණකය භාවිත කිරීමට ඇති පහසුව | .846 | | | | |
| පරිගණකය භාවිතා කරන විට නිර්මාණශීලීව සිදු කරන කාර්යයක් ලෙස දැනීම | .830 | | | | |
| පරිගණකය භාවිත කරන අකාරය හොඳින් ඉගෙන ගැනීමට ඇති අවශ්‍යතාව සහ වුවමනාවක් තිබීම | .814 | | | | |
| පරිගණකය භාවිතා කරන විට සිය කැමැත්තෙන් කරන කාර්යයක් ලෙස දැනීම | .812 | | | | |

| | | | |
|---|---|---|---|
| පරිගණකය හොඳින් භාවිතා කළ හැකි බවට ධනාත්මක ආකල්පයක් පැවතීම | .799 | | |
| පරිගණකය භාවිතා කිරීම ගැන දැනෙන බිය | .742 | | |
| පරිගණක භාවිතය පිළිබඳව යම් කෙනෙකුගෙන් අසා දැන ඇති ගැනීමට ලැජ්ජාශීලී බව | .740 | | |
| පරිගණකය භාවිත කිරීමට අවශ්‍ය වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | .687 | | |
| පරිගණකය භාවිතයේ වැඩදායක බව (පරිගණකය භාවිතයෙන් පුද්ගලයෙකුගේ කාර්ය සාධනයට වන බලපෑම ) | .658 | | |
| කිසිවෙකුගේ මඟ පෙන්වීමකින් තොරව අවශ්‍ය කාර්යයන් සම්බන්ධයෙන් පරිගණකය භාවිත කිරීමට හැකි වීම. | .596 | | |
| පරිගණකය සපයන ලද කාර්යය සම්පූර්ණ කිරීමට බොහෝ කාලයක් ලබාදී ඇති විටදී පරිගණකය භාවිත කිරීමට හැකි වීම. | .560 | | |
| පරිගණකය සමඟ කටයුතු කිරීමට විශාල මානසික වෑයමක් අවශ්‍ය නොවීම. | .540 | | |
| රැකියා ස්ථානයෙහි වැඩ කිරීමට සුදුසු මෘදුකාංග පද්ධති පිහිටුවා ඇත. | | .797 | |
| පරිගණක සාක්ෂරතාව වර්ධනය කර ගැනීම සඳහා රැකියා ස්ථානයෙන් මූල්‍යමය ප්‍රමුඛතාවය ලබා දෙයි. | | .756 | |
| පරිගණක හා තොරතුරු තාක්ෂණය භාවිතයට රැකියා ස්ථානයෙහි ප්‍රමුඛතාවය ලබාදීම. | | .746 | |
| පරිගණක සාක්ෂරතාව ඇගයීම මගින් පරිගණක භාවිතය දිරිගැන්වීම සඳහා රැකියා ස්ථානයෙන් ප්‍රමුඛතාවය ලබා දෙයි. | | .737 | |
| පරිගණකය භාවිතය රැකියාවේ විවිධ කාර්යයන් සම්බන්ධයෙන් උචිත වේ. | | .690 | |
| රැකියා ස්ථානයෙහි ඇති පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් පරිගණක උපාංග නිසි ආකාරයෙන් ක්‍රියා කරයි. | | .687 | |
| රැකියා ස්ථානයෙහි පරිගණකය භාවිතයට අවස්ථා හිමි වේ. | | .679 | |
| රැකියාව තුළ පරිගණකය භාවිත කිරීම වැදගත් වේ. | | .556 | |
| අධ්‍යාපනය ලැබූ පාසලෙහි පරිගණකය හා ඒ හා සම්බන්ධ අනෙකුත් උපාංග භාවිතයට අවස්ථාව හිමි විම | | | .888 |

| | | | |
|---|---|---|---|
| අධ්‍යාපනය ලැබූ පාසලෙහි පරිගණක හා තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීමට සිටි ගුරුවරු ප්‍රමාණවත් බව | .874 | | |
| අධ්‍යාපනය ලැබූ පාසලෙහි පරිගණක හා තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීම් ක්‍රමවේදයන් හොඳින් වීම | .844 | | |
| අධ්‍යාපනය ලැබූ පාසලෙහි පරිගණකය භාවිතයට අවශ්‍ය සම්පත් නිසි ලෙස නිසි පරිදි තිබීම | .835 | | |
| පාසල් අධ්‍යාපනයෙන් පරිගණක භාවිතය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලැබීම | .817 | | |
| අධ්‍යාපනය ලැබූ පාසලෙහි පරිගණක හා තොරතුරු තාක්ෂණ විෂය ලෙස වෙනම විෂයක් තිබීම | .810 | | |
| පරිගණක සාක්ෂරතාව වර්ධනය කර ගැනීම සඳහා නිවසෙන් ලැබෙන මූල්‍යමය ප්‍රමුඛතාවය | | .777 | |
| නිවාඩු දිනයන් වලදී පරිගණකය පිළිබඳව ඉගෙන ගැනීමට පරිගණකය භාවිත කිරීම සඳහා නිදහස් කාලයක් වෙන් කොටගෙන තිබීම | | .753 | |
| පරිගණක භාවිතය හා තොරතුරු තාක්ෂණය භාවිතයට නිවස තුළින් ප්‍රමුඛතාවය ලබා දෙයි. | | .749 | |
| පරිගණක සාක්ෂරතාව වර්ධනය කර ගැනීම සඳහා අන්තර්ජාලය භාවිත කිරීම | | .696 | |
| නිවසෙහි පරිගණකය භාවිතයට අවස්ථා හිමි වීම | | .582 | |
| නිවසෙහි පරිගණකය සමඟ වැඩ කිරීමට සුදුසු මෘදුකාංග පද්ධති පිහිටුවා ඇත. | | .577 | |
| නිවසෙහි ඇති පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් පරිගණක උපාංග නිසි ආකාරයෙන් ක්‍රියා කරයි. | | .547 | |
| රැකියාවෙහි නියුතු කාලය තුළ පරිගණකය පිළිබඳව ඉගෙන ගැනීමට පරිගණකය භාවිත කිරීම සඳහා නිදහස් කාලයක් තිබීම | | | .702 |
| පරිගණක පුහුණු පාඨමාලාවක් සඳහා යොමු වීමට හැකියාවක් තිබීම | | | .548 |
| පරිගණකය සමඟ වැඩ කිරීමට අවශ්‍ය අත්දැකීම් ඔබට තිබේ. | | | .510 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2020)

පොදු තේමාවන් හඳුනා ගැනීමට උත්සාහ කිරීම සඳහා එක් එක් සාධකය මත පැටවෙන අයිතම අන්තර්ගතය දෙස බලා පොදු නාමයක් සමාන විචල්‍යයන් සඳහා අර්ථ නිරූපණය කරයි.

සාධක 1 මත අධික ලෙස පටවන අයිතම සියල්ල සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව තීරණය වීම සඳහා සම්බන්ධ වන පුද්ගලික සාධකවල බලපෑම බව පෙනේ. එබැවින් අපි මෙම සාධකය පුද්ගලික සාධක ලෙස නම් කළ හැකිය. සාධක 2 මත අධික ලෙස පටවන අයිතම සියල්ලම පරිගණක භාවිතය සඳහා රැකියාවේ අදාළතත්වය සම්බන්ධව බව පෙනේ. එබැවින්, මෙම සාධකය රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික සාධක ලෙස නම් කළ හැකිය. 3 වන සාධකය මත අධික ලෙස පටවන අයිතම සියල්ල පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ බව පෙනේ. එබැවින්, මෙම සාධකය අධ්‍යාපනික සාධක ලෙස නම් කළ හැකිය. 4 වන සාධකය මත අධික ලෙස පටවන අයිතම සියල්ල පවුල් පරිසරයෙන් වන බලපෑමත් පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ බව පෙනේ. එබැවින්, මෙම සාධකය පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක බලපෑම ලෙස නම් කළ හැකිය. අවසාන වශයෙන්, 5 වන සාධකය මත අධික ලෙස පටවන අයිතම සියල්ලම පරිගණක භාවිතය සම්බන්ධව අත්දැකීම් හා පරිගණක භාවිතය පිළිබඳ පුහුණුව සම්බන්ධ වේ. එම නිසා, මෙම සාධකය පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථාවල බලපෑම ලෙස නම් කළ හැකිය. මෙම විශ්ලේෂණයෙන් හෙළි වන්නේ ආරම්භක ප්‍රශ්නාවලිය යථාර්ථයේ දී උප පරිමාණ පහකින් සමන්විත වන බවයි.

### 4.3 අභ්‍යන්තර අනුකූලතාව මැනීම

මෙම අධ්‍යනයේ මූලික අරමුණක් වන ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීමට සාධක විශ්ලේෂණය යටතේ හඳුනා ගත් පුද්ගලික සාධක පිළිබඳ ගොඩනගා ගන්නා ලද සාධකයේ ලිකර්ට් පරිමාණික මිනුම පිළිබඳ වලංගුභාවය, ආයතනික සාධක පිළිබඳ ගොඩනගා ගන්නා ලද සාධකයේ ලිකර්ට් පරිමාණික මිනුම පිළිබඳ වලංගුභාවය, අධ්‍යාපනික සාධක පිළිබඳ ගොඩනගා ගන්නා ලද සාධකයේ ලිකර්ට් පරිමාණික මිනුම පිළිබඳ වලංගුභාවය, පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක සාධක පිළිබඳ ගොඩනගා ගන්නා ලද සාධකයේ ලිකර්ට් පරිමාණික මිනුම පිළිබඳ වලංගුභාවය සහ පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථා පිළිබඳ ගොඩනගා ගන්නා ලද සාධකයේ ලිකර්ට් පරිමාණික මිනුම පිළිබඳ වලංගුභාවය පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය එක් එක් සාධකවලට අදාළ අයිතමයන් සඳහා පරික්ෂා කරන ලදි.

*වගු අංක 4: විශ්වාසනීයත්ව පරීක්ෂාව*

| සාධක | කොන්බැච් ඇල්ෆා අගය |
|---|---|
| පරිගණක භාවිතයේ දැක්ම හා සම්බන්ධ පුද්ගලික බලපෑම | .927 |
| රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික බලපෑම | .951 |
| පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික බලපෑම | .927 |
| පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක බලපෑම | .942 |
| පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථා සම්බන්ධ බලපෑම | .740 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය (2019)

### 4.4 පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හා පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කිරීම

ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හා පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කිරීම යන අරමුණ පරික්ෂා කිරීම සඳහා කයි වර්ග පරික්ෂාවක් සිදු කරන ලදි. එනම් පරිගණක භාවිතයේ දැක්ම හා සම්බන්ධ පුද්ගලික බලපෑම හා පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාව ,රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික බලපෑම සහ පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාව, පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික බලපෑම සහ පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාව, පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක බලපෑම පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාව, පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථාන්ගේ බලපෑම පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාවක් පවතී දැයි Pearson ගේ කයි වර්ග පරික්ෂාව මගින් පරික්ෂා කරන ලදි.

පරිගණක භාවිතයේ දැක්ම හා සම්බන්ධ පුද්ගලික බලපෑම හා පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$= 68.458 p = 0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත. රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික බලපෑම සහ පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$= 59.945 p = 0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත. පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික බලපෑම සහ පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$= 40.304 p = 0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත. පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක බලපෑම සහ පරිගණක සාක්ෂරතාව අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$= 54.824 p = 0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත. පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථාන්ගේ බලපෑම පරිගණක සාක්ෂරතාව අතර සම්බන්ධතාවක් අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$= 38.985 p = 0.000) එම විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත.

### 5. සමාලෝචනය

ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීමේ මූලික අරමුණ සඳහා සාධක විශ්ලේෂණයක් සිදු කරන ලදී. ඒ අනුව ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව බලපාන සාධක අයිතම හතලිස් එකක් සාහිත්‍ය විමර්ශන යටතේ සහ ප්‍රශ්නාවලියක් භාවිතයෙන් හඳුනාගත් අතර එයින් සාධක අයිතම පහක් සාධක විශ්ලේෂණ යටතේ ඉවත් කරන ලදී. ඒවා නම් පරිගණකය භාවිත කරන අකාරය හොඳින් ඉගෙන ගැනීමට හැකි බවට පවතින දැඩි ආත්ම විශ්වාසයක් තිබීම, සාමාන්‍ය ඉංග්‍රීසි දැනුම පරිගණක භාවිතයට ප්‍රමාණවත් වීම, ප්‍රදේශයේ ඇති පරිගණක පුහුණු පාඨමාලා අවස්ථා, පරිගණකය භාවිතයට අවශ්‍ය සම්පත් නිසි ලෙස නිසි පරිදි නිවසේ තිබීම, පරිගණකය භාවිතයට අවශ්‍ය සම්පත් නිසි ලෙස නිසි පරිදි රැකියා ස්ථානයේ තිබීම යන අයිතමයන් ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක

සාක්ෂරතාව සඳහා බලනොපාන බව නිගමනය කළ හැක. ඒ අනුව සාධක අයිතම තිස් හයකින් සමාන ලක්ෂණ සහිත මූලිකාංග පහකට වෙන් කරන ලද අතර එම සාධක පරිගණක භාවිතයේ දැක්ම හා සම්බන්ධ පුද්ගලික සාධකය, රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික සාධකය, පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික සාධකය, පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක සාධකය සහ පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථා සම්බන්ධ සාධකය ලෙස සංරචක පහක් හඳුනාගත හැකිවිය. මෙම අධ්‍යයනයේ දෙවන අරමුණ වූයේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක හා පරිගණක සාක්ෂරතාවක් තිබීම හෝ නොතිබීම කෙරෙහි ඇති කරනු ලබන බලපෑම හඳුනා ගැනීමයි.

මෙහිදී හඳුනා ගන්නා ලද ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාවට බලපාන්නේ කෙසේද යන මූලික ගැටලුවලට පිළිතුරු සෙවීම සඳහා ගොඩනඟාගත් අරමුණ විශ්ලේෂණය කිරීමට කයිවර්ග පරීක්ෂාවක් සිදු කරන ලදී. ඒ අනුව පරිගණක භාවිතයේ දැක්ම හා සම්බන්ධ පුද්ගලික බලපෑම , රැකියාවේ අදාළතත්වය සම්බන්ධ ආයතනික බලපෑම , පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ අධ්‍යාපනික බලපෑම, පරිගණක භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් හා සම්බන්ධ සංවිධානාත්මක බලපෑම, පරිගණක භාවිතය පිළිබඳ පුහුණු අවස්ථාන්ගේ බලපෑම අතර ස්වායක්තතාවය පරික්ෂා කිරීම කයි වර්ග පරීක්ෂාව ඇසුරින් කරන ලදී. ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක ඔවුන්ගේ පරිගණක සාක්ෂරතාවට එහිදී බලපාන බව මෙම අධ්‍යනය මඟින් සොයා ගත හැකි විය. ඒ අනුව අපට නිගමනය කළ හැක්කේ ග්‍රාමීයව වෙසෙන සේවා නියුක්තිකයන්ගේ පරිගණක සාක්ෂරතාව සඳහා බලපාන සාධක මත ඔවුන්ගේ පරිගණක සාක්ෂරතා මට්ටම තීරණය වන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව (2019), පරිගණක සාක්ෂ සමීක්ෂණ වාර්තාව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව

Alarape, M. A., & Suleiman, M. A. (2014). Computer Literacy Level AMONG Primary School Teachers in BIDA: Implications for E-Governance Deployment. *International Journal of Applied Information Systems (IJAIS), 6*(8), 17-20. Retrieved 10 16, 2020, from https://pdfs.semanticscholar.org/1af1/ef2c9ee9bc42ee3a9db32dd7c7c72ced5fea.pdf

Awang, H., & Jaffar, M. (2004). An outreach venture: bringing computer literacy to rural women in Malaysia. *Human Perspectives in the Internet Society: Culture, Psychology and Gender, 31*, 191-197.

Blake, D., & Hanley, V. (1995). *Dictionary of Educational Terms.* England: Aldershot : Arena .

Devalawatte , S. W. (2019). *Factor Affecting Computer Literacy in Sri Lanka Navy,* . General Sri John Kotelawala Defence University .

Dincer, S. (2016). Assessing the Computer Literacy of University Graduates. *The Third International Conference on Open and Flexible Education (ICOFE 2016)* (pp. 294-303). Hong Kong: ResearchGate. Retrieved 10 07, 2020, from https://www.researchgate.net/publication/308349331_Assessing_the_computer_literacy_of_university_graduates

Ezziane, Z. (2007). Information Technology Literacy: Implications on Teaching and Learning. *Educational Technology & Society , 10*(3), 175-191. Retrieved from https://www.researchgate.net/publication/220374108

Gallagher, B., Connolly, N., & Lyne, S. (2005). Equal Access to Technology Training (EATT): Improving the computer literacy of people with vision impairments aged over 35. *International Congress Series , 1282*, 846-850. doi:https://doi.org/10.1016/j.ics.2005.05.202

Gupta, G. K. (2006). Computer Literacy- Essential in Today Computer-Centric World. *38*, 115-119. Retrieved 10 08, 2020

Hsu, H. M., Hou, Y. H., Chang, I. C., & Yen, D. C. (2009). Factor influencing computer literacy of Taiwan and South Korea nurses. *Journal of Medical System , 33*, 133-139.

Kamaruddin, K., & Jusoh, O. (2008). Adult Computer Literacy Programme in Rural Areas in Peninsular Malaysia. *The Journal of Human Resource and Adult Learning, 4*(2), 141-153.

Kegel, R. H., & Wieringa , R. J. (2016). Measuring Computer Literacy without Questionnaires. 61- 65. Retrieved 11 5, 2020

Kumar, B. S., & Kumara, S. S. (2018). The digital divide in India: use and non-use of ICT by rural and urban students. World Journal of Science, Technology and Sustainable Development. 15(2), 156-168.

Kumar, B. S., Basavaraja, M. T., & Gagendra, R. (2014). Computer literacy competencies among Indian students: the digital divide. *Asian Education and Development Studies*.*3*(3), 267-281. doi:https://doi.org/10.1108/AEDS-03-2014-0007

Kumar, B. T., & Basavaraja, M. T. (2016). Computer access and use: understanding the expectations of Indian rural students. *Quality Assurance in Education, 24*(1), 56-69. doi:https://doi.org/10.1108/QAE-03-2014-0012

Michael, P. C., & Igenewari, S. L. (2018). The Impact of Computer Literacy among Secondary School. *International Journal of Education and Evaluation, 4*(1), 22-30. Retrieved 10 13, 2020

Oseghale, A. J., & John, O. (2014). The Impact of Computer Literacy on Students' Academic Performance in Senior Secondary. *Journal of Education and Human Development, 3*(3), 265-270. doi:10.15640/jehd.v3n3a21

Poynton, T. A. (2005). Computer literacy across the lifespan: a review with implications for educators. *Computers in Human Behavior , 21*(6), 861-872. doi:https://doi.org/10.1016/j.chb.2004.03.004

Railkar, D., & Katyare , P. (2014). A Comparative Analysis of Computer Literacy in Rural And Urban Schools of Pune Region. *International Journal of Innovative Research in Computer Science & Technology (IJIRCST), 2*(6), 50-55.

Seretse, M., Chukwuere , J., Lubbe, S., & Klopper , R. (2018). Problems around Accessing Information in Rural Communities. *Alternation: Interdisciplinary Journal for the Study of the Arts and Humanities in Southern*

Smith, S. G., & Crawford, K. (1992). Computer Literacy and Matters of Equity. *Journal of Information Technology for Teacher Education, 1*(2), 215-229. doi:10.1080/0962029920010206

The National Literacy Trust. (2012). *The State of the Nation – a picture of literacy in the UK today*. London: National Literacy Trust.

Tumburku, W. G., Kamba, A. H., & Muhammad , S. (2019). Computer Literacy and Teachers' Job Performance in Secondary Schools in DankoWasagu Local Government Area, Kebbi State, Nigeria. *2nd International Conference on Education and Development* , (pp. 63-68).

UNESCO. (2006). *Education for All Global Monitoring Report 2006 : Literacy for life*. Paris, France: UNESCO Publishing.

Vengerfeldt, P. (2003). Digital divide - questions beyond access . *Paper presented at the EMTEL Conference, 23-26 April 2003 New Media* (pp. 1-19). London, United Kingdom: Technology and Everyday Life in Europe Conference. Retrieved from https://www.lse.ac.uk/media@lse/research/EMTEL/Conference/papers/Vengerfeldt.pdf

Wickramasinghe, W. (2004). Rural Development Measures: Indicators and Indices for Sri Lanka,. *Sri Lanka Journal of Agrarian Studies, 4*(1&2)

# කාන්තාව උසස් අධ්‍යාපනයට යොමුවීම සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම

ජේ. එම්. ජී. ඩී. පියුමි

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
durekshapiumi92@gmail.com

***සංක්ෂේපය***

*1960 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය ක්‍රමක් ක්‍රමයෙන් පහළ බැස ඇති තත්ත්වයක් දක්නට ලැබුන අතර විවිධ රජයන් විසින් රට පුරා පාසල් ව්‍යාප්ත කිරීම, නොමිලේ පෙළපොත් සහ නිල ඇඳුම් ලබාදීම මෙන්ම නොමිලේ අධ්‍යාපනය ලැබීමට හැකියාව ලබාදීම වැනි ක්‍රියාමාර්ග තුළින් රට තුළ කාන්තාවගේ අධ්‍යාපන මට්ටම ඉහළ ඉහළ නැංවීමට උත්සාහ දරන ලදි. ඒ තුළින් කාන්තාවන් ද්විතීයික අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනය කෙරෙහි යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් දක්නට ලැබේ. එමගින් කාන්තාවගේ විවාහය ප්‍රමාද වීමක් හා පළමු දරුවා බිහි කිරීමේ වයස ප්‍රමාද වීම යන කරුණු හේතුවෙන් ඇයට ලැබිය හැකි දරුවන් ගණන පිළිබඳ තීරණය වීමක් දක්නට ලැබේ. එබැවින් කාන්තාවන් උසස් අධ්‍යාපනයට යොමු වීම සාඵල්‍යතාව කෙරෙහි බලපෑමක් ඇති කරන්නේද යන්න විමර්ශනය කිරීම උදෙසා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එමෙන්ම කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීම සාඵල්‍යතාව කෙරෙහි බලපෑමක් සිදුකර ඇත්තේද යන්න හඳුනා ගැනීම මූලික අරමුණ වන අතර අධ්‍යාපන මට්ටම් අනුව සාඵල්‍යයතාවය වෙනස් වීම හඳුනා ගැනීම හා ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ වයස් ව්‍යුහය අනුව සාඵල්‍යතාවය වෙනස් වීම හඳුනා ගැනීම යන උප අරමුණු පාදක කොට ගනිමින් මෙම අධ්‍යනය සිදු කළ අතර ඒ සඳහා අවශ්‍ය දත්ත රැස්කර ගැනීමට ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඇවරිවත්ත ග්‍රාම සේවා වසමේ වෙසෙන විවාහක කාන්තාවන් 100 ක නියදියක් සම්භාවිතා නියදි ක්‍රමයක් වන ස්තෘත සසම්භාවී නියැදි ක්‍රමය භාවිතා කරමින් ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස්කර ගත් අතර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් හා විභාග දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ගෙන් ද්විතීයික දත්ත රැස්කර ගන්නා ලදී. රැස් කරගත් දත්ත SPSS පරිගණක මෘදුකාංගය භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණය, කයිවර්ග පරීක්ෂාව හා සහසම්බන්ධතා සංගුණකය යන විශ්ලේෂණ ක්‍රමවේද යොදා ගෙන ඇත. ඒ අනුව පෙනීගිය කරුණක් වූයේ කාන්තාවගේ අධ්‍යාපන මට්ටම හා සාඵල්‍යයතාවය අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවයක් බවයි. උසස් අධ්‍යාපනයට යොමුවූ කාන්තාවන්ගේ විවාහ වන වයස ප්‍රමාද වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර අවුරුදු 26 ට පෙර විවාහ වූ කාන්තාවන්ගේ සාඵල්‍යතාවය අනෙකුත් කාන්තාවන්ට සාපේක්ෂව ඉහළ බවද දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය කරගැනීමට හැකි විය. මේ අනුව කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීම සාඵල්‍යයතාව කෙරෙහි බලපෑමක් ඇති කරන බව කිව හැකිය.*

***මුඛ්‍ය පද : කාන්තාව, සාඵල්‍යතාවය, ජනගහනය, අධ්‍යාපනය***

## 1. හැඳින්වීම

සෑම රටකම ඉතා වැදගත් සාධකය වන්නේ එම රටේ ජනගහනයයි. සාඵල්‍යතාවය යනු ජනගහන ගතිකතාවය මැනීමේ ප්‍රධානම නිර්ණායකයන්ගෙන් එකක් වන අතර එය ඕනෑම රටක, ජාතියක සංවර්ධනය මැනීමේ ප්‍රධාන දර්ශකයක් ලෙස හැඳින්විය හැක. එය ලෝකයේ ඕනෑම රටක ජනගහන ප්‍රමාණය ව්‍යුහය සහ සංයුතිය තීරණය කරයි. ප්‍රජා විද්‍යාවේදී නිර්වචනය කරන පරිදි සාඵල්‍යතාවය යනු සජීවී වශයෙන් උපත ලබන දරුවන් සංඛ්‍යාවයි. ජයතිලක (2013) ට අනුව සාඵල්‍යයතා දත්ත වලින් යම්කිසි කාල සීමාවකදී සත්‍යවශයෙන්ම සිදුවන උපත් ප්‍රමාණය පිළිබිඹු කරයි. දළ උපත් ප්‍රමාණය යනු ජනගහනයෙන් දහසකට වාර්තා වන උපත් ප්‍රමාණයයි. ජනගහනයේ ඇති ස්ත්‍රී පුරුෂ සංයුතිය, වයස් ව්‍යාප්තිය වැනි තොරතුරු උපත් සංඛ්‍යාව පුරෝකතනය කිරීම සඳහා වැදගත් වේ. කිසියම් ජනගහනයකට අයත් වන කාන්තාවන්ගේ ප්‍රමාණය ඉතාමත් අඩු අගයක් ගන්නා විට එකී සමාජයෙන් වාර්තා වන උපත් සංඛ්‍යාවද සීමා සහිත වේ. එමෙන්ම එහිදී කාන්තාවගේ වයස් ව්‍යුහයද බොහෝ සේ වැදගත් සාධකයක් වේ. මන්ද ළාබාල දැරියකට හා වයෝවෘද්ධ කාන්තාවන්ට දරුවන් ලැබීමේ හැකියාවක් නොපවතින බැවිනි. කාන්තාවගේ සාඵල්‍යතාවය ලෝකයේ බොහෝ උනන්දුවක් හා වැදගත්කමක් ඇති පර්යේෂණ විෂයයක් ලෙස හැඳින්විය හැකි අතර මෑතක් වන විට ශ්‍රී ලංකාවේ සාඵල්‍යතා හැසිරීම වෙනස් වෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. ජන විද්‍යාඥයින් විසින් පවසන පරිදි දරුවන් දැරීම ප්‍රමුඛ ලෙස විවාහ සංස්ථාව තුළම සිදුවන සාඵල්‍යතාවය වයස අවුරුදු 15-49 වයසේ පසුවන එනම් ප්‍රජනන වයසේ පසුවන විවාහක ස්ත්‍රීන් සංඛ්‍යාව මත රඳා පවතී. එමෙන්ම දරුවන් දැරිය හැකි කාලසීමාවේ මැදභාගයේදී වැඩි වශයෙන් දරුවන් ලැබිය හැකි යැයිද නිගමනය කරනු ලබන බවත් ඇතැම් කාන්තාවන් තම සාඵල්‍යතා කාල සීමාවේදී දරුවන් නොදැරීමට තීරණය කරන අතරම තවත් කෙනෙකු එම කාල සීමාවේදී ලද හැකි උපරිම දරුවන් සංඛ්‍යාව දැරීමටද කැමත්තක් දක්වනු ලැබේ.

දීර්ඝ කාලයක් තිස්සේ කාන්තාවන්ගේ දරු ප්‍රසූතියේ රටාවන්ට තීරණාත්මක සාධකයක් ලෙස අධ්‍යාපනය බලපෑම් කර තිබේ. ඒ අනුව සාඵල්‍යතාවය වෙනස් වීම පිළිබඳ අධ්‍යයනය කිරීමේදී කාන්තා අධ්‍යාපනයේ කාර්යභාරය විමසා බැලීම කළ යුතුය. ශ්‍රී ලංකාව තුළ ප්‍රාථමික, ද්වීතීයික හා තෘතීයික ආදී ලෙස අධ්‍යාපන මට්ටම් කීපයක් පවතී. මෙම අධ්‍යාපන රටාව තුළ කාන්තාවන් පිරිමින් හා සම මට්ටමින් අධ්‍යාපනය ලබයි. ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළු වන කාන්තා ප්‍රතිශතය මෙන්ම ද්වීයිතීක අධ්‍යාපනයට ඇතුලුවන කාන්තා ප්‍රතිශතය එම අධ්‍යාපන මට්ටම් වලට ඇතුලුවන පිරිමි ප්‍රතිශතය අභිබවා යන මට්ටමක පවතී. එමෙන්ම කඩඉම් පරීක්ෂණවලදී කාන්තාවන් පිරිමින්ට වඩා වැඩි කාර්යසාධනයක් පෙන්නුම් කරයි. තෘතීයික අධ්‍යාපනයට එනම් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වන කාන්තා ප්‍රතිශතය පිරිමි ප්‍රතිශතයට වඩා වැඩි අගයක් ගනී (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2019). මෙම ප්‍රවණතාවයන් තුළ කාන්තාවන් අධ්‍යාපනය තුළින් ඉහළ මට්ටමක් ලගා කරගෙන ඇති බව පැහැදිලි වේ. පසුගිය දශක කිහිපය තුළ කාන්තාවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුල දක්නට ලැබෙන්නේ කැපී පෙනෙන දියුණුවකි. ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය ආදී ලෙස ඔවුන්ගේ කාර්යසාධනය ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමක පවතින බවක් පෙනෙන්නට තිබේ (Semasinghe, 2017).

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ දරු සාඵල්‍යතා අනුපාතිකය හෙවත් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට තම ජීවිත කාලය තුළදී ලබා දිය හැකි දරු උපත් සංඛ්‍යාව බෙහෙවින් පහත වැටී ඇත. ශ්‍රී ලංකාවේ විවාහක කාන්තාවන්ගේ දරු සාඵල්‍යතාවය 2016 වන විට 2.2 ක් පමණ විය. 2020 වන විට එය ක්‍රමක් ක්‍රමයෙන් හීනවී ගොස් සාඵල්‍යතා අනුපාතිකය 2.17 ක් දක්වා පහල බැස ඇත (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2019). සාඵල්‍යතාවය පහත බැසීම සඳහා බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමේදී කාන්තාවගේ අධ්‍යාපනය ඒ සඳහා බලපෑම් කරන බව සොයාගැනීමට හැකි විය. ඒ අනුව කාන්තාවන්ගේ අධ්‍යාපනය සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීමට එමගින් පසුබිම සැපයිණි.

කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම තුළින් ද්විතීයික අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනය කෙරෙහි කාන්තාවන් යොමුවීමේ ඉහළ ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඒ තුළින් කාන්තාවන් තම විවාහය පිළිබඳවත් ප්‍රජනනය පිළිබඳවත් ස්වාධීන තීරණ ගැනීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම නිබන්ධනයේ මූලික පරමාර්ථය වන්නේ කාන්තාවගේ අධ්‍යාපනය සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමයි. ඒ අනුව කාන්තාවන්ගේ සාඵල්‍යතාවය කෙරෙහි ඔවුන් අධ්‍යාපනයට යොමුවීම බලපෑම් කර ඇත්තේද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන ගැටලුවයි. මෙම අධ්‍යයනයේදී යොදා ගත් පර්යේෂණ අරමුණු ලෙස කාන්තාව උසස් අධ්‍යාපනයට යොමුවීම සාඵල්‍යතාවය කෙරෙහි බලපෑමක් සිදුකර ඇත්තේද යන්න හඳුනා ගැනීම, අධ්‍යාපන මට්ටම් අනුව සාඵල්‍යතාවයේ වෙනස්වීම හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ වයස් ව්‍යූහය අනුව සාඵල්‍යතාවයේ වෙනස් වීම හඳුනා ගැනීම යොදා ගන්නා ලදී.

## 2. සාහිත්‍ය විමර්ශනය

ජයතිලක (2013) ට අනුව මෑත කාලීනව සිදු කරන ලද පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ අවධානය යොමු කිරීමේදී කාන්තාවන් ඔවුන්ගේ පෞද්ගලික අරමුණු හා අවශ්‍යතාවයන් සපුරාලිය හැකි වන පරිදි පවුල සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය අර්ථ දක්වා ඇත. එමෙන්ම නූතන ලාංකීය කාන්තාව සහ ඔවුන්ගේ ආකල්ප පිළිබඳ අධ්‍යයනය තුළ ඔවුන්ගේ රැකියා තත්ත්වය සහ පවුල් නායකත්වය ඉහළ යාම කාන්තාවන්ගේ ආකල්ප හා පවුල් භූමිකාවන් අතර සම්බන්ධතාවයේ විශාල වෙනසක්ද පෙන්නුම් කරයි. දරුවන් රැකබලා ගැනීම, ආහාර පිසීම හා නිවස පිරිසිදුව තබා ගැනීම වැනි සාම්ප්‍රදායික කර්තව්‍යයන් වෙනුවට විසි ගණන්වල මුල් භාගයේ සිටි සෑම තරුණියන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු පාහේම උසස් අධ්‍යාපනය සහ සේවා පළපුරුද්ද ලබාගැනීම සඳහා යොමු වී තිබේ. උසස් අධ්‍යාපනයට ඇතුළත් වීම සහ වයස අවුරුදු 35 දී පූර්ණ කාලීන ගෘහණියක් වෙනුවට රැකියාවක් ලැබීමේ අපේක්ෂාව විවාහය ප්‍රමාද වීම සමඟ සම්බන්ධ විය (චර්ලින්, 1980). අධ්‍යාපනය යනු සමාජීය චර්යාවේ වෙනස්කම් ඇති කරවනු ලබන ක්‍රියාවලියක් යැයි Brand (2011) විසින් පෙන්වා දෙන ලදී. සෑම පුද්ගලයකු හටම ඵලදායි අයුරින් සාමාජීය කටයුතුවලට සහභාගී වීමේ හැකියාව අධ්‍යාපනය මගින් සාධනය කරනු ලැබේ. එමෙන්ම සමාජ සංවර්ධනය සඳහා ඉතාමත් වැදගත් කාර්යයක් ඉටු කර ගැනීමට අධ්‍යාපන ක්‍රමය මගින් ලබාදෙන දැනුමේ ප්‍රතිඵලයක් ලෙස හැකියාව ලැබේ.

Drucker පෙන්වා දෙන්නේ ඉහළ අධ්‍යාපනයක් ලද පුද්ගලයා වර්තමාන සමාජයේ මූලික සම්පත බවයි. එවැනි මිනිසුන් සපයා දීමට අවස්ථාව සලසාදීම වනාහි රටක ආර්ථික, දේශපාලනික ආදී ක්ෂේත්‍රවල ශක්‍යතාවය පිළිබඳ සැබෑ මිනුම් දණ්ඩක් වන බවද ඔහුගේ අදහස වේ (කුමාර, 2008). Cleland (2009) දී පවසා ඇත්තේ ඉහළ උගත් ජනගහනයක් සිටින රටවල අධ්‍යාපන බඳවා ගැනීම් සහ අධ්‍යාපනික දියුණුව සශ්‍රීකත්ව කාල සීමාව, පවුලේ ප්‍රමාණය හවුල්කාරිත්වයේ තෝරාගැනීම් හා පුළුල් පවුල් හැසිරීම සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් පවතින බවයි. ඒ අතරම, සෑම රටකම අධ්‍යාපන පද්ධතිය පවුල් ප්‍රතිපත්ති, ආර්ථික සංවර්ධන මට්ටම ඇතුළුව විවිධ සමාජවල ආයතනික සන්දර්භයන්, ශ්‍රම වෙළඳපොළ ලක්ෂණ, පවුල් රටාවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පූර්ව සමාජයේ වටිනාකම මගින් අධ්‍යාපනයේ බලපෑම සකස් කරනු ලබන බවත් ඒ නිසාම 20 වන ශතවර්ෂය තුළ අධ්‍යාපනයේ වැදගත්කම වැඩි වී ඇතැයි James (2012) විසින් තර්ක ඉදිරිපත් කර තිබේ (Sobotka, Beaujouan,, & Bavel, 2017).

Hill & King (1995) ට අනුව ලොව පුරා සිදු කර පර්යේෂණ වලට අනුව පාසල්වලට ඇතුළත් වීමේ අනුපාතය සහ සාක්ෂරතාවය ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව බෙදී ඇති ආකාරයක් පෙන්නුම් කරයි. සංවර්ධනය වෙමින් පවතින රටවල, ලතින් ඇමරිකාවේ සහ කැරිබියන් දූපත් වල බොහෝ රටවල් හැරුණු විට, ගැහැනු ළමයින් ඇතුළත් කර ගැනීමේ අනුපාතය පිරිමි ළමයින් සඳහා වන අධ්‍යාපන මට්ටමට වඩා පසුගාමී වේ. වැඩිහිටි පිරිමින් සඳහා ලොව පුරා සාක්ෂරතා අනුපාතය කාන්තාවන්ට වඩා බෙහෙවින් වැඩි ය. අධ්‍යාපනික ප්‍රගතිය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම භුක්ති විඳ ඇති අතර, මෙම දියුණුව ස්ත්‍රී පුරුෂ පරතරය තුරන් කිරීමට අසමත් වී ඇත. අධ්‍යාපනය ශ්‍රම වෙළඳපල, ඵලදායිතාව සහ සැමට ආදායම් වර්ධනය වැඩි කරයි. අධ්‍යාපන මට්ටම ඉහළ යාම නිවසේ කාන්තාවන්ගේ ඵලදායිතාව වැඩි දියුණු කරන අතර එමඟින් පවුලේ සෞඛ්‍යය, දරුවන්ගේ යහපැවැත්ම සහ දරුවන්ගේ මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය වැඩි කළ හැකිය. කාන්තා අධ්‍යාපනයේ සමාජ ප්‍රතිලාභ ආර්ථික වර්ධනයට අනුබල දීමේ සිට ජනගහනයේ සාමාන්‍ය ආයු අපේක්ෂාව දීර්ඝ කිරීම, දේශපාලන ක්‍රියාවලීන්ගේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම දක්වා විහිදේ.

ජනගහනය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී සාඵල්‍යතාවයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ඕනෑම සමාජයක මානව පැවැත්ම හා ජීව විද්‍යාත්මක ආදේශය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් ලෙස සාඵල්‍යතාව හඳුනා ගත හැක. සාඵල්‍යතාවය යන්න ජනගහන වර්ධනය උදෙසා ධනාත්මක බලපෑමක් සිදුකරනු ලබයි. ප්‍රජා විද්‍යාවේදී නිර්වචනය කරන පරිදි සාඵල්‍යතාවය ලෙස හඳුන්වනු ලබන්නේ සජීවී වශයෙන් උපත ලබන දරුවන් සංඛ්‍යාවයි. යුවලකගේ හෝ පුද්ගලයකුගේ සාඵල්‍යතාවය ඔහුගේ හෝ ඇයගේ ජනක ශක්තිය මත රඳා පවතින අතර එය කායික විද්‍යානුකූල ධාරිතාව නිරූපණය කරනු ලබයි. පුද්ගලයෙකුගේ හෝ යුවලකගේ ජනක ශක්තිය පහළ මට්ටමක පවතින්නේ නම් සාඵල්‍යතා කාර්ය සාධනය ද පහළ මට්ටමක පවතී. සාඵල්‍යතාව යන සංකල්පය ප්‍රජනක කාර්ය සාධනයේ නියම මට්ටම සමාජ, සංස්කෘතික, කායික මෙන්ම ආර්ථික සාධක මගින් ද පාලනය වන ස්වභාවයක් පෙන්වනු ලබයි. ජනක ශක්තිය හා සාඵල්‍යතාවය යන වචන වෛද්‍ය විද්‍යාත්මක ඉතිහාසය තුළ භාවිතා කර ඇති අතර සමහර අවස්ථාවන්වලදී ඒවා සමාන අර්ථ ඇති වචන ලෙස හඳුන්වා ඇත. නමුත් ජනක ශක්තිය හා සාඵල්‍යතාවය යන

මෙම වචන දෙක අතර පවතින වෙනස ප්‍රජා විද්‍යාඥයන් විසින් මෙම විෂයට අනුව විස්තර කොට ඇත්තේ ජනක ශක්තිය යනු පුරුෂයෙකුට හෝ ස්ත්‍රියකට  නැතහොත් යුවලකට ප්‍රජනක ක්‍රියාවලියට සහභාගී වීමට ඇති කායික හැකියාව ලෙසයි. තවදුරටත් පැහැදිලි කරන්නේ නම් ප්‍රජනක ශක්‍යතාව ලෙස හඳුන්වන්නේ සජීවී දරුවෙකු බිහි කිරීමට යම් පුද්ගලයෙකු සතු වන විභව හැකියාවයි (ඊරියගම, 2016).

උගත් කාන්තාවන් විවාහයට පිවිසෙන්නේ ඔවුන්ගේ නූගත් සගයන්ට වඩා යම් තරමක ප්‍රමාද වීමකින් බව පරීක්ෂා කරන ලද සෑම රටකින්ම සොයා ගැනීමට හැකි වී ඇත. කාන්තාවන් විවාහ වන කාල සීමාව රටවල් පුරා විවිධ ලෙෂ වෙනස් වේ. එනම් පාසල් අධ්‍යාපනය ලබන කාන්තාවන් සඳහා වුවද සංස්කෘතික සම්මතයන් හා සම්ප්‍රදායන් විවාහ හැසිරීම් කෙරෙහි ප්‍රබල බලපෑම් පෙන්නුම් කරයි. උප සහරා අප්‍රිකානු හා උතුරු අප්‍රිකානු කලාප වල කාන්තාවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ අනුව විවාහ වන වයසෙහි සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය කළ හැක (Martin, 1995). උප සහරා අප්‍රිකානු රටවල එනම් කෙන්යාව, ලයිබීරියාව, ටෝගෝ, උගන්ඩාව සහ සිම්බාබ්වේ වැනි රටවල ඉහළ අධ්‍යාපනයක් ලද කාන්තාවන් විවාහය කල් දැමීමේ ස්වාභාවයක් විශේෂයෙන් දක්නට ලැබේ. අවම හා ඉහළම අධ්‍යාපනයක් ලද කාන්තාවන් අතර විවාහයේ වයස් පරතරය උතුරු අප්‍රිකානු සහ ආසියා රටවල අවු 4 සිට 7 දක්වා පරාසයක පවතී. ඉහළ අධ්‍යාපනයක් ලද කාන්තාවන් විවාහය කල් දැමීමේ ප්‍රවණතාවයක් මෑත කාලීනව දක්නට ලැබේ. කොලොම්බියාව, ඩොමිනිකන් ජනරජය, ග්වාතමාලාව, මෙක්සිකෝව සහ පේරු යන රටවල අවුරුදු 10 ක් හෝ ඊට වැඩි පාසල් අධ්‍යාපනයක් ලබන කාන්තාවන් අතර විවාහයේ මධ්‍යනය වයස විධිමත් පාසල් අධ්‍යාපනය නොලබන කාන්තාවන්ට වඩා අවුරුදු හයත් අටත් අතර ඉහළ ය.

මෑත කාලීන සාඵල්‍යතා අධ්‍යයන වලින් පෙනී යන්නේ බොහෝ සමාජ වල, රටවල සාඵල්‍යතා සංක්‍රාන්තිය සිඳුවෙමින් පවතින බවත් දරු ප්‍රසූතිය ප්‍රමාද කිරීම හෝ නතර කිරීමට කාන්තාවන් කැමති බව කාලයත් සමඟ වැඩි වෙමින් පවතින බවයි. Hanks (2007) ට අනුව සමීක්ෂණයක් සිඳු කිරීමේදී කාන්තාවන් සාඵල්‍යතාවය සඳහා ඇති මනාපය ප්‍රකාශ කළද ඔවුන්ගේ ජීවන තත්ත්වයන් වෙනස් වුවහොත් ඔවුන්ගේ එම කැමැත්ත වෙනස් කිරීමට වැඩි ඉඩකඩක් පවතී. බොහෝ ප්‍රදේශවල පවතින ආර්ථික හා වෙනත් දුෂ්කරතා නිසා සාඵල්‍යතාවය සඳහා ඇති කැමැත්ත බොහෝ දුරට සමාජ හා ආර්ථික පීඩනයන්ගෙන් බේරීම සඳහා වන තාවකාලික සලකා බැලීම් මගින් විශාල වශයෙන් බලපාන බව මොහු තර්ක කරයි.

කාන්තාවගේ අධ්‍යාපනය  විවිධ ආකාරයෙන් ඇයගේ සාඵල්‍යයතාවය කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබයි. සාඵල්‍යයතාවය ලෙස සලකනුයේ යුවලකට සිටිය හැකි උපරිම දරුවන් සංඛ්‍යාවයි. එය හිතාමතාම වැළැක්වීම සාඵල්‍යයතා පාලනය ලෙස හඳුන්වනු ලබයි. කාන්තාවකට ලැබිය හැකි දරුවන් සංඛ්‍යාව ඇයට අවශ්‍ය දරුවන් සංඛ්‍යාව, උපත් පාලන ක්‍රම ලබාගැනීමෙන් උපත් පාලනය කිරීමේ හැකියාව සහ ඒවා භාවිතා කරන ආකාරය පිළිබඳ දැනුම කාන්තාවගේ අධ්‍යාපනය වැඩි දියුණු වීම තුලින් සැපයෙන අතර එමගින් සාඵල්‍යයතාවයට බලපෑම් ඇති කරනු ලබයි (Gajanayaka, 1990).

Kim (2016) ට අනුව කාන්තාවගේ සෞඛ්‍ය, ඔවුන්ට දරුවෙකුට උපත ලබා දීමට හැකි ශාරීරික හැකියාව, දරුවන්ගේ සෞඛ්‍යය, අපේක්ෂිත දරුවන් සංඛ්‍යාව, උපත් පාලනය සඳහා කාන්තාවට ඇති හැකියාව සහ විවිධ උපත් පාලන ක්‍රම පිළිබඳ දැනුම හරහා කාන්තාවගේ අධ්‍යාපන මට්ටම සාඵල්‍යයතාව කෙරෙහි බලපෑම් එල්ල කරනු ලබයි ඒ අනුව කාන්තාවගේ අධ්‍යාපනයය හා සාඵල්‍යයතාව අතර පවතිනුයේ සෘණාත්මක සම්බන්ධතාවක් බව සොයාගෙන ඇත.

සාඵල්‍යතා අනුපාතිකය ආදේශන මට්ටමට වඩා පහල බසින විට අධ්‍යාපන මට්ටම් අනුව සාඵල්‍යතාවය අතර පවතින වෙනස නිරපේක්ෂව වටිනාකමෙන් අඩුවේ. සමාජ ස්ථර වලට අනුව සාඵල්‍යතාවයේ වෙනස්වීම් පැහැදිල් කිරීම සඳහා භාවිතා කළ හැකි උපත් පාලන ක්‍රම බොහෝ සංවර්ධිත රටවල පහසුවෙන් ලබා ගත හැකිය. නමුත් මෙහිදී තරුණියන් විශාල පවුල් ඇති කිරීමෙන් වැළකී සිටීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත රටවල අධ්‍යාපන මට්ටම අනුව සාඵල්‍යතාවය වෙනස් වේ. නමුත් මෙහිදී ආර්ථික අවපාතය හෝ ශ්‍රම වෙළඳපොල අනාරක්ෂිතතාවය ඇති වීමට බොහෝ ඉඩකඩ පවතී. අධ්‍යාපනය හා සාඵල්‍යතාවය අතර පවතින සෘණාත්මක සම්බන්ධය ප්‍රමාද වී හෝ පසු සංක්‍රාන්ති අවධියේදී අඩු වී හෝ ආපසු හැරවිය හැකිද යන්න තවමත් සොයාගෙන නැත. නමුත් සශ්‍රීකතා සංක්‍රාන්තියට වඩා සංගමයේ තීව්‍රතාවය වෙනස් වන බව පෙනේ (Yoo, 2014).

**3. අධ්‍යයන ක්‍රමවේදය**

කාන්තාවන් අධ්‍යාපනයට යොමුවීම සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම මෙම අධ්‍යයනය මගින් සිදු කර තිබේ. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නියැදිය තෝරා ගැනීමේදී සම්භාවිතා නියැදුම් ක්‍රමයේ පවතින ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිතා කළ අතර අතර ඒ අනුව මෙම අධ්‍යයනය ගම්පහ දිස්ත්‍රික්කයට අයත් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇවරිවත්ත ග්‍රාම සේවා වසම ඇසුරින් ප්‍රාථමික දත්ත ලබාගනිමින් සිදු කරන ලදී. දත්ත ලබා ගැනීමේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දත්ත දෙවර්ගයම භාවිතා කර ඇත. දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය මෙන්ම සම්මුඛ සාකච්ඡා ක්‍රමයද යොදා ගත් අතර අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව වෙනත් අයෙකු විසින් සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන, සඟරා මගින් ලබා ගැනීමට කටයුතු කර ඇත. මෙම අධ්‍යයනය කාන්තාවන්ගේ සාඵල්‍යතාවය මූලික කොට ගෙන සිදු කරනු ලැබූවකි. කිසියම් පර්යේෂණයක් සිදු කිරීමේදී එහි අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම ඉතා වැදගත් කරුණක් වේ. එසේ වන්නේ අධ්‍යයන කේෂ්ත්‍රය තුළින් පර්යේෂණයට අදාළ වන මූලික තොරතුරු එක්රැස් කරන බැවිනි . මෙම පර්යේෂණයට අවශ්‍ය අධ්‍යයන කේෂ්ත්‍රය තෝරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් කාන්තාවන්ගේ සාඵල්‍යතා අනුපාතිකයන් අවම මට්ටමක පැවතීමේ දත්ත තුළින් අධ්‍යයන කේෂ්ත්‍රය තෝරා ගන්නා ලදී. 2016 සාඵල්‍යතා සමීක්ෂණ වාර්තාවට අනුව කාන්තාවන්ගේ සාඵල්‍යතා අනුපාතිකයන් අවම දිස්ත්‍රික්ක වන්නේ කොළඹ, ගම්පහ, රත්නපුර වේ. මේ අනුව සාඵල්‍යතා අනුපාතිකය අවම දිස්ත්‍රික්කයක් වන ගම්පහ දිස්ත්‍රික්කය අධ්‍යයනයේ පහසුව තකා අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගැණිනි. එයට අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 13 අතුරින් වැඩිම කාන්තාවන් සංඛ්‍යාවක් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිටින බැවින් නියැදිය තෝරා ගනු ලැබුවේ ඒ ඇසුරිනි.

කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 79 අතරින් වැඩිම කාන්තාවන් සංඛ්‍යාවක් අමන්දොලුව ග්‍රාම නිලධාරි වසම තුළත් දෙවනුව වැඩිම කාන්තාවන් සංඛ්‍යාවක් ඇවරිවත්ත ග්‍රාම නිලධාරි වසම තුළත් ජීවත් වේ. ඇවරිවත්ත ග්‍රාම නිලධාරි වසම තුළ සම්පූර්ණ ජනගහනය 6804 ක් වන අතර කාන්තාවන් ප්‍රමාණය 4016 කි. ඒ අනුව කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඇවරිවත්ත ග්‍රාම නිලධාරි වසම ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම පර්යේෂණ සිදු කිරීමේදී නියැදිය තෝරා ගැනීම සඳහා සාඵල්‍යතා අනුපාතිකයන් භාවිතා කල අතර එම අනුපාතිකයන් අඩුම දිස්ත්‍රික්ක තුනෙන් එකක් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගන්නා ලදී. එමෙන්ම ගම්පහ දිස්ත්‍රිකයට අයත් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමසේවා වසම් අතුරින් ඇවරිවත්ත ග්‍රාම නිලධාරි වසමෙහි සිටින විවාහක කාන්තාවන් පමණක් යොදා ගනිමින් අධ්‍යයනය සිදු කරන ලදී.


මෙම අධ්‍යනයේදී නියැදිය තෝරාගැනීම සිදු කරන ලද්දේ සසම්භාවී නියදුම් ක්‍රමය යටතේ වේ. සසම්භාවිතා නියදුම් ක්‍රම වලදී නියැදි ඒකක තේරීම සම්භාවිතා පදනමක් මත සිදුකරයි. සසම්භාවී නියදුම් ක්‍රම භාවිතයෙන් නියැදිය තෝරාගැනීමේදී සියලුම එක් එක් සංගහන ඒකකයන්ට නියැදියට තේරීමට ඇති සමාන අවස්ථාව (1/nCN ) තහවුරු වන අතර නියැදිය තේරීමේදී වන පුද්ගලබද්ධතාවය හේතුවෙන් ඇතිවන අභිනනතාව හා ඥාති සංග්‍රහය වැනි දුර්වලතා ද මගහැරී ඇත. සංගහනය පිළිබඳ අනුමිතීන් කිරීමේදී එම අනුමිතීන්වල විශ්වාසනීයත්වය තහවුරු කිරීමට අවශ්‍ය නම් සම්භාවිතා නියදීම් ක්‍රම යොදා ගැනීම වැදගත් වේ. ඒ අනුව  ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ  කාන්තාවන් 100 ක් මෙම අධ්‍යයනය තුලදී නියැදිය ලෙස තෝරාගෙන ඇත. මෙම අධ්‍යනයේ නියැදි තරම නිශ්චය කිරීම සඳහා වඩාත් විශ්වාසනීය නියැඳුම් ක්‍රමයක් වන යමානේ (Yamane) නියැදුම් ක්‍රමය යොදා ගත් අතර මෙහිදි 90%ක විශ්වාසනීය මට්ටම යටතේ කාන්තාවන් 98 ක් මෙම අධ්‍යනය සඳහා යොදාගත යුතුය. එබැවින් 100ක නියැදියක් මෙහිදී යොදා ගන්න ලදී. එය පහත පරිදි තෝරා ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී.

මෙම අධ්‍යයනය සඳහා පදනම් කරගන්නා ලද ප්‍රධානම අරමුණ වන්නේ සාඵල්‍යතාවය කෙරෙහි අධ්‍යාපන මට්ටම සිදු කරන බලපෑම අවබෝධ කර ගැනීමයි. මෙහිදී විස්තරාත්මක සංඛ්‍යානයට අදාළ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තීරු ප්‍රස්තාර, වට ප්‍රස්තාර මෙන්ම සංඛ්‍යාතීන්, ප්‍රතිශත මිනුම් ඇසුරෙන් ගොඩනගා ගන්නා ලද වගු භාවිතා කරන ලදී. එමෙන්ම අධ්‍යයනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රමය, කයි වර්ග පරීක්ෂාව සහ සහසම්බන්ධතා සංගුණකය යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි.

### 4. දත්ත විශ්ලේෂණය

ප්‍රස්ථාර සටහන 1ට අනුව පෙනෙන්නේ මෙම නියැදිය අනුව උපාධි සහ ඉහළ අධ්‍යාපනයක් ලැබූවන්ගෙන් වැඩිම ප්‍රමාණයක් වයස අවුරුදු 20 - 24 ඛාණ්ඩයේ පසුවන බවයි. එමෙන්ම වැඩිම ප්‍රතිශතයක් උපාධි සහ ඊට ඉහළ අධ්‍යාපනයක් ලබා තිබෙන බව පෙනෙන්නට ඇති අතර කාන්තාවන් වැඩි වශයෙන් උසස් අධ්‍යාපනයට යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බව එමගින් අනාවරණය කර ගත හැක.


*ප්‍රස්තාර අංක 1: අධ්‍යාපනය හා වයස අනුව නියැදිය බෙදී යාම*




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

අධ්‍යාපනය යන්න ආදායම් මට්ටම කෙරෙහි සෘජුවම බලපෑම් සිදු කරන බව හඳුනා ගත හැකිය. මෙහිදී සාඵල්‍යතාවය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම මෙම සාධක දෙකම බලපානු ලබයි. මෙහිදී අධ්‍යාපන මට්ටම යන්න අධ්‍යාපනය නොලැබීමේ සිට උපාධි හා ඊට ඉහළ මට්ටම් දක්වා වර්ග කරගන්නා ලද අතර ආදායම යන්නද රුපියල් 50,000 සිට රුපියල් 250,000 දක්වා ක්‍රමවත් ස්වරූපයක වර්ග කර දක්වා ඇත. අධ්‍යාපන මට්ටම උපාධි හෝ පහළ මට්ටම් වල පවතින විට ආදායම් මට්ටම් පවතින්නේ රුපියල් 50,000 ට වඩා අඩු මට්ටම් වල බව හඳුනා ගත හැකි වීම විශේෂත්වයක් වෙයි.

*ප්‍රස්තාර අංක 2: අධ්‍යාපන මට්ටම හා ආදායම් මටටම අනුව නියැදිය බෙදී යාම*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

මෙහිදී හඳුනාගත හැකි විශේෂම ලක්ෂණ කීපයකි. එනම් අධ්‍යාපනයක් නොමැති පිරිස් සැලකීමේදී එම පිරිසෙන් 100%කම ආදායම් මට්ටම් රුපියල් පනස්දාහට වඩා අඩු මට්ටමක පවතින බව හඳුනාගත හැකි ය. අධ්‍යාපන මට්ටම 1 වසරේ සිට 5 වසර දක්වා වැඩිවන විට ආදායම් මට්ටම ක්‍රමයෙන් වැඩි වී ඇති බව හඳුනාගත හැකිය. එනම් සමස්ත සංගහනය 66.7% ක ආදායම් මට්ටම් රුපියල් පනස්දහසත් ලක්ෂයත් අතර මට්ටමට පැමිණ ඇත. විශේෂයෙන්ම උපාධි මට්ටම් සැලකීමේදී ඔවුන්ගේ ආදායම් එකිනෙකට බොහෝ සෙයින් වෙනස් ලෙස විසිර ගොස් ඇත. එනම් උපාධිධාරීන්ගෙන් 32.7% ක ආදායම රුපියල් 50,000ට වඩා අඩුම නමුත් 56.4% ක ආදායම විසිර පවතින්නේ 50,000 - 100,000 අතර බව හඳුනාගත හැකිය. එමෙන්ම සමස්ත උපාධිධාරීන්ගෙන් 1.8% ක ප්‍රතිශතයක් පමණක් රුපියල් 200,000 ට වඩා වැඩි ආදායම් මට්ටමක් උපයයි.

මීළඟට සලකා බලනු ලැබුවේ අධ්‍යාපන මට්ටම හා පවුල තුළ සිටින දරුවන් ගණන පිළිබඳවය. මෙහිදී ප්‍රධාන වශයෙන්ම අධ්‍යාපන මට්ටම යන්න අධ්‍යාපනයක් නොමැති මට්ටමේ සිට උපාධි හා ඊට ඉහළ මට්ටම් දක්වා අධ්‍යාපනය යන්න විහිදී පවතී. දරුවන් ගණන සැලකුවිට දරුවන් 1 සිට දරුවන් 5 දක්වා විහිදී පවතින බව හඳුනා ගත හැකිය.

*ප්‍රස්තාර අංක 3: අධ්‍යාපන මට්ටම හා සිටින දරුවන් ගණන අනුව නියැදිය බෙදී යාම*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

අධ්‍යාපන මට්ටම අනුව සැලකීමේදී අධ්‍යාපනය යන්න උපාධි මට්ටම දක්වා විහිදී පවතින විට දරුවන් ගණන 0-1 ත් අතර සිටින ප්‍රතිශතය 94.5% ක් බව හඳුනා ගත හැකිය. එනම් අධ්‍යාපන මට්ටම ඉහළ යන විට දරුවන් ගණන අඩු ප්‍රතිශතයේ සිට වැඩි ප්‍රතිශතය දක්වා ගමන් කරන බව පෙනී යයි. අධ්‍යාපන මට්ටමක් නොමැති අය සැලකීමේදී දරුවන් 5 ක්

හෝ ඊට වැඩි ගණනක් සිටින ප්‍රතිශතය 25% බව හඳුනා ගත හැකිය. නමුත් උපාධි මට්ටම සැලකීමේදී දරුවන් ගණන 5 ක් හෝ ඊට වඩා වැඩි ප්‍රතිශතය 0% ක් වීම මත මෙම තත්ත්වය තවදුරටත් පැහැදිළි වේ.

මීළගට විවාහයට පත්වූ වයස හා දරුවන් ගණන කෙසේ ව්‍යාප්තව පවතීද යන්න පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. විවාහයට පත්වූ වයස ප්‍රධාන වශයෙන් කාණ්ඩ කිහිපයක් යටතේ හඳුනා ගත හැකිය. එනම් අවුරුදු 15-20, 20-25 හා 25-30 යන වයස් කාණ්ඩ හඳුනා ගත හැකිය.

*ප්‍රස්තාර අංක 4: විවාහ වීමේ වයස හා දරුවන් ගණන අනුව නියැදිය බෙදී යාම*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

විවාහක වයස අනුව දරුවන් ගණන 0-1 ත් අතර සිටින ආකාරය සලකා බලන සමස්ත පිරිසෙන් 17.9% ප්‍රතිශතයක් අවුරුදු 15-20 ත් අතර විවාහ වූ අයයි. එමෙන්ම දරුවන් 0-1 ත් අතර සිටින සමස්ථය සලකා බලන විට එයින් වැඩිම ප්‍රතිශතයක් හඳුනා ගත හැකි වන්නේ වයස අවුරුදු 20-25 ත් අතර විවාහ වූ පිරිස බව කිව හැකිය. දරුවන් ගණන 4-5 ත් අතර සිටින සමස්ථ 100% ක ප්‍රතිශතය වයස අවුරුදු 20-25 ත් විවාහයට පත් වූ පිරිස බව හඳුනා ගත හැකි වීම විශේෂත්වයකි.

සාඵල්‍යතාව කෙරෙහි බලපාන්නාවූ තවත් වැදගත් සාධකයක් වන්නේ ආදායම් මට්ටමයි. එම ආදායම් මට්ටම මත සැදීමට අපේක්ෂිත දරුවන් ගණන කෙසේ ව්‍යාප්තව පවතීද යන්න මේ යටතේ විශ්ලේෂණය කර දක්වයි. ආදායම් මට්ටම් මෙහිදී ව්‍යාප්තව ඇත්තේ රුපියල් 50,000 ත් 250,000 ත් අතර බව හඳුනා ගත හැකිය. දරුවන් ගණන 0-7 දක්වා විහිදී පවතින බව හඳුනා ගත හැකිය.

*ප්‍රස්තාර අංක 5: ආදායම් මට්ටම් අනුව සෑදීමට අපේක්ෂිත දරුවන් ගණන*





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

ආදායම් මට්ටම අනුව සැලකීමේදී රුපියල් 0 - 50,000 ත් අතර ආදායමක් උපයන පිරිස සලකන විට සෑදීමට අපේක්ෂිත දරුවන් ගණන 0-2 ත් අතර බව පවසන පිරිස 47.2% බව හඳුනා ගත හැකිය. එමෙන්ම එම ආදායම් මට්ටම උපයන සමස්ථයෙන් 49.1% ක ප්‍රතිශතයක් දරුවන් 2-4 අතර සෑදීමේ බලාපොරොත්තුවෙන් පවතින බව හඳුනා ගත හැකිය. එමෙන්ම මෙහ හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණය වන්නේ රුපියල් 150,000 - 200,000 ත් අතර ආදායම් උපයන පිරිස තවදුරටත් දරුවන් සෑදීමට බලාපොරොත්තු නොවන බවයි. එමෙන්ම ආදායම 200,000 ට වඩා වැඩි වන විට දරුවන් සෑදීමේ බලාපොරොත්තුව 2-4 අතර පිරිසකට සීමා වන බව හඳුනා ගත හැකිය.

විවාහ වී ගතව ඇති කාලය සලකා බැලීමේදී පෙනී යන්නේ එය අවුරුදු 12 සිට අවුරුදු 48 ක් දක්වා විහිදී ඇති බවය. දරුවන් ගණන ගත් කළ 0 සිට 5 ට වඩා වැඩි මට්ටම් කරා විහිදී ඇති බව හඳුනා ගත හැකිය.

*ප්‍රස්තාර අංක 1.6: විවාහ වී ගතව ඇති කාලය හා සිටින දරුවන් ගණන*




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

දරුවන් ගණන 0-1 ත් අතර ඇති සමස්ථ පිරිසෙන් 57.7% ක ප්‍රතිශතය දරුවන් ගණන විවාහ වී අවුරුදු 0 - 12 ක වසර ගණනක් ගත වී ඇති පිරිසය. එමෙන්ම විවාහ වී අවුරුදු 12 - 24 ත් ගත වූ පිරිසට දරුවන් 0-1 ත් අතර සිටින්නේ එම පිරිසෙන් 16.7% ක් පමණ වන බව කිව හැකිය. දරුවන් 5 කට වඩා සිටින පිරිස සලකා බලන විට ඔවුන් 100% ක පිරිස විවාහ වී අවුරුදු 12 ක් බව හඳුනා ගත හැකිය. එමෙන්ම දරුවන් 4-5 ක් සිටින බව පවසන පිරිස 100% ක ප්‍රතිශතය විවාහ වී වයස අවුරුදු 48 ට වැඩි බව හඳුනා ගත හැකිය.

### 4.1 කාන්තාවන්ගේ සාඵල්‍යතාවය හා සම්බන්ධ අනෙකුත් විචල්‍ය අතර ස්වායක්තතාව පරික්ෂා කිරීම

පියර්සන්ගේ කයි වර්ග පරික්ෂාව මගින් පරික්ෂා කිරීමට යොදා ගන්නා ලද කල්පිත පහත පරිදි වේ. මෙහිදී විචල්‍යය එකිනෙකින් ස්වායක්ත වේද, මෙම විචල්‍යය එකිනෙක පරායක්ත වේද යන්න කයිවර්ග පරීක්ෂාව ඇසුරින් පරික්ෂා කිරීම සිදුවේ. මෙහිදී දෝෂ මට්ටම $\propto = 0.05$ ලෙස සලකමින් හා 95% ක විශ්වාස මට්ටමක් යටතේ කයි වර්ග පරීක්ෂාව සිදු කරන ලදී.

- H1:කාන්තාවගේ අධ්‍යාපනය හා සාඵල්‍යතාවය අතර සම්බන්ධතාවයක් නැත
- H2:විවාහකත්වයේ පවත්නා ස්වරූපය හා වයස අතර සම්බන්ධතාවයක් නැත
- H3:විවාහකත්වයේ පවත්නා ස්වරූපය හා ඉදිරියට දරුවන් බිහිකිරීමට බලාපොරොත්තු වීම අතර සම්බන්ධතාවයක් නැත
- H4:කාන්තාව රැකියාවක නිරත වීම හා සාඵල්‍යතාවය අතර සම්බන්ධතාවයක් නැත
- H5:කාන්තාවගේ සාඵල්‍යතාවය හා ස්වාමි පුරුෂයාගේ රැකියාව අතර සම්බන්ධතාවයක් නැත
- H6:කාන්තාවගේ සාඵල්‍යතාවය හා උපත් පාලන ක්‍රම භාවිතය අතර සම්බන්ධතාවයක් නැත.

මෙහිදී දරුවන් ගණන හා අධ්‍යාපන මට්ටම යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=46.284, p =0.000) සම්බන්ධතාවක් පවතින බව පෙන්නුම් කර ඇත. විවාහකත්වයේ වර්තමාන පවත්නා ස්වරූපය හා වයස යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=15.447, p=0.218) සම්බන්ධතාවක් නොපවතින බව පෙන්නුම් කර ඇත. විවාහකත්වයේ දැනට පවත්නා ස්වරූපය හා ඉදිරියට දරුවන් හදා වඩා ගැනීමට බලපොරොත්තු වීම යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=19.438, p=0.000) සම්බන්ධතාවක් පවතින බව පෙන්නුම් කර ඇත. දරුවන් ගණන හා කාන්තාව රැකියාවක නිරතවීමේ ස්වභාවය යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=3.718, p=0.294) සම්බන්ධතාවක් නොපවතින පෙන්නුම් කර ඇත. දරුවන් ගණන හා සැමියාගේ රැකියාවේ ස්වභාවය යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=43.712, p =0.000) සම්බන්ධතාවක් පවතින බව පෙන්නුම් කර ඇත. සාඵල්‍යතාවය (සිටින දරුවන් ගණන) හා උපත් පාලන ක්‍රම වල භාවිතය යන විචල්‍යය අතර ස්වායක්තතාව පරික්ෂා කළ අතර ($x^2$=7.694, p =0.032) සම්බන්ධතාවක් පවතින බව පෙන්නුම් කර ඇත.

### 4.2 කාන්තාවන්ගේ සාඵල්‍යතාවය හා සම්බන්ධ අනෙකුත් විචල්‍ය අතර සම්බන්ධතාව පරීක්ෂා කිරීම

කිසියම් පවුලක මවගේ වයස, අදාළ පවුල්වල සිටින දරුවන් ගණන හා සම්බන්ධයක් පවතිනවාද යන්න සහසම්බන්ධතා සංගුණකය මගින් පරීක්ෂා කර බලනු ලබයි. එහිදී කිසියම් පවුලක මවගේ වයස, අදාළ පවුල්වල සිටින දරුවන් ගණන අතර ගණනය කෙරෙන සහසම්බන්ධතා සංගුණකය වන්නේ +0.453 කි. ඒ අනුව පවුලක මවගේ වයස හා සලකා බලන පවුල්වල සිටින දරුවන් ගණන අතර ධන සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය. එම පවුල්වල මවගේ වයස වැඩි වන විට, එම පවුල්වල සිටින දරුවන් ගණන ද වැඩිවන අතර පවුල්වල මවගේ වයස අඩු වන විට, එම පවුල්වල සිටින දරුවන් ගණන ද අඩුවන බව හඳුනාගත හැකිය. ඉහත පරීක්ෂාව 99% වෙසෙසි මට්ටමක් යටතේ වෙසෙසි වීම තුළ ඉහත විචල්‍යයන් අතර පවතින සම්බන්ධය තවදුරටත් පැහැදිළි කරනු ලබයි. කිසියම් පවුලක මවගේ විවාහ විමේදී වයස, අදාළ පවුල්වල සිටින දරුවන් ගණන හා සම්බන්ධයක් පවතිනවාද යන්න මේ ඔස්සේ පරීක්ෂා කර බලනු ලබයි. එහිදී කිසියම් පවුලක මවගේ විවාහ වීමේදී වයස, අදාළ පවුල්වල සිටින දරුවන් ගණන අතර ගණනය කෙරෙන සහසම්බන්ධතා සංගුණකය වන්නේ -0.200 කි. ඒ අනුව පවුලක මවගේ විවාහ වීමේදී වයස හා සලකා බලන පවුල්වල සිටින දරුවන් ගණන අතර සෘණ සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය. එම පවුල්වල මවගේ විවාහ විමේදී වයස වැඩි වන විට, එම පවුල්වල සිටින දරුවන් ගණන ද අඩුවන අතර පවුල්වල මවගේ විවාහ විමේ වයස අඩු වන විට, එම පවුල්වල සිටින දරුවන් ගණන ද වැඩිවන බව හඳුනාගත හැකිය. ඉහත පරීක්ෂාව 95% වෙසෙසි මට්ටමක් යටතේ වෙසෙසි වීම තුළ ඉහත විචල්‍යයන් අතර පවතින සම්බන්ධය තවදුරටත් පැහැදිළි කරනු ලබයි. කිසියම් පවුලක සිටින දරුවන් ගණන, අදාළ පවුල්වල මාසික ආදායම හා සම්බන්ධයක් පවතිනවාද යන්න මේ ඔස්සේ පරීක්ෂා කර බලනු ලබයි. එහිදී කිසියම් පවුලක සිටින දරුවන් ගණන, අදාළ පවුල්වල මාසික ආදායම් මට්ටම සමඟ සහසම්බන්ධතා සංගුණකය වන්නේ -0.109 කි. ඒ අනුව පවුලක සිටින දරුවන් ගණන හා සලකා බලන පවුල්වල ආදායම් මට්ටම අතර සෘණ සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය. එම පවුල්වල සිටින දරුවන් ගණන අඩුවන විට පවුල්වල මාසික ආදායම වැඩි වන බව හඳුනාගත හැකිය. ඉහත පරීක්ෂාව 95% වෙසෙසි මට්ටමක් යටතේ වෙසෙසි වීම තුළ ඉහත විචල්‍යයන් අතර පවතින සම්බන්ධය තවදුරටත් පැහැදිළි කරනු ලබයි.

### 4.3 සාඵල්‍යතාවය කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම

මෙම අධ්‍යයනය තුළ සාඵල්‍යයතාවය කෙරෙහි බලපාන සාධක කිහිපයක් හඳුනා ගනු ලැබීය. එනම් එම විචල්‍යයන් වන්නේ පවුලේ ආදායම, පවුලේ මාසික වියදම, පවුලේ මාසික ඉතුරුම්, පවුල තුල ආදායම් උපයන්නන් ගණන හා අධ්‍යාපනය මට්ටම යන ඒවාය. මෙම විචල්‍යයන් සාඵල්‍යතාවය කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීම සඳහා මෙම විචල්‍යයක් මත පදනම්ව බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් ඇස්තමේන්තු කරන ලදී. එලෙස ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපායන ආකෘතිය පහත වගු සටහන මත ඇස්තමේන්තු කර දැක්විය හැකිය. මෙහිදී අධ්‍යාපනය යන්න කාණ්ඩගත දත්ත වීම මත ඒවා dummy variables ලෙස කාණ්ඩ ප්‍රමාණයට වඩා එකක් අඩුවන ලෙස ආකෘතියට එක් කර ඇත.

$\hat{y} = \hat{\beta}_0 + \hat{\beta}_1x_1 + \hat{\beta}_2x_2 + \hat{\beta}_3x_3 + \hat{\beta}_4x_4 + \hat{\beta}_5x_5 + \hat{\beta}_6x_6 + \hat{\beta}_7x_7 + \hat{\beta}_8x_8 + \hat{\beta}_9x_9 + e$

මෙම ප්‍රතිපායන අකෘතිය තුළ,

$y$ = සාඵල්‍යතාවය (දරුවන් ගණන)

$x_1$ = පවුලේ මාසික ආදායම (දහස්)

$x_2$ = පවුලේ මාසික වියදම (දහස්)

$x_3$ = පවුලේ මාසික ඉතුරුම් (පැය)

$x_4$ = පවුලේ ආදායම් උපයන්නන් ගණන (දහස්)

$x_5$ = උපාධි හෝ ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා තිබීම

$x_6$ = අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම

$x_7$ = අ.පො.ස සාමාන්‍යය පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබීම

$x_8$= 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබීම

$x_9$ = 0 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබීම

$e$ = දෝෂය

ලෙස දැක්විය හැකිය.

ඇස්තමේන්තු කරන ලද ආකෘතිය පහත පරිදි වේ

$$\hat{y} = 2.341 - 5.020x_1 + 1.638x_2 + 1.855x_3 + 0.302x_4 - 2.887x_5 - 1.985x_6 - 1.757x_7 - 1.569x_8 - 0.953x_9$$

මෙම අකෘතියට අනුව $\hat{\beta}_0$ , $\hat{\beta}_1$, $\hat{\beta}_2$, $\hat{\beta}_3$ , $\hat{\beta}_4$, $\hat{\beta}_5$, $\hat{\beta}_6$ , $\hat{\beta}_7$, $\hat{\beta}_8$ හා $\hat{\beta}_9$ යන අගයන් සියල්ල 95% වෙසෙසියා මට්ටම මත වෙසෙසි වේ. මේ අනුව අනෙකුත් සලකා බලන ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට පවුලේ මාසික ආදායම ($x_1$) යන්න එක ඒකකයකින් වෙනස්වන විට දරුවන් ගණන හෙවත් සාඵල්‍යතාව ($\hat{y}$) ඒකක -5.020 වෙනස්වන බව හඳුනාගත හැකිය. එමෙන්ම අනෙකුත් සලකා බලන ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට පවුලේ මාසික වියදම ($x_2$) යන්න එක් ඒකකයකින් වෙනස්වන විට දරුවන් ගණන ($\hat{y}$) ඒකක 1.638 වෙනස්වන බවක්ද හඳුනාගත හැකිය. අනෙකුත් සලකා බලන ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට පවුලේ මාසික ඉතුරුම් ($x_3$) යන්න එක් ඒකකයකින් වෙනස්වන විට දරුවන් ගණන ($\hat{y}$) ඒකක 1.855 වෙනස් වේ. එමෙන්ම අනෙකුත් සලකා බලන ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට පවුලේ ආදායම් උපයන්නන් ගණන ($x_4$) යන්න එක් ඒකකයකින් වෙනස්වන විට දරුවන් ගණන ($\hat{y}$) ඒකක 0.302 වෙනස්වන බව දක්නට ලැබේ. අවසාන වශයෙන් අනෙකුත් සලකා බලන ස්වායත්ත විචල්‍ය ස්ථාවරව පවතින විට අධ්‍යාපන මට්ටම ($x_5$ සිට $x_9$) එකක් සිදුවන විට දරුවන් ගණනට අලුතෙන් එකතුවන ප්‍රමාණයන් පිළිවෙලින් -2.887, -1.985, -1.757, -1.569 හා -0.953 යනාදී ලෙස වෙනස් වන බව කිව හැකිය. මේ අනුව සාඵල්‍යතාවය හෙවත් දරුවන් ගණන කෙරෙහි ප්‍රබල වශයෙන්ම මාසික ආදායම, මාසික වියදම, මාසික ඉතුරුම්, ආදායම් උපයන සාමාජිකයන් ගණන හා අධ්‍යාපන මට්ටම යන සාධක බලපාන බව හඳුනාගත හැකිය.

### 5. සමාලෝචනය

මෙම අධ්‍යයනයේ මූලිකම අරමුණ ලෙස කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීම සාඵල්‍යයතාව කෙරෙහි ඇති කරන බලපෑම හඳුනාගැනීම පෙන්වා දිය හැක. ඒ අනුව කාන්තාවකගේ අධ්‍යාපන  අධ්‍යාපන මට්ටම ඇයට සිටින දරුවන් ගණන කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදුකරන බව අනාවරණය විය. මෙහිදී උපාධිය සහ ඉහළ අධ්‍යාපන මට්ටමක් ලද කාන්තාවන් හට සිටින දරුවන් ගණන වැඩි වශයෙන් 0 ත් 1 ත් අතර පරාසයක පිහිටන බවත් ඊට පහල අධ්‍යාපන මට්ටම් පවතින කාන්තාවන්ට දරුවන් 2 ත්  5 ත් අතර ප්‍රමාණයක් සිටින බවත් අනාවරණය වූ අතර කාන්තාවගේ අධ්‍යාපන මට්ටම ඇයගේ දරුවන් සංඛ්‍යාව කෙරෙහි බලපෑමක් සිදු කොට ඇති බව මෙමගින් නිගමනය කළ හැක.

කාන්තාවගේ අධ්‍යාපනය හා සාඵල්‍යතාව අතර පවතින සම්බන්ධතාවය විමසීමේ දී කාන්තාවගේ අධ්‍යාපන මට්ටම හා ඇයගේ දරුවන් අතර සම්බන්ධතාවක් පවතින බවත් විවාහකත්වයේ වර්තමාන ස්වරූපය හා ඉදිරියට දරුවන් හදාවඩා ගැනීමට බලාපොරොත්තු වීම යන විචල්‍ය අතර සම්බන්ධතාවක් පවතින බවත් කාන්තාවගේ සැමියාගේ නැතහොත් කාන්තාවන් යැපෙන පුද්ගලයාගේ රැකියාවේ ස්වභාවය කාන්තාවගේ දරුවන් ගණන තීරණය කිරීම උදෙසා බලපෑම් කරනු ලබන බවත් කාන්තාවගේ සාඵ්‍යයතාවය එනම් සිටින දරුවන් ගණන හා ඇයගේ උපත් පාලන ක්‍රම වල භාවිතය අතරද සම්බන්ධතාවක් පවතින බව කයිවර්ග පරීක්ෂාව ඇසුරින් සිදු කරන ලද විශ්ලේෂණය හරහා නිගමනය කිරීමට හැකිවිය. කාන්තාවගේ විවාහයේ වර්තමාන ස්වරූපය හා ඇයගේ වයස මෙන්ම කාන්තාව රැකියාවක නිරත වීම හා ඇයට සිටින දරුවන් ගණන අතර සබඳතාවක් නොමැති බවත් මෙම නිරීක්ෂිත දත්ත හරහා සිදුකරන ලද විශ්ලේෂණය තුළින් නිගමනය කළ හැකිය.

විවාහක කාන්තාවන් සැලකිල්ලට ගත් විට මවගේ වයස යන සාධකය හ ඇයට සිටින දරුවන් ගණන කෙරෙහි වඩා හොඳ ධන සම්බන්ධතාවක් පෙන්නුම් කරනු ලබයි. බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණය සිදු කිරීම තුළ සාඵල්‍යයතාව කෙරෙහි බලපෑම් එල්ල කළ හැකි සාධක කිහිපයක් අනාවරණය කර ගත හැකි වූ අතර පවුලේ ආදායම, පවුලේ මාසික වියදම, පවුලේ මාසික ඉතුරුම්, පවුල තුළ ආදායම් උපයන ප්‍රමාණය හා අධ්‍යාපන මට්ටම් යනාදි සාධක හඳුනා ගත හැක. කාන්තාව උසස් අධ්‍යාපනයට යොමුවීම හා සාඵල්‍යතාවය අතර පවතින්නේ සෘණාත්මක සම්බන්ධතාවයක් බවත් එනම් කාන්තාවගේ අධ්‍යාපන මට්ටම හා කාන්තාවගේ දරුවන් ගණන අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවයක් බවත් මෙහිදී නිගමනය කිරීමට හැක. එමෙන්ම සාඵල්‍යයතාව හෙවත් දරුවන් ගණන කෙරෙහි ප්‍රබල වශයෙන්ම මාසික ආදායම, මාසික වියදම, මාසික ආදායම, පවුල තුල ආදායම් උපයන පුද්ගලයන් ගණන හා අධ්‍යාපන මට්ටම යන සාධක බලපාන බවත් කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීම තුලින් කාන්තාවගේ සාඵල්‍යතාවය එනම් ඇයට සිටින දරුවන් සංඛ්‍යාව සීමිත වන බවත් මෙම අධ්‍යයනය හරහා නිගමනය කළ හැකි විය. ඒ අනුව අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීම කාන්තාවගේ සාඵල්‍යතාවය කෙරෙහි සෘජුවම බලපෑමක් සිදු කරන බවත් ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්ෂික වාර්තාව, (2019. එක්සත් ජාතීන්ගේ සංවිධානය

කුමාර, එන්. වී. ජී. ඒ. එච්. (2008).සමාජ විද්‍යාව මූලික සංකල්ප න්‍යාය හා කමුවේදය. විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව (2019), ශම බල සමීක්ෂණ වාර්තාව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව

ජයතිලක, ඒ. කේ. ජී. (2013). සමාජ විද්‍යාව මූලික සංකල්ප. කඩුල්ල ප්‍රකාශන කඩවත

Brand, J. E., & Davis, D. (2011). The impact of college education on fertility. evidence for heterogeneous effects, 863-887.

Gajanayaka, I. (1990). *Fertility and its control: The puzzle of Sri Lanka.* Guttmacher Institute.

Hanks, J. (2007). Natural Intentions: Fertility Decline in the African Demographic and Health Surveys. *American Journal of Sociology, 112*(4), 1008-1043. doi:10.1086/508791

Hill, M. A., & King, E. (1995). Women's education and economic well-being. *Feminist Economics*, *1*(2), 21-46.

Kim, J. (2016). Female education and its impact on fertility. *IZA World of Labour*.

King, E. M. (2013). *Women's Education in Developing Countries Barries, Benifits and Policies.*

Martin, T. C. (1995). *Women'sEducation and Fertility.* Population Couìil.

Semasinghe, W. M. (2017). Women’s Labor force Participation in Sri Lanka: An Inquiry into the Factors Influencing Women’s Participation in the Labor Market. *International Journal of Social Science and Humanity*, *7*(3), 184-187.

Sobotka, T., Beaujouan,, E., & Bavel, V. J. (2017). Introduction: Education and Fertility in low fertility Settings. *Vienna Yearbook of Population Research*, 1-16.

Yoo, S.H. (2014). Educational differentials in cohort fertility during the fertility transition in South Korea. Demographic Research.

# Influence of the Industrial Sector on Economy of Sri Lanka

S.N.K.Karunarathne

*Department of Social Statistics, University of Kelaniya*
nishaka.karunarathne@gmail.com

***Abstract***

*The study about how does growth of industrial sector impact on economic growth of Sri Lanka. Industrial growth rate and Gross Domestic Product- GDP growth rate of Sri Lanka in (2000-2019), industrial export performance and Gross Domestic Product (2009-2019), industrial employment rate and unemployment of Sri Lanka (2009-2019) were used to study the impact of industrial sector on Sri Lanka's economy. This study has used secondary data which was gathered from annual reports (2000-2019) of Central Bank of Sri Lanka. Descriptive analysis methods, correlation and regression analysis were used as analysis methods of the study. Export performance of industrial sector and Gross Domestic Products have a strong positive relationship (R=0.867) but the industrial employment has poor impact (R=-0.320) on decreasing unemployment rate of Sri Lanka. Finally the study identified a positive relationship (R= 0.5) between industrial growth and GDP growth rate.*

***Keywords**: **Economy, Export, Industrial Sector, Gross domestic product, Unemployment***

## 1. INTRODUCTION

The Sri Lankan economic structure consists essentially of three sectors as agricultural, industrial and service (Central Bank of Sri Lanka-CBSL, 2019). There are number of sub-sectors pertaining to each main sector. Any economic activity carried out in Sri Lanka can be included in any of the above. As claimed by CBSL (2019) industry sector, services sector and agriculture sector are having 2.7%, 2.3 % and 0.6% of growth rates respectively. Hence the industry sector has the highest growth rate than other two economic sectors in 2019. As per CBSL, (2019) the industry sector of Sri Lanka basically divide into six main sub sectors as (i) Mining and Quarrying, (ii) Manufacturing (iii) Electricity, Gas, Steam and Air Conditioning Supply (iv) Water Collection, Treatment and Supply (v) Sewerage, Waste Treatment and Disposal Activities (vi) Construction. These sub sectors produced 2.3%, 15.6%, 1.1%, 0.2%, 0.3% and 6.9% respectively. The highest contribution is marked by manufacturing industry. As claimed by CBSL (2019), the key drivers of industrial sector are manufacturing and construction activities.

The export sector basically consists with Merchandize export and Service exports and according to Export Performance Indicators- EPI which Published By EDB in 2019, 19% of total GDP (US$ 84 Billion) is contributed by export sector of Sri Lanka and from that 19% exports consists with 15% of products export and as well as 4% of services export. That means 15% of GDP is contributed by products exports.

*Table 1. Structure of Export Sector*

| | | |
|---|---|---|
| Export Sector | Agricultural Sector | Tea<br>Coconut<br>Natural Rubber<br>Fruit and Vegetables<br>Other Export Crops |
| | Fisheries Sector | Seafood<br>Crustaceans<br>Other fish products<br>Aquarium fish |
| | Services | Logistics Education<br>Professional Services<br>Wellness Tourism<br>ICT/BPM<br>Construction |
| | Industrial Sector | Textiles & Garments<br>Petroleum products<br>Diamonds, Gems & Jewelry<br>Manufactures |


Source: EPI (2019)

As claimed by EPI (2019), industrial export sector has earned US$ Million 9138.97 in 2019. Other sectors have earned less than that amount. The main merchandize export partners of Sri Lanka are United States (26.29%), United Kingdom (8.36%), India (6.36%), Germany (5.41%) and Italy (4.45%) (EPI, 2019).

Unemployment is one of key measures of economic health and healthy economy means everyone should be employed at some wage (Labour Force Survey-LFC, 2019). Moreover unemployment has been playing major role as a powerful statistic which shapes the government policies and personal decisions.

According to Dickens and Lang (1991) Sri Lanka have faced serous unemployment problem because of the mismatch of workers aspirations and available jobs. As claimed by LFC (2019), Sri Lanka has 4.8% unemployment rate. Female unemployment rate (7.4%) is higher than male unemployment rate (3.3%) in 2019. There are 8,180,693 persons employed in Sri Lanka and it covered 49.8% of population of Sri Lanka. Figure 1 is showing the employed population of the three sectors.

*Figure 1: Employed Population of Agricultural, Industrial and Services Sectors*




Source: EPI (2019)

According to Figure 1, there is a difference in growth of employed persons in three sectors and industrial and services sectors are having growth while agricultural sector is having a decline. However the service sector has heights growth amount than industrial sector. The research problem of this study was identified as Does growth of industry sector influence on economy of Sri Lanka? This study basically focused to identify the impact of growth of industrial sector on economic of Sri Lanka. There is another objective to find out the influence of industrial export sector and industrial employment on economy of Sri Lanka.

## 2. LITERATURE REVIEW

According to Amirthalingam, (2008) there was a listless performance of the economy during 1948-1977 in Sri Lanka the delay of industrialization is identified as contributing prime factor to the slow performance of the economy. After the liberalization, the manufacturing sector which is the sub sector of industrial sector started to play main role in the production, export earnings and employment (Amirthalingam, 2008). As claimed by Embuldeniya (2015) the apparel industry which is one of the sub sectors of manufacturing sector give more impact than other industries to the total export earnings of the Sri Lanka over the 2010 to 2014.

According to Amirthalingam (2008), the outcome of the export led industrialization would be superior in the future, if Sri Lanka can move towards the production of hard manufacturing goods such as electronic goods. The construction industry which is one of the sub sectors of industrial sector helps to achieve lot of developments goals for any country such as providing technology, machinery, Engineering services and employment (Athukorala, 2014). Moreover Athukorala (2014) has revealed that the construction industry is highly booming sub sector in Sri Lanka. He found out a strong relationship between construction activities and economic growth.


## 3. METHODOLOGY

The study based on secondary data resources as Central Bank reports (2000-2019) and annual reports of Exports Performance Indicators (2018-2019).The statistical analysis methods as correlation and regression analysis have used to study the influence of the industrial sector on economy of Sri Lanka. This study has used GDP, unemployment rate as dependent variables and industrial growth rate, industrial export earnings and industrial employment rate are used as independent variables.  The relationships between these variables are shown in graphically by using scatter diagrams. Bar charts, Pie charts and line charts were used to compare and present other relevant data as well. SPSS statistical software and Microsoft Excel have used as analytical tools.

## 4. DATA ANALYSIS

The contribution of main three economic sectors to GDP is presented by Figure 1.


*Figure 2: Contribution of Industrial, Agricultural and Services Sectors to GDP*




Source: Central Bank of Sri Lanka (2019)

According to the Figure 2, the highest contribution is given by services sector and the lowest contribution from agricultural sector. However, there is different situation in behavior of growth rates of the three economic sectors than their contribution of GDP. The behavior of Industrial, Agricultural and Services sector with GDP was identified by figure 3.

*Figure 3: Behaviors of Industrial, Agricultural and Services Sectors (2010-2019)*





Source: Central Bank of Sri Lanka (2010-2019)

According to Figure 3, the highest growth rate is marked by industrial sector in 2010 and 2019. Even though these three economic sectors have different economic growth rates, here identified same trend in growth of three sectors.

Next consider the export performance of industrial sector and the merchandize export performance are identified by figure 4.


*Figure 4: Merchandize Export Performances*




Source: Export Performance Indicators- EPI (2019)

All other sectors expecting coconut based products, spices and essential oils, seafood, construction, wellness tourism, financial service, ICT/BPM and Transport are Industrial exports (EPI, 2019). Hence 59.6% of merchandize exports were contributed by industrial exports. The industrial exports consist with Apparel and garments, Diamond, gems & Jewelry, Manufactures and Petroleum products. Figure 4 presents the industrial export performance of those sectors.

*Figure 5: Industrial Export Performances (2009-2019)*





Source: EPI (2018-2019)

According to Figure 5, apparel and garments sector, manufactures sector and petroleum products sector have increased over 2009 to 2019. But diamonds, gems and jewelry sector has decreased their exports over the last ten years.

The impact of Industrial export performance on GDP is basically identified by Figure 6.

Figure 6: The Relationship between Industrial Export Performance and GDP




Source: Author Generated (2020)

According to figure 6, there is a positive impact of industrial export performance on GDP.

*Table 2. Simple Regression*


| Model | | Unstandardized Coefficients | | Standardized Coefficients | t | Sig. |
|---|---|---|---|---|---|---|
| | | B | Std. Error | Beta | | |
| 1 | (Constant) | -62.281 | 56.842 | | -1.096 | .302 |
| | Industrial export performance (US$) | .041 | .008 | .867 | 5.228 | .001 |

Source: Author Generated (2020)

According to the correlation and regression analysis, there is a strong positive relationship (R=0.867) between GDP and industrial export performance. $R^2$=0.752 is revealed that the 75.2% of change of GDP is represented by industrial growth rate.

The impact of industrial employment on unemployment of Sri Lanka is basically identified by Figure 7.

*Figure 7: The Relationship between Industrial Employments and Unemployment of Sri Lanka*





Source: Author Generated (2020)

According to Figure 7, when increase the industrial employment, it will decrease the unemployment of Sri Lanka.

There is a poor negative relationship (r = -0.320) between industrial employment and unemployment of Sri Lanka. Therefore, the study has identified a poor impact of industrial employment on decreasing unemployment of Sri Lanka.

The relationship between industrial growth and GDP is normal positive relationship. It can be show as follow.

*Figure 8. The Relationship between GDP and industrial Growth rate*




Source: Author Generated (2020)

*Table 3. Simple Regression*

| Model | | Unstandardized Coefficients | | Standardized Coefficients | t | Sig. |
|---|---|---|---|---|---|---|
| | | B | Std. Error | Beta | | |
| 1 | (Constant) | 2.632 | .754 | | 3.490 | .003 |
| | industry growth rate | .493 | .116 | .729 | 4.258 | .001 |

Source: Author Generated (2020)

According to the correlation and regression analysis, there is a strong positive relationship(R=0.729) between GDP and industrial growth rate. $R^2$=0.531 is revealed that the 53.1% of change of GDP growth rate is represented by industrial growth rate.

## 5. CONCLUSION

The economy of Sri Lanka consists with three economic sectors as agricultural, industrial and services sectors and services sector has given highest contribution to the economy than industrial and agricultural sectors. However, the study identified a highest growth rate from industrial sector than services sector. It implies that the industrial sector would give a positive influence to economy of Sri Lanka in future as well. Export sector is one of most valuable economic activities which contribute to increase GDP. But export sector of Sri Lanka has contributed 19% of GDP in 2019. If export sector will contribute more than that percentage, it will increase GDP. When consider the how industrial sector can improve the export sector of Sri Lanka, the study has identified that the industrial export sector has given more than 50% contribution for merchandize exports. This study identified that, there is a positive influence of industrial exports sector on GDP (R= 0.867) and that means the improvement of industrial exports will give more significance positive impact on economy of Sri Lanka.

Unemployment is one of main problems of Sri Lanka and it will harmful for health of economy. Thus, it is importance to have a look on how can decrease the unemployment rate of Sri Lanka and this study has focused to find is it significance to decrease unemployment through the increasing industrial employment. According to correlation analysis, industrial employment rate and unemployment rate have negative relationship (R= -0.321) and it implies that industrial sector can decrease unemployment of Sri Lanka. A wide expansion of industrial sector makes more job opportunities and it will decrease the unemployment problem and it is keeping a healthy economy. Finally the study has revealed that the growth of industrial sector will increase the growth of economy. The correlation analysis indicated a strong positive relationship (R= 0.729) between industrial growth rate and growth rate of GDP.

The Ministry of Industry and Commerce adopts several approaches to promote industrial sector as enhancing the competitiveness of selected thrust areas, Regional industrialization through *"Gamata Karmantha"* project, Regional industrial estate development, Environment friendly industrialization and productivity improvement in industry sector.

## References

Amirthalingam, K. (2008). Economic Liberalization and Its Impacts on the Manufacturing Industry in Sri Lanka, *Sri Lanka Economic Journal,* Colombo.9(2):31-35.

Amirthalingam, K, (2008). Social Development, Economic Growth and the Liberalization in Sri Lanka. Sri Lanka Economic Journal 8(2):1-20

Athukorala, R. (2014). Casual relationship between construction activities & GDP growth in Sri Lanka (Doctoral dissertation)._http://dl.lib.mrt.ac.lk/handle/123/11281.

Central Bank of Sri Lanka. (2000-2019).*Annual Reports.*

*Department of Census and statistics, Sri Lanka. (2018), Labour Force Survey Report.*

Dickens, W.T., Lang, K. (1991). An Analysis of the Nature of Unemployment in Sri Lanka. *NBER Working Papers Series*.

Embuldeniya, A. (2015). Impact of apparel industry on the economy of Sri Lanka. *Journal of Social Statistics*, *2*(1), 1-14.

Export Performance Indicators. (2018-2019), *Annual Reports of Export Development Board of Sri Lanka.*

# කර්තෘ නාම ලේඛනය


| | |
|---|---|
| ආර්. එම්. ආර්. පී. රාජපක්ෂ | 29 |
| එච්. ඒ. එන්. ඩී. ප්‍රේමලාල් | 1 |
| එන්. බී. පී. උපේක්ෂානී | 15 |
| ජේ. එම්. පී. ඩී. පියුමි | 105 |
| ඩබ්. එම්. එස්. එස්. මැණිකේ | 43 |
| ඩබ්. ඩී. ආර්. කුලතුංග | 57 |
| ඩී. කේ. තාරුකා | 79 |


# Author Index


| | |
|---|---|
| S.N.K.Karunarathne | 121 |